පඤ්ඤායි බහුභාණේන, කච්ඡපං ව්‍යසනං ගතන්ති.

නරවිරියසෙඨි, නරවීර්‍යයන්ගෙරෙහි ශ්‍රේෂ්ඨය; එතම්පි, මේ; දිස්වා, දැක; කුසලං, සත්‍යාදීන් ප්‍රතිසංයුක්තවූ; වාචං, තෙපුල්; පමුඤ්චේ, හරණේය හෙවත් නිර්දෝෂ කොට බණන්නේය; අතිවේලං, අතික්‍රාන්තවූ වේලා ඇතිකොට, නපමුඤ්චේ, නොබණන්නේය, කච්ඡපං, කූර්මයා; බහුභාණේන, බොහෝකොට බිණීමේ ව්‍යසනං, ව්‍යසනයට හෙවත් බිමහි මියයාමට; ගතං, ගියාහු; පඤ්ඤායි, ප්‍රත්‍යක්ෂකොට දක්නෙහිද- මුඛරතාවෙහි දෝෂප්‍රත්‍යක්ෂ කොට දුටුයෙහි වේද එතෙනින් දෙඩම්එනොවයි අවවාද කළේ.

215 කච්ඡපජාතකයයි.

---

286 නාවායමග්ගි තපති න සූලෝ සාධු තච්ඡිතෝ,
යඤ්ච මං මඤ්ඤති මච්ඡී අඤ්ඤං සෝ රතිමා ගතෝ.

අයං, මේ; අග්ගි, ගිනි; මං, මා; න තපති, නොතවයි; සාධු, මනාකොට; තච්ඡිතෝ, සස්නාලද; සූලෝ, හුලද; නතපති, නොතවත්නේයි; යඤ්ච, යම්බඳුවූ; මං, මැ; මච්ඡී, මැසිනි, සෝ, හේ මාගේ මත්සයා, අඤ්ඤං, අනික් මැසින්නකසම්පයට; රතිමා, කාමරතියපිණිස, ගතෝ, ගියේයයි; මඤ්ඤති, සිතුද-ඇගේ චිත්තාව මා තවත්නේයයි සේයි.

287 සෝ මං ඩහති රාගග්ගි චිත්තංවූපතපෙති මං,
ජලිනෝ මුච්ඡසිරා මං න කාමේ හඤ්ඤතෙ භවිති.

සෝ, හේ; රාගග්ගි, රාගගින්න; මං, මා; ඩහති, දවයි; චිත්තං ච, සිතද; මං, මා; උපතපෙති, තවත්නේය; ජාලිනෝ, කෙවුලෙනි; අසිරා, සාමීනි; මං, මා; මුච්ඡ, හැරපියව්; කාමේ, කාම යෙහිපිහිටි පුරුෂයා; භවි, කිසිවෙක්; නහඤ්ඤතෙ, නොනසා නොහොත් "කාමෝ"යනු හෙළුවියෙහි සපතම්හෝයි; කාමෝ,

කාමයන් හෙතුකොටගෙන (මැසින්න පස්සේ දුවන්නේ); ඛිවි, කිසි නොපසේවූවන් විසින්; නහඤ්ඤතෙ, මරණතොලබන්නේයි.

216 මච්ඡජාතකයයි.

288 සබ්බෝ ලොකෝ අතතමනෝ අහොසි
අකොවිදෝ ගාමධම්මස්ස සෙග්ගු,
කොමාරිකෝ නාම තවජ්ජ ධම්මෝ
යං ත්වං ගහිතා පවනෙ පරෙදසි.

සබ්බෝ ලොකෝ, සියලුසත්ත්වලොකයා; අතතමනෝ, මේකාම සෙවනය හෙතුකොටගෙන සතුටුවූයේ; අහොසි, විය, සෙග්ගු, සෙග්ගුනම් තැනැත්තිය; ගාමධම්මස්ස, ග්‍රාමධර්මයෙහි; අකෝවිදෝ, අදක්ෂයෙහිද; කොමාරි, කුමාරිකාව; ත්වං, තෝ; යං, යම් හෙයකින්; ගහිතා, (කාමසන්චය පිණිස මා විසින් අත්) ගත්නා ලද්දෙහි; පවනෙ, මහවල; අජ්ජ, අද; පරෙදසි, හඬන්නෙහිය; තව, තීගේ; ධම්මෝ, සභාවය; කෝ නාම, කෙනම්ද.

289 යෝ දුක්ඛද්ධාය භවෙය්‍ය තාණං
සෝ මෙ පිතා දූහි වනෝ කරොති,
සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ
සෝ තායිතා සෝ සහසා කරොතිති.

යෝ, යමෙක්; දුක්ඛ, දුකින්; ත්‍රස්ථාය, පහරණලද්දියට, තාණං, සරණ; භවෙය්‍ය, වේද; මෙ, මාගේ; සොපිතා, හේපියේ; වනෙ, වෙනෙහි; දූහි, ද්‍රොහක්‍රියාවක්; කරොති, කෙරෙයි; සා; හේ මම; වනස්ස, වනයාගේ; මජ්ඣෙ, මැද, කස්ස, කවරෙක්හට; කන්දාමි, හඬම්ද; යෝ, යමෙක්; තායිතා, රක්‍ෂාකරන්නේද; සෝ, හේ (රක්‍ෂාවට යොග්‍යවූ අපගේ) පිළේ; සහසා, සාහසිකවූ හෙවත් දරුණුවූ ක්‍රියාවක්; කරොති, කෙරේ- දුකක්සම්භවූකල ඒ දුකින් නහාගන්නට සුදුසුවූ පියාණන් වල්මැද මේ සාහසික ද්‍රොහක්‍රියා වක් කෙරෙම්යි ප්‍රසූතාකල කාට නියම්දැයි හැඩූ.

217 සෙග්ගුජාතකයයි.

290 සඪස්ස සාඨෙය්‍යමිදං සුචින්තිතං
පවෙච්ඡිතං පතිකූටස්ස කූටං,
ඵාලං වෙ අදෙය්‍යුං මූසිකා
කසමා කුමාරි නූලලා නො හරෙය්‍යුං.

සඪස්ස, ශඪයහට; ඉදං, මේ; සාඪෙය්‍යං, ශඪභාවය; සුචින්තිතං, මනාකොට සිතනලදැ; කූටස්ස, කූටයහට; පතිකූටං, ප්‍රතිකූටය; පවෙවාඛ්ඛිතං, සුදුසුකොට කරනලදැ; වෙ, ඉඳින්; මූසිකා, මූසික් යෝ; ඵාලං, යපඵු; අදෙය්‍යුං, කැවුනම්; කුලලා, උකුස්සෝ; කුම්භරං, කුම්භරයා; කස්මා, කුමක්හෙයින්; නොහරෙය්‍යුං, නොගෙනයෙද්ද- කෙරෙන්ටිකවූ උපායෙන් පරිප්‍රතිබඬවූ වස්තුව කැහැක්කැයි සිතාගත්හු ශඪයහට නැවත මූගේ ශඪප්‍රවෘත්තියට ශඪභාවය කරම්යි සිතාගත ප්‍රතිඥාඪෙය්‍යය කළසේ සුදුසුයයි නියා ප්‍රශංසාකොට මූගේ යපඵු මියන් කැඳුල තාගේ පුතු උකුස් සෝ කුමට නොගෙනයෙද්දැයි කිව්.

291 කූටස්ස හි සන්ති කූටිකූටා
භවතිවාපි නිකතිතොා නිකත්‍යා,
දෙහි පුත්තානඤ ඵාලනඤ්ඤස
ඵාලං මා තෙ පුත්තමභාසි ඵාලනඤොති.

කූටස්ස හි, කූටයහට වනාහි; කූටකූටා, කූටානි කූටයෝ; සන්ති, ඇත; අපි, නැවත; නිකතිතොා, වඤ්චප්‍රයොග ඇත්තාහට; නිකත්‍යා, අනිෂ්ට වඤ්චවෙන්යුක්ත පුද්ගලයෙක්; භවතිච, වන් තේමය; පුත්තානඤ, පුත්‍රයන්ගේය; ඵාලනඤ්ඤස, යපඵුනට තැනැත් තවුට; ඵාලං, යපඵු; දෙහි, දේ; ඵාලනඤොා, යපඵුනවතැනැත් තේ; තෙ, තෘගේ; පුත්තං, පුත්‍රයා; මාඅභාසි, නොගෙනයේවා- මියෝ යපඵුකැවූයයි වඤ්චකොට පියමියි සිතූ තාසේවූ කූටයන්ට වඩා කූටයෝ ඇත පුත්‍රයා නෂ්ට පුරුෂය මියෝ කා සිතා වඤ්ච කොට ගත් යපඵු දිපිය හේ යපඵු ලදින් තා පුතු දිපියයි එසේ නුදුන්නෙහි නම් නොදී ගෙනයෙයි නියා නිශ්චය කළෝ.

218 කූටවාණිජජාතකයයි.

---

292 හිරඤ්ඤං මෙ සුවණ්ණං මෙ එසා රත්තිං දිවා කථා,
දුමෙමඛානං මනුස්සානං අරියධම්මං අපස්සතං.

මෙ, මාගේ; හිරඤ්ඤං, මසුරණ; මෙ, මාගේ; සුවණ්ණං, රත්නැයි; දිවා, දහවල්හිද; රත්තිං, රාත්‍රියෙහිද; දුමෙමඛානං, ප්‍රඥරහිතවූ; අරියධම්මං, ආර්‍යධර්මය; අපස්සතං, නොබලන්නාවූ; මනුස්සානං, මිනිසුන්ගේ; එසාකථා, මේකථායි- දෙශනා ශ්‍රීයෙන් රත්නන්මසුරන් කී බවමුත් සියලු දශවිධ රුවන් සියලු පුඬිනිනා

අපරන්නාක්‍රෝශ්‍යත්‍ර ගව මහිෂාදි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක විසතු විෂයකොට පවත්නා කථාමුත් එයින්පිටත් අනිත්‍යාදි කථා වෙක්ම හේ අනාඥී සවරූපඥති දුර්ම්මධමනුෂ්‍යයන්ට නැතැයි කියා ඔබ්බේ උන්ගේ ප්‍රවෘත්ති නියත්තේ "ඉව වේ" යනාදිනී.

293 වෙ වේ ගහපතයො ගෙහෙ එකො තත්‍ථ අමස්සුකො,
ලම්බත්ථනො වෙණ්හතතො අථො අඩ්කිතකණ්ණකො,
නීතො ධනෙන බහුනා සො තං විතුදතෙ ජනානති.

ගෙහෙ, ගෙහි; ගහපතයො, ගෘහපතීන්හු; වේ වේ, දෙදෙනෙක් දෙදෙනෙක; තත්‍ථ, උන්දෙදෙනා අතුරෙන්; එකො, එකෙක්; අමස්සුකො, දැලිනැත්තේය; ලම්බත්ථනො, එලෙන තනඇත්තේය; වෙණ්හතතො, නානාප්‍රකාරයෙන් බදනාලද සිළු ඇත්තේය; අථො, නැවත; අංකිතකණ්ණකො, විදුනාලද කන්ඇත්තේය; බහුනා, බොහෝවූ; ධනෙන, වසතුවෙන්; නීතො, ගෙනයනලද්දේය, සො, හේ ගෘහපතිතෙම; තංජනං, ඒ ගෘහජනයා; විතුදතෙ, මුඛ ශස්ත්‍රාදින් විදුන්නේසි-ගෙයකැයි කොට රට දෙන්නෙක් නායකව ගෙන වෙසෙති උන්දෙන්නා කෙරෙහුත් එකෙකුගේ නිකට රොම නැත තනදෙක එලෙයි නොයෙක්ලෙසට සංස්ථාපිත සිළු ඇත්තේ එලෙන කන් ඇත්තේ ඌද මව්පිය දෙදෙන නහවා ආභරණාදින් සදු වාහනයකට නඟා බොහෝ වසතුද ගෙනයෙති සත්‍රිය පිණිස කියා ඉනිදු ගෘහනායක පුරුෂයා නැලැම්ර තුලුම්ර ඝනාදින් මුඛශස්ත්‍රයෙන් විද පාපසචය කරනබවමුත් මේසින් පිටත් සඤ්ඤාදි ධර්ම්මයන් උදව්‍යයවශයෙන් ඛලන්නෝම නැතැයි වානර රජ වානරසෙනාවට මනුෂ්‍යලොකයෙහි ප්‍රවෘත්තිනී.

219 ගරහිනජාතකයයි.

294 සුඛං ජීවිතරූපොසි රඤ්ඤා විවහමානතො,
සෙ එකකො අරඤ්ඤස්මිං රුකඛමූලෙ කපණ්ණො විය ඣායසි.

සුඛං, සුවසේ; ජීවිත රූපොසි, ජීවත්වූ ඔබරූප ඇත්තෙහි; කෙවත් නිදුනිත් වැඩිලෙස් ඇත්තෙහි; රඤ්ඤා, රටින්; විවහං, ජලරහිත අරණ්‍යයට; ආගතො, ආසි; සො, හේතෝ; එකකො, එකාකීව, අරඤ්ඤස්මිං, අරණ්‍යයෙහිවූ; රුකඛමූලෙ, වෘක්ෂමූලයෙහි; කප ණ්ණො විය, කෘපණයක්හු මෙන්; ඣායසි, සිතසි- හේ කුමනාම් සිනිවිල්ලෙක්දැයි විචාලෝ.

295 සුඛං ජීවිතරූපොස්මි
රඤ්ඤා විවනමාගතො
සො එකකො අරඤ්ඤස්මිං
රුක්ඛමූලෙ කපණො විය ඣායාමි
සතං ධම්මමනුස්සරන්ති.

සුඛං, සුවයෙන්; ජීවිත, ජීවත්වූ; රූපොස්මි, සවරූප ඇත්තෙමි හෙවත්නොපනිඩාසේ නිදුනිත්වැඩියෙමි;රඤ්ඤා,සැනියවූ රාජ්‍යයෙන්; විවනං, ජලනැත්තාවූ විලව; ආගතො, ආයිමි; අසා, හේ ආවාවූ මම; එකකො, හුදකලාව; අරඤ්ඤස්මිං, විල්හි; රුක්ඛමූලෙ, ගස්මුල; කපණො විය, බැගැවිත්හුමෙන්; සතං,සත්පුරුෂයන්ගේ; ධම්මං, ධර්මය; අනුස්සරං, සිහිකරන්නෙම්; ඣායාමි, සිතමි- ඔහ් හෙයකින් බුදාදිවූ සත්පුරුෂයෝ ලාභාලාභාදිවූ අෂ්ටලෝක ධර්මයෙන් මඩනාලදුව කම්පානොවේද්ද මමද ඒසත්පුරුෂයන් ගේ ධර්ම ඇත්තෙම් සමරණය කරන්නෙම් හුන්නෙම් හැඟවූහ.

220 ධම්මධජ ජාතකයයි

(7)සන්වන බිරණත්‍යමහ වගීයයි.

——ඃ⁘ඃ——

296 අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

අනික්කසාවො, ප්‍රහීනනොකරනලද ලොභචෙෂාදී සඞ්ඛ්‍යාත කෂායඇති; යො, යමෙක්; කාසාවං, කාෂායරසයෙන් යුක්තවූ වස්ත්‍රය; වත්ථං, වස්ත්‍රය; පරිදහෙස්සති, හඳනේ පොරෝනේද; දම්, ඉන්ද්‍රිය දමනයෙන්හා; සච්චෙන, නිර්වාණසඞ්ඛ්‍යාත පරමාර්ථ සත්‍යයෙන් නොහොත් චතුස්සත්‍යයන් විසින්; අපෙතො, දුරුකරනලදද නොහොත්,සච්චෙහා,ඔහු පවම්‍යාදියෙහි තෘතීයාවි ගෙන;(දමසච්චමහා, ඉන්ද්‍රිය දමනයහා පරමාර්ථ සත්‍යයන් කෙරෙන්;) අපෙතො, පහවූ; සො, ඒපුද්ගලයා; කාසාවං, කාෂායරසපිනවස්ත්‍රයට; න අරහති, නුසුදුසුයි.

297 යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන සවේ කාසාවමරහතීති.

යො ච, යමෙක් වහාහි; වන්තකසාවෝ, චිත්තසන්තානයෙන් දුරුකරනලද ලොභාදිකෙලෙසකෂාය ඇත්තේ; අසා,විද; සීලෙසු,

මාගිශීලයෙහිද ඵලශීලයෙහිද; සුසමාහිතො, සම්‍යක්ආහිතද හෙව් මනාකොට පිහිටියේද; දම, ඉන්ද්‍රියදමනයෙන් හා; සමථෙන, නිර්ණඝඩිඛ්‍යාත පරමාර්ථසත්‍යයෙන් නොහොත් චතුඝසත්‍යයෙන්; ඊපෙනො, සුඛනද; සො, එතෙම; වෙ, එකාන්තයෙන්; කාසාවං, අර්හත්ධවජවූ කාෂාව වස්ත්‍රයට; අරහති, සුදුසුයි.

221 කාසාව් ජාතකයයි.

———oo———

298 ඉදං නදුචරිවචො පාරාචරියො යදබ්‍රවී,
මාසු ඛං අකනි පාපං යං ඛං පච්ඡා කතන්නපෙ.

පාරාවරියො, පාරාචරියනම් බ්‍රාහ්මණතෙම; පාපං, පාපය; ඛං, තෝ; මාඅකරි, නහම්ක්කරව්; යං, යම්බදුපාපයක්; කතං, කරනලදද; ඛං, තෝ; පච්ඡා, පසුව; තපෙ, තැවේන්නේයනියා; යං, යම්චනයක්; තදු, එකල්හි; අබ්‍රවී, කීද; ඉදං, මේ; ආචරිය වචො, ආචාර්‍යයාගේ බසි- ආචාර්‍යයා කී දෙයම්ය මට වූයේයප් කී.

299 යානි කරොති පුරිසො තානි පස්සති අත්තනි,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං,
යාදිසං වපතෙ බීජං තාදිසං හරතෙ ඵලනති.

පුරිසො, පුරුෂයා; යානි, යම් පාපකෙනකුත්; කරොති, කෙරෙල්ද; තානි, ඒපාපයන්; අත්තනි, තමාකෙරෙහි; පස්සති, දක්නේය; කල්‍යාණකාරි, දැනාදිවූ කල්‍යාණක්‍රියාකරන්නේ, කල්‍යාණං, කල්‍යාණයක්; පස්සති, දනී; පාපකාරීව, ඒපව්කරන පුරුෂයාද; පාපකං, ලාමකවූ අනිෂ්ටයක්ම; පස්සති, දනී, හේ ලොකෙහෙයින්සාධ්‍යයි, යාදිසං, යම්බදුවූ, බීජං, බිජුවටක්, වපතෙ, වපුරාද, තාදිසං, එබදුවූ, ඵලං, ඵලයක්, හරතෙ, ගෙනයන්නේයි- සාලිබීජරොපනය කෙළේ හේ සාලිබීජයහා සදෘශවූ සාලිඵල ප්‍රතිලාභය කෙරේද. කොද්‍රවාදින්ගේ ප්‍රතිලාභය නොකෙරේද එපරිද්දෙන් කුශල ක්‍රියාවේ ප්‍රයුක්තයා සත්පුරුෂයා එයට අනුරූප සවග්ග්‍රාදියෙහි උත්පත්තිය ප්‍රතිලාභයකොට චක්‍ෂුරාදිවිඤ්ඤාණයන්ට ඉෂ්ටවූ රූපාදි කල්‍යාණවස්තු ප්‍රතිලාභය කෙරෙයි ඉතරවූ අනිෂ්ට යෙක් නොලැබේ.

222 චුල්ලනන්දිය ජාතකයයි.

———o———

300 නමෙ නමන්තස්ස තපේ තපජ්ඣනං
නිබ්බානුකුබ්බිස්ස කරෙය්‍ය නිච්චං
නානත්තකාමස්ස කරෙය්‍ය අත්තං
අසම්භජන්තම්පි න සම්භජෙය්‍ය.

නමන්තස්ස, නමස්කාරකරන්තාහට; නමෙ, ප්‍රතිවඳනය කරන්තේය; තපජ්ඣතං, තමාසෙවිනතු; තපේ, සෙවිතේය; නිච්චං, තමාගේ උපත් කෘත්‍යයට, අනුකුබ්බිස්ස, අනුකෘත්‍ය කරන්නාහට හෙවත් තමාගේ කෘත්‍යප්‍රතිපාදනයෙහි ප්‍රයුක්තයහට, නිච්චං, ප්‍රතික්‍රියා, කරෙය්‍ය, කරන්තේය, අනත්තකාමස්ස, අනර්ථකාමීහට, අත්තං, අර්ථයක් හෙවත් වැඩක්, න කරෙය්‍ය, නොකරන්තේය, අසම්භජන්තම්පි, තමා නොසෙවිනමුදු, න සම්භජෙය්‍ය, නොසෙවිතේය.

301 චජේ චජන්තං වනථං න කයිරා
අපෙතචිත්තෙතන න සම්භජෙය්‍ය
චිජෙ ද්‍රුමං ඛීණඵලන්ති ඤත්වා
අඤ්ඤං සමෙක්ඛෙය්‍ය මහා හි ලොකොති.

චජන්තං, තමා හරණහු; වජේ, නොමේද හරණේය, වනථං, ඔහුකෙරෙහි තෘෂ්ණායයි කියනලද වනථය; න කයිරා, නොකරන්තේය; අපෙත චිත්තෙන, පහවූ චිත්තයෙන් හෙවත් විපරීත චිත්තයෙන්, න සම්භජෙය්‍ය, නොසෙවිතේය, එසේවැයි, ද්‍රුමං, වෘක්ෂය, ඛීණඵලං ඉති, ක්ෂීණවූ ඵලයයි, ඤත්වා, දැන, චිජෙ, විජයා, අඤ්ඤං, අනික් රුකක්, සමෙක්ඛෙය්‍ය, සොයා ගන්තේය, ලොකොති, ලොකය; මහාහි, මහත- අවශ්‍යයෙන් තොප කෙරෙහි සෙනහ පුරුෂයකු ලබන්නාවැදැයි කිව්.

223 සුමහත්තජාතකයයි.

---

302 යස්සෙතෙ චතුරෝ ධම්මා වානරින්ද යථා තව,
සච්චං ධම්මෝ ධිති චාගෝ දිට්ඨං සෝ අතිවත්තති.

වානරින්ද, වානරෙශ්වරය, සච්චං, වාක්සත්‍යයද, ධම්මෝ, පරීක්ෂාකරන ධර්මයද, ධිති, අකම්පවූ ධෛර්‍යයද, චාගෝ, තිස්ස ඕහත්‍යාගයද යන, එතෙ, මේ, චතුරෝ ධම්මා, ධර්මයෝ සතර දෙන, යථා තව, තව මෙන්, යස්ස, යම් පුද්ගලයක්හට විද්‍යමාන වෝද, සෝ, හේ පුරුෂයා, දිට්ඨං, සතුරා, අතිවත්තති, ඉක්මවයි.

303 යස්ස එතෙ න විජ්ජන්ති ගුණා පරමහද්දකා,
සච්චං ධම්මෝ ධිති චාගෝ දිඨං සෝ අතිවත්තති.

සච්චං, සත්‍යය; ධම්මෝ, ප්‍රඥාව, ධිති, ධෛර්‍යය, චාගෝ, ත්‍යාගයයන; එතෙ, මේ; පරමහද්දකා, විශෙෂයෙන් හද්‍රවූ, ගුණා, ගුණයෝ; යස්ස, යමක්හට; නවිජ්ජන්ති, නැත්තාහුද; සෝ, හේ කියනලද ගුණරහිත පුද්ගලයා; දිඨං, සතුරු; නාති වත්තති, ඉක්ම පැවැත්ත නොහේ.

224 කුම්භිලජාතකයයි.

---

304 අහඤ් මෙ පුරිසෝ දෙව සඛඛනිවෙස්ස ව්‍යාවටෝ,
තඤ්ච වෙකොපරධඤ්ඤි තඤ්ච තවං ඛන්ති මකුඤ්ඤසි.

දෙව, දෙවයෙනි; මේ, මාගේ; සඛඛනිවෙස්ස, සියලුකෘත්‍යයෙහි, ව්‍යාවටෝ, ව්‍යාවෘතවූ; පුරිසෝ, පුරුෂයෙක්; අහඤ්, ඇත; තඤ්ඤ ච, ඔහුගේද; එකෝ අපරාධෝ, එක් අපරාධයෙක්; අහඤ්, ඇත; තඤ්, ඒ අපරාධයෙහිලා; ඛං, නෝ; ඛන්ති, කුමක්නම්; මකුඤ්ඤසි, සිතයිද- මෙසේවූ අපරාධයට මෙනම් දඩයෙක් කටයුත්තේයයි සිතූද ඒ සිත උපන් දණ්ඩනය මෙහෙයාද යන අභිප්‍රායයි.

305 අම්හාකම්පඤ්ඤි පුරිසෝ එදිසෝ ඉධ විජ්ජති,
දුල්ලභෝ අඛගාසඵලතෙනා ඛන්තිරසාහාරුච්චිනි.

අම්හාකම්පි, අපගේ පවා; එදිසෝ, තොප කී පරිද්දෙන් බොහෝ ප්‍රයොජන ඇති මහාදෙශවත්වූ; පුරිසෝ, පුරුෂයෙක්; අත්ථි, ඇත; (හෙද දුරකනොවෙයි) ඉධ, මෙහැත්හිම; විජ්ජති, ඇත; මෙනනම සිටියේයයි සේයි; අඛගසම්පනෙනා, සියලු ගුණාඩ්‍යයෙන් අවිකලවූ පුරුෂයෝ; දුල්ලභෝ, දුර්ලභයහ (එසේ හෙයින් මෙබඳු සත්‍යා යෙහි); අස්මාකං, අපට; ඛන්ති, ක්ෂාන්ති; රුච්චති, අභිමතයයි- ලොකයෙහි සර්වතොභද්‍ර පුරුෂයෝ අරුමයහ එකදෙශයක් බොහෝ ගුණයෙහි නිමග්නවන හෙයින් බොහෝ ප්‍රයොජනාපෙක්ෂාවෙන් එක අපරාධයෙක් ක්ෂමාකරම්හ රාජෙඝවයීයෙහි සිටි අපවැත්නවුන් අපරාධ සහනය කරන කල තොපසේ වූවත් අපරාධ ක්ෂමාකළ ඔනා වේදයි කිව්ය.

225 ඛන්ත්‍යවණ්ණජාතකයයි.

---

306 කාලෙ නික්ඛමනා සාධු නාකාලෙ සාධු නික්ඛමෝ,
අකාලෙන හි ඡින්නමූල එක කම්පි බහූජනෝ
න කිඤ්චි අත්ථං පජොතෙති බංකසෙනාව කොසියං.

නික්ඛමනා, නිෂ්ක්‍රමනය නොහොත් පරාක්‍රමය; කාලෙ, සුදුසු ප්‍රයත්නකාලයෙහි; සාධු, හොඳතේය; අකාලෙ, නොකල්හි; නික්ඛමෝ; (තමාගේ නිවාසස්ථානයෙන්) නිෂ්ක්‍රමනය නොහොත් පරාක්‍රමය; න සාධු, ප්‍රශස්තනොවෙයි; අකාලෙන හි, නොකල්හි ම නොහි; නික්ඛම්ම, නික්ම නොහොත් වියර්‍යකොට; කිඤ්චි, කිසි; අත්ථං, අභිවෘධියක්; න පජොතෙති, බබලත්තේ නොවෙයි; (ප්‍රයොජනයක් නොවිදුනේයයි සේයි) එකකම්පි, ශුද්ධකළඹවූ පුරුෂයා; බහූජනෝ, බොහෝ ජනයෝ; කොසියං, බකමුහුණුවා නැසූ; බංකසෙනාව, කාකසෙනාව මෙන් හෙවත් අකාලඥව වාසස්ථානයෙන් නික්මුනු බකමුහුණුවා කාකසමූහයා වැද පිරිවරා මැරුවාක් මෙන් කල් නොහැඳින නික්මිනිද වියර්‍යකළද ඔහු බොහෝදෙනා එවකොට විනාශයට පමුණුවන්නාහුයයි සේයි.

307 ධීරෙ ච විධි විධානඤ්ඤූ පරෙසං විවරන්තගූ,
සඛාමිතෙතා වසී කත්වා කොසියොව සුඛී සියානි.

විධි, (පුරාතන පණ්ඩිතවරුන් විසින් කොට තබනලද ප්‍රකෘති) විධියගේ; විධානඤ්ඤූ, විධානදන්නාවූ නොහොත්; විධානඤ්ඤූ, සංවිධානක්‍රමය දන්නාවූ; පරෙසං, මෙරමාගේ; විවරන්තගූ, විවරයන්ට අනුව යන්නාවූ නොහොත් විවරය දන්නාවූ; ධීරෙ ච, ප්‍රාඥව නාහි; සඛාමිතෙතා, සියලු සතුරන්; වසී කත්වා, (තමාගේ) වසඟකොට; කොසියො ඉව, මේ බාලකොසිකයා කෙරෙන් පිටත් ප්‍රාඥකොසිකයා පරිද්දෙන්; සුඛී සියා, සුවපත්වූයේ වන්නේයි - ප්‍රඥවත්පුරුෂයා මේ කාලයෙහි නික්මිය යුත්තේය මේ කාලයෙහි වියර්‍යකටයුත්තේයයි පුරාතන ව්‍යවස්ථාක්‍රමයෙහි ප්‍රවීණව ගෙන සර්වඥතුරන්ගේ විනාශයට සුදුසු විවර දැන ත්‍රිසඞ්ඛ්‍යාත කාලයෙහි නික්ම වියර්‍යකොට කාකයන් ශ්‍රිමිඳිනය කොට සුවසේ ගිය කොසිකයා මෙන් උපායක්‍රමය නොවරදවා තමා සතුරන් මැඩ සුවසේ වාසය කරන්නේය යන අභිප්‍රායයි.

226 කොසියජාතකය නිමි.

308 සූරෙ සූරෙන සංගම්ම විකතනෙතා පහාරිනා
එහි නාග නිවතනස්සු කින්නු භීතො පලායසි
පස්සන්තු අඛගමගඛා මම තුය්හං ච විකතං.

සූරෙන, ශෞරගුණයෙන් යුක්තවූ; විකතනෙතන, වික්‍රමප්‍රකෘති ඇති; පහාරිනා, ප්‍රහාරදෘඩදෙන්නාවූ පුරුෂයා හා; සූරෙ, සූර පුරුෂයා; සංගම්ම, එකස්ථානයට ප්‍රාප්තව; (අන්‍යොන්‍ය ප්‍රහාරවිශයෙන් යුඩනොකොට කුමකටනම්යේද) නාග, ඇසනිය; එහි, නැහි ඒ; නිවත්තස්සු, නවතු; කින්නු, කුමටනම්, භීතො, භයප්‍රාප්තවූයෙහි; පලායසි, යයිද; මය්හං ච, මාගේද; තුය්හං ච, තාගේද; විකතං, ශෞර්‍යය; අඩහා, අහුරට ඇත්තෝද; මගඛා, මඟඛරට ඇත්තෝද; පස්සන්තු, බලත්වයි කියා- එතැන්හි විගුල රටිකක් බී මත්වූ අශුචියෙහි හොත් කුරුවැනියක් එතන යනා ඇතෙකු දැක මෙසේ කියා සටන් ඉල්වූ.

309 න තං පාදූ වධිස්සාමි න දනෙහාහි න සොණ්ඩියා.
මිල්ගෙන තං වධිස්සාමි පූති හඤ්ඤතු පූතිනාති,

තං, තා; පාදූ, පාදයෙන්; න වධිස්සාමි, නොමරම්; දනෙහාහි, (මාගේ පවිත්‍රවූ) දළසඟලෙනුත්; න වධිස්සාමි, නොමරම්; සොණ්ඩියා, සොඬිනුත්; න වධිස්සාමි, නොමරම්; වැලිකුමකින්දයන? මිල්ගෙන, අශුචි යන්ම; තං, තා; වධිස්සාමි, මරම්; පූතිනා, අශුචීන්; පූති, අශුචිය; හඤ්ඤතු, නසනු ලැබේවායි- මෙසේ කියා ඌ ඇඟට විස්පිණෙන්නියක් ගෙලා මරා ඇත් නැඟී ගියා.

227 ගුළුජානජාතකයයි.

---

310 තයො ගිරී අනතරං කාමයාමි
පචාලා කුරුයො කෙකකෙ ච,
තතුතතරිං බ්‍රාහ්මණ කාමයාමි
තිනිවජ මං බ්‍රාහ්මණ කාමජීතං.

බ්‍රාහ්මණ, බමුණ; පචාලා, උත්තරපචාලයද; කුරුයෙ, කුරුරටද; කෙකකෙ ච, කෙකක නම් රටද යන; තයො ගිරී, මේ තුන්රාජ්‍යයන්ගේ; අනතරං, රාජධානිසඞ්ඛ්‍යාත අන්තරයද; කාමයාමි, ප්‍රාර්ථනා කෙරෙමි; තතුතතරිං, මා අනුභවකරමින් සිටි ඛාරාණසී රාජ්‍යයෙන් වඩා; කාමයාමි, අධිකයක් ප්‍රාර්ථනා කෙරෙමි; බ්‍රාහ්මණ, බමුණ; කාම

කීතං, කාමයෙන් විනාශයට පමුණුවනලදැ; මං, මා; තිකිච්ඡ, චිකිත්සාකර.

311 කණ්හාහි දඪ්හ කරෙන්තිහෙකෙ
අමන්තඝ වච්ටඝ කරෙන්ති පණ්ඩිතා,
න කාමනීතඝ කරෙන්ති කෙචි
ඔඝන්තත්ථඝකතඝ හි කා තිකිච්ඡාති.

කණ්හාහි, කෘෂ්ණඝෂධීන් විසින්; දඪ්හ, දෘඪකරන ලද්දු හට; එකෙ, සමහරකෙනෙක්, කරොන්ති හි, (මන්ත්‍රොෂධාදීන්) චිකිත්සා කරන්නාහුමය; පණ්ඩිතා, (හුත චිකිත්සාවෙහි දක්ෂවූ) පඬිවරු; අමන්තඝ, යඝෂධාවිසින්; වච්ටඝ, මඩනාලද්දුහට; කරොන්ති, (බලික්‍රියාපරිත්‍රාණඝාකරණ මන්ත්‍රොෂධාදි) චිකිත්සා කරන්නාහුය; කෙචි, කිසිවෙක්; කාම, ඵඝුකාමතෙලඝකාමයෙන්; නීතඝ, හානියට පමුණුවනලද්දුහට; නකරොන්ති, (අසාධ්‍යයෙන්) චිකිත්සාවක් නොකරන්නේය; ඒ එසේමැයි; ඔඝන්තත්ථ සුතඝඝ, අතික්‍රාන්තවූ ශුකුලධර්ම්ම ඇත්තාහට හෙවත් කුශලක්‍රියාව දුරුකොට අකුශලධර්ම්මයෙහි පිහිටියාහුට; කා තිකිච්ඡා, චිකිත්සානම් කවරේද? මන්ත්‍රොෂධාදියෙන් යාපනයොවෙයි සේයි.

228 කාමනීඝානකඝඪි.

312 ගජඝහමෙඛෙහි හයඝහමාලිහි
රථූමිඝතෙහි සරඝිවඝඝහි
ථරුඝහඝාවච්ටදල්හපාකාරිහි
පරිවාරිතා තඝඝ සිලා සමන්තතො.

ගජඝහ, (මදජලධාරානිසෙකයෙන් රමණීය ගම්භීරකොච්චා දඝඩ්ඛඝාත ගජනාඇති) උත්තම හඝති නම්ඇති; මෙඛෙහි, මෙඝශ්‍රෙණින්ද; ඝඪඝහඝාමාලිහි, අග්‍රවූ චතුරතර තුරඬහමාලාවන් විසින්ද; සර, සර නමැති, අහිවඝඝහි, එළිඳාවන් ඇති, රථ, රථශ්‍රෙණි නමැති; ඌම්ජාතෙහි, තරඬහමාලාවන් විසින්ද; තරුඝහඝ, කඩුමිටි ඇත්තාවූ; ථාවච්ට, ඉතා පරිශුද්ධ ඝ කොට; දල්හපාකාරිහි, දෘඪප්‍රාකාරයෙහි ඝ ගොඩඝත් විසින්ද; සමන්තතො, හාත්පසින්; තඝඝසිලා, තක්ස්ලා නම් නගරතොමෝ; පරිවාරිතා, වටකරනු ලැබෙද්ද එසේම පිරිවැරුඝයි නිවි.

313 අභිඛ්වථා ච පතථා ච
විවිබවිනාදිතා ච දන්තිහි
චත්තතජ්ජ තුම්ලෝ ඝොසෝ
යථා විජ්ජුතා ජ්ලධරස්ස ගජ්ජතොති.

විවිධ, නානාප්‍රකාරයෙන්; විනදිතා, මහානාදකරන්නාවූ තෙපි හැමදෙන; දන්තිහි, උතුම ඔස්තීන් හා සමඟ; අභිඛ්වථ, දිවව්; පතථ, පනිව්; අජ්ජ, අදු; තුම්ලෝ, උධ්‍වතාවූ; ඝොසෝ, ඝොෂාවෙක්; චත්තතු, පවතිවා; ගජ්ජතෝ, ගජ්ජිනාකරන්නාවූ; ජලධරස්ස, මෙඝයාගේ මුඛයෙන්; යථාවිජ්ජුතා, විද්‍යුත්ඝාරය මෙන් දිවන්නා විඝාතුවර වටකරවයි කිව්.

229 පලාසිජාතකයයි.

314 ඛජ්ජපරිම්තං අනන්තපාරං
දුප්පසහං ඛංකෙහි සාගරම්ව
ගිරිම්ව අනිලෙන දුප්පසහෝ
දුප්පසහෝ අහම්ප්පතාදිසෙන.

ඛජ්ජ, රථයෙහි මයූරපාදයෙහි නාගනලද ඛව්ජ; අපරිම්තං, සඞ්ඛ්‍යාතික්‍රාන්තය; අනන්තපාරං, මාගේ සෙනාව කිසිත් අන්තයක් නැත්තාවූ පාරඇත්තේ හෙවත් කෙළවර නැත්තේ; ඛංකෙහි සාගරම්ව, කාකයා විසින් සාගරය මෙන් හෙවත් සමුද්‍රෝල්ලඞ්ඝනයෙහි අසක්‍යකාකයා මෙන්; දුප්පසහං, දුප්පසහය හෙවත් පරසතුරන් විසින් මැඩපිය නොහැක්කේ; අනිලෙන ගිරිම්ව, මාරුතයෙන් පර්වතයක් මෙන් හෙවත් පර්වතවලනයෙහි චාතය අයොග්‍යද එසේම; දුප්පසහෝ, මාගේ සෙනාව කිසිවක්හු විසින් විධ්වංසනය කොට නොහැක්කේය; අහං, මම; අජ්ජ, අදු; තාදිසෙන, තාක්‍රේවුවත් විසින්, දුප්පසහෝ, මැඩපිය නොහැක්කෙමියි බොධිසත්වයන් අටලු ගෙයි සිටියත් දැක කියා.

315 මා බාලියං විලපි නහිඤ්ඤ තාදිසෝ
විලය්හසෙ නහි ලභසෙ නිසෙධකං
ආසජ්ජසි ගජම්ව එකචාරිතං
සෝ තං පාදුනලම්ව පොථ්සිඤ්ඤතීති.

බාලියං, (තාගේ) බාලභාවය; මා විලපි, න යමක් කීය හෙවත් අනාත්මවෙදිව අහංකාර වචන ප්‍රකාශ කරන්නෙහි අඥානභාව

යෙන් හඬන්නෙහියයි සේසි; නාදියො, (අනන්‍යාබලවාහන ඇත් තෙමේ ආතමනකීනය කරන්නාවූ)නාගේවූ (ආත්ම දේහී) පුරුෂයෝ; නහි අසස, රාජ්‍යග්‍රහණයෙහි සම්ථියෝ නොවෙත්; විලස්හසෙ, හූ දෙක් රාග වෙෂ මොහාදි ක්ලෙශ පරිදූහයෙන් දඩිත්තුලැබෙයි; නි සෙධකං,මා බදුනිසෙධකයක්හූ; නහි ලභසෙ,නොලැබෙයි හෙවත් මාවලකන්ට සුදුස්සෝ නැතැයි සේයි; එකචාරිනං, මදගලිත එකචාරීවූ, ගජමීව, හස්තිරාජයක්හූ සමීපයට මෙන්; ආසජ්ජයි, එන්නෙහි; පාදූ, පාදයෙන් වූණිකළ; නළමීව, හූණනලක් මෙන්; සො, හෙතෙම්; තං, තා; පොථයිස්සති, පොථනය කොට වූණි කෙරේ.

230 දුතියපලාසිජානකයයි.

---

(8) අමවත කාසාවවග්ගියයි.

——— ०३( )३० ———

316 යථාපි නීතා පුරිසස්සුපාහනා
සුඛස්ස අත්ථාය දුඛං උදබ්බහෙ
සම්මාහිතත්තා තලසා පපීළිතා
තස්සෙව පාදෙ පුරිසස්ස ඛාදරෙ.

පුරිසස්ස, පුරුෂයහට; සුඛස්ස අත්‍ථාය, සුව පිණිස; යථාපි, යම්සේ; නීතා, ගන්නාලදු; උපාහනා, උපාහනයෝ; දුඛං, දුක්; උදබ්බහෙ, එලවද්ද; සම්ම, සම්‍යෙන්; අහිතත්තා, විශෙෂයෙන් නැවුනාවූ; තලසා, පාදයෙන්; පපීළිතා, පීඩිතවූවාහූ; තස්සෙව, හෙම්; පුරිසස්ස, පුරුෂයාගේ; පාදෙ, පාදයන්; ඛාදරෙ, කා වූණ කරන්නාහුය.

317 එවමෙව යො දුන්නුලිතො අනාරියො
තණ්හාය විජ්ජං ච සුතං ච මාදිය
තමෙව සො තන්ත සුතෙන ඛාදති
අනාරියො වුච්චති පාතුදූපමො ති.

එවමෙව; එපරිද්දෙන්; යො,යම්; දුක්කුලිතො, හීනකුලයෙහි උපන්නාවූ; අනාරියො, (ශ්‍රිඅපත්‍රදෙනින් දුරුවූ) අනාර්‍යාදූගලයා; තණ්හාකා, ආවාර්‍යයා කෙරෙන්; විජ්ජං ච, විද්‍යාස්ථානයන්ද; සුත ච, ශ්‍රුතයන්ද; ආදිය,ගෙන; තන්ත,එහි; සුතෙන, ශ්‍රුතයෙන්; සො,

හෙතෙව්; තමේව ඛාදති, එමකන්තේය; අනරියො, අනාය්‍යපුරුෂයා; දානදුපමො, උපාහනූපමයයි; වුත්තති, කියතුලැබේ- "තමහාක විප්පං ච" යනානැන ගාථාබඹින සුවඉ පිණිස හැඟයි.

231 උපාහනජාතකයයි.

318 එකච්චතිතොව අයමඤ්ඤො බාලො අපරිනායිකො,
නා හි ඛුජ්ජෙන වාමෙන හොති සඛාන්තු මරහසි.

අයං, මේ; අඤ්ඤො, අඑය; එක, ක්‍ෂුදකළාව; චිත්තිතොව, සිතනලදද හෙවත් මේ කුදුහා සමග පලාගිය මැනවැයි යනමේ අඑය තෙපිම සිතාගතුදැ; බාලො, මේකුද එයොවැඩ චිනමුත් ඥන චිරහයෙන් බාලය; අපරිනායිකො, සවිශක්තියෙන් යන්නට අයොහැහෙයින් අපරිනායකය; හොති, පිත්වතිය; වාමෙන, කුණාඵවූ ඇසපාදයන්ඇති; ඛුජ්ජෙන, පිටින්කුදුහා; සඛාන්තුං, සමාගම යට එළඹෙන්නට; නාහි අරහසි, සුදුස්සෙහි නොවේයි.

319 පුරිසූසභං මඤ්ඤමානා අහං ඛුජ්ජ මකාමයිං,
සොයං සංකුච්තිතො සෙති ජිනනාතන්ති යථා ථූණූති.

ඛුජ්ජං, කුදුපුරුෂයා. පුරිස, පුරුෂයන්ට, උසහං, ශ්‍රෙෂ්ඨයෙකැයි හෙවත් උතුමෙකැයි; මඤ්ඤමානා, සිතන්නාවූ; අහං, මම; ඛුජ්ජං, කුදු; අකාමයිං, කැමැතිවිමි; සො අයං, හේ මා කැමැති කුදු; ජිනනා, සිඳුනාලද; තන්ති, තන්ත්‍රුඇති; යථාථූණූ, වීණාදණ්ඩක් මෙන්; සංකුච්තිතො, සංකුච්තවූයේ හෙවත් ශීතයෙන් හැකුළුනේ; සෙති, හොනාලදී.

232 වීණාථූණ ජාතකයයි.

320 කාමං යහිං ඉච්ඡසි තෙන ගච්ඡ
විඛොසි මම්මම්හි චිනිණණකෙන
භතොසි භතෙනා ස වාදිතෙන
ලොලොව මවෙජ අනුබබ්ධානො.

කාමං, එකාහනෙයන්; යහිං, යම්තැනෙක්හි; ඉච්ඡසි, කැමැත්තෙහිද; තෙන, එහෙයින්; ගච්ඡ; නැඟි යා; මම්මම්හි, මම්ස්ථාන යෙහි; චිනිණණකෙන, මඬවූ හා ඔයෙන්; විඛො, විදුනාලද්දෙහි; ආසි, වී; මවෙජ, ඒනාහැයන; අනුබබ්මානො, අතුව දිවන්නාවූ; ලො

ලොව, චිනනාවූ තෝ; සවාදිතෙන, තෙරිච්ඡ සහිතවූ; හතෙන, ඛත කරණකොටගෙන; හතො, නටුගෙහි; ආසි, වී.

321 එවම්පි ලොකාමිසං ඔපතනෙනා
විහඤඤති චිතතවසානුවතති
සො හඤඤති සුතියඛානමජ්ඣෙ
මචඡානුගො සොරිව සුංසුමාරොති.

ලොකාමිසං, රූපාදිගෙහි ඇල්ම හෙතුකොටගෙන ලොකාමිසයයි කියනලද පඤ්චකාමයට; ඔපතනෙනා, අනුව දිවන්නාවූ; චිතතවසානුවතති, චිතතවසගව පවත්නාවූ පුද්ගලයා; එවම්පි, එපරිද්දෙන්ම; විහඤඤති, නස්නේය; සො, හෙතෙම; සුතිං, නැගෝය; සඛානං, යහළුවෝය යනමොවුන්ගේ; මජ්ඣෙ, මැද; මචඡානුගො, මත්සයයන් අනුවයන්නාවූ; සුංසුමාරො ඉව, සුංසුමාරයා මෙන්; හඤඤති, විනාශයට යන්නේයි.

233 වීකිණණජාතකයයි.

---

322 තථමෙව දුනි මනුර යං කාමො වයපගමා තයි,
සොයං අපපටිසඤඤිතො ඛර ජීනනංව රෙරුකං.

තයි, තා කෙරෙහි; යං, යම්බදුවූ; කාමෝ, (මාගේ)කාමයෙක්; වයපගමා, පහවීද, හෙවත් ධ්‍යානයෙන් විෂකම්භිතද ඒ ගුණවිශෙෂයා; ඉදුනි, දැන්; තථමෙව, තෝම; අකරු, කෙළෙහි; මා නොකැමැතිව කින්නරුව පස්සේ දිවන්නාවූ තා විසින්ම කෙලේ; ඛරු, කියන්පතින්; ජීනනං, කපනලද; රෙරුකං ඉව, ඇත්දළක් මෙන්; සො අයං, ඉහ මේඅපවිසින් ධ්‍යානයෙන් ඔබනලද කෙලෙසයන්; අප්පටිසන්ධිකො, ප්‍රතිසන්ධාන නොකොට හැකි වී හෙවත් කෙලෙසයන්ගේ පුනරුත්පත්තිය නොවන පරිද්දෙන් කෙළෙවිසි කිව්.

323 අතිවජා අතිලොභෙන අතිලොභමදෙන ච,
එවං හායති අඤඤමා අහංව අසිතා භුයාති.

අතිවජා, ඒ ඒ වස්තුවෙහි ඉච්ඡාකාරන නැනැත්තේ, අතිලොභෙන, අධිකලොභයෙන්ද; අතිලොභමදෙන ච, ප්‍රාරූඹමද උපදවන හෙයින් අතිලොභසඞ්ඛ්‍යාතවූ මදයෙන්ද; අසිතාහුයා, අසිතාහු

නම් රාජකන්‍යාව කෙරෙන් පිරිහුනු; අහං ඉව, මම පරිද්දෙන්; අත්ත මහා, අභිලාෂිතාඒයෙන්; එවං, මෙසේ; හායති, පිරිහෙන්නේයි.

234 අසිනාභු ජාතකයයි.

324 සුඛා ඝරා වච්ඡ නාඛ සහිරඤ්ඤා සභොජනා,
යඤ්ච භුඤ්ජා ච පිවා ච සයේයාථ අනුස්සුකෝ.

වච්ඡනඛ, වච්ඡනඛය; භුඤ්ජා ච, මධුරආහාර අනුභවකෙරවද; පිවා ච, මධුරපානයත් බීද; යත්ථ, යම්අලඬකෘත ශ්‍රියහතෙක්හි; අනුස්සුකෝ, උත්කන්ඨාරහිතවූයේ; සයෙයාථ, හෝනෙහිද එසේහෙයින්; සහිරඤ්ඤා, හිරණ්‍යසහිතවූද; සභොජනා, භොජන සහිතවූද; ඝරා, ගෘහයෝ; සුඛා, සුවයයි ගෘහවර්ණනා කලෝ.

325 ඝරානානිහමාගම්ම ඝරා නා හඤ්ඤතෝ මුසා
ඝරා නා දින්නාදණ්ඩිස්ස පරෙසං අභූතබ්භිතෝ,
එවං ජීද්දං දුරභිභවං යොා ඝරං පවිපජ්ජති.

අනිහමානඤ්ච, කෘෂිගොරක්ෂ්‍යා ව්‍යාපාරයෙහි උත්සාහවත්නොවන්නාහට; ඝරා, ගෘහයෝද; න, නැත; (ගෘහවාශය නොපිහිටන්නේය) මුසා, මෘෂාද; හඤ්ඤතෝ, (ක්ෂෙත්‍රවිසතු හිරණ්‍යභණ්ඩාදින්පිණිස) බණින්නාහට; ඝරා, ගෘහයෝ; න, නොවන්නාහ; නාදින්නාදණ්ඩිස්ස, නොගත්නාලද දණ්ඩිඇති; පරෙසං, මෙරමාහට; අභූතබ්භිතෝ, ප්‍රහාරදුනාදි දණ්ඩිනය නොකරන්නාහට; ඝරා, ගෘහයෝ; න, නොවන්නාහුයි-යමෙක් දූසකම්මිකාරදින්ට අපරාධානුරූපව වධබන්ධන ඡේදන තාඩනවසයෙන් පීඩාවක් කටහේ නම් ගෘහවාශයෙහි සක්‍යත නොඑසේවිනම් අයෝග්‍යයයි; එවං, මෙකී ප්‍රකාරදෙන්; ජීද්දං, ජීදුකල්හි හෙවත් මෙකී වියදීවන්වීමාදිය නොකිරීමෙන් සිදුරුව පරිහානියට ගියකල්හි; දුරභිභවං, දුරාභවවූ; ඝරං, ගිහිගෙට; යොා, කවරනම් පුරුෂයෙක්; පවිපජ්ජති, පැමිනේද? නොපැමිනෙන්නේයයි සේයි.

235 වච්ඡනඛජාතකයයි.

326 භද්දකෝ වතයං පක්ඛි වීජෝ කුමුදසන්ථතෝ,
උපසොභති පඤ්ඤාහි මඤ්ඤමන්ධේව සක්‍යාති.

කුමුදසන්ථතෝ, හෙලැඹිලපෙන්තක්වැතිවූ; වීජෝ, වීජඝඩ්ඛා

තවු; අයං පකතී, මේ පැහැයියා; භද්‍රකොචිත, ඉතා භද්‍රයි; උපසමෙන හී, සංසුන්තාවු, පකෘතිහි, පැහැයෙන්; මැදුම්න්දෙව, මැදුම්කැයක් හුමෙන්; කිරියති, සිතයි.

327 නාසස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ,
අමෙඛ විජෙ නා පාලෙති තෙන පකෙඛ නා එඳුතිති.

අසස, මොහුගේ; සීලං, ආචාරශීලයක්; න විජානාථ, නොදනුව; අනඤ්ඤාය, නොදන, පසංසථ, ප්‍රසංසානාරව; අමෙඛ, අප කැමදෙන; විජෙ, මේ බකසඋකුණපක්ෂියා; න පාලෙති, රකිතේනොවෙයි; හෙවත් අපව උපද්‍රවයක් නොවුවමැනවැයි රකිතේ නොවෙයි අපකන්නට රකිතේය; තෙන, එසේහෙයින්; පකෙඛ, පක්ෂයන්, න එඳුති, නොසලා.

236 බ ක ජා ත ක ය යි.

---

328 කොනුඛො භාවා හෙතු එතෘවිව ඉධ පුග්ගලෙ,
අතිව හදයං නිඛිතති චිත්තං චාපි පසීදති.

භගවා, භාග්‍යවත්නි; ඉධ, මේ ලොකයෙහි; එකවේ පුග්ගලෙ, සම්භර පුද්ගලයක්හු කෙරෙහි; හදයං, හෘදය; අතිව, අතිශයින්ම; නිඛ්බායති, නිවෙන්නේය- සිසිරවාරිහරිත ඝවඝනඝෙන් මසනකාභිශෙකයක් මෙන් නිර්වාපනයට යන්නේය; චිත්තංව, චිත්තයද; පසීදති, දැහැමිතුගෙන් පහදනේය; ප්‍රේමවශයෙන් ආලෙන් නේයයිසේයි, කොනුඛො හෙතු, හේ කවරනම් හෙතුවෙක් දැයි සවිඤයන් විවාලෝ.

329 පුබෙබව සහනිවාසෙන පච්චුපනෘභිතෙන වා,
එවං තං ජායති පෙමං උපලංව යථොදකෙති.

පුබෙබ, පූර්ජාතියෙහි, සහනිවාසෙන වා, පුනුත්‍රාතඃසංසෙවා ඒවශයෙන් ඒ ඒ ස්ථානයෙහි සහවාසයෙන්වේයි, පච්චුපනෘන, වර්තමානභවයෙහි කල; භිතෙන වා, භිතයෙන් වේවයි; උදකෙ, දියෙහි උත්පලකුමුදාදිවූ ජලජවූ යම් කුසුමයෙක්; යථා, යම්සේද? එවං, එපරිද්දෙන්; තං, ඒ; පෙමං, ප්‍රේමය; සම්දෙකාරණයෙන් සම්භව වනහෙයින්; ජායති, හටගනී- "උපපලංව" යනතැන "උපප

ලංවා''යි නී නියායි, හේ වා ශබ්දය සමුච්චයෙහි වැටේ එසේගෙයින් ''කුමුදං වා පදුමං වා කමලං වා''යි අවිගතයුතු.

237 ඤාතෙනජානකයයි.

330 ඉච්ඡ එකපදං තාත අනෙකඤ්ඤපදයුතිතං,
නිච් සඞ්ඛාඤ්කං බ්‍රූහි යෙනාජ්ජේ සාවයාමසෙ.

ඉච්ඡ, ආරාධනාකරම් නොහොත් විචාරම්; තාත, පියාණෙනි; යෙන, යම්කිසි පදයකින්; අජ්ජේ, අහිවඩින්; සාවයාමසෙ, අසමෝද එසේවූ; අනෙක, නොයෙක්; අඤ්ඤපදසිතං, කාරණාපදාශ්‍රිතවූ; සඞ්ඛාඤ්කං, ඛොඤ්වූ පදයන් සඞ්ග්‍රහකොට සිටි; නිච්, නිසි; එකපදං, (කාරණොපසංහිතවූ) එක්පදයක්; බ්‍රූහි, කියා- ''ඉඞ්ඝ'' යන නිපාත වොදනාරාධනා දෙක්හි වැටේ.

331 දුක්ඛියෙකපදං තාත අනෙකඤ්ඤපදයුතිතං
තව සීලෙන සංයුතතං ඛන්තියා උපපාදිතං
අලං මිත්තෙන සුඛාපෙතුං අමිත්තානං දුඛායචාති.

තාත, පුත්‍රය; දුක්ඛියං, දුඃඛාවයයි නියතලද හෙවත් අවී ප්‍රවේශයෙහි ප්‍රවීණයාගේ ප්‍රඥාසම්ප්‍රයුක්ත විඥ්ඤඞ්ඛ්‍යාත; එකපදං, එකපදය; අනෙක, බොහෝවූ; අඤ්ඤපදයුතිතං, කාරණා පදාශ්‍රිතය; තව, හෙද; සීලෙන, ශීලයෙන්; සංයුතතං, යුක්තවූයේ; ඛන්තියා, අධිවාසනක්ෂාන්තියෙන්; උපපාදිතං, සපයන ලද්දේ; මිත්තෙන, මිත්‍රයන්; සුඛාපෙතුං, සුවපත්කරන්නට; අමිත්තානං, සතුරන්; දුඛායච, දුක්පත්කරන්නට; අලං, පමණ වන්නේයි.

238 එකපදජානකයයි.

332 ආසීවිසං මං සතතං පවිඤං කුමිණාමුඛං,
රුච්චතෙ හරිතා මාතා යං මං ඛාදන්ති මච්ඡකා.

හරිතා මාතා, නීලමැඩිය මව් කොට ඇත්තව; කුමිණාමුඛං, කෙමෙණ මුඛයට; පවිඤං, ප්‍රවිෂ්ටවූ; මං, මා; ආසීවිසං සත්තං, ආශීවිෂ සමානවූ; යං, යම්බඳුවූ; මං, මා; මච්ඡකා, මත්ස්‍යයෝ; ඛාදන්ති, කද්ද; (හේ තට) රුච්චති, අභිමතයි.

333 විලුම්පනෙව පුරිසො යාවස්ස උපකප්පති,
යදූ අඤ්ඤෙ විලුම්පන්ති සො විලුම්පතා විලුම්පතීති.

යාව, යම්තාක්; අස්ස, මෝහට; උපකප්පති, එඤ්ඣයී සමඩියද ඒතාක්; පුරිසො, පුරුෂතෙම; විලුම්පතෙව, මෙරමා පහරණ්ම ය; යදූ, යම්කලෙක්හි; අඤ්ඤෙ, සෙස්සෝ; (එඤ්ඣයීයෙති සිට)විලුම්පන්ති,පහරිද්ද; සො විලුම්පතා,ඒ දුබලඅවස්ථාවෙන් සිට අනුන් පැහැර නොගේක්පරිද්දෙන් බොහෝදෙනාට පිඩාකළ දුෂ්ටයා; විලුම්පති, පහරණාලැබේ-යමෙක් ප්‍රබලයෙම්යි බොහෝදෙනාට හිංසාකළානම් ඌ අතින් හිංසාලද බොහෝදෙනා දුබලවගෙන නැවත තමන් ඒඅයෙහිදී ඒ හිංසකයාට ප්‍රතිහිංසා කරන්නාහුයයි සේසි.

239 භාරිනජාතකයයි.

---

334 සඞ්ඛා ජනො හිංසිතො පිඩහලෙන
තසම්ං මනෙ පඞ්ඣයා වෙදයන්ති
පියො නු තෙ ආසි අකණ්හනෙත්තා
කස්මා තුවං රොදසි වාරපාල.

පිඩහලෙන, පිඩහලනම් රජුවිසින්; සඞ්ඛා, සියලු; ජනො, ජනතෙම, හිංසිතො; දඩගැනීම්ආදී නොයෙක් අධර්ම්ම ප්‍රවෘත්තින් පීඩිතය; තස්මිං, ඔහු; මනෙ, මළකල්හි; පඞ්ඣයා, ප්‍රීතින්; වෙදයන්ති, විඳින් හෙවත් ඔහු මළහෙයින් බොහෝදෙන සතුටුවෙති; වාරපාල, වාරරක්ෂාවෙහි ප්‍රයුක්තය; අකණ්හනෙත්තා, නිල් නොවූ ඇස්ඇති හෙවත් පිඟුවූ ඇස්ඇති හේරජ; තෙ,නට;පියොත්ථ, ප්‍රියවූයේ; ආසි, වීද; තුවං, තෝ; කස්මා, කුමක්හෙයින්නම්; රොදසි, හඬසිද.

335 න මෙ පියො ආසි අකණ්හ නෙත්තා
භායාමි.පච්චා ගමනාය තස්ස
ඉතො ගතො හිංසෙය්‍ය මච්චුරාජං
සො හිංසිතො ආතයෙ සුත ඉධාති.

අකණ්හ නෙත්තා, පිඩහලාක්ෂියා; මෙ, මට; පියො, ප්‍රියවූයේ; න ආසි, නොවී; තස්ස, ඔහුගේ; පච්චාගමනාය, ප්‍රත්‍යා ගමනයට; භායාමි, බමි; ඉතො, මෙයින් මිය; ගතො, ගියේ; මච්චුරාජං, මෘත්‍යු

රජයා; හිංසෙය්‍ය, හිංසනායකෙලේවිනම්; සෝ, හේ මාරයා; කිංසි නො, පීඩිනවූයේ; පුන, නැවත; ඉධ, මෙහි; ආනඥ, එවන්නෙහි- ලාකෙරෙහි සෙනහයකින් සඬන්නෙම් නොවේම් මොබදි බොහෝදෙනාට හිංසාකොට පුරුදුවූයේ ඔබදි මෘත්‍යුරාජයාට හිංසාවක් කෙලේ විනම් හේ හිංසාව විදපියා මී විසියදුනමනා එකෙක් නොවේයි කියා මු මිනිස්ලොව ලාපියවයි කියා එවිනම් නැවත දුක්විඳිනා චතුම්හයි එඹත් දුකට හඬම්යි කී.

240 මහාපිඩහලජාතකයයි.

(9) නවවන උපාහනවගීයයි.

00

336 සිගාලෝ මානඤ්ඩෝ පරිවාරෙන අත්‍ථිකෝ,
පාපුනි මහතිං භූමිං රාජාසි සඬ්ඛදූසීනං.

සිගාලෝ, ශෘගාලයා; මානඤ්ඩෝ, (පරිවාරනිසා) මානයෙන් සනඬ්ධවූයේ; පරිවාරෙන, (තවද අධික) පරිවාරයෙන්; අත්‍ථිකෝ, අර්‍ථිවූයේ; මහතිං, මහත්වූ; භූමිං, සම්පත්භූමියකට; පාපුණි, පැමිණියේ; සඬ්ඛදූසීනං, සියලු දළඹැනි සතුන්ට; රාජා ආසි, රජවී.

337 එවමෙවං මනුස්සෙසු යෝ හොති පරිවාරවා,
සෝ හි තත්‍ථ මහා හොති සිගාලෝ විය දූසීනන්ති.

එවමේවං, එපරිද්දෙන්; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; යෝ, යමෙක්; පරිවාරවා, පරිවාර ඇත්තේ; හොති, වේද; සෝහි, ඒ චනාහි; දූසීනං, දූසීන්ට රජවූ; සිගාලෝ විය, ශෘගාලයා පරිද්දෙන්; තත්‍ථ, එහිලා; මහා, මහත්වූයේ; හොති, වන්නේයි- යමෙක් ශෘගාලයාපරිද්දෙන් ලද පරිවාරයක් නිසාඅනාතමඤ්ඤවඅධිකයට පැමිනියේවිනම් හේ විනාශයට පැමිනෙන්නේය යන අභිප්‍රායයි.

241 සඛදූසීජාතකයයි.

338 බාලෝ එතායං සුනඛෝ යෝ චරන්තං න ඛාදති,
බන්ධනාව පමුච්චෙය්‍ය අසිතොව ඝරං වජේ.

බාලෝ, බාලවූ; යෝ සුනඛෝ, යම් බල්ලෙක්; අයං, මේ; චරන්තං, චරපට; වත, එකාන්තයෙන්; න ඛාදති, නොකයිද; බන්ධනා,

බන්ධනයෙන්; පමුඤ්චෙය්‍ය, මිදුනේද; අසිනොව, බඩපුරාකෑයේද, ඝරං, ගෙට; වජේ, යන්නේය- මේ ඥානපොතකයා අසනයෙන් සනසඋපිතවූයේද අවසාමින බන්ධනඇත්තේද නොපලා ගෙටම නැඟි එවසිකියා තුෂ්ටවූ.

339 අසිතමෙම මනස්මිං මෙ අථෝ මෙ හදයෙ කතං,
කාලංව පතිකඞ්ඛාමි යාව සස්සුපතූ ජනොනි.

මේ, මාගේ; මනසම්ං, සිත්හි; මේ; මාවසින්; අසිතං, (තොප ගේ කථාව) තබනලද; අථෝ, නැවත; මෙ, මාගේ; හදයෙ, හෘදයෙහි; කතං, (තොපගේ කථාව) කරනලද; කාලච, නැඟියන්ට සුදුසුකාලයක්; පතිකඞ්ඛාමි, ප්‍රතිකාංක්ෂාකෙරෙමි; යාව, යම්තාක්; ජනොා, ජනතෙමේ; පස්සුපතු, නිද්‍රාපගතවේවා- තොප නියනකථා සිතනබා නැඟියනකලක් සොයන්නෙම් මහජනයා නිදනතුරු හුන්නෙම්සිනී.

242 ෂූනඛජාතකය සි.

---

340 සත්තතන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං,
සො මං රඩහාම්හි අවෙහෙති සරණමෙව හොහි කොසිය.

සත්තතන්තිං, සප්තතන්ත්‍රියක්ඇති; සුමධුරං, විශෙෂයෙන් මධුරවූ; රාමණෙය්‍යං, රමණීයවූ හෙවත් ශබ්දරාගීන් විසින් අභිරමණය කරන්නට සුදුසුවූ වීණාව; අවාචයිං, මූර්ජනානබා ගානාප්‍රකාරය කීම් හෙවත් වීණාශිල්පය ඉගැන්වීමි; සො, හේ මාගේ ශිෂ්‍යයා; මං, මා; රඩහම්හි, රඩහායෙහි; අවෙහෙති, (තමා හා වාදයට) කැඳවයි; කොසිය, කොසිය ගොත්‍රය; මෙ, මට; සරණං, ප්‍රතිසරණ; හොහි, වේවා- මට මෙනැන්හි පිළිසරණවේවා.

341 අහං තං සරණං සම්ම අහමාචරිය පූජකො,
න තං ජඩිස්සති සිස්සො සිස්සමාචරියපෙස්සසිති.

සම්ම, සබඳ; අහං, මම; සරණං, සරණව; තං, තා; (රක්ෂාකෙරෙමි) අහං, මම; ආචරිය, ආචාර්‍යවරුන් කෙරෙහි; පූජකො, පූජ්‍යයෙමි නොහොත්; ආචරියපූජකො, ආචාර්‍යවරුන් විසින් පූජ්‍යයෙමි; එසේහෙයින්, තා දනවන ශක්තිඇතියෙමියි සේසි; සිස්සො, ශිෂ්‍යයා; තං, තා; න ජඩිස්සති, නොපරදවා; ආචරිය, ආචාර්‍යය; සිස්සං, ශිෂ්‍යයා; පෙස්සසි,(තොප)පරදවන්නෙහි- ආචාරීන් විණාඩාද

ඉගැන්වූ තොපගේ ශිෂ්‍යයා පරදවාගත නොහෙයි තොපි ශිෂ්‍යයා පරදවයි ශක්‍රයා ගුත්තිලගාන්ධර්වයාට කී.

243 ගුත්තිලජාතකයයි.

342 යං පස්සති න තං ඉච්ඡති
යඤ්ච න පස්සති තං කිර ඉච්ඡති
මඤ්ඤම් චිරං චරිස්සති
න හි තං ලච්ඡති යං සෝ ඉච්ඡති.

යං, යමක්; පස්සති, දනීද; තං, ඒ; න ඉච්ඡති, නොකැමතිය; යඤ්ච, යම්ක්; නපස්සති, නොදනීද; තං කිර, හේවනාහි; ඉච්ඡති, කැමතිය; චිරං, බොහෝකලක්; චරිස්සති, ඇවිදිනේයයි; මඤ්ඤම්, සිතම් හෙවත් ජලයෙන් විනිර්මුක්තවූ යම් ගඩගාවක් සොයන්නාවූ මේ පරිව්‍රාජකයා බොහෝකලක් ඇවිදිනේයයි සිතම් නොහොත් යම්සේ ජලයෙන් විනිර්මුක්තවූ ගඩගාවක් සොයා ඇවිදිනේද එපරිද්දෙන් රූපාදිධර්මයෙන් විනිර්මුක්ත ආත්මයකු දු අන්වේෂණය කරන්නේ සංසාරයෙහි පරිභ්‍රමණය කරන්නේයයි සිතම්, සෝ, හෙතෙම; යං, යම්ජලරහිත ගඩගාවක් කැමැතිද; තං, හේ; න හි ලච්ඡති, නොමලබන්නේයි.

343 යං ලභති න තේන තුස්සති
යං යං පත්ථේති ලද්ධුං ඛිලේති
ඉච්ඡා හි අනන්තගෝචරා
විනිච්ඡාතං නමෝ කරෝම්සේති.

යං, යම්ක්; ලභති, ලැබේද; තේන, හේලද විසුයෙන්; නතුස්සති, තුෂ්ටනොවේයි; ලද්ධුං, ලබන්නට හෙවත් අලබධවිසුප්‍රතිලාභය ට; පත්ථේති, ප්‍රාර්ථනාකෙරෙයි; යං යං ඛිලේති, යම්ක් යම්ක් ප්‍රාර්ථනා කොට ලදද ඒ ඒ ප්‍රාර්ථිතවිසුදු ලදිමින් කවරනම් ප්‍රයෝජන යෙක්දයි ප්‍රාප්තවිසුවට අවිශුකෙරෙයි එසේමැයි, ඉච්ඡාහි, තෘෂ්ණා නම්; අනන්තගෝචරා, මහත්වූදුනික්‍රාන්තවූ රූපාදීන් ආලම්බනය කොටඇත්තියි; විනිච්ඡාතං, විගතවූ තෘෂ්ණාඇත්තවුන්ට හෙවත් මානීඤ්ඡනයෙන් ඤ්‍යකරනලද තෘෂ්ණාඇති බුඩාදීන්ට; නමෝ, නමස්කාර, කරෝම්සෙ, කරමු.

244 විනිච්ඡාජාතකයයි.

344 කාලෝ ඝසති භූතානි සබ්බාකාරෙන සහත්තනා
යෝ ච කාලඝසෝ භූතෝ ඝහූතපචනිං පචී.

කාලෝ, පුබ්බාහ්න අපරාහ්නාදිකාලය; අත්තනා සහ, තම්බා සම්භ; සබ්බානි, සියලු; භූතානි, සත්ත්වයන්; ඝසති, කන්නේය; යෝ ච, යම්බදුවූ; කාලඝසෝ, කාලය කැවාවූ; භූතෝ, සත්ත්වයෙක් ඇද්ද; නොහොත් "කාලඝසෝ භූතෝ" යි තියා ලද යම් කිණාශ්‍රවයෙක් ඇද්ද; සෝ, ඉහතෙම; භූතපචනිං, තෘෂ්ණාව; පචී, පිසී-මේහිලා කාලය සත්ත්වයාගේ මාංසලූචනය කොට නොකන්නේය ආයුස්සංඛාරාදීන්ගේ විනාශය කොට යොවනය මඩන හෙයින් කාලඝතෙමේ සත්ත්වයන් හක්ෂණය කරන්නේ නම් සුබ්බාහ්නකාලය තෙම පෙරැළි අපරාහ්නයයි කියාද අපරාහ්නය තෙම පෙරැළි රාත්‍රියයි කියාද මේසේ ව්‍යවහාරය ඇතහෙයින් තෙමේ තම්බාකන්නානම්දුවේයි, කිණාශ්‍රවද ආයුෂ්මාගීන්හට එම්බැත්කාලයෙහි ප්‍රතිසන්ධිය කොට සිටි හෙයින් කාලඝසනම්වේයි, එසේකාලඝසනම්වූ මහාකිණාශ්‍රවයා සත්ත්වයන් අපායභූමියෙහි උපදවන්නුයි භූතපචනි නම්වූද තෘෂ්ණාව තම්බාගේ මාගීඥා නමැති චක්ෂුයෙන් දැකියයි ඇති අභිප්‍රායයි.

345 බහූනි නරසීසානි ලොමසානි බ්‍රහානි ච,
ගීවාසු පටිමුක්කානි සොච් දෙවේඝ කණ්ණවානි.

ලොමසානි, රොම ඇති; බ්‍රහානි, මහත්වූ; බහූනි, බොහෝවූ; නර, මනුෂ්‍යයන්ගේ; සීසානි, ශීර්ෂයෝ දක්නාලැබෙත් ඔහුදැ; ගීවාසු, ග්‍රීවයෙහිදැ; පටිමුක්කානි, බහාලනලදහුය හෙවත් කරපිට තබනලදහුය ගත්නාලද්දේ නොවෙති අතින් ගත්නාලද තාල ඵලයා තොපගේ ඉසහා වෙනසක් නැතැයි සේයි; එසේ, මේහිලා; කණ්ණවා, ප්‍රශ්‍රවත්හු; සොච්දෙව, සම්භරකෙනෙකි නොහොත්; කණ්ණවා, කණ්ඨිද්‍රාඇත්තෝ සම්භරකෙනෙකි, සම්භයෙහි බවමුත් ප්‍රශ්‍රවවයයි සේයි.

245 මූලපරියාය ජාතකයයි.

---

346 හන්ත්වා ඡිත්වා වධිත්වා ච දෙති දූනං අසඤ්ඤතෝ,
එදිසං භත්තං භුඤ්ජමානෝ ඝපාපෙන උපලිප්පති.

අසඤ්ඤතෝ, (කායවාරාදීන්) සඤ්ඤතයොවූ පුරුෂයා; හන්ත්වා, ප්‍රහාරයෙන්; ඡිත්වා, පීඩාකොට; වධිත්වා, මරා; දූනං, දූනයා; දෙති, දේද;

එදිසං,එබදුවූ; භන්තා,බත; භුජමානො,අනුභවකරත්නාවූ; සො,ඒ (ශ්‍රමණ); පාපෙන, පාපයෙන්; උපලිපති, යෙදේ- දුශ්ශීලයාගේ ආහාරය අනුභවකරන්නේ තෙමේද දුශ්ශීලනම්වේ.

347 පුත්තදාරම්පි චෙ භන්තා දෙති දූනං අසඤ්ඤතො,
භුජමානොපි සපඤ්ඤෙසු න පාපෙන උපලිපතීති.

අසඤ්ඤතො, දුස්සීලයා; චෙ, ඉදින්; පුත්තදාරම්පි, පුත්‍රදාරයන්ද; භන්තා, මරා; දූනං, උන්ගේ මස්; දෙති, දෙන්නේද; සපඤ්ඤෙසු, අපෙක්ෂා කෙරෙන්නිමෙත්‍රි ගුණාඩ්‍යයෙන් අවිකලවූ ප්‍රාඥයා වනාහි; භුජමානොපි, දුශ්ශීලයා දුන් ධර්ම්ම අනුභවකරන්නේ; පාපෙන, ඒ දෞශ්ශීල්‍යයෙන් යුක්තවූ දුරුකයාගේ පාපයෙන්; න උපලිපති, මිශ්‍රනොවේ.

246 නෙලොවාදජාතකයයි.

---

348 අඩා පාදඤ්ලි සඛෙබ පඤ්ඤය අතිරොචති,
තථා හි ඔඩා භජති උත්තරිං නූන පඤ්ඤති.

පාදඤ්ලි, පාදඤ්ලිනම් රාජකුමාරයෝ; අඩා, එකාන්තයෙන්; සඛෙබ, සියලු අප හැමදෙනා; පඤ්ඤය, ප්‍රඥයෙන්; අතිරොචති, අධිකව බබළයි; තථා හි, එසේමැයි; ඔඩං භජති, තොල්බිඳූ; නූන, එකාන්තයෙන්; උත්තරිං, මත්තෙහි අන්‍යකාරණයෙක්; පඤ්ඤති, බලා.

349 නායං ධම්මං අධම්මිං වා අඤ්ඤතඤ්ං ච බුජ්ඣති,
අඤ්ඤත්‍ර ඔඤ්ඤිබ්භොගා නායං ජානාති කිඤ්චනන්ති.

අයං, මේ පාදඤ්ලිනම් කුමාරයා; ධම්මං, ධර්ම්මයද; අධම්මං වා, අධර්ම්මයද; අත්ථං, අර්ථයද; අනත්ථං ච, අනර්ථයද; න බුජ්ඣති, නොදනී; ඔඤ්ඤිබ්භොගා, තොල්බිඳුමෙන්; අඤ්ඤත්‍ර, පිටත්; කිඤ්චනං, කිසිවක්; අයං, මේ; න ජානාති, නොදනී- මූ දන්නේ ඔඩභජනය මය අනික් කිසිදෙයක් දන්නේ නොවෙයි සේයි.

247 පාදඤ්ලිජාතකයයි.

---

350 සඛෙබහි නිංසුකො දීඝො නිවෙණ විච්ඡිනිවජ්ජථ,
නහි සඛෙඛසු ඨානෙසු සාරථි පරිසුවජ්ජිතො.

සඛෙබහි, නොප හැමදෙනාවිසින්; නිංසුකො, නිංසුකවෘක්ෂය; දීඝො, දක්නාලද; එථ, මෙහිලා; නිච, කුමකටනම්; විච්ඡිනිවජ්ජථ,

ඤංකාකරව්ද? සඛෙඛ්‍ය ඨානෙසු, සිඤ්ඣ ඨානයෙහි; සාරථි. රථං චාඤ්ඤය; නහි පරිප්පවජ්ජි තො, තොප විසින් නොමවිචාරනලදි.

351 එවං සඛෙඛහි කුණෙහි යෙසං ධම්මා අජානිතා,
තෙ වේ ධම්මස්ස කඞ්ඛන්ති නිංසුකස්මිංව භාතරොති.

එවං, එපරිද්දෙන්; සඛෙඛහි, සියලු; කුණෙහි, විදඤ්ඤා ඤුන ඉයන්; යෙසං, යම්කෙනෙකුට; ධම්මා ඇපඤ්ඤායතනාදීසං ඛඤාතවූ ධර්මයෝ; අජානිතා, නොදන්නාලදහුද; තෙ, ඔහු; වෙ, එකාන්තයෙන්; නිංසුකස්මිං, නිංසුකවාක්‍යයෙහි කාංක්‍ෂාඉපදවූ; භාතරොව, සතරබැගත් පරිද්දෙන්; ධම්මස්ස, එනියතලද ධර්මයන් කෙරෙහි; කඞ්ඛන්ති, කාංක්‍ෂාකෙරෙන්.

248 කිංසුකොපම ජාතකයයි.

---

352 එකපුත්තකො භවිස්සසි
භව නො හෙස්සසි ඉස්සරො කුලෙ,
ඔරොහ දුමඝමා සාලක
එහි දුනි ඝරකං වපෙමසෙ.

සාලක, සාලකය; තුවෙ, තෝද; එකපුත්තකො, එකම පුත්‍රයා යෙහි; භවිස්සසි, වී; නො, අපගේ; කුලෙ, කුලයෙහි; ඉස්සරො, ඉස්සරු වූයෙහි; හෙස්සසි, වන්නෙහි; දුමඝමා, ද්‍රැමයෙන්; ඔරොහ, බැස පිය; ඉදුනි, දැන්; එහි, එරේ; ඝරං, ගෙට; වපෙමසෙ, යමු- අපගේ ඉසුරෙහි හිමිවන්නට සිටි එකම එකපුතණුවන්වූව එරෝපුත ගසින් බැස එක්වලා ගෙටයම්හයි වානරයා ගඝහුන්නහු නලවා කෑදුවි.

353 නනු මිං හදයෙනිමකුසෑසි
යව හනසි මං වෙඨයසීයා,
පඤකම්බවණෙ රමාමසෙ
ගච්ඡ තුවං ඝරකං යථා සුඛන්ති.

නනු, නා විචාරමි; මං, මා; හදයෙ, හෘදයෙහියයි හෙවත් තවී සුදුසුයි; අනිමකුසෑසි, සිතයිද; යව, යම්හෙයකින්; මං, මා; වේඨයසීයා, හුණලීයෙන්; හනසි, පහරනෙහිද එසේහෙයින් නාහා කැවිව නොඑවිටි සේයි; පඤකම්බවණෙ, මේසුපැවවූ අඹවනෙහි;

රමාමසෙ, ඇලෙමි; එවං, තෝ; ඝට්ඨසුඛං, කාමනිපරිද්දෙන්; ඝරකං, ගෙද; ගවජ්, නැඟිඅා.

249 ඝාලකජාතකයං.

354 අයං ඉසී උපසමසංයමෙ රතො
සන්තිඣති සිසිරහෙතා අඩිතො,
හඳු අයං පවිසතුමං අගාරඤං
විනෙතු සීතං දරථං ච කෙවලං.

උපසමසංයමෙ, රාගාදිකෙලෙස ව්‍යූපසමය ශීලසංයමය යන මෙ ඝිලා; රතො, ඇලුණාවූ; සිසිරහෙතා, චාතවෘෂ්ටින් සංජාත ශිශිරහ සින්; අඩිතො, පීඩිතවූ; අයං, මේ; ඉසි, තපස්වී; සන්තිඣති, සිටිනේ ය; හඳු, එබැවින්; අයං, මේ තපස්වියා; ඉමං, මේ; අගාරකං, ගෙට; පවිසතු, ප්‍රවිශවේවා; (ඉමං, මේ;) කෙවලං, සියලු; සීතං, සීත ද; දරථං ච, ඵඩාද; විනෙතු, දුරුකෙරේවා.

355 නායං ඉසි උපසමසඤ්ඤමෙ රතො
කපිඅයං දුමවරසාඛගොචරෙ,
සො දුසතො රොසකොචාපි ජම්මා
සචෙ වජෙ ඉමම්පි දූසයෙ ඝරන්ති.

අයං, මේ; උපසමසඤ්ඤමෙ, කෙලෙසව්‍යූපසමය ශීලසංයමය යන මෙහිලා; රතො, ඇලුණාවූ; ඉසි න, සෘෂියෙක් නොවේ; වැළි ඇිමක්දයත? අයං, මේතෙම; දුම්වර, ද්‍රුමවරයන්ගේ; සාඛ, ශාඛා; ගොචරෙ, ගොචරකොටඇති; දුසතො, (ගිය ගිය තැන) කලුඅක රන්නාවූද; රොසකොචාපි, රොෂකරදවූ; ජම්මා. ලාමකදවූ; කපි, වානරයෙනි; සො, හේ; සචෙ, ඉදින්; වජෙ, (ඉම්පණ්ණිංශාලාවට) වන්නේවිනම්; ඉමම්පි ඝරං, මේපන්සල්ගෙයද; දූසයෙ, (මූත්‍රකරීෂ යෙන් හෝ ගිනිලා හෝ) දූෂ්‍යකරන්නේයි.

250 නපිජාතකයං.

(10 දසවන ශෘඟාල වග්ගොයඩි.)

තස්ස උද්දානං.

තස්ස, ඒ වග්ගොයාගේ; උද්දානං, උදාන ගාථාවෙක් වන්නේය.

දළහවගෙහා අපරෝ සත්ථවං කල්‍යාණවගහාසදිසෝ,
රූහකං නතංදළහං යොගහං කසාවදුපාහනං සිගාලෙනෙතෙදස.

දළහවගෙහා, ප්‍රථමවූ දල්හවර්ගීයද; අපරෝ, අනෑවූ; සත්ථව වගෙහා, දෙවැනිවූ සත්ථවර්ගීයද; කල්‍යාණවගෙහා, තුන්වන කල්‍යාණවර්ගීයද; අසදිසෝ, සතරවන අසදෘශවර්ගීයද; රූහකං, පස්වන රූහකවර්ගීයද; නතංදළ්හං, සවන නතංදළ්හවර්ගීයද; යොග්ගං, සත්වන යොගාවචර්ගීයද; කසාවං, අටවන කසාවවර්ගීයද; උපාහනං, නවවන උපාහනවර්ගීයද; සිගාලෙන, සිගාලවර්ගීයහා; එතෙ, මොහූ; දස, වර්ගයෝ දශදෙනෙකි.

ඛුද්දකනිකායෙ ධම්මපදපාළියං.

---

356 සංකප්පරාගවිනෙන චිත්තකනිසිතෙන ච,
නාලං කටකභද්දෙන නුස්සුකාරකතෙන ච.

සංකප්ප,කාමවිතර්කයන්ගෙන්වූ; රාගවිනෙන,රාග නමැති ජලයෙන් දියකළද; චිත්තක, චිත්ත නමැති ශිලාඛණ්ඩයෙහි; නිසිතෙන, රාගනම්වැනි ජලය චක්කොට ගහා මුවහත්තබනලද; නාලංකටකභද්දෙන, නොම්අලඬකාර කරනලද නොමහදුවූ; නව උසුකාරකතෙන, උසුකාරයා විසින් නොමකරනලද.

357 නකණ්ණාසතමුතෙතන නාපි මොරූපසෙවිනා,
තෙනාම්පි භදයෙ විඩ්ඩෝ සඛ්ඛිභපරිදුහිනා.

නකණ්ණාසතමුතෙතන, කණ්ණාතයෙ දක්වා හයානොහරනලද; නපිමොරූපසෙවිනා, මයූරපත්‍රාදීන් නොසදනලද; සඛ්ඛිභපරිදුහිනා, සච්චිභපරිදුහෙ කරන්නාවූ; තෙන, ඒ කෙලෙස නමැති කාණ්ඩියෙන්; භදයෙ, හෘදයප්‍රදෙශයෙහි; විඩ්ඩෝඅම්හි, විදුනාලද්දෙම්වීම්.

358 ආවෙධඤ්ච නා පස්සාමි යතොා රුහිරමස්සවෙ,
යාව අයොනිසොා චිත්තං සයමෙම දුක්ඛමාභතන්ති.

යතොා, යම්හෙයකින්; රුහිරං, රුධිරය; අස්සවෙ, වැහේද: ආවෙධං ච නා පස්සාම්, එසේ විදිතෙනකුදු නොදකිම්; යාව අයොනිසොා චිත්තා, දුඩිකොට නුනුවණින් සිතවඩනාලදද? එසේහෙයින්;

සඤ මේ, සච්චියවූ මාවිසින්; දුක්ඛං, චෙතසිකදුඃඛය; ආහතං, එ ළවනලදී.

251 සංකප්ප ජාතකයයි.

---

359 අජ්ජාපි මෙ තං මඝාසි යං මං තුවං නිලමුසියා,
බාහාය මං ගහෙත්වාන ලසියා අනුතාළසී.

නිලමුසියා, මිටක්පමණ තලහෙතුකොටගෙන; මං බාහාය ග හෙත්වාන, මා අතකරගන්වා; ලසියා, හුණලිගෙන්; තුවං, නෝ; මං, මා; අනුතාළසී, ගැසිද; තං, තාදුන් ඒගෙඩිය; අජ්ජාපි, අදදක්වා; මෙ මඝාසි, මාගේ සිත්නිමැසි- එසේහෙයින් මා සම්පයට එන්නාවූ නා විසින් මරණගෙන ආවයි සිතම්.

360 නනු ජීවිතෙ න රමසි යෙනාපි බ්‍රාහ්මණාගතො,
යං මං බාහං ගහෙත්වාන නික්ඛන්තුං අනුතාළසි.

බ්‍රාහ්මණ, බමුණ; යං මං, යම්බඳුවූ මා; බාහං ගහෙත්වාන, අත කරගන්වා; නික්ඛන්තුං, තුන්විවෙක; අනුතාළසී, ගැස්වීද; යෙන, යම්හෙයකින්; ආගතො අසි, අසිද; එසේහෙයින්; ජීවිතෙ, තාගේ ජීවිතයෙහි; න රමසි නනු, නොඇලෙයි සිතම්.

361 අරියො අනරියං කුබ්බං යො දණ්ඩෙන නිසෙධති,
සාසනාසං න තං වෙරං ඉති නං පණ්ඩිතා විදුන්ති.

අනරියං කුබ්බං, නොකටයුතු කරන්නහු; යො අරියො, යම් ආචාර්‍යකෙනෙක් තෙම; දණ්ඩෙන, දණ්ඩනයෙන්; නිසෙධති, වල කයි යන යමෙක් ඇද්ද; පණ්ඩිතා, නුවණැත්තෝ; තං, ඒවැළැක්ම; සාසනාසං, භික්ෂුවතු පිණිසය; න වෙරං ඉති, වෛරපිණිස නොවෙයි නියා; විදුං, දනිත්- ප්‍රශස්තවූ ආකාරයෙන් යුක්තවූ රජ දරුවෝද ගුරුහුද ප්‍රාණාතිපාතාදි දුශ්ශීලකර්‍මයා කරන සෙවක ශිෂ්‍යාදීන් ප්‍රහාරදී නිග්‍රහකොට ඒ ඒ අසත්ක්‍රියායෙන් වළක්වද්ද ඒ උන්ට වැඩපිණිස වෙයි එසේහෙයින් ප්‍රහාරාදිය ලත් සෙවක ශිෂ්‍යාදීන් වෛරනොකොට යුත්තේයයි යනු අභිප්‍රායයි.

252 නිලමුසිජාතකයයි.

---

362 මමන්නපානං විපුලං උළාරං
උපපජ්ජතිමස්ස මණිස්ස හෙතු,
තන්නෙන නං දස්සං අති යාචකොසි
නාචාපි තෙ අස්සමං ආගමිස්සං.

ඉමිස්ස මණිස්ස හෙතු, මේ මාණික්‍යරතනහෙතුවෙන්; මම,මේ ව; අන්නා, ඔදනාදිකද; පානං, අම්බපානාදිවූ අෂ්ටවිධ පානයද; විපුලං. බොහෝව; උළාරං, ශ්‍රෙෂ්ඨව; උපපජ්ජති, උපදනේය-මේ මැණික ආනුභාවයෙන් පුණිතවූ දිව්‍යාන්නපානාදිඳු විපුලව ලැබෙන්නාහුයයි හේයි; තං, එසේ මහිමඇති මාණික්‍යරතනය; තෙ, තට; න දස්සං, නොදෙමි; අතියාචකොසි, ඉක්මවා යාච්ඤා කෙළෙහි වි; එසේහෙයින්; තෙ, තාගේ; අස්සමං, ආශ්‍රමයටද; නව ආගමිස්සං, නැවත නොඑමි.

363 සුසූ යථා සකඛිරඩොනපාණි
නාසෙසි මං සෙලං යාචමානො,
තන්නෙන නං දස්සං අතියාචකොසි
නවාපි තෙ අස්සමං ආගමිස්සං.

සකඛර, පාෂාණයෙහි; ඩොන, ගහා සෝදනලද; පාණි, හස්ත තලඇති හෙවත් තෙලපාෂාණයෙහි ගහා මුළුහත්තබතලද ඛඩ්ගයෙන් යුකත අත් ඇති; සුසූ යථා,බාලසූරුෂයා මෙන් හෙවත් ශබ්ධවණ්ණිත ඛඩ්ගයක් ගෙන නිසිවක්නොදන්නා බාලයක්හු හය ගැන්වූ පූරුෂයක්හුමෙන්; සෙලං, සෙලාඛ්‍යාතවූ මාණික්‍යය; මං, මා, යාචමානො, යාච්ඤාකරන්නෙහි; නාසෙසි, නාසකෙළෙහි; තෙ, තට; නං, ඒමැණික; නදස්සං, නොදෙමි; අතියාවකොසි, අධිකව යාච්ඤාකෙළෙහි වි,එහෙයින්; තෙ, තාගේ; අස්සමං අපි, ආශ්‍රමයටද; නව ආගමිස්සං, ඉනිනිත් නොඑමි.

364 න තං යාචෙ යස්ස පියං ජිගිංසෙ
දෙස්සො හොති අතියාචනාය,
නාගො මණිං යාචිතො බ්‍රාහ්මණෙන
අදස්සනං යෙව තදජ්ඣගමාති.

යස්ස, යම්පුද්ගලයක්හට; පියං, යම්වස්තුවක් ප්‍රියයි; ජිගිංසෙ, දන්නාලදද; තං, ඒවස්තුව; න යාචෙ,යාච්ඤා නොකරන්නේය (කුමක්හෙයින්දයත්?) අතියාචනාය, ප්‍රමාණ නොදැන අතිරෙක

කොට කළ යාච්ඤාව හෙතුකොටගෙන; දෙස්සෝ හොති, යාචකයා කෙරෙහි වෙශවන්නේය (එසේමැයි); බ්‍රාහ්මණෙන, බම්මණා විසින්; මණිං, මැණික; යාචිතෝ, යාච්ඤා කරනලදැ; නාගෝ, මණිකණ්ඨකනම් නාගරාජයා; අදස්සනං යෙව, නොදැක්වීම; තං, එනැන්පටත්; අජ්ඣගමා, පැමිණියේය- යම්සේ මණිකණ්ඨකනම් නාගරාජයා තපස්වීන්කෙරෙහි ඒසාමහත් ප්‍රේමයක් හැරදැමීනය නොකැමැතිව නොඅවුත් හැරපිදෙ මේනාඥාවඤ්ඤුව යාච්ඤානම් බොහෝ දෙනා අප්‍රියවන්නටහෙතුය යමකු ලවා ප්‍රේමයක්කරවා ගනුම් හයි සිතන්නවුන් විසින් යාච්ඤා නොකටයුත්තේය යනුභාවයි.

253 මණිකණ්ඨ ජාතකයයි.

---

365 හුත්වා තිණපරිඝාසං හුත්වා ආචාමකුණ්ඩකං,
එතං තෙ භොජනං ආසි කස්මා දුනිං න හුජසි.

තිණපරිඝාසං, අශ්ව වෘෂභාදීන් විසින් කා අවශෙෂවූ උච්ඡිෂ්ට වූතණ; හුත්වා, අනුභවකොට; ආචාම, ආචාමනීයවූ ඝනුකැන් දිය හා; කුණ්ඩකං, කුඩු; හුත්වා, අනුභවකොට නොවැඩියෙහි එසේ හෙයින්; තෙ, තට; එතං, මේ; භොජනං, භොජනවූයේ; ආසි, විය; කස්මා, කුමක්හෙයින්; දුනිං, දැන්; (ආචාම දිය) න හුජසි, අනුභව නොකෙරේද?

366 යඤ්ඤ පොසං න ජානන්ති ජාතියා චිනයෙන වා,
බහූ තඤ්ඤ මහාබ්‍රහ්ම අපි ආචාමකුණ්ඩකං.

යඤ්ඤ, යම්තැනෙක්හි; බහූ, බොහෝදෙන; පොසං, පුරුෂයා; ජාතියා, සම්පන්නජාති ඇත්තේයයි ජාතිය කරණකොට ගෙනද; විනයෙන වා, ආචාරවිනයෙන් යුක්තයයි විනයකරණකොට ගෙනද හෙවත් ඖරූපවශයෙන්; නජානන්ති, නොඅඳුනන්නේ; මහා බ්‍රහ්ම, මහබමුණ; මහාබ්‍රහ්මයයි ආදරයෙන් ආමන්ත්‍රණයි; තඤ්ඤ, එතැන්හිලා; ආචාමකුණ්ඩකං අපි, උළුකැන්දිය ද කුඩු ද අනුභවකෙරේ- තමාගේ ඖරූප දන්නවුන් නැතිතෙනදී ලදයමක් ම අනුභවකරන්නේයයි සේසි.

367 තුවං ච ඛො මං ජානාසි යාදිසො යං භයුත්තමො,
ජානඤ්ඤා ජාන මාහම්හ න තෙ හඤ්ඤාමි කුණ්ඩකන්ති.

අයං, මේ; භයුත්තමෝ; අශ්වයන් කෙරෙහි ශ්‍රේෂ්ඨයා, යාදිසෝ, යම්බඳුද එසේවූ; මං, මා; තං ච ඛො, නොවනාහි; ජානාසි,

දත්තෙහි කෙවත් මාගේ උසස්ම අශ්වභාවය වූ පරිද්දෙන් දන්නෙහි; ජානං,දන්නා තා කරා; ජානනෙනා, දන්නාවූ මම; ආගම්ම,අවුදින්; තෙ, තාගේ; කුණ්ඩිකං, කුඩු; න භක්ඛාමි, නොකම්- කුලප්‍රදෙශාදි හෙයින් නොදත්නාතැනදී ලදගම්දෙයක් අනුභවකළත් තොපසේවූ අනුන්ගේ ඖරූපදත්නවුන් කරා පැමිණිකල්හි හොජන අනුභවනොකරමියි ආවාම්කුණ්ඩිකාදිය ප්‍රතික්ෂෙපකෙළේ.

254 කුණ්ඩිකකුවේපි සිනිවජාතකයයි.

---

368 යාව සො මත්තඤ්ඤූසි භොජනස්මිං විහඩ්ඩමො,
තාව අඩ්ඩානමාපාදි මාතරං ච අපොසයි.

යාව,යම්තාක්; සො විහඩ්ඩමො,ආකාශචාරී හෙයින් විහඩ්ඩමනම්වූ ඒගිරව්; භොජනස්මිං,භොජනයෙහි; මත්තං,ප්‍රමාණ; අඤ්ඤූසි, දන්ද; තාව, ඒතාක්කල්; අඩ්ඩානං, දිඝ්ඝකාලයක්; ආපාදි, පැමිණී හෙවත් බොහෝකලක් ආයුවැළැඳිය; මාතරංව, මැණියන්ද; අපොසයි, පොෂණකළ; "මාතරව"යි දෙශනාවිලාශ හෙයින් වදුළුඛව මුත් මැණියන්ද පියාණන්ද දෙදෙනා රක්‍ෂාකළයි වදාළේ.

369 යතො ච ඛො බහුතරං භොජනං අජ්ඣුපාහරි,
තතො තත්‍රෙව සංසීදි අමත්තඤ්ඤූහි සො අහු.

යතො ව ඛො, යම්කලෙක්හි වනාහි; සො, ඒ ගිරේ; බහුතරං අධික කොට; භොජනං, ආහාරය; අජ්ඣුපාහරි, කෑයේවිද; සො, ඒගිරේ; අමත්තඤ්ඤූහි, අමාත්‍රඥ අහු,විද; තතො,එකල්හි; තත්‍රෙව, ඒ සමුද්‍රයෙහිම; සංසීදි, ගැලිණී- ගැලී සමුද්‍රයෙහි මත්සෲයන්ට ඛන්විසයි සේසි.

370 තස්මා මත්තඤ්ඤූනා සාධු භොජනස්මිං අගිබහා,
අමත්තඤ්ඤූ හි සීදන්ති මත්තඤ්ඤූ ච න සීදරෙති.

තස්මා, යම්හෙයකින්; අමත්තඤ්ඤූහි, ආහාරයෙහි අමාත්‍රඥෙෝ; සීදන්ති, සමුද්‍රයෙහි ගැලෙත්ද; මත්තඤ්ඤූ, භොජනයෙහි මාත්‍රඥයෙෝ; න සීදරෙ, නොගැලෙන්නාහුද හෙවත් සමුද්‍රයෙහි ගැලිවිනාශයට නොයෙද්ද; තස්මා, එහෙයින්; භොජනස්මිං, භොජ

ජනයෙහි; මියකඤ්ඤතා, මාතුඝබවද; අගිඛතා, ගිල්ලනොවන-බවද, සාධු; ප්‍රශස්තයි.

255 සූ ක ජා ත ක ය යි.

371 ජරූදපානං ඛණමානා වාණිජා උදකත්ථිකා,
අජ්ඣගංසු අයොලොහං තිපුසීසං ච වාණිජා.

372 රජතං ජාතරූපඤ්ච මුත්තා වෙළුරියා බහූ,
තෙ ච තෙනා අසන්තුට්ඨා භීයෝ භීයෝ අඛාණිංසු.

ජරූදපානං, ඉහලූළිඳක්; ඛණමානා, කණන්නාවූ; උදකත්ථිකා, ජලාර්ථවූ; වාණිජා, වෙළෙඳහු; අයොලොහං, කාළලොහ තාම්‍රලොහයටද; ත්පු, සුදුතුඹයටද; සීසංච, කළුතුඹයටද; රජතං, රිදියටද; ජාතරූපඤ්ච, ස්වර්ණයටද; බහූ, බොහෝවූ; මුත්තා, මුක්තාවලද; වෙළුරියා, වෛදූර්‍යමාණික්‍යයටද; අජ්ඣගංසු, පැමිණියහ; තෙනා, ඒලබ්ධවස්තුවෙන්; අසන්තුට්ඨා, අසන්තුෂ්ටවූ; තෙ ච වාණිජා, ඒව්‍යාපාරයෝ; භීයෝ භීයෝ, වඩවඩාලා; අඛාණිංසු, කැණියහ.

373 තෙ තණ්හාසිවියෝ ඝොරෙ නෙජස්සී නෙජසා හනී,
තස්මා ඛණෙ නාති ඛණෙ අතිඛාතං හි පාපකං,
ඛාතෙනා ච ධනං ලඛං අතිඛාතෙන නාසිතන්ති.

තෙ, ඒ කණන්නාට පටන්ගත් ව්‍යාපාරයන්; තණ්හ, එහිලා; තෙජස්සී, තෙජස්මත්වූ; ඝොරෙ, දරුණුවූ; ආසිවිසෝ, ආශීවිෂයෙක්; නෙජසා, තමාගේ විෂතෙජසින්; හනි, පහළ; තස්මා, එහෙයින්; ඛණෙ, කණන්නේය; නඅතිඛණෙ, අතිරෙකකොට නොකණන්නේය; කුම්ක්හෙයින්ද යත්? අතිඛාතංහි, අතිශයින් ඛාතය වනාහි; පාපකං, ලාමකයි; ඛාතෙන, ප්‍රමාණාතිඛාතය හෙතුකොටගෙන; ධනං, මුක්තාදි වස්තුව; ලඛං, ලබනලද; අතිඛාතෙන, ප්‍රමාණාතික්‍රාන්ත ඛාතය හෙතුකොටගෙන; නාසිතං, ලදවස්තුව ද නසනලදි- ව්‍යාපාරයෝ පැන්පිණිස ළිඳ්බිඳ ඉන් වස්තුප්‍රතිලාභය කොට තවද වස්තුපිණිස භූමිඛාතය කොට නාගරාජයාගේ මස්තකයෙහි පාංශු බහා කොප කරවා විභාග්නින් දග්ධව් ලද

ඉසතුව අනුභව කොට නොගී විනාශයට පැමිණියහ එසේහෙයින් ලදදෙයින් තුෂ්ටනොව අධිකයට ප්‍රාර්ථනාව විනාශකරය යන අර්ථ ප්‍රායයි.

256 ජරූදපානජාතකයයි.

---

374 නායං භරතානං කුසලෝ ලෝලෝ අයං විලීමුඛෝ,
කතං කතං ඛෝ දුඝෙය්‍ය එවං ඔවම්මිදං කුලං.

අයං, මේතෙම; භරතානං, ගෘහස්ථන් සම්බන්ධව; කුසලෝ න, දක්ෂ නොවෙයි; ගෘහකරණයෙහිද ගෘහවිචාරණයෙහිද දක්ෂතොවෙයි සේයි; ලොලෝ, ලුබ්ධප්‍රකෘතිවූ; විලීමුඛෝ, රැලිහුන් මුහුණුඇති; අයං, මේතෙම; කතං කතං ඛෝ, කළකළදෙය වනාහි; දුඝෙය්‍ය, විනාශයට පමුණුවන්නේය, එසේමැයි; ඉදං කුලං, මේ වානරකුල ය; එවං ඔවම්මං, වෙබඳු භාවය ඇත්තේයි.

375 නාසිදං චිත්තවතෝ ලෝමං නාසං අස්සාසිකෝ මිගෝ,
සඤ්ඤං මෙ ජනයන්තේන නායං කිඤ්චි විජානාති.

චිත්තවතෝ, පරිඝාණඥානයෙන් යුක්තවූ ඝමක්ගව; ඉදං ලෝමං, මෙසේවූ රූපසම්පත්තිවූ ලෝමය; න, නැත; ප්‍රඥාවතුන්ගේ ශරීරයෙහි ලෝම සුසැම්මවතොත් මුත් මෙසේ රූපසම්පත්තිවූ නොවෙයි සේයි; අයං, මේතෙම; අස්සාසිකෝ, මෙරමා අස්වාසය; මිගෝ, මෘගයෙක්; න, නොවෙයි කෙවත් අනුත්ව අනුශාසනාකොට අස්වාසත්නට සුදුසු එකෙක්නොවෙයි; අයං, මෙතෙම; කිඤ්චි, කිසිවක්; නවිජානාති, නොදන්නේයයි; මෙ, මට; ජනයන්තේන, ජනයන්නාවූ විසින්; සඤ්ඤං, අනුශාසනා කරනලදී- ඔබ කිසිවක් නොදන්නා බව මට කියන ලදයි සේයි.

376 න මාතරං වා පිතරං වා භාතරං භගිනිං සඛං,
ඣරෙය්‍ය තාදිසෝ පොසෝ සඤ්ඤං දඝරථෙන මෙති.

මාතරංවා, මැණියන්වේවයි; පිතරංවා, පියාණන් වේවයි, භාතරං, මලකුබැයනුවේවයි; භගිනිං, නඟන බුනන වේවයි; සඛං, මිතුයකුවේවයි; තාදිසෝ, එබඳුවූ; පොසෝ, පුරුෂයෙක්; න භරෙය්‍ය, භරණය නොකරන්නේයි; වේ, වව; දඝරථෙන, දඝරථනම්

රජ්ජුවිසින්; සඤ්ං, අනුසාසනා කරනලදී හෙවත් උගන්වනලදී.

257 ආදූසමුඛජාතකයයි.

(ගාමණිවණ්ඩිජාතකයයිද කියත්)

———ඃ()ඃං———

377 යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා,
සබ්බේව දූසා මඤ්ඤා යෙ පාණා පඨවිනිස්සිතා.

චන්දිමසූරියා, චන්ද්‍රසූර්‍යයීදෙදෙන; යාවතා, යම්පමණ ස්ථානයක් හිත්; පරිහරන්ති, මෙරූ පරිහරණය කෙරෙද්ද; හෙවත් පැදකුණු කොටයෙද්ද; යාවතා, යම්පමණවූ; දිසා, සියලු දිගුත්; භන්ති, බබුළුවද්ද; යාවතා, යම්පමණ ස්ථානයක්; විරොචනා, බබළන ස්වභාවයෝද; ඒතාක්තැන්; පඨවිනිස්සිතා, භූමිආශ්‍රිතවූ; යෙ පාණා, යම් ප්‍රාණිකෙනෙක් ඇද්ද; තෙ සබ්බෙ එව, ඔහුගැමදෙනම; මඤ්ඤා, මඤ්ඤාතුරජ්ජුගේ; දූසා, දූසයෝය- යම්තාක්තැන්හි හිරූ සඳු දෙදෙන පවතිද්ද ඒ තාක්තැනා ජනයෝ මඤ්ඤාතුන්ම රජ්ජුරූ වෝ අපගේ ස්වාමියයි ස්වාමිභාව කරණකොට ගෙන වෙසෙන්නුයි උන්ට නොගැනිවූද සත්වයෝ දූසයෝමයයි සේසි.

378 න කහාපණවස්සෙන තිත්තී කාමෙසු විජ්ජති,
අප්පස්සාදූ දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

කහාපණවස්සෙන, කාෂාපණවර්ෂයෙන් හෙවත් දූසහුන සඳයන් පිණිස වමන හකුළුවා දකුණතින් හස්තාසෙළුවනය කළ කල ධාරාපාත වර්ෂයේ වැගිරෙන කාෂාපණයෙන් පොවා; කාමෙසු, වස්තුකාම ක්ලේශකාමයෙහි; තිත්තී, තෘප්තියෙක්; නවිජ්ජති, නැති; එසේ හෙයින් තෘෂ්ණා මෙසේ දුස්පූරයයිකියාද; කාමා, කාමයෝ; අප්පස්සාදූ ඉති, අල්පවූ ආශ්වාද ඇත්තෝයයි කියාද; දුකඛා, කායිකචෛතසික දුඃඛයන්ට හෙතුහෙයින් දුක්ඛයයි කියාද; ඉති, මෙසේ; පණ්ඩිතො; ප්‍රාඥයා; විඤ්ඤාය, දැන-

379 අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛයං රතො හොති සම්මාසම්බුද්ධසාවකොති.

සො, ඒ තත්ත්වඥ පුරුෂයා; දිබ්බෙසු, දිව්‍යවූ; කාමෙසු අපි, කාමයෙහිදු පොවා; රතිං, ඇල්මට; නාධිගච්ඡති, නොපැමිණෙත්

තේය; එසේ මැයි; සම්මාසම්බුඩ, සම්‍යක්සම්බුඩයන්ගේ; සාව කො, ශ්‍රාවකයා; තණ්හක්ඛය, තෘෂ්ණාවගේ ක්ෂයනිරීමේහි නොහොත් නිර්ණයට පැමිණ තෘෂ්ණාව ක්ෂයවනයෙයින් තණ්හක්ඛයයයි නියනාලද නිර්ණයෙහි; රතො, අභිරතවූයේ; හොති, වන්තේය- සර්ඥශාසනයෙහි ශ්‍රද්ධාවෙන් අවගාහණය කළ මිහණ මනුෂ්‍යලොකයෙහි අලාභාදවූ කාමයෙහි අභිරති තබා සවිගී ලොකයෙහි අග්‍රවූ කාමාභාදයෙහි අභිරති හැර නිර්ණයම් අසී කාංක්ෂාකොට මනස්කාරයෙහිම ප්‍රයුක්තවන්තේයයි යනු අභි ප්‍රායයි.

258 මණිකුජ්ජනකයයි.

---

380 නාසිමස්ස විජ්ජාමයමත්ති කිඤි
නා බන්ධවො නො පන තෙ සහායො,
අථ කෙන වණ්ණෙන තිරීටවවේජා
තෙදණ්ඩිකො හුජති අග්ගපිණ්ඩං.

ඉමිස්ස, මේතපස්වියාගේ; විජ්ජාමයං, විද්‍යායෙන් නිර්මාතවූ; කිඤි, කිසිප්‍රයොජනයෙක්; නා අත්ථි, නැත; තෙ, තාගේ; බන්ධවා, නෑයෙකුදු; නා, නොවෙයි; තෙපන, තාගේවිනාහි; සහායොනා, බාල්‍යාවස්ථාවෙහි සිට කෑවිව චැඩී සහඵවෙකුත් නොවෙයි; අථ, එතකුදුවුව; කෙන වණ්ණෙන, කවරහෙම් කාරණයකින්; තිරීටවවේජා, තිරීටවවේජනාම්ලද; තෙදණ්ඩිකො, ත්‍රිදණ්ඩඅැති තැනැත්තේ; අග්ගපිණ්ඩං, අධිකවූරස ඇතිහෙයින් අග්‍රගම්වූ පිඬු පිඬු කොට කනාහෙයින් පිණ්ඩයයි නියනාලද මේ අග්‍රඛත; හුජති, අනුභව කෙරෙයි; එසේවූ නිෂ්ප්‍රයොජනව ඉච්ඡතකුමටකසිදැයි විවාලේ- කෙණ්ඩිකාව තබනුපිණිස තිදණ්ඩක්ගෙන ඇවිදිනාහෙයින් තෙදණ්ඩිකයයි ව්‍යවහාර කෙරෙත්.

381 ආපාසු මෙ ද්‍යූතපරාජිතස්ස
එනස්ස කත්වා විවනස්මිං හොරෙ,
පසාරයී කිවිජගතස්ස පාණිං
ඉතන්නුදතාරිං දුඛසම්පරෙතො.

යුඩි, සමරභූමියෙහි; පරාජිතස්ස, පරදවනලද; කිවිජගතස්ස, දුඃඛයට පැමිණියාවූ; එකස්ස, අචිත්තයවූ; මේ, මට; ආපාසු, ආපදා

යෙහි; කතා, අනුග්‍රහ කොට; ඝොෂෙර, දරුණුවු; විවනස්වීං, ජල දුගීවූ අරණ්‍යයෙහි; පාණීං, විශ්‍රයෙන් ප්‍රතිසංයුක්තයා හස්තතලයා පසාරයි, දික්කෙලේ හෙවත් යුඩයෙහි පරදවනලදුව හයින් වලව වැද පැන්නොලදින් ළිදෙක හි දුක් ගත්නාවූ මට හිණක් බැඳ විශ්‍රකොට අත දික්කෙලේ; තෙන, ඒකාරණයෙන්; දුඛසම්පරේ තො, දුකින්මඩනාලද්දුවූ මම; උදහාරීං, කුපයෙන් ගොඩට නැංගෙමි.

382 එතඤ්ච නිම්මේවන ඉධානුපපත්තා
වෙසායිනෝ විසයා ජීවලොකෙ,
ලාභාරහො තාත නිරීටවවේජා
දෙථඤ්ච භොගං යජනාම යඤ්ඤන්ති.

එතඤ්ච, මේතාපසයාගේ; නිම්මේවන, අනුග්‍රහයෙන් හිණි බැඳ ළිදවඛහා අතදිගොඩටනැඟු කෘත්‍යයෙන්; ඉධ, මෙයට; අනුපපත්තා, (හොමියා) පැමිණි යෙමි; වෙසායිනෝවිසයා, යමයාගේ විශ්‍රයෙන් හෙවත් පරලොව්ත්මිදී; ජීවලොකෙ, මනුෂ්‍ය ලොකයෙහි; (වසම්) තාත, පුත්‍රය; නිරීටවවේජා, නිරීටවත්‍යතාම් තපස්වී; ලාභාරහො, ලාභ යට සුදුසුය; අඤ්ඤ, මෝඝට; භොගං, (අනුභොගය්‍යවූ අර්ථයෙන්) භොගනම්වූ චීවර පිණ්ඩපාත ශයනාසන ගලානප්‍රත්‍යයාදී; දෙථ, දෙව; යජනං ච යඤ්ඤං, නියතලද ප්‍රත්‍යයෙන් අවශෙෂවූ යාගද්‍රව්‍ය යද දෙව; "මේතපස්වීහු මට කළ උපකාර මෙසේ මහත එසේ ඇති චීවරාදිවූ ප්‍රත්‍යයද අවශෙෂ දන්දදෙව" යි නියොග කොලෝ.

259 නිරීටවවිජ්ජානකයයි.

---

383 යඤ්ඤා දූරමායන්ති අම්තතම්පි යාචිතුං,
තස්සූදරස්සහං දූතො මා මෙ කුපඤ්චි රථෙසභ.

අවිතතම්පි, සතුරාද; යාචිතුං, යාච්ඤාකරන්නව; යඤ්ඤා, සම්ක්ෂ පිණිස; දූරං, (මේ සත්වයෝ නාඝණාවසඟවා) දුරස්ථානය වද හෙවත් කුසිපොෂ්‍යය පිණිස සතුරෙකුදු ධනවත්වීනම් උගෙන් හිසිවක් ඉල්වාගනුම්හයි ලොභවසඟව අතිදුර දෙශයට පොවා; ආ ඝන්ති, යෙත්ද; තස්සූදරස්ස, එසේවූ උදරයාගේ; අහං, මම; දූතො, දුතයෙමි; රථෙසභ, රාජොත්තමය; මෙ, මට; මාකුපඤ්චි, නොතිප.

384 යස්ස දිවා ච රත්තෝ ච වයමාගච්ඡන්ති මානවා,
තස්සූදරස්සාහං දූතෝ මා මෙ කුප්ඣි රථෙසභ.

යස්ස, යම් උදරයක්ගේ; වයං, වයගබවට; මානවා, සත්ව යෝ; දිවා ච, දවහල්ද; රත්තෝ ච, රාත්‍රියෙහිද; ආගච්ඡන්ති, පැමිණෙත්ද; තස්ස උදරස්ස, ඒ උදරයාගේ; අහං, මම; දූතෝ, දූත යෙමි; රථෙසභ, රජ්ජුතුමි; මෙ, මට; මා කුප්ඣි, නොකිප.

385 දදුමි තෙ බ්‍රාහ්මණ රොහිණීනං ගවං සහස්සං සහ පුඨ්ඨවෙනා
දූතෝ හි දූතස්ස කථං න දජ්ජා මයම්පි තස්සෙව භවාම දූතාති.

බ්‍රාහ්මණ, බමුණ; පුංගවෙන සහ, වෘෂභරාජයක්හු හා සමඟ; රොහිණීනං, රෝහිවු; ගවං, ගෙරි; සහස්සං, සහස්‍රයක්; තෙ, තට; දදුමි, දෙමි; (එසේමැයි): දූතෝ හි, දූතයෙක් වනාහි; දූතස්ස, දූත යෙක්හට; කථං, කුමටනම්; න දජ්ජා, නොදේද; මයම්පි, මමද අවශෙෂවූ ජනයෝද; තස්සෙව, ඒතානියනලද උදරයාටමැ; දූතා, දූතවුවමු; භවාම, වම්හ— "මයම්පි" නිතැන අපිශබ්ද අනුකත සමුච්චයාර්ථමය, එසේහෙයින් "මමද ජනයෝද" සි යන අර්ථයි.

260 දූතජාතකය යි.

පළමුවන සඞ්ඝභෙදවග්ගයයි.

---

386 යථා කෙසා ච මස්සූ ච ජීනානං ජීනානං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

යථා, යම්සේ; කෙසා, කෙශයෝද; මස්සූ ච, ශ්මශ්‍රුද; ජීනානං ජීනානං, කැපූ කැපූසේ; විරූහති, (නැවත) හටගනීද; එවං, එපරිද්දෙන්; තෙ, තාගේ; නාසා, නාසිකාතොමෝ; රූහතු, (නැවත) හටගනීවා; යාචිතො, (අප විසින්) ඉල්වන ලද්දෙහි; පදුමං, පියුම්ක්; දෙහි, දේ.

387 යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

යථා, යම්සේ; සාරදිකං, සරත්කලැගෙනැතුබු; බීජං, (සරු) බීජුවව; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; වුත්තං, වපුරනලද්දේ; විරූහති, හට

සථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා මහාමිගනති.

ලුද්දක, වැද්ද; මුත්තං, (පාසයෙන්) මුක්තවූ; මහාමිග., මහා මෘගයා; දිස්වා, දැක; අජ්ජ, අද; සථා,සම්යේ; අහං, මම; නන්දාමි, සතුටුවීමිද; එවං, එපරිද්දෙන්; සහ සබ්බෙහි ඤාතිහි, සියලු නැයන් හා සමඟ; නන්දස්සු, (බොහෝකලක්) සතුටුව—මම සම්යේ පාසයෙන් මුක්තයමිණන් දැක සතුටුවීමිද පෙපිදු එපරිද්දෙන් බොහෝ නැයන් හා සමඟ සතුටුවවයි කියා ආශීර්වාද කළා.

759. සුවණ්ණමිගජාතකයයි.

---

759 වාති ගන්ධො තිමිරානං කුසමුදෙව ඔසවා
දූරෙ ඉතො හි‡සුසොණ්ඩි තම්බ කාමා තුදන්ති මං.

තම්බ, තාම්බ්‍ර තම් රජ; තිමිරානං, නිවුලකුසුමයන්ගේ හෙවත් මිදෙල්ලමලෑ; ගන්ධො, සෞරභ, වාති, පවත්නේය; කුසමුදෙ, ව, ක්ෂුද්‍රසාගරයද; ඔසවා, ඔසවත; ඉතො හි, මෙයින් විනාහි; සුසොණ්ඩි, සුසොණ්ඩි තම් බිසෝ; දූරෙ, දූරදෙශයෙහි හියා එසේ හෙයින්; කාමා, කාමයෝ නොහොත්, තම්බකාමා, තාම්බ්‍රයා විසින් අභිලෂිත කාමයෝ; මං, මා; තුදන්ති, විදිති—"තම්බකාමා"යි එක් කොට ගතිති, තම්බ යයි කියා ආමන්ත්‍රණවශයෙන් ගෙන "කාමා තුදන්ති" කියා හෝ අර්ථ ගනිත් සුපණ්ණභවනයෙහි ගරුඩරාජයා වසඤ්ඤාශ්‍රොධ විෂ්ණය සිසාරා යිවි මිදෙල් ගෙන "තිමිරානං ගන්ධො වායති"යි කීහ. එම කෘෂ්ණශ්‍රොධයට සමීපව ගෙන "කුසමුදෙ ව ඔසවා"යි කිහ.

760 කථං සම්බුද්ධමනසි කථං අද්දසකි සෙරුමා ?
කථං තස්සා ච තුයහං ච අස්සු සඞ්ගම සමාගමෙ.

---

‡ සුසඟාඛාණ්ඩි—මරණ.
? අද්දස—මරණ.

සමුද්දං, සාගරය; කථං, කෙසේනම්; අහරි, එතරම්ද; සෙරුමිං සෙරුම් නම් ළිපය; කථං අදූසකි, කෙසේනම් දිරිද; සඤ්ඤ, සඤ්ඤය තස්සා ච, ඇගේද; තුයඤ්ඤං ච, තාගේද; සම්මාගමෝ, සම්මාගමය; කථං අහු, කෙසේනම් වීද.

761 හරාසාවජා පයාතානං වාණිජානං ධනෙසිනං
මකරෙහබ්භිදූ නාවා එලකෙනහමපලවිං.

හරාසාවජා, හරාසාවජා නම් පටුන් ගමින්; පයාතානං, යන්නාවූ; ධනෙසිනං, ධනසොයන්නාවූ; වාණිජානං, වණික් ජනයන්ගේ; නාවා, නෞකාතොමෝ; මකරෙහි, මෝරුන් විසින්; අබ්භිදූ, පලනලද; අහං, මම; එලකෙන, පුවරු කඩෙකින්; අපලවිං, එතරව ගෙන සියෙමි.

762 සාමං සමණාහන මුදූනා නිවවං වඤ්ඤනගඤ්ඤිනී
අඩෙඤ්ඤන උඩරී හදදා මාතා පුත්තංව ඔරසං,

නිවවං, නිත්‍යයෙන්; වඤ්ඤනගඤ්ඤිනී, වඤ්ඤනගන්ධම වන; සා භද්‍රා, ඒ භද්‍රා තොමෝ, සමණාහන, සලඤ්ඤණවූ; මුදූනා, මෘදු වචනයෙන් අස්විසා; මං, මා; ඔරසං, උරෙහි ජාත; පුත්තං, පුත්‍රයෙකු; මාතා ඉව්, මව්සාමෙන්; අඩෙඤ්ඤන, ඇඟයෙන් හෙවත් බාහු සුග්මයෙන්; උඩරී, හොඬනැඟී.

763 සාමං අත්තනන පාත්තෙන වත්ථෙන සයනෙන ච
අත්තනාපි ච මඤ්ඤති එවං සබ්බ විජානති.

සබ්බ, සාමුය; සා මඤ්ඤති, මෙවිත්‍රලොවනා තොමෝ; මං, මා; අත්තෙන, අන්නයෙන්ද; පාත්තෙන, පානයෙන්ද; වත්ථෙන, වස්ත්‍රයෙන්ද; සයනෙන ච, ශයනයෙන්ද සන්තප්පණය කළා; අත්තනාපිච, හුදෙක් ආහාරාදීන් මතු නොවෙයි නොමෝ මා අභිරමණය කරන්නී ප්‍රණවූවසි; එවං, මෙපරිද්දෙන්; විජානති, දනු.

860 සුසොණ්ඩි ජාතකඤ්ච.

පළමුවන මණිකුණ්ඩලවගයි.

—(0)—

764 වණ්ණාරොහෙන ජාතියා බලනික්කමණෙන ච
සුබාහු න මයා සෙය්‍යෝ සුදත්ථ ඉති භාසති.

වණ්ණ, වණ්ණයෙන්ද; ආරොහෙන, ආරොහයෙන්ද; ජාතියා, උත්තම ජාතියෙන්ද; බල, කායබලයෙන්ද; නික්කමණෙන ච, සෞශීල්‍යයෙන් නිෂ්ක්‍රාන්තවූ වීර්‍යයෙන්ද යන මේ කාරණයෙන්; සුබාහු; මේ සුබාහු නම් ව්‍යාඝ්‍රු; මයා, මා හා; න සෙය්‍යෝ, නොම උතුම් නොම සදෘශය; සුදත්ථ, ශොභනවූ දංෂ්ට්‍රා ඇත්තාව; ඉති භාසති, තෝ මෙසේ කිල හේ සැබෑදැයි විවාළේ.

765 වණ්ණාරොහෙන ජාතියා බලනික්කමණෙන ච
සුදත්ථෝ න මයා සෙය්‍යෝ සුබාහු ඉති භාසති.

වණ්ණ, වණ්ණයෙන්ද, ආරොහෙන, ආරොහයෙන්ද; ජාතියා, උත්තම ජාතියෙන්ද; බල, කායබලයෙන්ද; නික්කමණෙන ච, සෞශීල්‍යයෙන් නිෂ්ක්‍රාන්තවූ වීර්‍යයෙන්ද යන මේ කාරණයෙන් සුදත්ථෝ, මේ සුදත්ථ නම් මෘගරාජයා; මයා, මා හා; න සෙය්‍යෝ, නොම උතුම් නොම සදෘශය; සුබාහු, ශොභනවූ බාහු ඇත්තව; ඉති භාසති, තෝ මෙසේ කිල හේ සැබෑදැයි විවාළේ.

767 එවමෙවං විහඤ්ඤතං සුබාහු සම්ම දුබ්භසි
න දුනාහං තයා සද්ධිං සංවාසමභිරොචයෙ.

සුබාහු, ශොභනවූ බාහු ඇති තැනැත්තව; සම්ම, යහලුව; එවමෙවං, මෙසේම; විහඤ්ඤතං, වසන්නාවූ හෙවත් නොප හා සමඟ වසන්නාවූ; මං, මා; දුබ්භසි, ශෘගාලයාගේ බසගෙන විනාශය කරන්නා කැමැත්තෙහි; දුනි, දැන්; අහං, මම; තයා සද්ධිං, නා හා සමඟ; වාසං, එක්ව විසීමක්; න අභිරොචයෙ, නොකැමැත්තෙමි.

768 යෝ පරෙසං වචනානි සද්දහෙථ යථා තථං
ඛිප්පං භිජ්ජථ මිත්තෙහි වෙරඤ්ච පසවෙ බහුං.

යෝ, මෙක්; පරෙසං, මෙරමාගේ; වචනානි, මිථ්‍යාවචනයන්, යථාතථං, අවිපරීතකොට හෙවත් මුන් කීයේ මෙයයි; සද්දහෙථ; අදහාගනීද එසේවූයේ; මිත්තෙසම්, මිත්‍රයාකෙරෙහි; ඛිප්පං; සීඝ්‍රවම; භිජ්ජථ, බිඳෙන්නේයි; බහුං, බොහෝවූ; වෙරඤ්ච; වෛරයද; පසවෙ, ප්‍රසවකරන්නේයි—බොහෝ කොට තමා සිත්හි වෛර කරන්නේය සි සේයි.

769 න සො මිත්තො යො සද අපමත්තො
හෙද සඞ්කී රන්ධමෙවානුපස්සති
සහම්ං ච සෙති උරසීව පුත්තො
සවෙ මිත්තො යො අහෙජ්ජො පරෙහිනි.

හෙද, සඞ්කි, අද බිඳෙයි සෙට බිඳෙයි කියා මෙසේ මිත්‍රයාගේ හෙදයම ආශඞ්කා කෙරේද; රන්ධමෙවානුපස්සී, රන්ධ්‍රයම සොයන සුලුද හෙවත් වරදක්ම දැකපියනු කැමැතිද; යසම්සඳ, යම් තෙනෙක්හි වනාහි; උරසීව පුත්තො, උරෙහි ජාතපුත්‍රයෙකුමෙන්; සද, අපමත්තො, හැම වේලෙහිම අප්‍රමත්තව මිත්‍රයාට විශ්වාසය නොදැන; සො, හේ; මිත්තො, මිත්‍ර නම් වෙයි; පරෙහි, මෙරමා විසින්; අහෙජ්ජො, අහෙද්‍යවූ; යො, යමෙක්; සෙති, පවතීද; සො, හෙතෙම; වෙ, එකාන්තයෙන්; මිත්තො, මිත්‍රයි.

361 වණ්ණාරොහ ජාතකයයි.

---

770 සීලං සෙය්‍යො සුතං සෙය්‍යො ඉති මෙ සංසයො අහු
සීලමෙව සුතා සෙය්‍යා ඉති මෙ නත්ථි සංසයො,

සීලං, ශීලය; සෙය්‍යො, උතුම්; සුතං, ශ්‍රැතයද; සෙය්‍යා, උතුමැයි; හෙවත් මෙදෙක සංසයයි; ඉති, මෙසේ කිමෙහි; මෙ, මට; සංසයො; සංශය; අහු, විය; සුතා, ශ්‍රැතයට වඩා; සීලමෙව, ශීලයම; සෙය්‍යා, උතුම; ශ්‍රෙෂ්ඨයයි මෙසේ කිමෙහි; මෙ, මට; සංසයො, සංශය; න අත්ථි, නැති.

771 මොඝා ජාති ච වණ්ණො ච සීලමෙව කිරුත්තමං
සීලෙන අනුපෙතස්ස සුතෙනකිඤ්චා න විජ්ජති.

ජාති ව, (ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදිවූ) ජාතියද; වණ්ණො ච, (ම්නාවූ) රූප වර්ණයද; මොඝා, ව්‍යර්ථය; සීලමෙව, ශීලයම; උත්තමං කිර, (ජාත්‍යාදී සියල්ලට වඩා) අත්‍යුත්තමය, එසේමැයි; සීලෙන, ශීලයෙන්; අනුපෙතස්ස, උපෙත නොවන්නා හට. හෙවත් සිල් නොරකින්නාහට; සුතෙන, ශ්‍රැතයෙන්; අත්ථො, ප්‍රයොජනයෙක් න විජ්ජති, නැති.

772 ඛත්තියා ච අඛත්තියා වෙස්සා චාඛත්තියානිස්සිතා
සෙ පරිවජ්ජුභො ලොකෙ උපපජ්ජන්ති දුග්ගතිං.

අධම්මඤ්ඤා, දශවිධ අකුශල සඞ්ඛ්‍යාත අධර්ම්මයෙහි පිහිටියාවූ; ඛත්තියෝ ච, ක්ෂත්‍රියයාද; අධම්මනිස්සිතෝ, අධර්ම්මනිශ්‍රිතවූ; එක් වන් අකුශල මාර්ගයෙහි ප්‍රයුක්තවූ; වෙස්සෝ වා, ව්‍යාපාරයාද යන; තෙ, දෙපක්ෂයෙහි ඇත්තෝ; උභෝ ලොකෙ පරිච්චජ්ජ, සවර්ගී මනුෂ්‍ය දෙලොව හැර; දුග්ගතිං, අපායෙහි; උපපජ්ජන්ති, උපදිත්.

773 ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාලපුක්කුසා
ඉධ ධම්මං චරිත්වාන භවන්ති තිදිවෙ සමා.

ඛත්තියා, ක්ෂත්‍රියයෝය; බ්‍රාහ්මණා, බ්‍රාහ්මණයෝය; වෙස්සා, වෛශ්‍යයෝය; සුද්දා, ක්ෂුද්‍රයෝය; චණ්ඩාල, චණ්ඩාලයෝය; පුක්කුසා, බඹුරෝය යන මොහු; ඉධ, මේ මනුෂ්‍ය ලොකයෙහි, ධම්මං චරිත්වාන, දශකුශල ධර්ම්මයෙහි හැසිර; තිදිවෙ, සවර්ගයෙහි; සමා භවන්ති, සම වෙත්.

774 න වෙදා සම්පරායාය න ජාති නොපි බන්ධවා
සඤ්ඤව සීලං සංසුද්ධං සම්පරාය සුඛාය ච.

වෙදා, (තෙල) වෙදදීහුද; සම්පරායාය න, පරලෝ පිණිස නොවන්නාහ; න ජාති, උත්තම ජාතියද පරලෝ පිණිස නොවන්නේය; නාපි බන්ධවා, බන්ධුජනයෝද පරලෝ පිණිස නොවන්නාහ වැළි පරලොව කුමකින් සැදේදයත්; සංසුද්ධා, සංසුද්ධවූ; සඤ්ඤා සීලං, සවකීය ශීලය; සම්පරාය සුඛාය ච, පරලොව සුව පිණිසද මෙලොව සුව පිණිසද වන්නේයි- "ච" ශබ්දය සමුච්චයෙහි වැටෙයි. එසේ හෙයින් පරලොවද මෙලොවද යන අර්ථයි.

361 සීලවීමංස ජාතකයයි.

---

775 හිරිනත්තරත්තං විජිගුච්ඡමානං
තව්හමසම් ඉති භාසමානං
සෙය්‍යානි කම්මානි අනාදියානං
නෙස්සා මමන්ති ඉති නං විජඤ්ඤා.

හිරිනත්තරත්තං, ලජ්ජා තමා කෙරෙන් දුරුකරන්නාවූ; විජිගුච්ඡමානං, මිත්‍රභාවයෙන් පිළිකුල් කරන්නාවූ; තව, තාගේ; අහං, මම; අසම්, මිත්‍රවීම්; ඉති, මෙසේ; භාසමානං, වචනමාත්‍රයකින් කියන්නාවූ; සෙය්‍යානි කම්මානි, උත්තමකර්ම්මයන්; අනාදි

ඝන්නං, දෙම් සි කෙරෙම් සි හෝ නොකරන්නාවූ මෙබඳු පුද්ගල යා; මං, මාගේ; එසෝ, මෙතෙම්; න ඉති, මිත්‍රයෙක් නොවෙයි කියා; ඉති, මෙසේ; නං, ඒ පුද්ගලයා; විජඤ්ඤා, දන්නේසි--"භවා හමසම්මං" කිතෙන අනුස්සාරය ඡන්දස් පිණිසය "අසම්" යනු ක්‍රියාවයි.

776 යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ
අකතේ‍රඤ්ඤං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

මෙහි අටි 583 වෙනි අඞ්කය ධරන ගාථායෙන් බලා දතයුතුයි.

777 න සෝ මිත්තෙනා යෝ සදා අපපමත්තෙනා
හෙදා සඞ්කී රක්ඛමෙවානු පස්සති
යස්මිඤ්ච සෙති උරසිව පුත්තෙනා
සවෙ මිත්තෙනා සෝ අහෙඨෙජෝ පරෙකි.

හෙදා සඞ්කී, හෙදයෙහි ආසඞ්කා කරන්නාවූ; රක්ඛමෙවානු පස්සී, වරදම බලන සුලුවූ; යෝ, යමෙක්; සදා, හැම වෙලෙහිම; අපපමත්තෙනා, ප්‍රමත්තනුවූයේද මිත්‍රයාට විශ්වාසය නොදේද; සෝ, හේ; න මිත්තෙනා, මිත්‍ර නොවේ; පරෙහි, මෙර මංවිසින්; අහෙඨෙජෝ, අහෙඨවූ; යෝ, යමෙක්; යස්මිං ච, යමක්හු කෙරෙහි වනාහි; උරසි ව පුත්තෙනා, උරෙහි ජාත පුත්‍රයෙකු මෙන්; සෙති, පවතීද; සෝ, හෙතෙම; වෙ, එකාන්තයෙන්; මිත්තෙනා, මිත්‍රයි.

778 පාමුජ්ජකරණං ඨානං පසංසාවහණං සුඛං
ඵලානිසංසෝ භාවෙති වහන්තෙනා පොරිසං ධුරං.

පොරිසං, දැන ශීල භාවනා මෛත්‍රී සඞ්ඛ්‍යාත පුරුෂ ප්‍රතිබඳවූ; ධුරං, ධුරය; වහන්තෙනා, උසුලන්නාවූ; ඵල, ඵලයද; ආනිසංසෝ, ආනිසංශයද යන මේ දෙක; ඒදිනා කැමති කුලපුත්‍රයා; පාමුජ්ජ කරණං, ප්‍රමෝද්‍ය කරණයට, ඨානං, සථානවූ; නොහොත් කාරණ වූ; පසංසාවහණං, ප්‍රසංශා ඵලවන්නාවූ සුඛං, සුඛය; භාවෙති, වඩන්නේ සි— ප්‍රමෝද්‍යකරණසථාන නම් දැනය, ශීලය, ප්‍රාඥයන් හා සමඟ මිත්‍ර භාවය, යන මේසි එතකුදු වුවත් මෙතැන්හි සුජනයන් හා කළ මිත්‍රත්වය පිණිස කීහ. කල්‍යාණ මිත්‍රයන් හා සමඟ කළ මිත්‍ර භාවය ප්‍රමෝද්‍යකරණ හෙයින් ඒ ඵලලෞකික කායික චෛතසිකසුඛයට හෙතු හෙයින්ද සුඛයයි යන මිත්‍රවාසය ගත්හ, එසේ හෙයින් මිත්‍රභාවය සුව වඩන්නේයි.

779 පවිවෙකරසං පිබිත්වා රසං උපසමස්ස ච
නිද්දරෝ හොති නිප්පාපෝ ධම්මපීති රසං පිබං.

ධම්මපීති, ධර්‍මප්‍රීති; රසං, රසය; පිබං, බොන්නේය; පවිවෙක රසං, කායවිවේක චිත්තවිවේක ඇති මොවුන්ගේ රසයද; උප සමස්ස ච රසං, කෙලෙශව්‍යුපශමයෙන් ලද සෞමනස්‍ය සංඛ්‍යාත රස යද; පිත්වා, පී; සෝ, හෙතෙම්; නිද්දරෝ හොති, කෙලෙසදරථයක් නැති හෙයින් විගතවූ පිඩා ඇති වන්නේය; නිප්පාපෝ, කෙලෙ සන්ගේ නැවීමෙන් නිෂ්පාපද වන්නේයි.

362 කිරි ජාතකයයි.

"කොඤ්චසද්දමනි පඵෙජාතෙ" යන මේ ධඵෙජාපනකයෙහි ප්‍රශ්නය මහ උමංඟයෙහි විස්තාරවශයෙන් ආයි.

---

779 මුතෙනාමහි සම්ම සුමුඛ පූරෙන අකඛපරාජිතෝ
*සාවෙහි අම්බපක්කානි විරියෙන භක්ඛයාමසෙ.

සම්ම සුමුඛ, යහළු සුමුඛය; මුතෙනාමහි, මිදුනෙමි වීමි, පූතෙ, දූනයෙහි; අකඛපරාජිතෝ, අඤ්ඤයෙන් පරදවනලදී; අම්බපක්කානි, ආම්‍රඵලයන්; සාවෙහි, මට හෙළ; විරියං, (තාගේ) වීර්‍යය, භක්ඛ යාමසෙ, අනුභව කරමු—තාගේ වීර්‍යයෙන් උපන් අඹ අනුභව කරමහයි සේයි.

780 අලිකං වත මං සම්ම අභූතෙන පසංසසි
සෝ නෙ සුතෝ වා දිට්ඨෝ වා සුමුඛෝ නාම මක්කටෝ.

සම්ම, යහළුව; මං, මා; අභූතෙන, අවිද්‍යමාන ගුණයෙන්; පසං සසි, ප්‍රසංශා කෙරෙහි; අලිකං වත, ඒ ප්‍රසංශාකිරීම එකාන්තයෙන් බොරුය; කුමක් හෙයින්දයත්;මක්කටෝ, වානරයා; සුමුඛෝ නාම, ශෝභනවූ මුහුණු ඇත්තේමයයි, තෙ, තා විසින්; සෝ, සවර තැනෙක; සුතෝ වා, අසනලද විරිද; දිට්ඨෝ වා, දක්නාලද විරිද.

781 අජ්ජාපිමෙතං මනසි යං තවං මං අභිගුණ්හිසි
ඛඤ්ඤදාපණං පවෙසිත්වා මතෙනා ජාතං හනාසි මං.

---

* හාරෙසි—මරම්ම.

අභිගුණ්හිත්ථ, සජ්ඣයන් හෙළුවන තැනැත්හව; ඉහනා, මත්වූ; ත්වං, හෝ; ඡාහං, ක්ෂුධාදුඃඛයෙන් පීඩිහවූ, මං, මා; ධඤ්ඤූපණං, ධාන්‍යාපණයට; පවෙසිත්ථා, ප්‍රවිශවකොට; යං, යම්හෙයකින්; මං, මා; හනසි, වෙත්‍රලතාවෙන් දෙතුන් පහර ගැසිද; තං, ඒ; අජ්ජාපි, දැන් දක්වා; මෙ, මාගේ, මනසි, සිත්හිමැසි.

782 නාහං සරං දුක්ඛමෙසෙය්‍යං අපිරජ්ජමපි කාරයෙ
නෙව තං යාචිතො දජ්ජං තථාහි භයතජ්ජිතො.

තං දුක්ඛමසෙය්‍යං, ඒධාන්‍යාපණයෙහි දුඃඛශෙය්‍යාවන්; සරං, සමරණයකරන්නාවූ; අහං, මම; අපි රජ්ජමපි, ඉදින් රාජ්‍යයද; කාරයෙ, කරවන්නෙහි විහම්. හෙවත් මේ බාරාණසිරාජ්‍යය ගෙන මාලවා රාජ්‍යය කරවයි නම්; යාචිතො, තාවිසින් යාචඤ්ඤාකරන ලද්දෙම්; තං, තට; නෙවදජ්ජං, එසඳ ආමඵලයක් නොමදෙම්-සුඛයයි තානානිගුණයෙන් සතුන්කරන්නාතබා මාලවාරාජ්‍යය කරවයි නමුත් තා කළ දරුණුකම් සඳහන් කරන්නෙම් අඹපක් නොදෙම්; තථාහි, එසේමැසි; එසේමදැනිවන්නට කාරණාඇතිව; භයතජ්ජිතෝ, තා කෙරෙහි භයින් තැතිගනිම්—දැනිකොට තොප බාම් එතෙකින් නොකළවයි සේසි.

783 යඤ්ච ජඤ්ඤා කුලෙ ජාතං ගබ්භෙ තිත්තං අමච්ඡරිං
තෙන සඛිඤ්ච මිත්තඤ්ච ධීරා සඞ්කාතුමරහති.

කුලෙ ජාතං, පූජ්‍යකුලයෙහි ජාතවූ; ගබ්භෙ, සුභොජන රසයෙන් මාතෘ කුක්ෂි සඞ්ඛ්‍යාත ගර්භයෙහි දෙ නොහොත් අලංකෘත ශයන ගර්භයෙහි; තිත්තං, නාපත්වූ; අමච්ඡරිං, අප්‍රාප්තවූ භොගාශාවෙන් කෘපණභූවූ; යං, යම්කිහු වනාහි; ජඤ්ඤා, ජන්‍යවූ පරිද්දෙන් ඇත්තේවිද; ඤාත, එබඳු මොහු හා සමග; සඛිඤ්ච, සඛිභාවයද; මිත්තඤ්ච, මිත්‍රභාවයද; ධීරෝ, ධීරයා තමා; සඞ්කාතුං, මිත්‍රසන්ධානය කරන්නට; අරහති, සුදුසුසි.

863 අභිගුණ්හිත්ථ ජාතකයයි.

---

784 මධුවණ්ණං මධුරසං මධුගන්ධං විසං අහු
ගුම්බියො සාසමෙසානො අරඤ්ඤෙ ඔදහි විසං.

මධුවණ්ණං, මී වැනි පෑ ඇති; මධුරසං, මීයට බඳු රස ඇති; මධුගන්ධං, මීයේ ගඳවැනි ගඳඇති; විසං, විෂයෙක්; අහු, වීය; ගුම්බි

යෝ,ගුම්බියනම් යක්ෂයා;ඝාසං,තමාටආහාරයක්;එසනෝ,එෂණය කරන්නේ; අරඤ්ඤේ, අරණ්‍යයෙහි; විසං, විෂය; ඔදහි, පිහිටවී.

786 මධූනි මඤ්ඤමානා යෙ නෙ නං විසමඛාදිසුං
තෙසං තං ඝාටුඝං ආසි මරණං තෙනුපාගමුං.

මධූනි, මධුයයි, මඤ්ඤමානා, සිතන්නාවූ; යෙ, යමෙක් ඇද්ද; තෙ, ඔහු; තං විසං, ඒ විෂය; අඛාදිසුං, කෑවුද; තෙසං, ඔවුන්ට; තං, ඒ විෂය; ඝාටුඝං ආසි, තීක්ෂණවිය; තෙන, ඒ විෂයෙන්; මරණං, මරණයට; උපාගමුං; පැමිණියාහ.

786 යෙ ච ඛො පටිසඞ්ඛාය විසං නං පරිවජ්ජයුං
නෙ ආතුරෙසු සුඛිනා ඩයහමානෙසු නිබ්බුතා.

යෙ ච ඛො, යම් කෙනෙක් වනාහී; පටිසංඛාය, ඥාණයෙන් පරීක්ෂාකොට; තං, ඒ විෂය; පරිවජ්ජයුං, දුරුකොළෝ ඇත; තෙ, ඔහු; ආතුරෙසු, විෂානුභවකොට ආසන්න මරණ ඇත්තන් අතුරෙහි; සුඛිතා, නිදුක්වූ; ඩයහමානෙසු, විෂතෙජසින් දන්නවුන් අතුරෙහි; නිබ්බුතා, නිවුණාහ.

787 එවමෙව මනුසෙසසු විසං කාමා සමොහිතා
ආමිසං බඞ්ගනංවෙතං මච්චුවෙසො ගුහාසයො.

එවමෙව, එපරිද්දෙන්; මනුසෙසසු, මනුෂ්‍යයන් කෙරෙහි; කාමා, රූපාදී පඤ්චකාමයෝ; සමොහිතා, ඒ ඒ තැන බහාලන ලදහු කෙරෙන්ද; විසං, ඔහු විෂයසිදනයුත්තාහුයි; එහං, මේකාම ගුණය; ආමිසං, මනුෂ්‍යභූතවූ ලොකයහට මරණතැමැති බිලිවැද්ද විසින් බහනලද ආමිෂය; බඞ්ගනං, භවයෙන් නොනික්මිය දෙන පිණිස සත්වයන් විෂයෙහි බහාලූ අඳුන ආදිවූ බන්ධනය; එසො, මේ පඤ්චකාමය; ගුහාසයො, ශරීර නැමැති ගුහායෙහි ශයනය කරන; මච්චු, ගුණ මරණය කරන හෙයින් මෘතය.

788 එවමෙව ඉමෙ කාමෙ ආතුරා පරිචාරකෙ
යෙ සදා පරිවජ්ජෙති සඛං ලොකෙ උපච්චගූ තති.

එවමෙව, එපරිද්දෙන්; ඒ මාගීයෙහි යක්ෂයා විසින් බොහෝ දෙනාගේ විනාශය පතා බහාලූ විෂය ප්‍රඥාවත් බොධිසත්වයන්ගේ උපදෙශයෙන් නොකාහැර යෙහෙන් හියවුන් මෙන්; පරිවාරකෙ, කෙලෙසනැමැති පරිවාරකයන් ඇති; ඉමෙ කාමෙ, මේ පඤ්චකාම

ගුණයන්; ආතුරා, ආතුරවූ; යෙ, යම් කුවණෑති මරණසන්තම්කුඡ්ඣ කෙනෙක්; සදා, හැම්වේලෙහිම; පරිවජ්ජෙන්ති, දුරුකෙරෙද්ද ඔහු; ලොභෙ, ලොභයෙහි; සඞ්ගං, ලගනාඊයෙන් සඞ්ගයයි කියන ලද නම් ඇති රාගාදීවූ කෙලෙසයන්; උපචගුං, ඉක්මෙව්වාහුවෙත්.

361 ගුම්බිය ජාතකයයි.

---

789 සොයං සාළිසජාපොති කණ්හසපපං අගාහයි
තෙන සපෙපනයං දණ්ඩෙ හතො පාපානුසාසකො.

යො අයං, යම් මේ දුශ්ශිල මෙවිද්‍යයෙක්; සාළියජාපොති සාළලිහිණී පැටියයි; කණ්හසපපං, කෘෂ්ණසර්පයා; අගාහයි, කිසිවක් නොදන්නා බාලයා ලවා ගැන්විද; එසේවූ, අයං පාපානුසාසකො, මේ ලාමකවූ අනුශාසනා කරන්නාවූ; හෙවත් බාලයා හට විනාශය වන පරිද්දෙන් සාළලිහිණී පැටවෙහා අල්වා ගනුවයි බාලයා ගැන්වූ හීනයා; තෙන සපෙපන, ඒ සර්පයා විසින්; දණ්ඩෙ, කනලදුයේ; හතො, නෂ්ටවීය.

790 *අහනනතමහනනාරං යො නරො හනතුම්ඉච්ඡති
එවං සො නිහතො සෙති යථායං පුරිසො හතො.

යො නරො, යම්නරයෙක්; අහනනතං, තමා කිසිවකින් නොපහරනාවූ; අහනනාරං, තමා කිසිවකින් නොනසන්නාවූ; (යමෙක්) හනතුං, නසන්නට; ඉච්ඡති; ආකාංක්ෂා කෙරේද; සො, හෙතෙම; අයං පුරිසො, මේපුරුෂයා; යථා, යම්සේ; හතො, නෂ්ටද; එවං, එපරිද්දෙන්; හතො, නෂ්ටවූයේ; සෙති, මරණශෛය්‍යාවේ හෝනේති.

791 †අහනනතමඝාතෙනතං යො නරො හනතුම්ඉච්ඡති
එවං සො නිඝතො සෙති යථායං පුරිසො හතො.

යො නරො, යම්නරයෙක්; අහනනතං, තමා කිසිවකින් නොපහරනාවූ; අඝාතෙනතං, තමා කිසිවෙකින් නොමරන්නාවූ(යමෙක්) හනතුං, නසන්නට; ඉච්ඡති, ආකාංක්ෂා කෙරේද; සො, හෙතෙම; අයං පුරිසො, මේ පුරුෂයා; යථා, යම්සේ; හතො, නෂ්ටද; එව., එපරිද්දෙන්; නිහතො, නෂ්ටවූයේ; සෙති, මරණශෛය්‍යාවේ හෝනේති.

---

* අහනතාරමහනතාර-මරම්ම.
† අහන්තාරමඝාතෙනතං-මරම්ම.

792 යථා පංසුමුඛිං පුරිසෝ පටිවාතං පටික්කමෙ
තමෙව සෝ රජෝ හනති යථායං පුරිසෝ හතෝ.

යථා, යම්සේ, පංසුමුඛිං, පාංශුමුෂ්ටියක්; පුරිසෝ, පුරුෂයා; පටිවාතං, උඩුසුළඟට; පටික්කමෙ, දමා; සෝ රජෝ, ඒ රජස්; යථා, යම්සේ; තමෙව, ඒ පුරුෂයාම; හනති, පහරනේද; තථා, එපරිද්දෙන්; අයං පුරිසෝ, මේ පුරුෂයා; හතෝ, කවා මරමි සි සඤ්ඤා ගන්වා හෙමේම ඒ සඤ්ඤා විසින් බහනලදුව විෂයෙහි නිරුඬවී.

793 යෝ අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පෝසස්ස අනඞ්ගණස්ස
තමෙව බාලං පචෙචති පාපං
සුඛුමෝ රජෝ පටිවාතංව ඛිත්තෝ.

සුද්ධස්ස, නිරපරාධවූ; අනඞ්ගණස්ස, අඞ්ගණ රහිතවූ; අප්පදුට්ඨස්ස, කිසි දෙෂයක් නැත්තාවූ; පෝසස්ස, පුරුෂඝඩ්‍යතාවූ; නරස්ස, නරයා හට; දුස්සති, වෙෂකෙරේද; පටිවාතං, ප්‍රතිවාතයට; ඛිත්තෝ, දමනලද; සුඛුමෝ, සුක්ෂමවූ; රජෝ ඉව, ධූලි මෙන්; තමෙව, ඒ නිරපරාධය හට අපරාධකළාවූ; බාලං, අඥානයා කරා, පාපං, පාපය; පචෙචති, නැවත එන්නේය—යමෙක් සුජනය හට අපරාධයක් කළාද, ඒ අපරාධ යටසුළඟ සිට උඩුසුළඟට ධූලි දැමූ තා කරාම අවුත් ඇහ ගැසෙන්නාක් මෙන් මොහුට එම අපරාධයම එම ආත්මභාවයෙහිම විපාකදෙන්නේය සි සේසි.

365 සාළියජාතකයයි.

---

792 *අම්තතහත්ථගතා තවසාරසමපිතා
†පසන්නාමුඛවණ්ණාථ කසමා තුමෙහ න සොචථ.

තවසාර, ඔබයක් හරකොට ඇති හුනදන්ඩෙන්; සමපිතා, සන්නාර්පිතවූ; ගෙවත් බඳනාලදුව; අම්තතහත්ථතගතා, සතුරන්ගේ හසනබවට ගියාවූ තෙපි; පසන්නාමුඛවණ්ණාථ; ප්‍රසන්නාවූ මුඛ වණ්ණ ඇත්තව; තුමෙහ, තෙපි; කසමා, කවරහෙයකින්; න සොචථ, නොස්සුද.

---

* අම්තතහත්ථගතා—සමහර.
† පසන්නාමුඛවණ්ණාථ—සමහර

795 න සොචනාය පරිදෙවනාය
අත්ථොව ලබ්භා අපි අප්පකොපි
සොචන්තමෙතං දුඛිතං විදිත්වා
පච්චත්ථිකා අත්තමනා භවන්ති.

සොචනාය, ශොකකිරීමෙන්ද; පරිදෙවනාය, හැඬීමෙන්ද; අප්පකොපි, සුවල්පදවූ; අත්ථො, ප්‍රයොජ්‍යයෙක් විනාශි; න ලබ්භා එව, නොලැබේමය; සොචන්තං, ශොකකරන්නාවූ; දුඛිතං, දුඃඛිත වූ; එතං, මේ පුද්ගලයා; විදිත්වා, දැන; පච්චත්ථිකා, සතුරෝ; අත්තමනා, සතුටුවූවාහු; භවන්ති, වෙති–හැඬීම් ශොක කිරීමෙන් කිසි ප්‍රයොජ්‍යයක් වූකලි නැත, ඉන් ප්‍රයොජ්‍යනම් සතුරන් සතුටුවන බව මැයි සේයි

796 යතො ච ඛො පණ්ඩිතො ආපදාසු
න වෙධති අත්ථවිනිච්ඡයඤ්ඤූ
පච්චත්ථිකාස්ස දුඛිතා භවන්ති
දිස්වා මුඛං අවිකාරං පුරාණං

අත්ථවිනිච්ඡයඤ්ඤූ, ඒ ඒ අර්ථයෙහි විනිශ්චය දන්නාවූ; පණ්ඩිතො, ප්‍රාඥවූ පුරුෂයා; යතො ච ඛො, යම්හෙයකින් වනාහි; ආපදාසු, ආපදුයෙහි; න වෙධති, චිත්තොත්‍රාසයෙන් කම්පානොවේද; එසේහෙයින්, අස්ස, මේදුඃඛයෙහි කම්පානොවන ස්වභාවත් පුරුෂයාගේ, අවිකාරං, විකාරයට නොපැමිණි; පුරාණං, පුරාතනවූ; හෙවත් අපර නොඅ ඌාලයෙහි මෙන් සතුටුව තුබූ; මුඛං, මුහුණ; දිස්වා, දැක; පච්චත්ථිකා, සතුරෝ; දුඛිතා, දුඃඛිතවූවාහු; භවන්ති, වෙත්.

797 ජප්පෙන මන්තෙන සුභාසිතෙන
අනුප්පදානෙන පවෙණියා වා
යථා යථා යත්ථ ලභෙථ අත්ථං
තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

ජප්පෙන, මන්ත්‍රජප්කිරීමෙන්ද; මන්තෙන, ප්‍රාඥයන් හා සම්මන්ත්‍රණය කිරීමෙන්ද; සුභාසිතෙන, ප්‍රියවචනකිමෙන්ද; අනුප්පදානෙන, අල්ලස්දීමෙන්ද; පවෙණියා වා, තමාගේ මුතුන් මිමුතුන් ආදී ප්‍රවේණි කථා කීමෙන්ද යන; යථා යථා, මේ පවකාරණයන් අතුරෙන් යම් යම් පරිද්දෙකින්; යත්ථ, යම්තැනෙක්හි; අත්ථං, අර්ථයක්; ලභෙථ, ලබන්නේද; තථා තථා, එසේම; තත්ථ, එහිලා, පරක්කමෙය්‍ය, යත්නකරන්නේයි.

798 යතො ච ජානෙය්‍ය අලබභනෙයෙය්‍ය
මයා වා අඤ්ඤතා වා එසඅත්ථො
අසොචමානො අධිවාසයෙය්‍ය
කමමං දළහං කිනති කරෙමිදානීති.

මයා වා, මා විසින්ද; අඤ්ඤතා වා, සෙස්සන් විසින්ද; එසො අත්ථො, මේ අර්ථය; අලබභනෙයෙය්‍ය, ලබන්ට නොපිළිවනැසි; යතො ච, යම් හෙයකින් වනාහි; ජානෙය්‍ය, දන්නේවිනම්; අසොචමානො, ශොක නොකරන්නේ; දළහං, දැඩවූ; කමමං, අකුශල කර්මය කෙළේවිනම්; ඉදානි, දැන්; කිනති, කුමක් නම්; කරෙමි, කෙරෙම් දැයි; අධිවාසයෙය්‍ය, කෙසේ දුකකුදු ඉවසන්නේය.

366 කවසාර ජාතකයයි.

---

799 කාහාහං දෙවානමකාරං කිං පාපං පකතං මයා
යං මෙ සිරසම්හි උභතවව වක්කං හමති මත්ථකෙ.

යං, සී සේ; (යෙන කාරණෙන) යම් කාරණයෙකින්; වක්කං, චක්‍රය; මෙ, මාගේ; සිරසම්හි, හිස; උභතවව, පැහැර; මත්ථකෙ, මස්තකයෙහි; හමති, බමාද; එසේ හෙයින්; අහං, මම; දෙවානං, දෙවතාවන්ට; කිං, කුමන නම් අපරාධයක්: අකරං, කෙළෙම්ද; මයා, මා විසින්; කිං පාපං, භාවරතම් පාපක්‍රියාවෙක්; පකතං, කරනලදද.

800 අතික්කමම රමණකං සදෘමත්තමව දූභකං
බ්‍රහමත්තරව පාසාදං කෙනත්ථෙන ඉධාගතො.

රමණකං, ස්ඵටිකප්‍රාසාදයද; සදෘමත්තං, රජත ප්‍රාසාදයද; දූභකං, මැණික්මය ප්‍රාසාදයද; බ්‍රහමත්තරව පාසාදං, සවණී ප්‍රාසාදයද; අතික්කමම, ඉක්ම; කෙනත්ථෙන, කවරතම් කාරණයකින්; ඉධ, මෙයට; ආගතො, ආයිද.

801 ඉතො බහු තරා හොගා අත්‍ර මඤ්ඤෙ භවිස්සරෙ
ඉති එතාය සඤ්ඤාය පස්ස මං ව්‍යසනං ගතං

ඉතො, මේ ස්ඵටිකප්‍රාසාදාදී ප්‍රාසාද සතරට වඩා; අත්‍ර, මෙහිලා; හොගා, හොගයෝ විශෙෂයෙන්; බහුතරා, බොහෝ වූවාහු; භවිස්සරෙ, වන්නා හයි; මඤ්ඤෙ, හඟිම්; ඉති, මෙසේ ප්‍රවෘත්තවූ;

එතාය සඤ්ඤාය, මේ සඤ්ඤාවෙන්; ව්‍යසනං ගතං, ව්‍යසනයට ප්‍රාප්තවූ; මං, මා; පස්ස, බල.

802 චතුඛ්භි අට්ඨඞ්ගමා අඤ්ඤිපි ච සොළස
සොළසහි ච ඛත්තිංස අත්‍රිච්ඡං වක්කමාසදෙ,
ඉච්ඡාගතස්ස පොසස්ස වක්කං භමති මත්ථකෙ.

මෙහි අවි 104 වෙනි අඞ්කය ධරන ගාථාව බලා දතයුතුයි.

803 උපරි විසාලං දුප්පූරං ඉච්ඡා විසටගාමිනිං
යෙ ච තං අනුගිජ්ඣන්ති තෙ හොන්ති වක්කධාරිනොති.

උපරි, මතු මතුයෙහි; විසාලං, විශාලවූ; දුප්පූරං, දුෂ්පූරවූ; ඉච්ඡා, ඉච්ඡාවෙන්; විසට ගාමිනිං, පැතිර පවත්නාවූ; තං, ඒ තෘෂ්ණාව; යෙ ච, යම් කෙනෙක්; අනුගිජ්ඣන්ති, අනුව ගිජුවෙද්ද; තෙ, ඔහු; වක්කධාරිනො හොන්ති, චක්‍රධාරි වෙත්.

367 මිත්තවින්දුජාතකයයි.

---

804 හංසො පලාසමවව නිග්‍රොධො සම්ම ජායති
අඞ්කසම්ං තෙ නිසින්නොව සො තෙ මම්මානි ඡෙජ්ජති.

හංසො, හංශයා; පලාසං, කැලරුකවස්‍යාසෙයින් උපචාරවශයෙන් නම්ලද පලාශයාට; අවව, කී; සම්ම, යහළුව; නිග්‍රොධො, න්‍යග්‍රොධවෘක්ෂයෙක්; ජායති, උපදනේය; තෙ, තාගේ; අඞ්කසම්ං අඞ්කසංඛ්‍යාත වෙළඳ; නිසින්නොව, හුන්නාවූම; සො, හේ න්‍යග්‍රොධය; තෙ, තාගේ; මම්මානි, මර්මයන්; ඡෙජ්ජති, සිදුණේයි.

805 වඩ්ඪතුමෙව නිග්‍රොධො පතිඨස්ස භවාමහං
යථා පිතා වා මාතා වා එවමෙසො භවිස්සති.

නිග්‍රොධො, න්‍යග්‍රොධය; වඩ්ඪතු එව, වඩනේම වේවා; අස්ස, මෝහට; අහං, මම; පිතා වා මාතා වා, පියකෙනෙක් මෙන්; පතිඨා භවාමි, පිහිටවෙමි; එවං, මෙසේම; එසො, මෙතෙම; භවිස්සති, වේ– යම්සේ පුත්‍රයෝ වැදූ මව්පියන්ට පිහිට වෙද්ද මෙද මා වැඩිමාපු කල පිහිටවන්නේයයි සේසි.

806 යං භිංඅඞ්කසම්ං වඤ්ඤසි ඛීරරූකඛං භයානකං
ආමන්න ඛෝ තං ගච්ඡාම වඩ්ඪිමස්ස න රුච්චති

යං භිං, තෝ යම්හෙයකින්; භයානකං, භයානකවූ; ඛීරරූකඛං, ක්ෂීරවෘක්ෂය; අඞ්කසම්ං, අඞ්කයෙහි; වඤ්ඤසි, වඩියි ද; එසේවූ; තං, තා; ආමන්තා ඛෝ, ආමන්ත්‍රණයකොට, ගච්ඡාම, යම්හ; කුමක් හෙයින් ද යත්; අස්ස, මේ නාග්‍රොධයාගේ; වඩ්ඪි, වැඩීම; න රුච්චති, මට රුස්නේ නොවේයි.

807 ඉදානි ඛෝ මං භායති මහාතෙරූනීදස්සනං
හංසස්ස අනභිඤ්ඤාය මහා මෙ භයමාගතං.

ඉදානි ඛෝ, මේ නාග්‍රොධය බාල්කලම් තොසකොට වැඩකාල යෙහි; මං, මා; භායති, භයගන්වයි; හංසස්ස, හංශරාජයාගේ; මහා තෙරූනිදස්සනං, සිනෙරුපර්වතයා සමානවූ; න අභිඤ්ඤාය, වචනය අසා නො දැන; මෙ, මට; මහා, මහත්වූ; භයං, භය; ආගතං, අය-මට අවවාද කතීවූ හංශරාජයාගේ මෙරසේ අලඞ්ඝනීයවූ වචන අසා මට හිතයෙකැයි දැනනොගෙන දැන් උන් කීවාට හෙතුභූත මවි අයයි හැඬී.

808 න තස්ස වඩ්ඪි කුසලප්පසත්ථා
යො වඩ්ඪමානො ඝසතෙ පතිඞ්ං
තස්සූපරොධං පරිසඞ්කමානො
පතාරසි මූලවධාය ධීරොති.

වඩ්ඪමානෝ, වැඩෙන්නාවූ; යෝ, යමෙක්; පතිඞ්ං, තම හට්වන් මූලප්‍රතිෂ්ඨාව්; ඝසතෙ, නසාද; තස්ස, ඔහුගේ; වඩ්ඪි, අභිවෘඩිය; කුසල, ප්‍රාඥයන් විසින්; පසත්ථා න, ප්‍රශංසාකරනලද්දේ නොවෙයි; තස්ස, ඔහුගේ; උපරොධං, විනාශය; පරිසඞ්කමානෝ, ආශඞ්කා කරන්නාවූ; ධීරෝ, ධීරයා; මූලවධාය, මූලොද්ඝාතය පිණිස; පතාරසි, යත්න කරන්නේයි.

368 ජලාස ජාතකයයි.

දෙවන වර්ණාරොහ වර්ගයයි.

809 එවම්භූතස්ස තෙ රාජ ආගතස්ස වසෝ මිගී
අත්ථි නු කොචි පරියායෝ යෝ තං දුක්ඛා පමොචයෙ.

රාජ, රජ; මම, මාගේ; වසෝ, වශඟබවට; ආගතස්ස, ආවාවූ එවම්භූතස්ස, මෙබඳුවූ; තෙ, තාගේ; යෝ කොචි පරියායෝ, යම්කිසි, කාරණයෙක්, තං, තාගේ; දුක්ඛා, මෙඔදු දුඃඛයෙන්; පමොචයෙ, මුදන්නේද; එසේවූ කාරණයෙක්; අත්ථි නු, ඇද්ද.

810 එවම්භූතස්ස මෙ තාත ආගතස්ස වසෝ තවි
නත්ථි නු කොචි පරියායෝ යෝ මං දුක්ඛා පමොචයෙ.

තාත, දරුව; තව, තාගේ; වසෝ, වශඟබවට; ආගතස්ස, ආවා වූ; එවම්භූතස්ස, මෙබඳුවූ; මෙ, මාගේ; යෝ කොචි පරියායෝ, යම් කිසිකාරණයෙක්; මං, මා; දුක්ඛා, මෙබඳු දුකින්; පමොචයෙ, මුදද; එසේවූ කාරණයෙක්; නත්ථි, නැති—නු යනු නිපාතයි.

811 නාඤ්ඤං සුචරිතං රාජ නාඤ්ඤං රාජ සුභාසිතං
නාඝතෙ මරණෙ කාලෙ එවමෙවිතරං ධනං.

රාජ, රජ; සුචරිතං, සුචරිතයට වඩා; අඤ්ඤං, අනික්; මරණෙ කාලෙ, මරණකාලයෙහි; තාඝතෙ න, රක්ෂාකරන්නේනොවේ; රාජ, රජ; සුභාසිතං, සුභාෂිතයට වඩා; මරණෙ කාලෙ; මරණ කාල යෙහි; අඤ්ඤං, අනිකක්; තාඝතෙ න, රක්ෂාකරන්නේ නොවේ, ඉතරං, මේ සුචරිත සුභාෂිත දෙදෙනාට වඩා; ධනං, මුක්තාමාණික්‍යාදී ධනය; එවමෙව, එසේමැයි; මරණ කාලයෙහි රක්ෂාකරන්නේ නොවෙයි. කරන්නේ නම් සුචරිත සුභාෂිත දෙදෙනාමය, එයින් පිටත් යම්ම ධනයෙක් මරණ කාලයෙහි රක්ෂා කට නොහෙන හෙයින් ව්‍යර්ථයයි සේසි.

812 අකොකාචජි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ ච තං උපනයහන්ති වෙරං තෙසං න සම්මති.

මං, මට; අක් කොචජි, ආක්‍රෝශකෙළේය; මං, මා; අවධි, පහළු; මං, මා; අජිනි, දිනීය; මෙ, මාගේ අයිතිදෙය; අහාසි, ගතැයි; මෙසේ; යෙ ච, යම් කෙනෙක්; තං උපනයහන්ති, ඒ සිත තබද්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං; වෛරය; න සම්මති, නො සන්සිඳේ.

813 අකොකාචජි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනයහන්ති වෙරං තෙසූපසම්මති.

මං, මට; අක්ඛොචේසි, ආක්‍රොශ කෙළේය; මං, මා; අවධි, පහළ; මං, මා; අජිනි, දිනීය; මෙ, මාගේ අසිතිදෙය; අහාසි, ගතැසි මෙසේ; යෙ, යම් කෙනෙක්; තං, න උප නයහන්ති, ඒ සිත නොත බඳ්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, වෛරය; උපසම්මති, සන්සිඳේ.

814 නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති එසධම්මෝ සනන්තනොති.

ඉධ, මෙහිලා, වෙරෙන, වෛරයෙන්: වෙරානි හි, වෛරයෝ වනාහි; කුදාචනං, කවර කලෙකත්; න සම්මන්ති, නොම සංසිඳෙති; අවෙරෙන ච, වෛර නොකිරීමෙන්ම; සම්මන්ති, සන්සිඳෙති; සන නන්තනෝ, සත්පුරුෂයන්ගේ; එසෝ ධම්මෝ, මේ ප්‍රවේණි සවභාවයි.

369 දිඝිතිකොසල ජාතකය.

---

815 අගාරා පවවුපෙතස්ස අනගාරස්ස තෙ සතෝ
සමණස්ස න තං සාධු යං පෙතමනුසොචසි.

පෙතං, පරලොව ගියවුව; අනුසොවසි, අනුව ශොක කෙරෙහි ස්ස; යං, යමක් ඇද්ද; තං, ඒ; අගාරා, ගිහිගෙන්; පවවුපෙතස්ස, ගියාවූ; අනගාරස්ස, ගෙය නැත්තාවූ; සමණස්ස සතෝ, තපස්වී වූ; තෙ, තට; න සාධු, යහපත් නොවේ.

816 සංවාසෙන හවෙ සක්ක මනුස්සස්ස මිගස්ස වා
හදයෙ ජායතෙ පෙමං තං න සක්කා අසොචිතුං.

සක්ක, ශක්‍රය; හවෙ, එකාන්තයෙන්; සංවාසෙන, එක්ව විසීමෙන්; මනුස්සස්ස, මනුෂ්‍යයන්හුගේද, මිගස්ස වා, මෘගයන්හුගේද; හදයෙ, හෘදයෙහි; පෙමං, ප්‍රේමය; ජායතෙ, හටගන්නේය; තං, ඔහු; අසොචිතුං, ශොකනොකරන්නට; න සක්කා, නොපිළිවන.

817 මතං මරිස්සං රොදන්ති යෙ රුදන්ති ලපන්ති ව
ඉසි මා රුදි රොදිතං තං මොඝමාහු සනෙතා.

මතං, මළවුවද; මරිස්සං, මියන්නහුටද; යෙ, යම් කෙනෙක්; රොදන්ති, හඬද්ද; තෙ, ඔහු; රුදන්ති, හඬත්මය; ලපන්ති ව, බෙණෙත්මය; ඉසි, ඍෂිය; මා රුදි, නහමක් හඬ; තං රොදිතං, ඒ හැඬීම; සනෙතා, සත්පුරුෂයෝ; මොඝං, මොඝයයි; ආහු, කිවූ.

818 රොදිතෙන හවෙ බ්‍රහ්මෙ මතො පෙතො සමුඨහෙ
සබ්බෙ සංගම්ම රොදාම අසඤ්ඤිඤ්ඤස්ස ඤාතයෙ.

බ්‍රහ්මෙ, බ්‍රහ්මය; හවෙ, එහෙනත්තයෙන්; රොදිතෙන, හැඬීමෙන්; මතො, මළාවූ; පෙතො, ප්‍රෙතයා; සමුඨහෙ, ඉදින් නැගී සිටිනේනම්; සබ්බෙ, හැමදෙන; සංගම්ම, එක්වගෙන; අසඤ්ඤි මඤ්ඤස්ස, ඔවුනොවුන්ගේ; ඤාතයෙ, මිළ නැයන්ට; රොදාම, හඬමු-හැඬීමෙන් මළෝ උපදින්නම් නිසාම් කුමට හිඳුම්ෝද වැලි එක්වලා ඔවුනොවුන්ගේ මළ මළ නැයන්ට හඬම්හයි වෙහෙසී.

819 ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං
වාරිනා විය ඔසිඤං සබ්බං නිබ්බාපයෙ දරං.

මෙහි අටී 715 වෙනි අඞ්කය ධරන ගාථාව බලා දතයුතුයි.

820 අබ්බහී වත මෙ සල්ලං යමාසි හදය නිස්සිතං
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

මෙහිද අටී 716 වෙනි අඞ්කය ධරන ගාථාව බලා දතයුතුයි. මෙහි "පුත්තසොකං" යන්න වෙනසි.

821 සොහං අබ්බුළ්හසල්ලොසම්ි විතසොකො අනාවිලො
න සොචාමි න රොදාමි තව සුභාන වාසවාති.

මෙහිද අටී 717 වෙනි අඞ්කය ධරන ගාථාව බලා දතයුතුයි. මෙහි "වාසව" යනු වෙනසි. වාසව, ශක්‍රදිව්‍යරාජය.

370 මිගපොතක ජාතකයයි.

---

822 කුහිං ගතා කත්ථ ගතා ඉති ලාලපතී ජනො
අහමෙව එකො ජානාම් උදපානෙ මූසිකා හතා,

කුහිං ගතා, කොසි ගියා දෝ; කත්ථ ගතා, කොසි ගියා දෝ සි කියා; ඉති, මෙසේ; ජනො, ජනතෙම; ලාලපති, බෙණෙයි; මූසිකා, මූසිකාතොමෝ; උදපානෙ, ළිඳ; හතා, නශ්වයයි; එකො, අචිනීයවූ; අහමෙව, මමම; ජානාමි, දනිමි- කුහිංගතා කත්ථගතා, යනු සමානාර්ථයි.

823 යථෙතං ඉතිවිති ච ගද්‍රභොව නිවත්තසි
උදපානෙ මූසිකං හන්ත්වා යවං භක්ඛතූ මිච්ඡසි.

යථා, යම් හෙයකින්; ඉතිවඉතිව, මෙසේද මෙසේද ප්‍රහාරයට අවකාශ සොයන්නේ; ගද්‍රභොව, කොටලුවෙකුමෙන්; නිවත්තසි, පසුබස්හිද; එසේ හෙයින්; එතං, තෑමේ පසුබස්නා කාරණය දනී මියි සේයි; උදපානෙ, උදපාන යෙහි; මූසිකං, මූෂිකාව; හෝ නොහොත් මූෂිකානම් දැසිය; හන්ත්වා, නසා; යවං, යවද; නොහොත් යවනම් රජුද; භක්ඛතූං, භක්ෂණය කරන්නට; ඉච්ඡසි, කැමැත්තෙහිද.

824 දහරො වසි දුමේධ පඨමුපපත්තිකො සුසු
දීඝං වෙතං සමාසජ්ජ න තෙ දස්සාමි ජීවිතං.

දුමේධ, දුමේධය; දහරොව අසි, ළදරු වෙහිද වී; පඨමුපපත්තිකො, ප්‍රථම වයසින් නැඟෙහි ප්‍රථම වයසෙහි සිටියෙහිසේයි. සුසු, තරුණයෙහි; දීඝං ච එතං, දික්වූ මේ යෂ්ටියෙන් යුක්තවූ ආයුධයක්; සමාසජ්ජ, ගෙන එල්ඛ සිටියේයි; තෙ, තාගේ; ජීවිතං, ජීවිතය; න දස්සාමි, නොදෙමී–මෙවිට තා ඉකරේ ලජ්ජාවක් නොකෙරෙමි මරාපියා කඩකඩකොට හුල අවුණාලම් භයගැන්වී.

825 නාන්තලික්ඛචරෙන නාඛපුත්තසිරෙන වා
පුත්තෙනාහි පඤ්ඤිතො සිලොකෙහි පමොචිතො.

අන්තලික්ඛචරෙන, අන්තරීක්ෂයෙහිවූ දිව්‍යභවනයෙන්ද; අඛපුත්තසිරෙනවා, ශරීරාවයව සදෘශවූ පුත්‍රයා කරණකොට ගෙනද; න, මුක්තවූයේ නොවේ; වැලි කෙසේද යත්? පුත්තෙන, පුත්‍රයා විසින්; අභිපඤ්ඤිතො, මරණ ප්‍රාර්ථනා කරන ලද්දෙම්; සිලොකෙහි, මාගේ ආචාරීන් බැඳ දුන් ගාථාවෙන්; පමොචිතො, මිදිනිමි.

826 සබ්බං සුතමධීයෙථ හීනමුක්කට්ඨමජ්ඣිමං
සබ්බස්ස අත්ථං ජානෙය්‍ය නවසබ්බං පයොජයෙ
හොති තාදිසකො කාලො යත්ථඅත්ථාවහං සුතන්ති.

හීනං, හීනවූද; උක්කට්ඨං, උත්කෘෂ්ටවූද; මජ්ඣිමං, මධ්‍යමවූද; සබ්බං, සියලු; සුතං, ශ්‍රැතය; අධීයෙථ, හදාරන්නේය; සබ්බස්ස, සියලු ශාස්ත්‍රයාගේ; අත්ථං, අර්ථය; ජානෙය්‍ය, දන්නේය; සබ්බං, සියලු හීනොත්කෘෂ්ටමධ්‍යමවූ මන්ත්‍රාදිවූ ශාස්ත්‍රය; නවපයොජයෙ,

නොම ප්‍රයොග කරන්නේය; උගන්නා බවමුත් හීන මන්ත්‍රයක් වේවයි ශිල්පයක් වේවයි හැම සමයෙහි ප්‍රයොග නොකොට අත්‍ය තනම විද්‍යාවක්ම ප්‍රයොග කරන්නේයි. යත්, යම්කලෙක; සුතං, ශ්‍රැතය; අත්‍ථාවහං අර්‍ථඵලවයිද; තාදිසකොං,එබඳුවූ; කාලොං, කාල යක්; හොති, වන්නේය-හීනාදි වශයෙන් සිවිකල ශාස්ත්‍රාගදරන් නේය; හැමතැනම හීනවිද්‍යාව නොපවත්වා මහෞෂධ පණ්ඩිතයන් කුම්භකාර විද්‍යාව ප්‍රයොගයෙන් ජීවන කළාමෙන් එබඳු සමයෙක ප්‍රයොජන විදිනා පරිද්දෙන් සකල ශාස්ත්‍ර පරිඥනයට ප්‍රයොග කටයුතුයයි සේසි.

371 මූසික ජාතකයයි.

---

827 සබ්බං භණ්ඩං සමාදාය පාරං තිණ්ණොසි බ්‍රාහ්මණ
පච්චාගච්ඡ ලහුං ඛිපං මම්පි තාරෙහි දානිතො.

බ්‍රාහ්මණ, බමුණ; සබ්බං, සියලු, භණ්ඩං, භාණ්ඩය; සමාදාය, ගෙන; පාරං, තෙරට; තිණ්ණොසි, තීර්‍ණවීමි; ලහුං, ලඝුව; ඛිපං, සිඝුව; පච්චාගච්ඡ, නැවත ඒ; ඉදානි, දැන්; ඉතො මේ නදියෙන්; මම්පි, මාද; තාරෙහි, එතර කරව.

828 අසන්‍ථතං මං විරසන්‍ථතෙන
නිමිත්තං හොති අධ්‍රුවං ධ්‍රුවෙන
මයාපි හොති නිම්නෙය්‍ය අඤ්ඤං
ඉතො අහං දූරතරං ගමිස්සං.

මෙහි අර්‍ථ 577 වෙනි අඞ්කය ධරන ගාථාව බලා දතයුතුයි. "හොතී" යන්න පමණක් වෙනසි.

829 කායං එළගලා ගුම්බෙ කරොති අහු භාසියං
නසිධ නච්ච ගීතං වා තාලං වා සුසමාහිතං
අනමහකාලෙ සුසෙසාණි කිනාහු ජගසි සොහතෙ.

එළගලාගුම්බෙ, කලිල (තුවර) ලැහැබ්හි, අහු භාසියං කරොති, මහසිනා කෙරෙහි; කා අයං, මෝ කවරක්ද;-යමක් දැක තොසෙසිද එසේවූ සිනාවට සුදුසුවූ; නච්චං වා; නෘත්‍යයෙක් වේවයි; ගීතං වා; ගීතයෙක් වේවයි; සුසමාහිතං, හස්තයෙහි සාවධානකොට වාදනය කරන්නාවූ; තාලං වා, කුළුතාලමෙක් වේවයි; ඉධ මෙහෙ

න්හි; න, නැත්තේය; සුසොණී, සුඳුරවූ ශ්‍රොණී ඇති; සොභනෙ, සොභනවූ තැනැත්තිය; අනමතග්ගකාලෙ, හැඩියයුතු කාලයෙහි; කින්නු, කුමක් හෙයකින්; ජගඝසි, (නොහඬා)මහසිනා කෙරෙහිද

830 සිගාල බාල දුමෙමධ අපප පඤ්ඤසි ජම්බුක
ජීනො මච්ඡඤ්ච පෙසිඤ්ච කපණො විය ක්‍රායසි.

සිගාල, සෘගාලය; බාල, අඥනය; දුමෙමධ, දුම්මේධය; ජම්බුක, ජම්බුකය; අපපපඤ්ඤසි, ප්‍රඥනැත්තෙහි; ආසි, වී; මච්ඡඤ්ච, මත්ස්‍යයාද, පෙසිඤ්ච, මාංසපෙසියද යන මේ දෙකින්; ජීනො, පිරිහුණු බවට පැමිණ; කපණො විය, කෘපණයක්හු මෙන්; ක්‍රායසි, සිතයි;-අඥනයා මත්ස්‍යයා හා මාංසපෙසින් පිරිහුණුයෙහි සහශ්‍රයෙකින් පිරිහුණුවකුමෙන් ශොක කෙරෙයි කියා සෘගාලයාට නිගුඬිණු.

831 සුදසසං වජජං අඤ්ඤසං අත්තනො පන දුද්දසං
ජීනා පතිං ච ජාරං ච නිමපි මඤ්ඤව ක්‍රායසි.

අඤ්ඤසං, මෙරමාගේ; වජජං, වරද; සුදසසං, සුවසේ දැක්ක හැක්ක; අත්තනො පන, තමාගේ වරද වනාහි: දුද්දසං, දක්නට නොපිළිවන එසේ හෙයින්; නිමපි, නොද; පතිං ච, සැමියාද; ජාරඤ්ච සොර සැමියාද යන මේ දෙන්නා කෙරෙන්; ජීනා, පිරිහුණුයෙහි මං එව, මා මෙන්; ක්‍රායසි, සිතයි.

832 එවමෙතං මිගරාජ යථා භාසසි ජම්බුක
සා නූනාහං ඉතො ගනත්වා භත්තු හෙසසං වසානුගා.

මිගරාජ, මෘගරාජය; ජම්බුක, ජම්බුකය; යථා භාසසි, යම්සේ කීද; එතං, මේ; එවං, මෙසේමය; සාහං, හේ මම; නූන, එකාන්තයෙන්; ඉතො ගන්ත්වා, මෙයින් ගොස් අනික් සැමියෙකු ලදින්; වසානුගා, වසඟබවට පැමිණියෙම්; හෙසසං, වෙමි;-මෘගරජය තා කීයේ සැබෑමය බල මෙතනම සිට සමාන කෙනකුන් ලදින් උන්ට අනුව පවතිමි සි කියා.

833 යො හරෙ මත්තිකාථාලං කංසථාලමපි සො හරෙ
සතංයෙව තයා පාපං පුනපෙවං කරිසසසීති.

යො, යමෙක්; මත්තිකාථාලං, මැටිතල්ලක්; හරෙ, සොරාගද්ද; සො, එසේම පුරුදුව ගත්තේ; කංසථාලමපි, කාංසථාලයකුදු; හරෙ

සොරා ගන්නේය; පාපං, පාපය, තයා, නී විසින්; කතං එව, කරණ ලදමය එසේ හෙයින්; පුනපි, නැවතද; එවං, මෙසේ; කරිස්සසි, කරන්නෙහි;-තුච්ඡනැත්තිය යම්සේ මැටි හල්ලක් සොරා පැහැර ගත්තේ ඒ පරිවාරයෙන් රන්හලියකුදු සොරාගනිද එපරිද්දෙන් තෝ ඒසාවූ පව්කොට පුරුදුව ගත්තෙහි නැවතද ඒ දරුණු කම්ම කරන්නෙහි වේදැයි කියා බිණී.

372 චුල්ලඛනුගහක ජාතකයයි.

---

834 ඉදානි ඛොමහි සුඛිතො අරොගො
නිබ්බණ්ටකො නිප්පතිතො කපොතො
කාහාමිදානී හදයස්ස තුණ්ඩිං
තථා හිමං මංසසාකං බලෙති.

ඉදානි ඛො, දැන් වනාහි; කපොතො, කෘපණ කපොතක; නිප්පතිතො, නිගීහස එසේ හෙයින්; සුඛිතො, සුවපත්වූයෙම්; අරොගො, නිරොගිවූයෙම්; නිබ්බණ්ටකො, ශතෘකණ්ටක රහිතවූ යෙම්;අමහි, වීම්; එසේ හෙයින්; ඉදානි, දැන්; හදයස්ස, මාගේ හෘද යට; තුණ්ඩිං, තුණ්ඩියක්; කාහාමි, කෙරෙම්; තථාහි, එසේමැයි; ඉමං, මේ; මංසසාකං, මාංශයද අවශෙෂකයද මෙමුලුතැන්ගෙයි තුබූ මස්ද රසද; බලෙති, මට බල කරන්නේය නැති සිට මස්ද රසද අනුභව කෙරෙයි කියන්නක්හු මෙන් උත්සාහ කෙරෙයි සේසි.

835 කාසං බලාකා සිඛිනී චොරී ලඞ්ඝි පිතාමහා
ඔරං බලාකෙ ආගච්ඡ වණ්ණඩා මෙ වායසො සඛා.

ලංඝිපිතාමහා, මෙඝයා මුතුන් කොට ඇති; චොරී, සෙරවු; සිඛිනී, ශිඛා ඇති; අයං බලාකා, මේ කෙකිනී; කා, කවරක්ද? බලාකෙ, කෙකින්න; ඔරං, මෑතට; ආගච්ඡ, නැඟී ඒ; මෙ, මාගේ; සඛා, යහලුවූ; වායසො, කවුඩුවා; වණ්ණඩා, වණ්ඩය;-ඇඹුල් මොර ආදීන් ගල්වා සුදුකොට නීලපක්ෂියෙහි හෙවූ කවුඩුවා දැසා බොහි සඤ්ඤෝ සුදු බව ගෙන කෙකින්න මැතට නැඟී ඒ අපගේ කවුඩු වාගේ නීල පක්ෂියෙහි නොහෝ; ආ නම් වෙහෙස දෙයි මැතට නැඟී ඒ යනාදීන් වෙහෙසත්.

836 අලංහි තෙ ජග්ඝිතායෙ මමං දිස්වාන එදිසං
විළෙනං සූදපුත්තෙන පිසිමද්දෙන මක්ඛිතං.

සූදපුත්තෙන, සූද පුත්‍රයා විසින්; විඤ්ඤතං, සිදිනාලද පියාපත් ඇති; පිසිමදෙන, ගබකල්ක ආදී නොයෙක් පිටි කලලින්; මක්ඛිතං, ගැල්වූ; එදිසං, මෙබඳුවූ; මං, මා; දිස්වාන, දැක; තෙ, තාගේ; ජග්ඝිතායෙ, සිනායෙන්; අලංහි, පමණි;–මෙබඳුදුසකට පැමිණියාවූ මා දැක තාගේ වෙහෙසුම් නොකැමැත්තේ මා නොවෙහසයි කීය.

837 සු නහාතො සුවිලිත්තොසි අන්නපානෙන තප්පිතො
කණ්ණෙ ච තෙ වෙලුරියො අගමා නු කජඞ්ගලං.

සුනහාතො, යහපත් කොට නහන ලද්දෙහි; සුවිලිත්තොසි, මනාකොට සුවඳ ගල්වන ලද්දෙහි වී; අන්නපානෙන, අන්නපාන යෙන්; තප්පිතො, සන්තර්පිතය කරනලද්දී; තෙ, තාගේ; කණ්ණෙ ච, ග්‍රීවයෙහිද; වෙලුරියො, වෛඩූර්‍යී මාණික්‍යයෙක; එසේ හෙයින්; කජඞ්ගලං, කජඞ්ගලාවට; අගමා නු, ගියේද;–වෛඩූර්‍යී මාණික්‍යයෙකැයි අරක්කැම්යා විසින් කර බැඳ එල්වන ලද කැබිලිත්ත ගෙන කීහ, කජඞ්ගලයයි එම බාරාණසිය අපෙක්ෂාකොට කීහ, එසේහෙයින් මෙසින් ගොස් ඇතුලුනුවරට ගියේදැයි විවාළේ.

838 මා තෙ මිත්තෙනා අමිත්තෙනා වා අගමාසි කජඞ්ගලං
පිජානි තප්ප ලාසිත්වා කණ්ණෙ බන්ධන්ති වඞ්ඪනං.

තෙ, තාගේ; මිත්තෙනා වා, මිත්‍රයෙක් වේවයි; අමිත්තෙනා වා, අමිත්‍රයෙක් වේවයි; කජඞ්ගලං, කජඞ්ගලාවට; මා අගමාසි, නහ මක් යේවා; කුමක් හෙයින්ද යත්? නහ, එහිලා; පිජානි, පියා පත්‍ර යන්; ලාසිත්වා, සිදපියා; කණ්ණෙ, කර; වඞ්ඪනං, කැබිලිත්ත; බන්ධන්ති, බඳිත්,

839 පුනපාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං
න හි මානුසකා භොගා සුභුජා හොන්ති පක්ඛිනාති.

සම්ම, සබඳ; පුනපි, නැවතද; ආපජ්ජසි, මෙබඳු දුසකට පැමිණෙන්නෙහි; තව, තාගේ; සීලං, සුභාවය වන්නාහි; තාදිසං, එබඳුසි; මානුසකා, මනුෂ්‍ය ලොකයෙහි; භොගා, සම්පත්තීහු; පක්ඛින්නා, පක්ෂියන්හු විසින්; න හි සුභුජා, නොම සුවසේ අනුභව කටයුත්තේසි–මනුෂ්‍යයන්ගේ සුදුසු අන්නපානය පක්ෂියන් ඉදුරා අනුභව කරන්නට නොලබන්නේසි සේසි.

378 සුපොත ජාතකයයි.

රාජඞ්ගරාදී නම් ජාතක සත්‍යයේ පඤ්ච නිපාත වර්ණනා නිමි.

810 මාසසු කුජ්ඣ භූමිපති මාසසු කුජ්ඣ රථෙසභ
කුඩ්ඨං අපපටිකුජ්ඣනෙතා රාජා රඨසස පූජිතො.

භූමිපති, පෘථිවීශ්වරයාණෙනි; මාසසු කුජ්ඣ, නොකිපුන මැනවි; රථෙසභ, රාජොත්තමය; මාසසු කුජ්ඣ, නොකිපෙහු මැනවි; කුඩ්ඨං, කිපුනහුට; අපපටිකුජ්ඣනෙතා, ප්‍රතික්‍රොධ නොකා රන්තාවූ; රාජා, රජතෙම; රඨසස, රටවැස්සා විසින්; පූජිතො, පිදිය යුතුවේ.

841 ගාමෙ වා යදි වාරඤ්ඤෙ නිනෙන වා යදි වා ථලෙ
සබ්බත්ථ අනුසාසාම් මාසසු කුජ්ඣ රථෙසභ

ගාමෙ වා, ගමෙහි හෝ වේවා; යදි වා, නොහොත්; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි හෝ වේවා; නිනෙන වා, නිම්නස්ථානයෙහි හෝ; යදි වා, නොහොත්; ථලෙ, ගොඩෙහි හෝ වේවා; සබ්බත්ථ, (මෙකී ග්‍රාමාදී යම්කිසි තැනෙක්හි වඤ්ඤේද ඒ) සියලු තන්හි; අනුසාසාම්, (නුඹවහන්සේට)අනුශාසනාකරමි; රථෙසභ, රාජොත්තමය; මාසසු කුජ්ඣ, නොකිපුන මැන;-නරපතීහු වාවායුධ ඇතියෝ ඔවුන් කිපි වචන පමණින් ජීවිතක්ෂයට හෝ බොහෝදෙන පැමිණෙති එහෙයින් රජ විසින් කිපෙන්ට නොවටී සි බෝසත් රජහට ඔවදන් දුනි.

842 අචාරියපිතා නාම අහු ගංගාය නාවිකො
පුබ්බෙ ජනං තාරෙඤ්ඤාන පච්ඡා යාචති වෙතනං
තෙනසස හණ්ඩනං හොති න ච හොගෙහි වඩ්ඪති.

ගංගාය, ගඩහාවෙහි; අචාරියපිතා නාම, අචාරියපිතා නම්වූ (ඔහුගේ පිතාව අචාරියා නම ඇතේ නම් වශයෙන් අචාරිය පිතා නම්වී) නාවිකො අහු, නැවියෙක්(තොටියෙක්)වී හෙතෙම: පුබ්බෙ, පෙර; (පළමුවොට) ජනං, (මිහි) ජනයා; තාරෙඤ්ඤාන, එතරකොට; පච්ඡා, පසුව; වෙතනං, වැටුප් (මිළ); යාචති, ඉල්වයි; තෙන, ඒ කාරණයෙන්; අසස, ඔහුගේ; හණ්ඩනං, (ජනයා හා සමඟ) ඛරය; හොති, වේ; හොගෙහි, හොගයෙන්; න ච වඩ්ඪති, නොවැඩේ.

843 අතිණ්ණං‍යෙව යාචස්සු අපාරං තාය නාවිය
අඤ්ඤෙසු හි තිණ්ණසස මනො අඤ්ඤෙසු හොති හරෙසිනො

තාය, දරුව; නාවිය, නාවියාය; අපාරං, මෙතර සිටියාවූ; අතිණ්ණංයෙව, එතරකොවුම ජනයා; යාචස්සු, (වැටුප්) ඉල්වව; තිණ්ණසස, පරතෙරට ගියහුගේ; මනො, සිත; අඤ්ඤෙසු හි, අනී

කෙක් මැයි; (වැටුප් නොදී යනු කැමැතිවෙයි) තරෙසිනෝ, තරණය සොයන්නහුගේ (පරතෙරට යනු කැමැත්තහුගේ) සිත; අසෙසුදා හොනි, අතිකෙක් වෙයි; (අතිරේකයකුදු දී යනු කැමැති වෙයි සේයි) බොධිසත්වයෝ අවාරිය පින් නැවිතට හොගවෘඩිය ප්‍රකාශ කළෝ.

844 ගාමෙ වා යදි වාරඤ්ඤ නිඤ්ඤෙ වා යදි වා ථලෙ
සබ්බත්ථ අඤ්ඤාසාඝි මාස්සු කුප්ඣිත්ථ භාවිත.

භාවිත, නැවිත; මාස්සු කුප්ඣිත්ථ, නහමක් කිපෙව; සෙස්ස, යටකී නයින් දතයුතු.

845 යායෙවානුසාසනියා රාජා ගාමවරං අදා
තායෙවානුසාසනියා නාවිකො පහරී මුඛං.

යාය එව අනුසාසනියා, යම් බඳු අනුශාසනාවකින්ම; රාජා, රජතෙම; ගාමවරං, ගම්වරක්; අදා, (තපස්වීහට) දුන්නේද, තාය එව අනුසාසනියා, ඒ අනුශාසනායෙන්ම; නාවිකො, නැවිතෙම; මුඛං, (තපස්වීහුගේ) මුඛයට; පහරී, පහර දුන්නේය;-අවවාදය සුතුවූ ජනසාටම දියයුතුය අයුතු ජනයා හට නොදිය යුතුයයි මෙයින් ප්‍රකාශ කළේ.

846 භත්තං භින්නං හතා හරියා ගබ්භා ච පතිතො ඡමා
මිගොව ජාතරූපෙන න තෙනත්ථං අබඤ්ඤුති.

භත්තං, බත්තලිය; භින්නං, බිඳිනලදී; හරියා, භාර්‍යාතොමෝ හතා, නසනලදී; ගබ්භා ච, දරුගභීයද; ඡමා, භූමියෙහි; පතිතො හෙළනලදි; ජාතරූපෙන, (සවණියක් හෝ හිරණ්‍යයක් හෝ මුකනාමාණික්‍යාදියක් නෝ මදීනයකොට යන්නේද ඇක්ම හෝ යේද ඒ) ජාත රූපයෙන් (තමහට අභිවෘඩියක් නිපදවන්ට නොහැකිවූ); මිගොඉව, මෘගයකු යම්සේද එපරිද්දෙන්; තෙන, ඒ අවවාදයෙන්; සො, ඒ අඤ්ඤාල නැවිතෙමෙ; නුවණැත්තන් විසින් දුන් අවවාදය අසා; අත්ථං, තමහට අභිවෘඩියක් නෝ ධර්ම වෘඩියක් නිපදවන්ට නොහැකිවී; "අබඤ්ඤුති" යන්නෙහි "අඛඤ්ඤොනි"යි මෙසේ අර්ථය දතයුතු; සො ඉති, යන මේ පදයන්ට "සුති"යි සංඛ්‍යාවේ.

374 අවාරිය ජාතකයයි.

847 මා තාත කුජ්ඣි න හි සාධු කොධෝ
බහුම්පි තෙ අදිඤ අස්සුතං ච
මාතා පිතා දිසතා සෙතකෙතු
ආචරියමාහු දිසතං පසත්ථා.

තාත සෙතකෙතු, දරුව සෙත කෙතු නම් නැනැත්තෙනි; මා කුජ්ඣි, නහමක් ක්‍රෝධකරව්; කොධෝ, ක්‍රෝධ කිරීම; නහි සාධු, යහපත් නොවේ; තෙ අපි, තා විසින් වනාහි අදිඤ, ප්‍රහාණකොට නුදුටු දෙයද; අස්සුතං ච, කනින් නොඇසූ දෙයද; බහුං, අතිශයින් බෙහෙව; මාතා පිතා, මව්පිය දෙදෙන; දිසතා, පළමුකොට උපන් හෙයින් සත්‍වයාට පූර්වදිසාවයහ; ආචරියං, ආචාරිවරහු; දිසතං පසත්ථා, දක්ෂිණෙය හෙයින් දිශාවන් අතුරෙහි ප්‍රශස්තාවූ දක්ෂිණ දිශාවයහයි; ආහු, බුඩාදි ආර්‍යයෝ කියත්.

848 අගාරිනා අන්නාදපානවත්ථේ
අවහායිකා හම්පි දිසං වදන්ති
එසා දිසා පරමා සෙතකෙතු
යං පත්වා දුක්ඛී සුඛිනෝ භවන්ති.

සෙතකෙතු, සෙතකෙතුව; අන්නාද, බත්දෙන්නාවූ; පානද, පානවගීදෙන්නාවූ; වත්ථද, වස්ත්‍රදෙන්නාවූ; අවහායිකා, (දැනොපකරණ විළිගනුවයි) කැඳවන්නාවූ; අගාරිනො, යම් ගෘහස්ථ කෙනෙක් ඇද්ද; තම්පි, හෙද; දිසං, දිගකැයි; වදන්ති, බුඩාදිහු කියති;-ආහාරාදී දෙය වස්තුව විළිගන්ට එවයි කැඳවන හිහි ජනයෝද ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් උපගන්තව්‍යයෝත්‍රයි දිශා ව්‍යවහාර ලැබෙනියි සේසි; නොහොත්; අන්නාද, බත් දෙන්නාවූ; පානවත්ථද, පාන දෙන්නාවූ වස්ත්‍රදෙන්නාවූ; අගාරිනො, යම් ගෘහස්ථ කෙනෙක්ද ඔවුන්ට; අවහායිකා, නානාවිධ දිව්‍යලෝක සම්පත් දීමෙන් මතු මතු කැඳවන යම් ධාම්මික ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද ඔවුන් දිසායයි කියති, බුඩාදිහු ඔවුන්ද උපරි දිසා යයි කියති යයි සේසි; යම්පත්වා, යම් දිගකට පැමිණ; දුක්ඛී, දුප්පත් ජනයෝ; සුඛිනෝ භවන්ති, සුවපත්වෙති; එසා දිසා, මේ දිසා නොමෝ; පරමා, ඔයලු දිහුන්ට උත්කෘෂ්ටයි-යම් දිගකට පැමිණි දුඃඛිත ජනයෝ සුවපත් වෙද්දැයි කිමෙන් නීචාන දිගට පැමිණි ජනයා ජාත්‍යාදි දුක්හැර සානන්තප්‍රණීතාදීන් නීචාන සුඛ ප්‍රාප්තවන හෙයින් නිවන් දිග්ගත්හු.

849 ඛරාජිනා ජටිලා පඞ්කදන්තා
දුම්මක්ඛරූපා යෙමෙ ජපන්ති මන්තෙ
භාවී නු තෙ මානුසකෙ පයොගෙ
ඉදං විදූ පරිමුත්තා අපායා.

ඛරාජිනා, කඩිනවූ අඳුන් දිවිසම් හඳිනාවූ; ජටිලා, ජටා මඬුළු බැන්දවූ; පඞ්කදන්තා, කාෂ්ඨයාගේ නොඇමෙන්මල හුන් දත් ඇත්තාවූ; දුම්මක්ඛරූපා, අනාජීත අවඩිත හෙයින්ද රූක්ෂ හදනා පොරෝනා ඇරූහෙයින්ද මාලාගන්ධාදි භූෂනයක් නැතිහෙයින්ද කිලුටුවූ ශරීර ඇතියේ; යෙ ඉමෙ, යම් මේ තාපස්වී වරයෙනෙක් ඇද්ද ඔහු; මන්තෙත ජපන්ති, මන්ත්‍ර ජපහෙරෙද්ද; භාවී නු, කිමෙක්ද; මානුසකෙ, මනුෂ්‍ය ලොකයෙහි; පයොගෙ, ප්‍රයොග යෙහි; ඉදං විදූ, මෙලොව දන්නාවූ හෙවත් මනුෂ්‍යයන් විසින් කතීව්‍ය ප්‍රයොගයෙහි සිට මෙලොව දැන; එතෙ, මොහු; අපායා, අපායෙන්; පරිමුත්තා, විනිර්මුක්තයෝද.

850 පාපානි කම්මානි කත්වාන රාජ
බහුස්සුතොා වෙ න විරෙය්‍ය ධම්මං
සහස්සවෙදෙපි න තං පටිච්ච
දුක්ඛා පමුඤ්චෙ චරණං අපත්වා.

රාජ, රජ; වෙ, ඉදින්; බහුස්සුතොපි, බහුශ්‍රුතයෙකුදු; පාපානි, ලාමකවූ; කම්මානි, කර්මයන්; කත්වාන, කොට; ධම්මං, ධර්මය; න විරෙය්‍ය, නොහැසුරුනේවිනම්; සහස්සවෙදෙපි, සහශ්‍රවෙදයාද මම බහුශ්‍රුතයෙමිසි ත්‍රිවිධ සුචරිත ධර්මයන් නොහැසිර පාපරාශියම කෙරේද හේ; තං පටිච්ච, ඒ බහුශ්‍රුත්‍යය නිසා; චරණං, ශීලය හා සමඟ අෂ්ටවිධ සමාපත්තියට; අපත්වා, නොපැමිණ; දුක්ඛා, දුඃඛයෙන්; න පමුඤ්චෙ, නොමිදෙන්නේමි.

851 සහස්සවෙදෙපි න තං පටිච්ච
දුක්ඛා පමුඤ්චෙ චරණං අපත්වා
මඤ්ඤාමි වෙදා අඵලා භවන්ති
සසඞ්ඛාරං චරණඤ්ඤාව සච්චං.

සහස්සවෙදෙපි, සහශ්‍රවෙදයාද, චරණං අපත්වා, චරණයට නොපැමිණ; තං පටිච්ච, ඒ බාහුශ්‍රුත්‍යය හෙතුකොට ගෙන; දුක්ඛා, දුක්ඛයෙන්; න පමුංචෙ, නොමිදෙන්නේද එහෙයින්; වෙදා, වෙද යෝ; අඵලා, නිෂ්ඵලවූවාහු; භවන්ති, වන්නාහුයයි; මඤ්ඤාමි, එසේමැයි; සසඞ්ඛාරං, ශීලය සහිතවූ; චරණඤ්ඤාව, චරණයම; සච්චං, එක් සත්‍යයෙකි.

852 නහෙව වෙදා අඵලා භවන්ති
සසඤ්ඤමං චරණඤ්ඤව සච්චං
කිත්තිං හි පපොති අධිචව වෙදෙ
සන්තිං පුනෙති චරණෙන දන්තො ති.

වේදා, වෙදයෝ; අඵලා, නිප්ඵලවූවාහු; නහෙව භවන්ති, නොම වන්නාහ; සසඤ්ඤමං, ශීලය සහිතවූ; චරණං එව, චරණ ධම්මසඞ්ඛ්‍යාත සමාපත්තියම; සචවං, උත්තමය ඒ එසේමැයි; වෙදෙ, වෙදයන්; අධිචව, ඉදුරා; කිත්තිං, කීර්තියට; පපොති, පැමිනෙයි; පුන, නැවත; චරණෙන, චරණ ධම්මය කරණකොට ගෙන; දන්තො, දැමුනේ; සන්තිං, නිර්වානයට; පපොති, පැමිනෙයි—වෙදදි ශාස්ත්‍රාඩ්‍යයනයද මෙලොව කීර්තියට පමුණුවන හෙයින් නිෂ්ඵල නොවෙයි එසේ හෙයින් හැදෑරීමද යහපත ශීල යෙහි පිහිටාගෙන සමාපත්ති ධම්මයන් ආසන්න කාරණකොට ඇති විදර්ශනා වැඩුයේද අත්‍යන්ත ශීතලවූ නිර්වානයට පැමිනෙන්නේය එසේ හෙයින්ම බහුශ්‍රැත්‍යයද යහපත සිල්පයද යහපතැයි දෙකම අර්ථවත් කළෝ.

375 මෙඝතෙතු ජාතකය.

---

853 පඞ්කා ච කාමා පලිපා ච කාමා
භයඤ මෙතං තිමූලං පවුත්තං
රජෝ ච ධූමොච මයා පකාසිතා
හිත්වා තුවං පබ්බජ බ්‍රහ්මදත්ත.

බ්‍රහ්මදත්ත, බ්‍රහ්මදත්තය; කාමා, කාමයෝ නම්; පඞ්කා ච, පඞ්කයය; කාමා, කාමයෝ නම්; පලිපා ච, මඩපතරය එසේ හෙයින් මේ කාමයන්; තිමූලං, තුන්මූලකින් පිහිටියා මෙන්ද අචලවූ; එතං, මෙය; භයං, මහාභයකැයි; පවුත්තං, කියනලදි; රජොච, රජසද; ධූමොච, ධූමයද; මයා, මා විසින්; පකාසිතා, ප්‍රකාශකරනලදි; හිත්වා, මෙකී නුගුණ ඇති කාමයන් හැර, තුවං, තෝ; පබ්බජ, පැවිදිවව—යම්සේ දියෙහි පිහිටන්නහු එහි තෘණ සෙවාලාදියෙහි ලග්නව විනාශයට යේද එපරිද්දෙන් සංසාර සාගරය එතරවන යොගාවචරයා තෙමේ පඤ්චකාමයෙන් බැඳී විනාසයට යේනුයි කියා කාමයෝ පඞ්කතාම් වන්නාහ කදිමයෙහි ගැළුනු සූකරයා එහි ගලාවිනාශ කෙරේද එපරිද්දෙන් කාමයෝද

නමින් කෙරේ ගැලුහුවුන් සසර ගලා නැහ නොදෙස්නුසි පලිප නමුදුවන්නාහ මෙලොවද පරලොවද සියලුභවයටද දෙතිස් කම් කටුලටද නව අනුවක් ව්‍යාධියටද ප්‍රාප්තවූවාහුගේ භයටද ප්‍රත්‍යය නුසි මේ කාමයන්ම මහා භයෙහා එක්වූවහුගේ කලුෂ කරවන හෙයින් රජසය ගුණ ඇත්තවුන්ගේ ගුණ නසන්නේ මේ ආදි කාම ගුණ අසා දැන ඒ කාමයන් හැර බ්‍රහ්මදත්තාය වහා මහණව හන්නැයි අවවාද කළෝ.

854 ගථිතෝ ච රත්තෝ ච අධිමුච්ඡිතෝ ච
කාමෙසුවහං බ්‍රාහ්මණ භිංසරූපං
තං නුස්සහෙ ජීවිකත්ථෝ පහාතුං
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; කාමෙසු, කාමයෙහි; ගථිතොව, ග්‍රථිතවූ; රත්තොව, රක්තවූ; අධිමුච්ඡිතොව, අතිසයෙන් මූර්ඡාවූ; ජීවිකත්ථෝ, ජීවිකාවෙහි අර්ථිවූ; අහං, මම; භිංසරූපං, භයපත් සවරූප ඇති; තං, විවිධකාමයා; පහාතුං, හරණට, න උස්සහෙ, නොපොහොසත්මි, බලඑකෙක් ඇත්; අනප්පකානි, නොමදවූ; පුඤ්ඤානි, පුණ්‍යයන්; කාහාමි, කෙරෙමි.

855 යෝ අත්ථකා මස්ස හිතානුකම්පිනෝ
ඔවජ්ජමානෝ න කරෝති සාසනං
ඉදමෙව සෙය්‍යෝ ඉති මඤ්ඤමානෝ
පුනප්පුනං ගබ්භමුපෙති මන්දෝ.

අත්ථකාමස්ස, වැඩකැමතිවූ; හිතානුකම්පිනෝ, හිතසිතින් අනුකම්පාකරන්නාහු විසින්; ඔවජ්ජමානෝ, අවවාද කරනලද; යෝ යමෙක්; ඉද මෙව සෙය්‍යෝ ඉති, මෙබ උතුමැයි; මඤ්ඤමානෝ, සිතන්නේ; සාසනං, අනුශාසනය; න කරෝති, නොකෙරේද; මන්දෝ, අඥාන පුද්ගලයා; පුනප්පුනං, නැවත නැවත; ගබ්භං, මාතෘ; ගර්භයට; උපෙති, පැමිනෙන්නේය.

856 සෝ ඝොර රූපං නිරයං උපෙති
සුභාසුභං මුත්තකරීසපූරං
සත්තා සකාසෙ න ජහන්ති ගිද්ධා
යේ හොන්ති කාමෙසු අවීතරාගා.

සුභාසුභං, (සංසාරයෙහි භයපත්වූ යොගාවචර) ශුභඝන්ට අශුභවූ; මුත්තකරීසපූරං, මූත්‍රකරීසදෙකින් පිරුනු; ඝොරරූපං,

දරුනුවූ සවරූප ඇති; නිරයං, මාතෘඝාති සඞ්ඛ්‍යාත නරකයට; උපෙති, පැමිනෙන්නේය; යෙ, යම් කෙනෙක්; කාමෙසු, කාම යෙහි; අවීතරාගා හොන්ති, අවීතරාගයෝද; ගිධා, කිලිනනයෝද; සත්තා, ලගනයෝද ඔහු; සකායෙ, ඒ මාතෘඝාති සඞ්ඛ්‍යාතවූ වාසය, න ජහන්ති, නොහරිත්.

857 මීළෙහන ලිත්තා රුහිරෙන මක්ඛිතා
සෙමෙහන ලිත්තා උපනික්ඛමන්ති
යං යං හි කායෙන ඵුසන්ති තාවදෙ
සබ්බං අසාතං දුඛමෙව කෙවලං.

858 දිසවා වදාමි නහි අඤ්ඤතො සවං
පුබ්බෙ නිවාසං බහුකං සරාමිති.

මීළෙහන, අසුචින්, ලිත්තා, ලිපාවූ; රුහිරෙන, රුධිරයෙන්; මක්ඛිතා, වැකුනාවූ; සෙමෙහන, සෙමින්; ලිත්තා, ලිපාවූ සත්වයෝ; උපනික්ඛමන්ති, නික්මෙන්නාහුද; යං යං හි, යමක් යමක් වනාහි; කායෙන, ශරීරයෙන්; ඵුසන්ති, නික්මෙන වේලෙහි ස්පර්ශකෙරෙද්ද; සබ්බං, ඒසියල්ලම; තාවදෙ, එවිගසම; අසාතං, අමධුරය; කෙවලං, හුදෙක්; දුඛමෙව, දුක්මැයි.

අඤ්ඤතො, ශ්‍රමණ බ්‍රාහ්මණාදි අනිකාක්හු කෙරෙන්; සවිං, අසා; නහි වදාමි, නොම කියමි—අනික් කෙනකුන් කෙරෙන් අසා කියන දෙයෙක් නොවෙයි වැලිකෙසේද යත්? පුබ්බනිවාසං, පෙරවිසූ කඳපිළිවෙළ යයි කියන ලද පූර්වනිවාසය; බහුකං, බොහෝ කොට හෙවත් කප්ලක්ෂයක් අධිකකොට ඇති දෙයාසඞ්ඛ්‍යයක්කප්; සරාමි, සිහිකෙරෙමි—පූර්ණියටම සම්බන්ධයි, අපරාධිය සර්ඥයන් වදාළේ.

859 චිත්‍රාහි ගාථාහි සුභාසිතාහි
දරිමුඛො නිජ්ඣාපයි සුමෙධන්ති.

දරිමුඛො, (ඔහණෙනි) දරිමුඛ පසේබුදුරජතෙම; චිත්‍රාහි, විසිතුරුවූ; සුභාසිතාහි, මනාකොට කියනලද; ගාථාහි, ගාථායෙන්; සුමෙධං, මනාවූ නුවන ඇති රජු; නිජ්ඣාපයි, තමාගේ වචන ගැන්වී.

376 දරිමුඛ ජාතකයයි.

---

860 කා කොලා කාකසඞ්ඝා ච මයඹ පතතං ගිරිං
සබ්බව සදිසා හොම ඉමං ආගම්ම පබ්බතං.

කාකොලා, වන කවුඩුවෝද; කාකසඞ්ඝාව, ප්‍රකෘතිකවුඩුවෝද; පතතං වරු, පක්ෂිරාජවූ; මයඹ, අපිද යන; සබ්බව, හැමදෙනම, ඉමං පබ්බතං, මේ පර්වතයට; ආගම්ම්, පැමිණ; සදිසා හොම; සම්වම්හ.

861 ඉධ සීහා ව්‍යග්ඝා ච සිගාලා ච මිගාධමා
සබ්බව සදිසා හොනති අයං කො නාම පබ්බතො.

ඉධ, මේ පර්වතයෙහි; සීහා, සිංහයෝද; ව්‍යග්ඝා ච, ව්‍යාඝ්‍රයෝද; මිගාධමා, මෘගාධමවූ; සිගාලා ච, ශෘගාලයෝද; සබ්බව, හැමදෙනම; සදිසා හොනති, සදෘශවෙති; අයං පබ්බතො, මේ පර්වතය; කො නාම, කෙ නම්ද.

862 ඉමං නෙරුනි ජානන්ති මනුස්සා පබ්බතුත්තමං
ඉධ වණ්ණඤ්ච සම්පන්නා වසන්ති සබ්බපාණිනො.

ඉමං පබ්බතුත්තමං, මේ පර්වතොත්තමයා; මනුස්සා, මනුෂ්‍යයෝ; නෙරුනි, සවණ්ණපර්වතයයි කියා; ජානන්ති, දනිති; ඉධ, මේ පර්වතයෙහි; සබ්බපාණිනො, සිඟලු ප්‍රාණීහු; වණ්ණඤ්ච සම්පන්නා, වර්ණයෙන් සම්පන්නව; වසන්ති, වාසය කරන්නාහුයි.

863 අමානනා යත්ථ සියා සන්තානං වා විමානනා
හීනසම්මානනා වාපි න තත්ථ වසති වසෙ.

යත්ථ, යම් තැනෙක්හි; සන්තානං, සත්පුරුෂයන්ට; අමානනා, අසම්භාවනාව හෝ; වා, නොහොත්; විමානනා, අවමාන්‍ය හෙයින් විමානන හෝ; හීන, හීනයන්; සම්මානනා වා අපි, සම්මාන්‍යයෙ හෝ; සියා, වන්නීද; තත්ථ, එහිලා; වසති, විසීමද; න වසෙ, නොව සන්නේය.

864 යත්ථාලසෝ ච දුක්ඛා ච සූරෝ භීරු ච පූජියා
න තත්ථ සන්තෝ නිවසන්ති අවිසෙසකරෙ නගෙ.

යත්ථ, යම් තැනෙක්හි; අලසොව, අලසයාද; දුක්ඛාව, දුඃඛයාද; සූරොව, සූරයාද; භීරුව, භීරුද යන මොහු; පූජියා, පූජ්‍යයෝද; අවිසෙසකරෙ, විශෙෂ විභාගයක් නොකරන; තත්ථ නගෙ, ඒ පර්වතයෙහි; සන්තෝ, සුජනයෝ; නනිවසන්ති, නොවසන්නාහුයි

865 නාසං නෙරු විභජති හීනමුක්කට්ඨමජ්ඣිමේ
අවිසෙසකරෙ නෙරු ගණ්හ නෙරුං ජහාමසෙති.

අයං නෙරු, මේ සවණ්ණ පළිතය; හීන, හීනය; උක්කට්ඨ, උත්කෘෂ්ටය; මජ්ඣිමෙ, මධ්‍යමය ඝන සියල්ලන්; නවිභජති, විභාග නොකෙරෙයි; නෙරු, මේසවණ්ණ පළිතය; අවිසෙසකරෙ, විශෙෂ විභාගයක් කරන්නේ නොවෙයි; ගණ්හ, එබැවින්; නෙරුං, සවණ්ණ පළිතය; ජහාමසෙ; හරිමු.

877 නෙරු ජාතකයයි.

---

866 ආසාවතී නාම ලතා ජාතා චිත්තලතා වනෙ
තස්සා වස්සසහස්සෙන එකං නිබ්බත්තතෙ ඵලං
තං දෙවා පසිරුපාසන්ති තාව දූරඵලෙ සති.

චිත්තලතාවනෙ, චිත්‍රලතාවනයෙහි; ආසාවතී නාම, ආසාවතී නම්වූ; ලතා, ලතාවක්; ජාතා, හටගත; තස්සා, ඇගේ; වස්ස සහස්සෙන, අවිරුද්ද දහසකින්; එකං, එක්; ඵලං, ඵලයෙක්; නිබ්බත්තතෙ, උපදනේය; තාව, ඒතාක්; දූරඵලෙ සති, දූරඵල ඇත්තාවූ; තං, ඒ ලතාවට; දෙවා, දෙවතාවෝ; පසිරුපාසන්ති, නැඹත නැඹත එළඹෙත්.

867 ආසිංසෙව තුවං රාජ ආසා ඵලවතී සුඛා
ආසිංසෙථෙව සො පක්ඛී ආසිංසෙථෙව සො ජිජෝ

රාජ, රජ; තුවං, තොද; ආසිංසෙව, (ආසිංසා එව) ආසාවෙජ්ද සක් නොකරසි සේයි; ප්‍රාර්‍ථනාමකර; ඒ එසේමැයි; ඵලවතී; ඵලවත් වූ; ආසා, ආසාතොම; සුඛා, සුවයි; සො පක්ඛී, හේ පක්ෂීතෙම; ආසිංසෙථෙව, ප්‍රාර්‍ථනාකරන්නේමය; සො ජිජෝ, ඒ විජයා; ආසිං සෙථෙව, ලබමියි පතන්නේමය; මෙනම් මෙනම් ලැබෙයි ආසා චෙජ්දය නොකරන්නේයයි සේයි.

868 තස්ස වාසා සම්පජ්ජිත්ථ තාව දූර ගතා සති
ආසිංසෙව තුවං රාජ ආසා ඵලවති සුඛා.

තස්ස, ඔහුගේ; තාව, ඒතාක්; දූරගතාසති, දූරගතවූද; ආසා, ආසාතොම; සම්පජ්ජිත්ථ, සමෘඬ්ධිමය එසේ හෙයින්; රාජ, රජ; තුවං, තොද; ආසිංසෙව, ප්‍රාර්‍ථනාමකර; කුමක් දෙයින්ද යත්; ඵලවති,

ඵලවත්වූ; ආයෝ, ප්‍රාර්‍ථනාතොමෝ; සුඛා, සුවසි—මහරජ එක්තෝ සෙක් පොවා පියුම් විලෙකින් ගොදුරුගෙන පළිතයක් මුදුනේ හුන්නේ මේ පළිතයෙන් නොබැස මෙසේම හිඳ ගොදුරුකා මේ තෙනම හිඳ කරදික්නොට පැන් බීම් තම් යෙහෙයැයි සිතීය එ ද වස්ම ශක්‍රයා අසුර නිම්මථනය කොට ත්‍රයත්ත්‍රිංසත් භවනයෙහි එකාතපත්‍රබවට පැමිනියේ මාගේචිත්තාව මසතකප්‍රාපනීය අනික් කවරක්හුගේ මනඃ කල්පනාව අසමඃඩේයි බැලූයේ තොකු දැක මුගේ ආසා බඤ්ඤනය මසතක ප්‍රාපනකෙරෙයි ඌ උන් පළිතයට සමීප දෙශයෙහි මහොඤයක් නිම්මානය කොට පළිතාග්‍රයෙන්ම හෙයිල හේ කොකාද සිතූ පරිද්දෙන් ගොචරාග්‍රහවකොට පැන් බී එදවස් ඒ පළිතයෙහි විසීම ලැබෙයි මේ කථාව ගෙන හැර "ආසිං සෙථෙව සො පක්ඛි" යනාදීන් දෘෂ්ටානෙතාපනාසය කොට රජ්ජුරුවන් උතසාහවත් කලහ.

869 * සමෙපසි ඛො මං වාචාය නව සංපෙසි කම්මුනා
මාලා සෙරෙය්‍ය කසෙසව වණණවන්නා අගඤ්ඡා

අගඤ්ඡා, නිගීඤ්ඡවූ; වණණවන්නා, සොභාවත්වූ; සෙරෙය්‍ය කසස, මාරි වෘක්ෂයාගේ; මාලා ඉව, මල් පරිද්දෙන්ම; මං, මා; වාචාය ඛො, වාක්මාත්‍රයකින්; සමෙපසි, ඥානඡිනය කෙළෙහි; කම්මුනා, කායකර්මාදි ක්‍රියාවකින්; න සංපෙසි, නොමසඥානඡිනය කෙළේයි.

870 අථලං මධුරං වාචං යො මිත්තෙනසු පකුබ්බති
අදදං විසසජං හොගං සඤ්ඤ තෙනසස ජීරති.

යො, යමෙක්; අදදං, නොදෙන්නේ; හොගං, හොගය; අවිසස ජං, නොහරනේ; මිත්තෙනසු, යාලුවන්කෙරෙහි; අථලං, නිෂ්ඵලවූ; මධුරං, මියුරුවූ; වාචං, තෙපලක්; පකුබ්බති, කෙරේද; තෙන, ඔහු හා සමඟ; අසස, ඔහුගේ; සඤ්ඤ, මිත්‍ර සඥාවය; ජීරති, නො ගැලපේ.

871 යඤ්හි කයිරා තඤ්හි වදෙ යං න කයිරා න තං වදෙ
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා

යං හි, යමක් වනාහි; කයිරා, කරන්නේද; තංහි, හේ වනාහි; වදෙ, කියන්නේය; යං, යමක්; න කයිරා, නොකරන්නේද; තං, ඒ; න වදෙ, නොකියන්නේය; අකරොන්තං, සොරෙම් දෙම් කියා නොකරන්නාවූ නොදෙන්නාවූ; භාසමානං, අකාල මෙඝයක්සේ

---

* සංසෙසි—මරම්ම.

නොකරන නොදෙන දෙය කෙරෙමි දෙමි ව්‍යාජිතෙපුල් බණන් නහු; පණ්ඩිතා, නුවණැත්තෝ; පරිජානන්ති, දනිත්; යහපත් කොට ඌ හැඳින ගන්නාහු යි සේසි.

872 බලඤ්ච වත මේ ඛීණං පාථෙය්‍යං ච න විජ්ජති
සඞ්ඛෙ පාණුපරොධාය හඤ්ඤති වජාමිහං

එත, එකාන්තයෙන්; මෙ, මාගේ; බලඤ්ච, බලයද; ඛීණං, ක්ෂීණය; පාථෙය්‍යංච, මාගොපකරණයද; න විජ්ජති, නැත; එසේ හෙයින්; පාණුපරොධාය, ප්‍රාණයාගේ උපරොධයෙහි හෙවත් මෙහිම මාගේ ජීවිත විනාශය; සඞ්ඛෙ, සාඩ්කා කෙරෙමි; හඤ්ඤ, එබැවින්; ඉදානි, දැන්; අහං, මම; වජාමි, හැරයෙමි.

873 එතදෙවහි මෙ නාමං යං නාමසම්මං රථෙසභ
ආගමෙහි මහාරාජ පිතරං ආමන්තයාමහන්ති.

රථෙසභ, රාජෝත්තමය; අසම්මං හි, මෙහිලා; යං නාමං, යම්බදු නමක් ඇත්තේද; මෙ, මාගේ; එතංඑව, මේ වනාහි; නාමං, නාමය වේ; මහාරාජ, මහරජ්ජුරුවෙනි; ආගමෙහි, බලව; අහං, මම; පිතරං, පියා; ආමන්තයාමි, කැඳවමි.

378 ආසඞ්ක ජාතකයයි.

---

874 න මෙ රුච්චි මිගාලොප යස්ස තෙ තාදිසි ගති
අතුච්චං තාත පතසි අභූමිං තාත සෙවසි.

මිගාලොප, මිගාලොපය; යස්ස තෙ, යම්බදුවූ තාගේ; ගති, ගමන; තාදිසි, එබඳුද ඒ ගමන; මෙ, මට; න රුච්චි, අභිමතනොවිය; තාත, පුත; අතුච්චං, (සෙසු ගිජුලිහිණියන්ගේ සීමා ඉක්මවා) අන්‍යන්‍යා දෙසයට; පතසි, යෙහි; තාත, පුත; අභූමිං, තට නුසුදුසු භූමිය; සෙවසි, සෙවිනෙහි.

875 වතුක්කණ්ණංව කෙදාරං යදා තෙ පථවී සියා
තතො තාත නිවත්තස්සු මාස්සු එතෙනා පරං ගමි.

යදා, යම් කලෙක්හි; තෙ, තට; පථවී, සියලු මුළු පොළොව; චතුක්කණ්ණං කෙදාරං ඉව, සිව්රැස් ලියද්දක් පරිද්දෙන්; සියා, වූද; මෙසේ ක්ෂුද්‍ර වූවාමෙන් පැනේද; තාත, පුත; තතො, එසේ

පැනෙන සථානයෙන්; නිවත්තස්සු, නවතු; එතෙතා පරං, එසේ පැනෙන තැනින් ඔබ්බට; මා ගමි, නහමක් යා. ("අස්සු" යනු නිපාත මාත්‍රයකි.)

876 සනති අඤ්ඤපි සකුණා පතතයානා විහඩගමා
අකකිතතා වාතවෙගෙන නඬා තෙ සසසතී සමා

පතතයානා, පියාපත් යානාකොට ඇත්තාවූ; විහඩගමා, ආකාශයෙන් යන්නාවූ; අඤ්ඤපි සකුණා ,සෙසු පක්ෂීහුද; සනති, විද්‍යමානයහ; තෙ, ඔහුද; වාත වෙගෙන, පවන් වෙගයෙන්; අකකිතතා, අපගේ සීමාතික්‍රාන්තාව හිය හෙයින් අදනා ලදුව නටහ; සසසතී සමා, ධරණීතලය පළිතය හා සමානකොට ආතමතකීතය කරන ඔහු පොවා; නඬා, (තමන්ගේ හවිරුදු දහසක් පමණ ආයු නොවළඳ, අතුරෙහිම) නටහ.

877 අකතවා * අපරණණසස ‡ පිතුවඩඪස්ස සාසනං
කාලෙ වාතෙ අතික්කමම වෙරම්බානං වසං අගා:

අපරණණසස, අපරණ්ණ නම්වූ; වඩඪස්ස, වැඩිමහලුවූ; පිතු, පියාගේ; සාසනං, අනුශාසනය; අකතවා, නොකොට; කාලෙ වා තෙ, කෘෂණවාතය; අතික්කමම, ඉක්මගෙන; වෙරම්බානං, වෙරම්බවාතයන්ගේ; වසං, වසඟබවට; අගා, ගියේ.

878 තසස පුතතා ච දුරූ ච යෙවඤ්ඤා අනු ජීවිනො
සබබෙ ව්‍යසනමාපාදුං අනොවාදකරෙ විජෙ.

විජෙ, ඒ මෘගාලොපනම් විජයා; අනොවාද කරෙ, අවවාදය නොකරන කල්හි හෙවත් පියාණන්ගේ අවවාදවූ පරිද්දෙන් නොපවත්නා කල්හි; තසස, ඒ අවවාදයෙන් මිරිකීමට නොගිය ගිජඣායාගේ; පුතතාව, පුත්‍රයෝද; දුරුව, දුරයෝද; අඤ්ඤා, පුත්‍රදුරයන් හෙරෙන් අන්‍යවූ; අනුජීවිනොව, ඔහු නිසා ජීවත්වන ජනයෝද ඝන;සබබෙ, හැමදෙනම; ව්‍යසනං, පිඩාවට; ආපාදුං, පැමිණියෝද;

879 එවමපි ඉධ වඩානං යො වාකයං නාව බුජඣති
අතිසීමං චරෙ දිතෙතා ගිජ්ඣොවාතීතසාසනො
සබබෙ ව්‍යසනං පපෙපාතති අඤ්ඤා වඩඪසාසනාති

එවං, මෙපරිද්දෙන්; යො අපි, යමෙක් වනාහි; ඉධ, මෙලෙම්හි ලා; වඩානං, ගුණතුවනින් වැඩිහිටියන්ගේ; වාකයං, තෙප්ල; නාව

* අපණඤඤස්ස මරම්ම.
‡ වුඩඪස්ස මරම්ම.

බුජ්ඣති, අවබුධ නොකෙරේද හෙවත් මෙම ශ්‍රෙයසෙකැයි නොගනීද ඔහු; අතීතසාසනා, ඉක්මුනු අනුශාසනා ඇති; දිට්ඨා, ගර්විෂ්ටවූ; අතිසිමවරෝ, තමාහට ප්‍රතිනියත සීමා ඉක්මවා ඇසුරුණු; ගිජ්ඣෝ ඉව, මෘගාලෝප නම් ගිජ්ඣයා මෙන්; සබ්බං, හැම දෙනම; වඩ්ඪාසනං, වැඹිමහල්ලන්ගේ අනුශාසනය; අකත්වා, නොමකාට; ව්‍යසනං, පිඹාවට; පපෙපානති, පැමිනෙත්.

379 මිගාලෝප ජාතකයයි.

---

880 කානු කාලෙන වණ්ණෙන න චාපි පියදස්සනා
කා වා තුවං කස්ස වා සීතා කථං ජානෙමු තං මයං.

කාලෙන වණ්ණෙන, ශරීර වස්ත්‍රාභරණයන්ගේ නීලවර්ණයෙන් යුක්තායෙහි; න චාපි පියදස්සනා, නොද ප්‍රියවූ දර්ශනා ඇත්තෙහි බලන්නට අප්‍රියයෙහි සේසි;එසේවු තෝ; කානු, කවරක්හිද; තුවං, තෝ; කා වා, කාවරක්ද; කස්ස වා සීතා, කවරක්හුගේ දුවෙක්ද; මයං, අපි; තං, නී; කථං ජානෙමු, කෙසේ දනුමෝද; කවරකැයි කියා හැඳිනගනුමෝදැයි සේසි.

881 මහාරාජස්සහං සීතා විරූපක්ඛස්ස වණ්ඩියා
අහං කාලී අලක්ඛිකා කාලකණ්ණීති මං විදූ
ඔකාසං යාචිතෝ දෙහි වසෙමු තව සන්තිකෙ.

විරූපක්ඛස්ස, විරූපාක්ෂ නම්වූ; මහාරාජස්ස, මහාරාජයාගේ; අහං, මම; සීතා, දුවනියෙමි; චණ්ඩියා, ක්‍රෝධ සභාවයෙන් චණ්ඩී නම් ඇත්තෙමි; කාලී, කෘෂ්ණයෙමි; අලක්ඛිකා, අධන්‍යයෙමි; මං, මා; කාලකණ්ණීති, කාලකණ්ණියයි; විදූ, (සව්මහාරජයේ ඇත්තෝ) දනිති; යාචිතෝ, ආරාධනා කරන ලද්දෙහි; ඔකාසං, මට අවකාශයක්; දෙහි, දෙව; තව සන්තිකෙ,(අද මේ එක රැ)තා පමිපයෙහි; වසෙමු, වසමි.

882 කිං සීලෙ කිං සමාචාරෙ පුරිසෙ නිවසසෙ තුවං
පුච්ඡා මෙ කාලි අක්ඛාහි යථා ජානෙමු තං මයං.

කිං සීලෙ, කෙබඳු සිල් ඇති; කිං සමාචාරෙ, කෙබඳු සමාචාර ඇති; පුරිසෙ, පුරුෂයා කෙරෙහි; තුවං, තෝ; නිවසසෙ,වෙසෙහිද;

කාලී, කාලිය; මේ, මාවිසින්; ප්‍රඥා, විචාරණ ලද්දෙහි; අකඛාහී, කියව; මයං, අපි; හං, තී; යථා ජානෙමු, වූ පරිද්දෙන් දනුමෝද එපරිද්දෙන් කිය යි සේසි.

883 මක්ඛී පලාසී සාරම්භී ඉස්සුකී මච්ඡරී සඨො
සො මය්හං පුරිසො කාණෙහා * ලඛං යසස විනසසති

මක්ඛී, යම් පුරුෂයෙක් කඩෙකින් දිය ගිඳිනක්හුයේ කළ ගුණමකාද, පලාසී, ප්‍රකෘතවචනයක් කී කල්හි කිමෙක්ද මම නොදනිම් දැයි ප්‍රගල්භාහසෙරේද; සාරම්භී, කාරණොත්තරිය සඞ්ඛ්‍යාත සාරම්භයෙරේද-බිණුවවුට බෙණෙම් ගැසුවවුට ගසමි දුස්ප්‍රවෘත්ති ඇතිව වෙසේ දැයි සේසි; ඉස්සුකී, අනුන්ගේ වසතුප්‍රාප්ති ලාභයෙහි තුෂ්ටනොවේද—අපූර්‍ව වසතු මටම වේවයි අනුන්ට නොවේවයි සිතාදැයි සේසි; මච්ඡරී, සඞ්ඝසම්පත්තිය ගෙන යමෙක් මෙර මාට තෘණාග්‍රයෙනුදු තෙල්බිඳුවක් පමණත් නොදේද; සඨො, යමෙක් කෙරුවිසා ලක්ෂණයෙන් ප්‍රකෘතව තමාසතුදෙය මෙරමාට නොදී ඒ ඒ උපායෙන් අනුන්ගේ අයත්දෙයම කාදැ; යසස, යම්කු ගේ; ලඛං, ලබන ධන ධාන්‍යය; විනසසති, විනාශවේද හෙවත් යම් පුරුෂයෙක් සත්‍රීධූර්‍තව අක්ෂධූර්‍තව සුරාධූර්‍තව ලද ලද දෙය නසාද මෙකිගුණයෙන් ප්‍රකෘත; සො පුරිසො, හේ පුරුෂයා; මය්හං, මට; කාණෙහා, ප්‍රියය—මෙබදු පුරුෂයා කෙරෙහිම සිතින් වසන්නේ යයි කිවු.

884 කොධනො උපනාහි ච පිසුණො ච විහෙදකො
?අඩකවාචො ඵරුසො සො මේ කාණතතරො තතො.

කොධනො, යමෙක් මඳකින් කිපේද; උපනාහී ච, යමෙක් මෙරමා කළ අපරාධයයි සිත්හි තබා බොහෝ කලකිනුදු ඕහට අනර්‍ථකෙරේද; පිසුණො ච, යමෙක් කෙලාම් කියා ප්‍රියයන් භින්න කෙරේද; විහෙදකො, යමෙක් මඳකින් මිත්‍රයන් බිඳිනා සුලුද; අඩකවාචො, යමෙක් දෙඅසඝිත තෙප්‍රල් ඇත්තේද; ඵරුසො, යමෙක් ක්‍රූරතෙපුල් ඇත්තේද; සො, හේ මෙකී ගුණඇති පුරුෂයා; තතො, ඒ යටකී ගුණ ඇති පුරුෂයාට වඩා; කාණතතරො, අතිසයින් ප්‍රියයි.

---

* ලඛං යසං-ම්‍රම්ම.
? කාණ්ඨඛාණොවා-ම්‍රම්ම.

885 අජ්ජ්සුවෙහි පුරිසෝ සදත්ථං නාව බුජ්ඣති,
ඔවජ්ජමානෝ කුප්පති සෙය්‍යං සෝ අතිමඤ්ඤති.

පුරිසෝ, පුරුෂයා; අජ්ජ්,අද මේ කටයුත්තේය; සුවෙ හි, සෙට කටයුත්තේයයි; සදත්ථං, සවකාර්‍යය; නාව බුජ්ඣති, නොදනිද හෙවත් අද හෙරෙමි සෙට හෙරෙමි තමාගේ කෘෂිවණිජ් ආදි කතීව්‍යයෙහි ප්‍රමාදද; ඔවජ්ජමානෝ, දන්නවුන් විසින් අවවාද කරනුලබන්නේ; කුප්පති, මූලා අපට අවවාද කරන්නේයයි කිපේද; සෝ, හේ;සෙය්‍යං, ජාති කුල ගොත්‍ර ප්‍රදෙස සිලාචාරාදීන් විසින් තමාට වඩා උත්තමයා; අතිමඤ්ඤති, හේ මා හා සමවෙයි ඉක්මපවතිද;

886 දවපපලඛෝ පුරිසෝ සඛ්ඛම්තෙනහි ධංසති
සෝ මයහං පුරිසෝ කන්තෝ තසම්ං හොමි අනාමියා:

දවපපලඛෝ, රූපාදීවූ පවත්තාම ගුණයෙහි නිරන්තරයෙන් ප්‍රවෘත්තදවසංඛ්‍යාත ජනූරාගයෙන් අභිභූතවූ; පුරිසෝ, පුරුෂයා; සඛ්ඛම්තෙනහි, තොප විසින් මට කුමක් කරතලද දැයි යන්නාදි වසයෙන් සියලු මිත්‍රයන් හෙරෙන්; ධංසති, පිරිහේද; සෝ පුරිසෝ, (මෙබඳු ගුණෙන් යුක්ත)හේ පුරුෂයා;මයහං, මට; කන්තෝ, ප්‍රියයා; තසම්ං, මෙබඳු ගුණ ඇති ඔහු හෙරෙහි; අනාමයා හොමි, නිදුස් ඛනිස්සොකීවෙමි මොහු ලදින් අනික් තැනක නිරුලයව සුවසේ වෙසෙමි කිව්.

887 අපෙහි එතෙනා කාලි තුවං තෙතං අමෙහසු විජ්ජති
අඤ්ඤං ජනපදං ගච්ඡ නිගමෙ රාජධානියොති.

කාලී, කාලීය; තුවං, නී; එතෙනා, මෙයින්; අපෙහි, පහව යා; එතං, මේ නී ප්‍රියවූ මඛඛාදී ගුණය; අමෙහසු, අපහෙරෙහි; න විජ්ජති, නැත; අඤ්ඤං, අනික්; ජනපදං, ජනපදයකට හෝ; නිගමෙ, නියම්ගමකට හෝ; රාජධානියෝ, රාජධානියකට හෝ; ගච්ඡ, නැඟී යා; අපි යම් තැනක හොවසමෝද එතැන යා යි සේසි;

888 අහම්පි ඛෝ තං ජානාමි නෙතං තුමෙහසු විජ්ජති
සන්ති ලොකෙ අලඛ්ඛිකා සංඛරන්ති බහුං ධනං
අහං දෙවෝ ච මෙ භාතා උභෝ නං විධමිම්හෙ.

එතං, මේ මට ප්‍රියවූ මඛඛාදිගුණ; තුමෙහසු,තොප හෙරෙහි;න විජ්ජති, නැතැයි; අහම්පිඛෝ, මමද; තං, ඒ; ජානාමි, දනිමි; ලෝ

සෙ, ලොකයෙහි; අලක්ඛිසා, පින්නැත්තෝ; සන්හි, ඇත; බහුං, බොහෝවූ; ධනං, වසතු; සංඝරන්හි, පින් නැති ජනයෝ රැස්කෙරති; තං, ඒධනය; අහං, මම්ද; මෙ, මාගේ, භාතා, බෑවූ; දෙවොව, දෙවසඞ්ඛ්‍යාත දිව්‍යපුත්‍රද යන; උහො, දෙදෙන; විධමාමසෙ, නසමු.

889 කානු දිබ්බෙන වණ්ණෙන පථව්‍යා සුපතිට්ඨිතා
කා වා තුං කස්ස වා ධිතා කථං ජානෙමු තං මයං.

දිබ්බෙන, විශෙෂවූ; වණ්ණෙන, වර්ණයෙන් යුක්තය; පථව්‍යා, ප්‍රථිව්‍යෙහි; සුපතිට්ඨිතා, මනාව පිහිටියාවූ මෝතොමෝ; කානු, කවරක්ද; තුං, තී; කාවා, කවරක්හිද; කස්සවා ධිතා, කවරක්හුගේ දුවක්හිද; තං, තී; මයං, අපි; ඤාථං, කවරකැයි; ජානෙමු, දනුමෝද.

890 මහාරාජස්සහං ධිතා ධතරඨස්ස සිරීමතො
අහං සිරිව ලක්ඛි ච භූරිපඤ්ඤෙති මං විදූ
ඔකාසං යාචිතො දෙහි වසෙමු තව සන්තිකෙ.

සිරීමතො, ශ්‍රීමත්වූ; ධතරඨස්ස, ධ්‍රතරාෂ්ට්‍රනම් ලද; මහාරාජස්ස, මහාරාජයාගේ; අහං, මම; ධිතා, දුවෙක්මි; සිරි ව, ශ්‍රී නම්ද; ලක්ඛි ච, ලක්ෂ්මීනම්වූ යෙම්ද; අහං, මමඅ; මං, මා; භූරිපඤ්ඤෙති, පොළෝසේ විපුලවූ නුවනැත්තී යයි; විදූ, (දිව්‍යලොකයෙහි ඇත්තෝ) දනිති, යාචිතො, යාචඤ්ඤාකරන ලද්දේ; ඔකාසං, අවකාස යෙක්; දෙහි, දෙව; තව සන්තිකෙ, තාගේ සමීපයෙහි; වසෙමු, වෙසෙමු.

891 කිං සීලෙ කිං සමාචාරෙ පුරිසෙ නිවසසෙ තුවං
පුඨා මෙ ලක්ඛි අක්ඛාහි යථා ජානෙමු තං මයං.

ලක්ඛි, ලක්ෂ්මිය; (සෙස්ස 879 වෙනි ගාථාව ලෙස දතයුතුයි.

892 යො වාපි සීතෙ අථ වාපි උණ්හෙ
වාතාතපෙ ඩංසසිරිංසපෙ ච
ඛුධං පිපාසං අභිභුය්‍ය සබ්බං
රතනින්දිවං යො සහතං නියුත්තො
* කාලාගතඤ්ච න හාපෙති අත්ථං
සො මෙ මනාපො නිවසෙම තම්හි.

යො වාපි, යමෙක් වනාහි; සීතෙ, ශීතයෙන්ද; අථවා, නො

* කාලාහතං—සඑහර.

හොත්; උණ්හෙ අපි, උෂ්ණයෙන්ද; ඕහාතපෙ,වාන ආතප දෙදෙනා හෙවත් අව්සුලං දෙකද; ඩංස, ඩැහැ ලේ බොන මැසි මදුරුවන්ද; සිරිංසපෙ, දීඝීජාති සර්පයන්ද; බුධං, ක්ෂුධා දුඃඛයන්ද; පිපාසං, පිපාසා දුඃඛයන්ද යන; සබ්බං, සියළු අසමිහා විසතුන්; අභිභුය්‍ය, මැඩ හෙවත් මෙසියල්ලම තෘණලවයක් කොටද නොගෙන; යෝ, යමෙක්; රත්තින්දිවං, රෑ දවල්; සතතං, නිත්‍යයෙන්; නීයුත්තෝ, තමාගේ කෘෂිවණිජ්ජාදි කර්මාන්තයෙහිද දාන ශීලාදී ක්‍රියායෙහිද සියල්ලෙහි යෙදිනීද හෙවත් එහි තමා යොදූ විසිද; එසේවූයේ; කාලා, කෘෂිවණික් ආදී කර්මාන්ත කාලයෙහිද; ධන පරිත්‍යාග ශීලරක්ෂණ, ධර්මශ්‍රවණාදි කාලයෙහිද යන මේ ආදිවූ ඒ ඒ වසතුන් සැදිය යුතු සමයෙහි; ආගතං, එළඹියිවි; අත්ථං, ප්‍රයොජනය: න හාපෙති, නොපිරිහෙළාද; සෝ, එසේවූ ඒ පුරුෂයා; මේ, මට; මන්තපෝ, ඉෂ්ටදෙවිය; තම්හි, ඔහු කෙරෙහි; නිවසෙම්, වාසය කෙරෙම්.

893 අක්කොධනෝ මිත්තවා වාගවා ච
සිලූපපන්නෝ අසඨෝ උජ්ජුභූතෝ
සඞ්ගාහකෝ සඛිලෝ සණ්හ වාචෝ
මහන්තපත්තොපි නිවාතවුත්ති

තස්මාහං පොසෙ විපුලා හවාමි
ඌම්මිං සමුද්දස්ස යථාපි වණ්ණං.

අක්කොධනෝ, යමෙක් අක්‍රෝධීද; ක්ෂාන්තීන් යුක්තද්දැයි සේසි; මිත්තවා, කල්‍යාන මිත්‍රයන් විසින් යුක්තද; වාගවා, ධනපරිත්‍යාගයෙහි යුක්තද; සීල, ශීලයෙන්; උපපන්නෝ, යුක්තද; අසඨෝ, කෙරුවිකා ගුණයෙන් යුක්තව ගෙන කිසිවක් තමාගෙන් නොදී අනුන් ගැත්තගෙන නොකෑමෙන් අසඨද; උජ්ජුභූතෝ, යමෙක් කායවාරාදියෙන් සෘජුද; සංඛාහකෝ, යමෙක් මිත්‍රසංග්‍රහ ආමිස සංග්‍රහ ධර්මසංග්‍රහ යන මොවුන් කරන්නේද; සඛිලෝ, යමෙක් මෘදුවචන ඇත්තේද; සණ්හවාචෝ, යමෙක් සිලුටු තෙපුල් ඇත්තේද; මහන්තපත්තොපි, යමෙක් ඔහත්වූ සථානාන්තර ඓශ්වර්‍යයට පැමිණියේද; නිවාතවුත්ති, යමෙක් අනුඩතව නිව ප්‍රවෘත්ති ඇත්තේද.

තස්මිං පොසෙ, එබඳුගුණඇති ඒපුරුෂයාකෙරෙහි, සමුද්දස්ස, සමුද්‍රයාගේ; යථා අපි වණ්ණං, යම්සේ වර්ණය බලන්න වුන්ට ඌර්මිං, මතු මත්තෙන් දිවන්නාවූ තරඟමාලා විපුලව වැටහේද එප

රිද්දෙන්; අහං, මම්; විපුලා, විපුලව, භවාමි, වෙමි—යන්නේ මෙහි ගුණ ඇත්තේද; ඔහු කෙරෙහි මූහුදුවණි බලන්නහුට රළපහර විපුලව පෙනෙන්නාසේ ඔහුකෙරෙහි ම බොහෝ සේ පැමිණෙමි කිව්.

894 යො වාපි මිත්තෙ අථ වා අමිත්තෙ
සෙඨෙ සරිකෙඛ අථ වාපි හීනෙ
අත්ථං වරන්නං අථ වා අනත්ථං
ආවි රහො සඞ්ගහමෙව වත්තෙ.

යො වා, යමෙක් වනාහි; මිත්තෙ අපි, මිත්‍රයන් කෙරෙහීද; අථ වා, නොඑහාත්; අමිත්තෙ, සතුරා කෙරෙහිද; සෙඨෙ, තමාට ගුණෙන් නුවණින් ශ්‍රෙෂ්ඨයන් කෙරෙහිද; සරිකෙඛ, තමා හා සදෘශයන් කෙරෙහිද; අථ වා, නොහොත්; හීනෙ අපි; තමාට හීනයා කෙරෙහිද; අත්ථං, තමාට වැඩ; වරන්නං, හැසිරෙන්නාවූද; අථවා, නොහොත්; අනත්ථං, තමාට අනර්ථකරන්නහුවද; යන මෙසේ මිත්‍රාදිභෙදවත් සියලු පුද්ගලයා කෙරෙහි; ආවි, පැමිණි තැන වේවයි; රහො, රහස වේවයි; සංගහමෙව, චතුර්විධ සඞ්ග්‍රහයම; ඒතෙන, පවත්වාද

895 වාචං න විජ්ජා එරිතං කදාචි
මනසා ජීවසා ව තසා හොමි
එතෙසං යො අඤ්ඤතරං ලභිත්වා
කන්නා සිරි මජ්ඣති අපපපඤ්ඤ
තං දිත්තරූපං විසමං වරන්නං
කරීසවාටංව විවජ්ජයාමි.

කදාචි, කිසිකලෙක්හි; එරිතං, ශ්‍රවණ කටොරවූ; වාචං, තෙප්ලක්; නවජ්ජා, නොකියා එසේවූ; මනසා, මලාවූද; ජීවසාව, ජීවත්වන්නාවූද; තසා, ඔහට; හොමි, (සම්ප)වෙමි–යමෙක් එරිත නොබැණ සකල ජනයාට ශ්‍රවණ රමණීයවූ මධුර තෙපුල් බෙණේද ඔහු මළද නොමළද නොහැර ගිය ගිය තැන උඟ සම්පයේ වෙසෙමිසි සේසි—අපපපඤ්ඤ, ප්‍රඥ රහිතවූ; යො, යමෙක්; කන්නාසිරි, කාන්තාශ්‍රියයි සේසි; කන්නං සිරිං, කාන්තවූ ශ්‍රිය; ලභිත්වා, ලදින්; එතෙසං, මේ යව කියනලද සිතොෂණාභිහවනාදී ව්‍යාපාරයෙන් එසෙසා; මජ්ජති, ප්‍රමාද වේද—යමෙක් ශ්‍රී ලදින් ලද ශ්‍රී පමණ, එතෙකින් රැ දුවල් කුමට දුක්ගතිමදැයි කියිවෙක්හි ප්‍රයත්නකොට අසතපුරුෂාදනාදීන් සුඛිතවූයේ ප්‍රමාද වේද—තං, ඒ; දිත්ත

රූපං, උඩත සවරූප ඇති; විසමං වරන්නං, කාය දුශ්චරිතාදීන් විසමව හැසිරෙන්නහු; කරිසවාටං ඉව, කරිසඟල්යක්මෙන් (හෙවත්) කෘතාරී පුරුෂයක් නු අසුචි පිරුණු වළක් පිළිකුල්කරන්නාමෙන්; විවජ්ජයාමි, දුරුහෙරෙමි.

896 අත්තනා කුරුතෙ ලක්ඛිං අලක්ඛිං කුරුතෙත්තනා
නහි ලක්ඛිං අලක්ඛිං වා අඤ්ඤස්ස කාරකොනී.

ලක්ඛිං, ලක්ෂ්මිය; අත්තනා, තමා විසින්ම (පුරුෂයා) තමාටම; කුරුතෙ, කරන්නේය; අලක්ඛිං, අශ්‍රියද; අත්තනා, තමා විසින් තමාටම; කුරුතෙ, කරන්නේය; ලක්ඛිං, ශ්‍රිය වේවයි; අලක්ඛිං වා, අශ්‍රිය හෝ වේවයි; අඤ්ඤස්ස, අනිකාට හට; අඤ්ඤ කාරකො, අනික් කරන්නෙක්; නහි, නැහැ;-ලොකයෙහි එසෙක් එසකුට ශ්‍රී දෙන්නේ නොවෙයි ශ්‍රීත් අශ්‍රීත් වන්නේ තම තමා විසිනි සේසි.

380 ඔදි කාලකණ්ණි ජාතකයයි.

---

897 සුචිත්තපත්තාචජ්දන ලම්බචූළ විහංගම
ඔරොහ දුමසාඛාය මුධා හරියා භවාමි තෙ.

සුචිත්ත, විශෙෂයෙන් චිත්‍රවූ; පත්තචජ්දන, පත්‍රයෙන් කරන ලද සෙවෙනි ඇත්තව; ලම්බචූළ, ඵලෙන සිළක් ඇත්තව; විහංගම, ආකාශචාරිය; දුමසාඛාය, දුමශාඛයෙන්; ඔරොහ, බහු; තෙ, තට; මුධා, කිසිවක් නොගෙණ නිකම්ම; හරියා භවාමි, අඹුවෙමි.

898 චතුපපදූ ඨවං කළ්‍යාණි විපදූහං මනොරමෙ
මිගී පක්ඛී අසඤ්ඤුත්තා අඤ්ඤං පරියෙස සාමිකං.

කළ්‍යාණි, සොහනාව; ඨවං, නී; චතුපපදූ, චතුෂ්පාදයෙහි: මනොරමෙ, මනහර තැනැත්තිය; අහං, මම; විපදෙ, විපාදයෙමි; මිගී, චතුෂ්පදවූ මිග සඞ්ඛ්‍යාත තොප බැළලිනියන් හා; පක්ඛී, පක්ෂිවූ මා කුකුළා හා දෙන්න; අසඤ්ඤුත්තා, අඹුසැමි වන්නට අයුක්තාහ; නොහොත් ඔවුනොවුන් හෙරෙහි සම්බන්ධ නොවෙති; අඤ්ඤං සාමිකං, අනික් සැමියෙකු; පරියෙස, එසේ හෙයින් සොයා ගණු.

899 කොමාරිකා තෙ හෙඨාමි මජ්ජා පිය භාණිනි
විඳ මං අරියෙන වෙදෙන සාවය මං යදිච්ඡසි.

තෙ, තට; කොමාරිකා, බාල්‍යාවස්ථාවෙහි සිට අද දක්වා අන්‍ය පුරුෂ සම්භෝගයක් නොකළ හෙයින් තට කොමාරිකාවූ අඹුවුයේ; හෙඨාමි, වෙමි; මජ්ජා, මධුර කථායෙන්; පියභාණිනී, හෘදයඞ්ගම කොට බණන්නෙම්වෙමි; අරියෙන, සුන්දරවූ; වෙදෙන, ප්‍රතිලාභයෙන්; මං,මා, විඳ, ප්‍රතිලාභය කරව;යදිච්ඡසි, ඉදින් කැමැත්තෙහි වීනම්; සාවය, අසව;අස්සවා පියභාණිනි, යනු පායසි; අස්සවා, කීකරුය යන අර්ථයි;-කුකුළාණෙනි මමද මෙතෙක් කල් පුරුෂ සපත්නියක් නොදනිමි තෙපිද සපත්නියක් නොදනුව එසේ හෙයින් දෙන් නමු බ්‍රහ්මචාරිම්භ එසේවූ නිර්දෝෂ ලාභයෙන් මා ගැණ ඉදින් බාගේ බස් බොරුයයි නොගිවිස්සීනම් දෙලොස්යොදුන් බාරුණසියෙහි බෙරලවා මේමාගේ දූසියයි අස්වා ගනුවයි ආරාධනා කෙරේ.

900 සකුණඛාදිනී ලොහිතපෙ චොර් කුක්කුටපොථිනී
න ත්වං අරියෙන වෙදෙන මමං හත්තාරම්ච්ඡසි.

සකුණඛාදිනී, පක්ෂීන් භක්ෂණය කරන හැනැත්තිය; ලොහිතපෙ, සතුන් ඇහ ලේ බොන්නිය; චොරී, සෙර; කුක්කුටපොථිනී, කුකුළ් මරන්නිය; ත්වං, නී; අරියෙන වෙදෙන, බ්‍රහ්මචරිය ලාභයෙන්; මමං භත්තාරං, භර්තෘවූ මා; න ඉච්ඡසි, කැමැත්තෙහි නොවෙසි; බැළලිය මා සැමිකමට පතන්නෙහි නොවෙසි කී.

901 එවම්පි චතුරා නාරී අපි දිසවා වසං නරං
නෙන්ති සණ්හාහි වාචාහි බිළාරී විය කුක්කුටං.

එවං, මෙසේ; චතුරා අපි, සියලු සන්ත්‍රාසත්‍යයට දක්ෂවූ; නාරී, සත්‍රීහු; නරං, පුරුෂයා; දිසවා, දැක; සණ්හාහි, සිඳුවුවූ; වාචාහි, තෙපුලෙන්; කුක්කුටං, කුකුළා; බිළාරී විය, බැළලකුමෙන්; වසං, තමන් වසඟ බවට; නෙන්ති, පමුණුවත්;-යම්සේ බැළැල් මධුර වචනයෙන්ම කුකුළා මරු වසඟ කරන්නට යත්න කළාද එපරිද්දෙන් මේ ලොකයෙහි සත්‍රීහු පුරුෂයා හාවභාව ලීලා කටාක්ෂ පාතාදී චාතුර් විලාසයෙන් තමන් වසඟ බවට පමුණුවති සේසි.

902 යො ව උපපතිතං අත්ථං න බිපජ්ජති බුද්ධිමා
අම්භතවසමඤ්ඤෙති පච්ඡා ච අනු තප්පති.

යොව්, යමෙක් වනාහි; උපපතිතං, උපන්නාවූ; අත්ථං, අර්ථය; ඛිපපං, වහා; න අනුබුජ්ඣති, නොදනීද; එසේවූයේ; අභිඤ්ඤාවසං, සතුරාගේ වසඟ බවට; අත්තෙති, පැමිණෙයි; පඤ්ඤා ච, පසුව්ද; අනුතපපති, නැවෙන්නේද වේ.

903 යෝ ච උපපතිතං අත්ථං ඛිපපමේව නිබ්බොධති
මුච්චතෙ සත්තුසම්බාධා කුක්කුටොව බිළාරියාති.

යෝ ච, යමෙක් වනාහි; උපපතිතං, උපන්නාවූ; අත්ථං, අර්ථය; ඛිපපමෙව, වහාම; නිබොධති, දනීද; ඒ පුරුෂයා: බිළාරියා, බැළලි කෙරෙන් මිදුනාවූ; කුක්කුටෝ ඉව, උපාවරණයෙහි දක්ෂවූ කුකුළා මෙන්; සත්තුසම්බාධා, ශත්‍රුසංඛ්‍යාතවූ හබකයෙන් හෙවත් සතුරා කෙරෙන්; මුච්චතෙ, මිදෙන්නේයි.

381 කුක්කුට ජාතකයයි.

---

904 ධම්මං චරථ සුනතයෙ ධම්මං චරථ භද්දවෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

සුනතයෙ, නැයෙනි; ධම්මං, කායසුචරිතාදිභෙදවූ කුශලධර්මයෙහි; චරථ, හැසිරෙව්; ධම්මං චරථ, එකවාරයෙක කොට නොනැවත නැවත නැවත කුශල ධර්මයෙහි හැසිරෙව්; වෙ, නොපව; භද්දං, භද්‍රයෙක් වන්නේය; ධම්මචාරී, කුශල ධර්මයෙහි හැසිරෙන්නේ; අස්මිං ලොකෙ, මෙලොවද; පරම්හි ච, පරලොවද; සුඛං සෙති, සුවසේ හෝනේය; "සුඛංසෙති"යි දෙශනා විලාශ බව මුත්"යමෙක් කුශල ධර්මයෙහි හැසිරේද ඒවූකලී දෙලොවම සතර ඉරියව්වෙන් සුවසේ දවස් යවන්නේයි.

905 භද්දකො වතයං පක්ඛී යිජෙ පරම්ධම්මිකො
එකපාදෙන තිට්ඨන්තො ධම්මමෙවානුසාසති.

එකපාදෙන තිට්ඨන්තො, එක පයින් සිටිනාවූ; යිජෙ, යිජයා; ධම්මමෙව, ධර්මයක්ම; අනුසාසති, අනුශාසනා කෙරේද එසේ හෙයින්; පරම්ධම්මිකො, විශෙෂයෙන් ධර්මිෂ්ඨවූ; අයං පක්ඛී, මේ පක්ෂියා; භද්දකො වත, ඉතා භද්‍රය.

906 නාසස සීලං විජානාථ අනාකුසුය පසංසථ
තුච්ඡා අණ්ඩං ච ඵොතව්ව ධම්මෙනා ධම්මොනි නාසති.

අසඃ, මොහුගේ; සීලං, ශීලයක්; න විජානාථ, නොදනුව; අත්තසුඤ්ඤය, ශීලාදි මෙවෙනි ගුණ විශෙෂයක් ඇතැයි නොදූන; පසංසථ, ප්‍රසංසා කරවි; අණ්ඩං ව, බිජුවටද; පොතඃ, පැටවුන්ද; භුඤ්ඣා, කා, ධමෙමා ධමෙමාති; ධම්මය ධම්මයති; භාසති, කියයි;- අනුන්ට කුශල ධම්මයෙහි හැසිරෙවයි කියන බවමුත් තෙමේ කුශල ධම්මයෙහි හැසිරෙන එකෙක් නොවෙයි ප්‍රසංශා ආදි ආදරයෙක් නොකරවයි සේයි.

907 අසඤ්ඤං භණති වාචාය අසඤ්ඤං කායෙන කුබ්බති
වාචාය නො ච කායෙන න තං ධම්මං අධිඝිතො.

වාචාය, වචනයෙන්; අසඤ්ඤං, අනීතක්; භණති, බෙණෙයි; කායෙන, ශරීරයෙන්; අසඤ්ඤං, අනීතක්;කුබ්බති, කෙරෙයි; වාචාය, මේ වනාහි බසින් ධම්මය කියයි; නො ච කායෙන, කයින් වූකලී කුසල ධම්මයක් කරන්නේ නොවෙයි; තං ධම්මං, යයිසේය; තං ධම්මං, (තසඃමිං ධමෙම) හේ ධම්මයෙහි; අධිඝිතො න, පිහිටියේ නොවෙයි.

908 වාචාය සඛිලො මනොවිදූගෙහා
ඡන්නෝ කූපසයොව කණ්හසපෙපා
ධම්මඛජෙ ගාමනිගමෙසු සාධූ
දූප්ජානෙ පුරිසෙන බාලිසෙන

වාචාය, බසින්; සඛිලො, සිළුටුය; මනොවිදූගෙහා, මනසින් විඳීද හැක්කේ නොවෙයි විෂමවූ කල්පනා ඇත්තේයයි සේ සි; ඡන්නෝ, ප්‍රකාශ නොවන අභිප්‍රා ඇති හෙයින් ප්‍රච්ඡන්නවූ; කූප සයො, බිලයෙහි හෝනාවූ; කණ්හසපෙපා ඉව, කෘෂ්ණ සර්පයෙකු බඳුවූ; ධම්මඛජෙ, සුචරිත ධම්මයන් ධජයක්කොට ඇවිදිනා හෙයින් ධම්මධ්වජවූ; ගාම, ග්‍රාමයෙහිද; නිගමෙසු, නියම් ගම්හිද සාධූ,සාධුයයි සම්භාවනා කරන ලද මෙබඳු දුශ්ශීලයා; පුරිසෙන බාලිසෙන, අඥන පුරුෂයා විසින්; දූප්ජානො, මෙබඳු සවරූපයක් ඇත්තේයයි නොදන හැකිවිය.

909 ඉමං තුණ්ඩහි පකෙඛහි පාදෙ විමං විපොථථ
ඡවං හිමං වීතාසෙථ නායං සංවාසනාරහොති.

ඉමං, මේ සර්පයා; තුණ්ඩහි, තුඹින්ද; පකෙඛහි, පක්ෂඃ යෙන්ද; පාදෙ ව, පයින්ද; විපොථථ, පහරව්; ඡවං ඉමං හි, මේ

ලාමකයා; විනාසෙථ, විනාසකරව්; අයං, මේ ගිනයා; සංවාසතං, එකාසථානයෙහි විසීමට, න අරහො, සුදුසු නොවෙයි.

382 ඛණ්ඩවජ ජාතකයයි.

---

910 සචෙ බ්‍රාහමණ ගචෙඡසි සාකෙතෙ අඤ්ජනං වනං
වජ්ජාසි නන්දියං නාම පුත්තං අසමාසමොරසං
මාතා පිතා ච තෙ වුඩා තෙ නං ඉචඡනති පසසිතුං.

බ්‍රාහමණ, බමුණ; සාකෙතෙ, සාකෙත නම් නුවර; අඤ්ජනං වනං, අඤ්ජන වන නම් උයනට; සචෙ, ඉදින්; ගචඡසි, යෙයි නම්; තෙ, තාගේ; මාතා ච, මවද; පිතා ච, පියාද යන; තෙ, මොහු දෙදෙන; පසසිතුං, (තා)දක්නට; ඉචඡනති, කැමත්තාහයි; අසමාසමං, අපගේ; ඔරසං, උරෙහි ජාතවූ; නන්දියං නාම, නන්දිය නම්වූ; තං පුත්තං, ඒ පුත්‍රයාහට; වජ්ජාසි, කිය.

911 භුත්තා මයා නිවාපානි රාජිනො පානභොජනං
තං රාජපිණ්ඩං අවහොතුං නාහං බ්‍රාහමණමුස්සහෙ.

බ්‍රාහමණ, බමුණ; රාජිනො, රජුගේ; නිවාපානි, ගොචර පිණිස වපුරනලද තෘණයෝ; මයා, මා විසින්; භුත්තා, අනුභව කරන ලදහු; පානභොජනං, පාන භොජනයද; භුත්තා, අනුභවකරන ලද; තං රාජපිණ්ඩං, ඒ රජහු සතුවූ මා අනුභව කළ පිණ්ඩය; රජු අයතිවූ පිණ්ඩය අද එක තැන තිබූ බැවින් පිණ්ඩව්‍යවහාර ලදහ; (පානභොජනං, පානයද තෘණ සංඛ්‍යාතවූ භොජනයද;) අවහොතුං, නපුරුකොට කන්නට; අහං, මම; නුස්සහෙ, උත්සාහ නොකෙරෙමි; "බ්‍රාහමණමුස්සහෙ" කී තැන මකාර සංහිතාවශයෙන් කියනලදි.

912 ඔදහිස්සාමහං පස්සං ඛුරපානිස්ස රාජිනො
තදාහං සුඛිතො මුත්තො අපිපස්සෙය්‍ය මාතරං.

ඛුරපානිස්ස, මහඟියෙන් යුක්ත අත් ඇති; රාජිනො, රජුව; පස්සං, (මාගේ) පාශ්වය; අහං, මම; ඔදහිස්සාමි, පිඹිටුවමි; හෙවත් මා මරවයි ඇලෙ පෑ සිටිමි; තදා, එකල්හි; සුඛිතො, සුඛිතවූ;

මුත්තෝ, මරණින් මුකතවූ; අහං, මම; මාතරං, මැණියන්; පසෙස
ය්‍ය අපි, දුටුයෙම්වින්නම් යෙහෙකි;-රජ්ජුරුවන්ගේ තණ පැන්
අනුභවකොට ප්‍රයොජන නොබැඳී නැඟිගියෙම් නම් නපුරුකොට
කෑවානම් වෙයි එසේ නොව දුනු හීතල ගෙන මුවන් විදින්ට
ආ කල මුවමුලින් නික්ම රජ මා විදයි ඇලය පැ සිට එවේලෙහි
රජු විසින් කිවක් අසා ප්‍රාණවධ නොකරන පරිද්දෙන් අවවාද දී
සුවසේ මරණින් ගැලවී මවුපියන් අවුත් දකිම්හි යේසි.

913 මිගරාජා පුරෙ ආසිං කොසලස්ස නිකෙතනෙ
නන්දියෝ නාම නාමෙන අභිරූපෝ චතුපදෙ.

කොසලස්ස, කොසලරජුගේ; නිකෙතනෙ, වාසස්ථානවූ; රාජ
භවනයට සමීපදෙසවූ උද්‍යානයෙහි; අභිරූපෝ, විශිෂ්ට රූ ඇති;
චතුපදෙ, චතුෂ්පදවූ; නාමෙන, නමින්; නන්දියෝ නාම, නන්දිය
නම්වූ; මිගරාජා, මෘගරාජයෙක්; පුරෙ, පෙර; ආසිං, වීමිද.

914 තං මං වධිතුමාගඤ්ඡි දයසම්ං අඤ්ඤතෙ වනෙ
ධනුං අදෙජඤං කත්වාන උසුං සඤ්ඤාය කොසලෝ.

දයසම්ං, මෘගයන්ගේ නිවාසය පිණිස දෙන ලද; අඤ්ඤ
වනෙ, අඤ්ඤවනනම් උද්‍යානයෙහි; කොසලෝ, කොසලයා; ධනුං,
දුන්න; අදෙජඤං කත්වාන, දුනුදිය හා සමඟ එක්කොට ලා හෙවත්
දුනුදියද නඟාලා; උසුං, ශරය; සඤ්ඤාය, දුනුදියෙහි පිහිටුවා; තං
මං, ඒ මා; වධිතුං, වධකරන්නට හෙවත් විදින්ට; ආගඤ්ඡි, ආය.

915 තස්සාහං ඔදහිං පස්සං බ්‍රහ්මපානිස්ස රාජිනෝ
තදාහං සුඛිතෝ මුත්තෝ මාතරං දක්ඛිමාගතෝ හි.

බ්‍රහ්මපානිස්ස, හීතල ගත් අත් ඇති; තස්ස රාජිනෝ, ඒ රජුට;
පස්සං, මාගේ මහාපාර්ශ්වය; අහං, මම; ඔදහිං, පිහිටුවිමි හෙවත් මා
මරවයි ඇලය පැ සිටියෙමි; තදා, එකල්හි; සුඛිතෝ, නිදුක්වූ;
මුත්තෝ, මරණින් මුකතවූ; අහං, මම; මාතරං, මැණියන්; දක්ඛිං,
දක්නට; ආගතෝ, ආමි—මහනෙණි එසමයෙහි අභිරූප මෘගව
උපන්නෙමි දුනු හීතල ගෙන මුවන් විදින්ට ආ කොසලරාජයාට
මුවමුලින් නික්ම අවුත් මෛත්‍රී පාරමිතාව පෙරදැරිකොට අවශෙ
ෂවූ පාරමිතා ධර්මයන් සම්මර්ශනයකොට ඇලය පැ සිට මහරජ මා
ඉදු සී ආරාධනා කෙළෙමි ඒ මාගේ මෛත්‍රී බලයෙන් මා පසෙහි

සඤ්ඤා කළ ශරය නැරපිය නොහී මාගේ ගුණ දැන සිටි රජුට ධර්ම දෙශනාකොට හැමසතුන්ට අභය ගෙන දී යෙහෙන් අවුත් මව් පියන් දුටුයෙම් වේදැයි වදලෝ.

383 නන්දිය මිග ජාතකයයි.

පළමුවන අචාරිය වගීයයි.

---

916 සච්චං කිරෙවමාහංසු භස්සං බාලොති පණ්ඩිතා
පස්ස බාලො රහො කම්මං ආවි කුබ්බං න බුජ්ඣති.

භස්සං, එලුවා; බාලෝති, අඥයයයි; පණ්ඩිතා, ප්‍රාඥයෝ; සච්චං එව, සැබවක්ම; ආහංසු කිර, කිව්ල; බාලො, අඥන; රහො, රහස්හි කටයුතු; කම්මං, කර්මය; ආවි කුබ්බං, ප්‍රකාශස්ථානයෙහි කරන්නේ; න බුජ්ඣති, හේ දෙඛවශයෙන් නොදනී; පස්ස, බල— යම් හෙයකින් මේ එලුවා රහස්කෘත්‍යය ප්‍රකාශකොට කෙරේද එසේ හෙයින් එලුවා අඥනයයි ප්‍රාඥයන් විසින් කිම යුක්ත යයි සේසි.

917 ඛං ඛො සම්ම බාලොසි ඛරපුත්ත විජානහි
රජ්ජුයාසි පරික්ඛිත්තෙනා වඞ්කාඩො ඔඛිතො මුඛො.

සම්ම ඛරපුත්ත, සබඳ ගද්‍රභ පුත්‍රය; ත්වං ඛො, තෝ වනාහි; බාලො අසි, මට වඩා බාලයෙහිය; කුමක් හෙයින්ද යත්? රජ්ජුයා, රැහැනින්; පරික්ඛිත්තෙනාසි, විසහා සමඟ ග්‍රීවයෙහි පරික්ෂිප්තයෙහිය හෙවත් කරබඳනා ලද; වඞ්කා, වක්වූ; ඕඩො, ඔශ්ටය ඇත්තෙහි; ඔඛිතො, මුඛබන්ධන රජ්ජුවෙන් බැඳ තබන ලද; මුඛො, මුව ඇත්තෙහි; විජානාහි, මොහුට වැඩි මම් අඥනයෙමි දනු.

918 අපරම්පි සම්ම තෙ බල්‍යං යො මුත්තෙනා න පලායසි
යෝ ච බාලතරෝ සම්ම යන්ත්වං වහසි සෙනකං.

සම්ම, සබඳ; මුත්තෙනා, බන්ධනයෙන් මුක්තවූ; යෝ ත්වං, යම්බඳු තෝ; න පලායසි, නොපලාසිද නොපලායාම; තෙ, තාගේ; අපරම්පි බල්‍යං, අනික්ම බාල භාවයෙකා; සම්ම, යාලු; ත්වං, තෝ; යං,

සම් බදුවූ; සෙනකං, සෙනඤ්ඤම් රජකු; වහයි, උපුලයිද; සෝ ච, ඒ තාවිසින් උපුලනු ලබන ඒ රජද; බාලතරෝ, අප දෙන්නාට වඩා අතිශයින් බාලය.

919 යන්නූ සම්ම අහං බාලෝ අජරූජ විජානහි
අථ සෝන සෙනඤ්ඤෝ බාලෝ තං මෙ අකඛාහි පුච්ඡිතෝ.

සම්ම අජරූජ, යාලු එළුරූජය; ඤ්, යයි සේසි; යං, (යෙන) සම් මේ තිරශ්චීන්ගත කාරණයකින්; අහං බාලෝ, මම අඥාන යෙම් ඒ අඥාන කාරණය; විජානාහි, දනු එසේහෙයින්ම මා ගේ අඥානභාවය තාවිසින් දන්නට පිළිවනැයි සේසි; අථ, ඉක්බිත්තෙන්, සෙනඤ්ඤෝ, සෙනඤ්ඤ නම් රජ; සෝන, සාවරණම් හෙතුවකින්; බාලෝ, අඥානද; පුච්ඡිතෝ, මාවිසින් විචාරණ ලද්දෙහි; තං, ඒ; මෙ, මට; අකඛාහි, කිය—සබඳ මට වන්නා ගද්‍රභපුත්‍රය යනාදි කියන්නෙහිද තමෘ කි එවැන්න මට සුදුසුය මෙ අපගේ සෙනඤ්ඤ නම් රජ කවර කාරණයකින් අඥානද මට කියාලයි කි.

920 උත්තමත්ථං ලභිත්වාන භරියා යෝ පදස්සති
තෙන ජීයිස්සතත්තානං සා වෙවස්ස න හෙස්සති.

යෝ, යමෙක්; උත්තමත්ථං, සියළු හඬ දන්නා මන්ත්‍රය; ලභිත්වාන, ලැබ; භරියා, භාර්‍යාවට; පදස්සති, දෙන්නේද; හෙන, ඒ කාරණයෙන්; අස්ස, ඔහුගේ; අත්තානං, ආත්මය; ජීයිස්සති; පිරිහේ. මන්ත්‍රය අඹුවන්ට දී ගින්නට වදනේ තෙමේ තමා පොවා නොලැබෙයි සේයි. සාව එව, නෝද, අස්ස, මෝහට; න හෙස්සති, නොවන්නීය-යමෙක් ලද යසසසිරකොට ගත නොහේද අඥානය එසේ හෙයින් මේ තමා ලද යසසද; අනුභවිකොට ගතනොගෙන මේවෙනි මන්ත්‍ර විශෙෂයද; අඹුවට දී ගිනිවදනේ තිරශ්චීන්ගත හෙයින් අඥානවූ තට වඩා මේ අඥානයයි කිය.

921 න වෙ පියං මෙති ජනින්ද තාදිසෝ
අත්තානං නිරං කත්වා පියානි සෙවති
අත්තාව සෙය්‍යෝ පරමාව සෙය්‍යෝ
ලබභා පියා * ඔජිතතෙනන පච්ඡාති.

ජනින්ද, ජනෙශ්වරය; තාදිසෝ, තා වැන්නෙක්; අත්තානං, ආත්මය; නිරං කත්වා, හැරපියා; පියං මෙති, මේ වසතුව මට ප්‍රියයයි; පියානි, ප්‍රියවසතුන්; වෙ, එකාන්තයෙන්; සෙවති, සෙවුනේය; කුමක්

* උජිතතෙනන-මරම්ම.

හෙයින්ද යත්? පරමාව සෙයෙහෝ; ලොකයෙහි උත්තමයයි ප්‍රසිද්ධවූ ශ්‍රෙෂ්ඨවස්තුවට මෙලොවත් පරලොවත් ප්‍රියවස්තූහු තුමූම ලබන්නාහු යයි සේසි; අත්තාව. ආත්මයම; සෙයෙහෝ, ශ්‍රෙෂ්ඨය; එසේමැයි; ඔජිතත්තෙන, වඩනලද ආත්ම ඇත්තාහු විසින්; පජා, පසුව; පියා, ප්‍රියවස්තූහු; ලබා, ලබන්නාහුයි, ප්‍රියවස්තු ප්‍රතිලාභය පිණිස ආත්මය නොනසා යහොඩන ප්‍රඥාදින් අත්මය වැඩුනාහටය, නැත මෙම පාඨහෝය "පරමා වා සෙයෙහෝ" කියා හි තැන වසාර අපි ශබ්ද ප්‍රකාශනය හෙරෙයි එසේ හෙයින් "පරමාව සෙයෙහෝ අපි" කියා අර්ථ ගත යුතු.

384 ඛරජුතන ජාතකයයි

---

922 අසක්කසං අථිරූසං ඛරධොතං සුපාසිකං,
සුබ්බං තිඛිණගහං ච කො සූචිං කෙතුමිච්ඡති.

අසක්ඛසං, පටලයක්නැති සකීසහුවූ; අථිරූසං, සිලුවූ හෙයින් පරුෂනුවූ, ඛරධොතං, පිරෙහි හෝ කුරුඳු පාෂාණයෙහි ගහා ශුඛකරන ලද හෙයින් ඛරධොත නම්වූ; සුපාසිකං, යහපත් කොට විදුහා ලද මලින් යුක්ත හෙයින් සුපාසික නම්වූ; සුබ්බං, සූක්ෂ්මවූ; තිඛිණගහං ච, තීක්ෂණවූ අගද දනි; සූචිං, හිදිකටුව; කෙතුං, විකුණන්නට; කො, කවරෙක්; ඉච්ඡති, කැමැත්තේද.

923 සුමජ්ජං ච සුපාසං ච අනුපුබ්බං සුවට්ටිතං
සන්තාතිමං පවිත්ථිඛං කො සූචිං කෙතුමිච්ඡති.

සුමජ්ජං ච,(කුරුඳුසුන්නෙන්)යහපත්සොටමදනාලද;සුපාසං ච, (සිඳුවූවූ විදිනාකණ්ටකයෙන් විදිඟෙසින්)සුන්දර පාස ඇති; අනුපුබ්බං, අනුක්‍රමයෙන්; සුවට්ටිතං, මනාකොට විදිනා ලද; සන්තාතිමං, සටනකාල සනවූ කිණිහිර පලාගෙන ඇතුළට වදනාපමන සන හෙයින් සන සාතිමනම්වූ; පවිත්ථිඛං, සැඳ්ධවූ; හෙවත් මොලොක්නොවූ; සූචිං, හිදිකටුව; කෙතුං, විකුණන්නට; කො ඉච්ඡති, කවරෙක් කැමතිද.

924 ඉතොදුනි පනායනානි සූචියො බලිසානි ච
කොයං කම්මාරගාමසම්මිං සූචිං විකෙතුමිච්ඡති.

ඉදුනි, දැන්; සූචියො, බොහෝ හිදිකටුද; බලිසානිව, බිලිදු යන මේ සියලු නවාමූහු; ඉතෝ, මේ කම්මාරග්‍රාමයෙන්; පනායනති,

බැහැරට යන්නාහ ඒ දිගට පැතිරයන්නාහයි; කම්මාරගාමසම්ං, කම්මාර ග්‍රාමයෙහි; සූචිං, හිදිකටු; විකෙකාතුං, විකුණන්නට; ඉච්ඡති, කැමතිද; කො අයං, මේ කවරෙක්දැයි—සියලු කම්මාර උපකරණ මේ ගමින් බැහැරට යත් මෙ ගමට අවුත් හිදිකටු විකුණන්නේ කවරෙක් දැයි කිවූ.

925 ඉතො සත්ථානි ගච්ඡන්ති කම්මන්තා විවිධා පුථූ
කොයං කම්මාරගාමසම්ං සූචිං විකෙකාතුමරහති.

ඉතො, මෙයින්; සත්ථානි, නානාප්‍රකාර ශස්ත්‍රයෝද; ගච්ඡන්ති, යෙති; විවිධා, නානාප්‍රකාරවූ; පුථූ, බොහෝවූ; කම්මන්තා, කර්‍මාන්තයෝද මෙයින්ම ගෙන ගිය උපකරණයෙන්ම පවතිති එසේවූ; කම්මාරගාමසම්ං, මේ කම්මාර ග්‍රාමය; සූචිං, හිදිකටු; විකෙකාතුං, විකුණන්නට; කො අයං, මේ කවරෙක්; අරහති, සුදුසුද.

926 සූචිං කම්මාරගාමසම්ං විකෙකාතබබා පජානතා
ආචරියාව ජානන්ති කම්මං සුකතදුක්කතං.

පජානතා, ප්‍රාඥපුරුෂයා විසින්; සූචිං, සූචි නොමෙ; කම්මාර ගාමසම්ං, කර්‍මාර ග්‍රාමයෙහි; විකෙකාතබබා, වික්කයුතුය; කුමක් හෙන්ද්‍රියන්? සුකතදුක්කතං, සුකෘතදුෂ්කෘතවූ; කම්මං, කර්‍මාන්තය හෙවත් මේ නවාම් කළ නියාව යහපත මේ නවාම්කළ නියා නපුරුයි; ආචරියාව, ඒශිල්පයෙහි කෙළපැමිණි ආචාරිවරහුම; ජානන්ති, හුණදෙස වශයෙන් හඳුනත්; "සූචිං" කී තැන විභක්තිවිපරිණාම යෙන් "සූචි" කියා ප්‍රථමාසි නපුරු යහපත් කර්‍මාන්ත නොදන්නා කර්‍මාරග්‍රාමයෙන් පිටතට ගෙනගොස් කර්‍මාන්තයෙහි නපුර යහපත සොසේ ප්‍රකාශකොට ලද්ද කිවූ.

927 ඉමව තෙ පිතා භද්දෙ සූචිං ජඤඤූ මයා කතං
තයා ච මං නිමන්තෙත්‍වා යවපඤඤං ඝරෙ ධනන්ති.

භද්දෙ, භද්‍රාව; තෙ, තීගේ; පිතා, පියේ; මයා, මා විසින්; කතං, කරන්නලද; ඉමං සූචිං, මේ ඉදිකටුව; ජඤඤූ, හැඳින්නේවීනම්; තයා ච, තී විසිනුදු; මං, මා; නිමන්තෙත්‍වා, පවරන්නේය; යං, යම් බඳුවූ; අඤඤං, අනික්; ධනං, ධනයෙක්; අසි, අද්ද; ඉතුදු පවරන්නේය; සොදුර ඉදින් තී පියේ මා ඉදිකටුවෙ නවාම් සතුටුවිය සෙස්ස තබා තීද දෙම් පවරයි සියලු වසතුද දෙමියි පවරයි.

385 සූචි ජාතකයයි.

928 නවචම්පකෙ දානෙ දියාති
පුණ්ණායං දෙණී සාමිනී සිතා
බහුකෙ ජනෙ පාසපාණිකෙ
නො ච ඛො මෙ පටිහාති භුඤ්ජිතුං.

නවචම්පකෙ, අභිනවාකාරවූ; දානෙ, දානය; දියාති, දෙයි ලැබෙයි; අයං දෙණී, මේ අපගේ බත්දෙන; පුණ්ණා, පුදු බතින් පිරිනා; සාමිනී, අපගේ සැමි දියනියෝද; සිතා, සිටියාහ; ඇ මතු නොවෙයි; පාසපාණිකෙ, මලගත් අත් ඇති; බහුකෙ ජනෙ, බොහෝ ජනයෝ; සිතා, සිටියාහ; භුඤ්ජිතුං; එසේ ගෙයින් බත් කන්නට; මෙ, මට; නො ච ඛො පටිහාති, නොම පැනෙයි; මේහැම ආකාති බලා බත් කන්නට රුචි නැතිව ගියයි සේයි, මෙහි "නව චම්පකෙ දානෙ" කී තැන "නවචම්පකං දානං තං" කියා විභක්ති විපරි නාමයයි; "බහුකෙ ජනෙ පාසපාණිකෙ" යි කී තැන "බහුකො ජනො පාසපාණිකො" යි කියා විභක්ති විපරිනාමයි.

929 තසසි භමසි ලෙණමිච්ඡසි අත්තානොසි කුහිං ගමිස්සසි.
අපෙපාසසුකොකා භුජ තුඩිල මංසත්ථාය හි පොසියාමසෙ.

තුඩිල, තුඩිලය; තසසි, මරණ භයින් ත්‍රාසවෙහි; භමසි, භ්‍රම නය වෙහි; ලෙණං, පිහිටක්; ඉච්ඡසි; කැමැත්තෙහි; අත්තානොසි, අස රණයෙහි වී; කුහිං ගමිස්සසි, කොයි යෙහිද;-බල අපගේ මව පෙර අප රක්ෂා කළා දැන් පැහැර පියව අන්‍යවූ කවරනම් පිළිසරණක් ලැබේදැයි සේයි, අපෙපාසසුක්කොකා, නිරුත්සාහිව; භුජ, අනුභව කර; මංසත්ථාය, මාංශ පිණිස; හි, එකාන්තයෙන්; පොසියාමසෙ, පොෂණය කරණ්‍ය ලබමු.

930 ඔගාහ රහදං අකද්දමං සබ්බසෙදමලං පවාහය
ගණ්හාහි නවං විලෙපනං යස්ස ගන්ධො න කදාචි ජීරති.

අකද්දමං, කර්දම රහිතවූ; රහදං, විලට; ඔගාහ, බස්; සබ්බං, සියළු; සෙදමලං, සෙවදමලය; පවාහය, දුරුකර; යස්ස, යමක්හුගේ ගන්ධො, ගන්ධය; කදාචි, කිසිකලෙක්හිත්; න ජීරති, නොසිදෙන් නේද; එසේවූ; නවං, අළුත්වූ; විලෙපනං, විලවුන්; ගණ්හාහි, ගනු; මඩ නැති විලට බැස සියළු සෙවදමලය හැර හැම වේලෙහි නොසිඳී පවත්නා අළුත් සුවඳ ගන්වයි කියය.

931 කතමො රහදෙ අකද්දමො කිංසු සෙදමලනති වුච්චති
කතමව නවං විලෙපනං කස්ස ගන්ධො න කදාචි ජීරති.

අනඳමෝ, මිඩතැති; රහදෙ, විල; සාතමෝ, සවර දෙ; සෙද මිලං ඉති, සෙවදමලයයි; කිංසු, කිමෙක්; වුවචති, කියනු ලැබේද, නවං, අළුත්වූ; විලෙපනං, විලවුන් නම්; තහම්ච, කවදේද; තස්ස කවරක්හුගේ; ගන්ධො, ගන්ධය; කදාචි, කිසිකලෙක්හි; න ජීරති, නොසිදේද.

932 ධම්මෝ රහදෙ අනඳමෝ පාපං සෙදමලන්ති වුවචති
සීලං ච නවං විලෙපනං තස්ස ගන්ධො න කදාචි ජීරති.

ධම්මෝ, පවශීල දශශීල ත්‍රිවිධ සුවරිත සප්ත ත්‍රිංශත් බොධි පාක්ෂික ධම්ම අමෘතමහා නිර්වාණ සඞ්ඛ්‍යාත ධම්මයනම්; අනඳමෝ, රාග වෙෂ මෝහ මාන දිෂ්ටි ආදීවූ කෙලෙසුන්දීම රහිත හෙයින් අකදීමවූ; රහදෙ; විලය; පාපං, එකාවිධාදි වසයෙන් සිටි පාපය; සෙදමලං ඉති, සෙවද මිලයයි; වුවචති, කියනු ලැබෙයි; සීලච, පව ශීල චතුපාරි ශුඛි ශීලයයි කියනලද ශීලය; නවං, අළුත්වූ; විලෙ පනං, විලවුන් හා සමයයි කියති; තස්ස; ඒ ශීලයාගේ; ගන්ධො, ගන්ධය; කදාචි, කවර කලෙකත්; න ජීරති; නොසිදෙයි;–සකල ලොකයෙහි පැතිර පවතී යයිදේසි.

933 නන්දන්ති සරීරඝාතිනො න ච නන්දන්ති සරීරධාරිනො
පුණ්ණාය ච පුණ්ණමාසියා රම්මානාව ජහන්ති ජීවිතං.

සරීරඝාතිනො, අනුන්ගේ ශරීර ඝාතය කරන මේ අඥාන ජනයෝ හෙවත් මධ්‍ය ඖංශාත්‍රභවය කරම්හ අඹුදරුවන්ට දෙම් හයි ප්‍රාණාතිපාත කරන ජනයෝ; නන්දන්ති, සත්ත්වවධයෙහි සන්තු ෂ්ටවෙති; සරීරධාරිනො, සරීරධාරිහු; න ච නන්දන්ති, තමන්ට මරණ පැමිනි කල්හි මෘගරාජ හස්ත්‍යාජානීය ක්ෂිණාශ්‍රවයන් තබා අවි ශෙෂ ජනයෝ නොසතුටුවෙති; මේ සතර දෙනමුත් සජීජනයෝම; මරණෙහි භය ඇත්තාහසිසේයි; පුණ්ණාය ච, ගුණෙන් පිරුණාවූ; පුණ්ණමාසියා, පූර්ණචන්ද්‍රයා යුක්ත දිනයෙහි මස පුරා සිටි දිනඥෙහි; රම්මානා එව, අප වැනි ශීලාචාරයෙන්යුත් කෘත පුණ්‍ය සම්භයෝ කළපින් සිහිකොට ඒ හිසා සතුටුවන්නාහුම නොහොත් ගති නිමිත්ත වශයෙන් උපස්ථිත සවර්ගීසම්පත්තියෙහි ඇලෙන් නාහුම; ජීවිතං, ජීවිතය; ජහන්ති, හරනාහුයි;–මූලතුණ්ඩිලයෙනි මේ ලොකයෙහි මරණ බන්නේනම් කළපින් නැත්තෝමය; අප වැනි කළපින් ඇත්තෝ මරණ කිසිවක්කොට නොහැඟ කාලක්‍රියා කරන්නාහයි දෙශනා කොළෝ; "පුණ්ණාය ච පුණ්ණමාසියා" යනු මැදි පොහෝ දවස හෙයින් සම්භව වශයන් කිවුසි.

386 තුඩිල ජාතකයයි.

931 සිංගී මිගො ආයතචක්ඛුතෙත්තා
අනිත්තනෙො වාරිසයො අලොමො
තෙනාභිභූතො වපණා රුදම්
හරෙ සඛා කිස්ස නු මං ජහාසි.

හරෙ සඛා, කොළු යාළුව; ආයතං, පදික්වූ; චක්ඛුනෙත්තො, දර්ශනාඥියෙන් චක්ෂුස් තම්වූ නයනාඥියෙන් නෙත්‍ර තම්වූ චක්ෂු සඞ්ඛ්‍යාත නෙත්‍ර ඇති; අනිත්තනො, අස්පිමි තව කොට ඇති; වාරිසයො, දියෙහි හෝනාවූ; අලොමො, රොම නැති; සිංගීමිගො, සවණිණවණිණ හෙයින් හෝ නළ සංඛ්‍යාතවූ ශෘඞ්ගයන්ගේ විදැ මානත්වයෙන් හෝ ශිංගී මෘගයෙක හෙවත් කකුළුවෙක; තෙන, ඔහු විසින්; අභිභූතො, මඩනා ලද්දෙම්; වපණං, බැගෑ බවට පැමිණියෙම්; රුදම්, හඬම්; කිස්ස නු, කවරතම් කාරණයකින්; මං, මා; ජහාසි, හළෙද.

935 සො පස්සසන්තො මහතා එණෙන
භුජඞ්ගමො කක්කටමජ්ඣපත්තො
සඛා සඛාරං පරිතායමානො
භුජඞ්ගමං කක්කටකො ගහෙසි.

සඛා, යහළුවූ; පස්සසන්තො, ප්‍රාශ්වාස කරන්නාවූ හෙවත් සුස්මන්නාවූ; සො භුජඞ්ගමො, ඒ නාගයා; සඛාරං, යහළුවූ කපුටුවා; පරිතායමානො, රක්ෂාකරන්නේ; මහතා, මහත්වූ; එණෙන, එණයෙන් යුක්තවූ; කක්කටකං, කකුළුවා කරා; අජ්ඣපත්තො, පැමිණියේය; භුජඞ්ගමං, එසේ පැමිණි භුජඞ්ගමයා; කක්කටකො, කකුළුවා; වාමෙන නළෙන ගහෙසි, වම් නළින් ගත්.

936 න වායසං නො පතකණ්ඨසපපං
සාසත්තිකො කක්කටකො අදෙය්‍ය
පුච්ඡාමි නං ආයතනෙත්තචක්ඛු
අථ කිස්ස හෙතුම්හ උභො ගහිතානි.

කක්කටකො, කකුළුවා, සාසත්තිකො, ආහාරාජීවී; වායසං, කපුටුවා; න අදෙය්‍ය, නොගන්නේය; කණ්ඨසපපං, කෘෂ්ණසර්ෂපයාද; නො පන අදෙය්‍ය, නොමගන්නේය; ආයත, දික්වූ; නෙත්ත චක්ඛු; නෙත්‍ර සඞ්ඛ්‍යාතවූ ඇස් ඇත්තව; තං, හා; පුච්ඡාමි, විචාරම්; අථ, එසේ කල්හි; කිස්ස හෙතු, කවර හෙතුවකින්; උභො, දෙදෙනාවූ; ගහිතා අම්හ, හා විසින් ගන්නාලදුමෝද.

937 අයං පුරිසෝ මම අත්ථකාමෝ
සෝ මං ගහෙත්වාන දකාය නෙති
තසම්ං මතෙ දුක්ඛමනපපකං මෙ
අහව එසෝ ච උභෝ න හොම්.

අයං පුරිසෝ, මේ බ්‍රාහ්මණ පුරුෂයා; මම්, මට; අත්ථකාමෝ, වැඩ කැමතිය; සෝ, හේ; මං, මා; ගහෙත්වාන, ගෙන; දකාය, දියට; නෙති, ගෙන යෙයි; තසම්ං, ඔහු; මතෙ, මළ කල්හි; මෙ, මට; අනපපකං, නොමඳවූ; දුක්ඛං, දුක් වන්නේය; අහව, මම්ද; එසෝ ච, ඒ ද යන; උභෝ, දෙදෙනම; න හොම්, නොවමු:—සොල මේ පුරුෂයා මට උපකාරිය මූ මෙතන මළකල මා ගෙන ගොස් දියෙහි ලනවුන් නැති හෙයින් මම ද මියෙමි මෙ මියෙයි එසේ වන්නා අප දෙදෙනම මියන නියායයි කී.

938 මමව දිස්වාන පවඩ්ඪකායං
සබ්බා ජනෝ හිංසිතුමෙවම්චෙජ්
සාදුව ථුල්ලව මුදුව මංසං
කාකාපි මං දිසව විහෙඨයෙයුං.

පවඩ්ඪකායං, ප්‍රවෘද්ධ කාය ඇති හෙවත් සුහුඹුල්ව වැඩී ශරීර ඇති; සාදුව, මිපුරුවූද; ථුල්ලව, සථුලවූද; මුදුව, මොළොක්වූද; මංසං, මස් ඇති; මමව, මා ද; දිස්වාන, දැන; සබ්බා ජනෝ, සියලු ජන; හිංසිතුං එව, හිංසාකරන්නටම; ඉච්ඡ, කැමති වන්නේය; මිනිස්සු වතු නොවෙති; කාකාපි, කවුඩුවෝද; මං දිසවා, (ගොඩහොත්) මා දැක; විහෙඨයෙයුං; හිංසා කරන්නාහුමයයි ආරුඩනා කෙළේ.

939 සචෙ තස්ස හෙතුමහ උභෝ ගහිතෝ
උඩ්ඩතු පොසෝ විසමාචමාමි
මමං ච කාකං ච පමුඤ්ච බ්‍රිපපං
පුරෙ විසං ගාළ්හමුපෙති මච්චං.

සචෙ, ඉදින්; තස්ස හෙතු, ඔහු හෙතුකොටගෙණ; උභෝ, දෙදෙනම්; ගහිතා අමහ, ගත්තා ලදුමෝ නම්; පොසෝ, පුරුෂයා; උඩ්ඩතු, නැඟී සිටීවා; විසං; විෂය; ආචමාමි, හැරගනිමි; පුරෙ, මද විගසකින්; විසං, විෂය; මච්චං, සත්වයා; ගාළ්හං, දැඩිව; උපෙති, පැමිණේද හෙවත් මුට විෂය දැඩිව නොනැහෙනතුරු; මමං ච, මා ද; කාකං ච, මේ කවුඩුවා ද; සීඝං, වහාම; පමුංච, හැරපිය;—විෂය දැඩිනොවනතුරු අප දෙදෙනා හැරපිය මම විෂය හැරපියම්හි කාඝයා කකුළුවාට කීය.

940 සපපං පමොක්ඛාමි න තාව කාකං
පටිබඬඩකෝ හොහිති තාව කාකෝ
පුරිසං ච දිසවාන සුඛිං අරොගං
කාකං පමොක්ඛාමි යථෙව සපපන්ති.

තාව, පළමුකොට; සපපං, සඒයා; පමොක්ඛාමි, හරිමි; න කාකං, කවුඩුවා එසේ කෝ හරිමි; කුමක් හෙයින්ද යත්; කාකෝ තාව, කවුඩු වනාහි; පටිබඬඩකෝ හොහිති, තා ප්‍රතිබඬ වන්නේයි හෙවත් තට ඇපවන්නේයි; යථෙව සපපං, යම්සේ සඒයා හලිම්ද එපරිද්දෙන්; කාකං, කවුඩුවාද; සුඛිං, සුවපත්වූ හෙවත් මේ මරණ දුකින් මුකතවූ; අරොගං, නිරොගිවූ හෙවත් විෂවෙග යෙන් සන්හුන්; පුරිසං, පුරුෂයා; දිසවාන, දැක; පමොක්ඛාමි, මාගේ ගත් නලින් මුදහරිමි–සඒයා තාද කවුඩුවාද දෙන්නා එක වට නොහරිමි තට ඇපයට කවුඩු මා නළමැදම සිට පසුව තා මා සබඳුගේ විෂය හැර නිදුක් නිරොගිකොට නහා සිටුවාලූවාහු දැක තා හළුවා සේම කවුඩුවා හැර පියම් කිය.

387 සුවණ්ණ කක්කටක ජාතකයයි.

---

941 සකුණො මයහකො නාම ගිරිසානුදරීවරො
පක්කං පිපඵලිමාරුයහ මයහමයහනති කන්දති

ගිරි, ශිලාපඒතයෙහිද; සානු, පාංශුපඒතයෙහිද; දරී, පඒත ගුහා විවරුදිවූ ලෙණද; වරො, හැසිරෙන්නාවූ; මයහකො නාම, "මයහං මයහං" කියා හඬන හෙයින් මයහක නම්වූ; සකුණො, සකුණයෙක්; පක්කං, පරිපක්වූ ඵලඇති; පිපඵලිං, පුලිල ගසකට; ආරුයහ, නැඟී; මයහ මයහාති, මාගේ මාගේයයි කියා මෙසේ; කන්දති, හඬයි.

942 තසෙසවං විලපන්තස්ස විජසංඝා සමාගතා
භුඤ්ජන පිපඵලිං යන්ති විලපන්තෙව සො විජො.

එවං, මෙසේ; විලපන්තස්ස, හඬන්නාවූ; තස්ස, ඔහුගේ; පිප්ඵලිං, පුලිලය; සමාගතා, රැස්වූ; විජසංඝා, පක්ෂිවගීයා; භුඤ්ජන, අනුභවකොට; යන්ති, යෙති; සො විජො, හේ විජයා වූ කලී; විල පන්තෙව, හඬාමැයි; ඒ වූකලී පක්ෂිගණයා පුලිල ඵල කෑවුමයයි සේයි; "පිප්ඵලිං භුඤ්ජා" කී තැන "පිපඵලිං" කියා වර්ණ ව්‍යාජයෙන් ඵල ගත්හු.

943 එවමෙව ඉධෙකච්චෝ සංහරිත්වා බහුං ධනං
අතිවත්තතෝ න ඤාතීනං යථොධිං පටිපජ්ජති

එවමෙවං, එපරිද්දෙන්ම; ඉධ, මේ ලොකයෙහි; එකච්චෝ, සමහර කෙනෙක්; බහුං, බොහෝවූ; ධනං, වස්තුව; සංහරිත්වා, රැස් කොට; යථොධිං, කොටස්වූ පරිද්දෙන්; අත්තනෝ, තමාට ද; නෙව පටිපජ්ජති, නොම දෙන්නේය; ඤාතීනං, නැයන්ට දියයුතුවූ පරිද්දෙන් නොමදෙන්නේසි-යම්හර අඥානයෝ වස්තු රැස්කොට තමා නොඅනුභව කෙරෙති පුත්‍රදාරාදිහු යම් යම් කොටසෙක්දී රක්ෂා කටයුත්තෝද ඔවුන්ට කිසිවක් නොදෙන්නේ යසි සේසි.

944 න සෝ අච්ඡාදනං භත්තං න මාලං න විලෙපනං
නානුභොති සකිං කිඤ්චි න සංගණ්හාති ඤාතකෙ.

සෝ, හේ; අච්ඡාදනං, වස්ත්‍රද; භත්තං, බත්ද; සකිං, එකවරක්; න අනුභොති, නොඅනුභව කෙරෙසි; න මාලං, නොම මල් පලඳී; න විලෙපනං, විලවුන්ද නොගනී; කිඤ්චි ඤාතකෙ, කිසි නැයක්හුද; න සංගණ්හාති, සංග්‍රහයක් නොකෙරේද හේ අඥානයා එකවේල කත් සකස්කොට කිසිවක් තෙමේද අනුභව නොකෙරෙසි නැ ආදී අනුන්ටද කිසිවක් නොදෙසි සේසි.

945 තසෙසවං විලපන්තස්ස මයා මයාන්ති රක්ඛතෝ
රාජානෝ අථ වා චොරා දය්‍යාදා යෙ ච අප්පියා
ධනමාදාය ගච්ඡන්ති විළපතොව සෝ නරෝ.

මයා මය්හන්ති, මාගේය මාගේයසි; රක්ඛතෝ, රක්ෂාකරන්නාවූ; එවං විලපන්තස්ස, මෙසේ හඬන්නාවූ; තස්ස, ඔහුගේ; ධනං, වස්තුව; රාජානෝ, රජ්ජුරුවෝද; අථ වා, නොහොත්; චොරා, සොරුද; අප්පියා, අප්‍රියයෝද; දය්‍යාදා ච, හිමියෝද; ආදාය, ගෙන; ගච්ඡන්ති, යෙති; සෝ නරෝ, හේ සත්ත්වයා; විළපතොව, හඬාමැසි.

946 ධීරෝ ච භොගෙ අධිගම්ම සංගණ්හාති ච ඤාතකෙ
තෙන සෝ කිත්තිං පපොති පෙච්ච සග්ගෙ ච මොදතීති

ධීරෝ ච, ධීරයාවූ කැලී; භොගෙ, සම්පත්තියට; අධිගම්ම, පැමිණ; ඤාතකෙ, නැයන්; සංගණ්හාති ච, සංග්‍රහකෙරෙසි; තෙන, එසින්; කිත්තිං, කීර්තියටද; පපොති, පැමිණෙසි; පෙච්ච, පරලොවද; සග්ගෙ, සවර්ගයෙහි; මොදති, සතුටුවේ.

388 මය්හන ජාතකය සිය.

947 දුබ්බණ්ණරූපං තුවමරියවණ්ණිනී
පුරක්ඛත්වා පඤ්ජලිකො නමස්සසි
සෙය්‍යො හු තෙ සො උදවා සරිකෙඛා
නාමං පරස්සත්තනෝ වාපි බ්‍රූහි.

අරියවණ්ණිනී, සුන්දරවූ වර්ණඇති; තුවං, තෝ; දුබ්බණ්ණරූපං, දුර්වර්ණවූ රූ ඇත්තාහු; පුරක්ඛත්වා, අභිමුඛකොට; පඤ්ජලිකො, ප්‍රඥලිවූයෙහි; නමස්සසි, නමස්කාර කෙරෙහි; එසො, මේතෙම; තෙ, තට; සෙය්‍යො හු, උතුම්ද; උද වා, නොහොත්; සරිකෙඛා, තා හා ශබ්දඥද; පරස්ස, අනිකාගේද හෙවත් තුළුගේද; අත්තනෝ වාපි, තාගේද; නාමං, නාමය; බ්‍රූහි, කියව.

948 න නාමගොත්තං ගණ්හන්ති රාජ
සමඝතානුජ්ජුගතානදෙවා
අහං ච තෙ නාමධෙය්‍යං වදාමි
සක්කොහමස්මි තිදසානමින්දෝ.

රාජ, රජ; සමඝතානං, සියලු සංස්කාර ධර්මයන් සවඤ්ඤත්‍ය වඥඥයන් සම්මර්ශනය කොට අග්‍රවූ අර්හත්ඵලයට සම්ප්‍රාප්ත හෙයින් සම්‍යග්ගත නම්වූද; උජ්ජුගතානං, අෂ්ටාංගික මාර්ගයෙන් නිර්වාණයට ගියෝත්‍රුසි; ඍජුගත නම්වූ අත්‍යුත්තමවූ විශුද්ධි දෙවඥාවන්ගේ; නාමගොත්තං, නාමගොත්‍ර දෙක; දෙවා, උත්පත්ති දෙවතාවෝ; නගණ්හන්ති, නොගනිත්; ආදර නොවන හෙයින් නොකියති සේසි; අහං ච, මම්වූකලී; තෙ, තට; නාමධෙය්‍යං, මාගේ නම; වදාමි, කියමි; තිදසානං, ත්‍රයත්‍රිංශත් භවනයෙහි දෙවතාවන්ට; ඉන්ද්‍රෝ, ප්‍රධානවූ; අහං, මම; සක්කෝ අස්මි, ශක්‍රවම්.

949 යෝ දිසව භික්ඛුං වරණූපපන්නං
පුරක්ඛත්වා පඤ්ජලිකො නමස්සති
පුච්ඡාමි තං දෙවරාජෙතමත්ථං
ඉතෝ චුතෝ කිං ලභතෙ සුඛං සො.

දෙවරාජ, දෙවරාජය; එතං අත්ථං, මේ කාරණය; තං, තා; පුච්ඡාමි, විවාරමි; වරණ, චරණයෙන්; උපපන්නං, යුක්තවූ; භික්ඛුං, භික්ෂුවක්හු; දිසවා, දැක; පුරක්ඛත්වා, අභිමුඛකොට; පඤ්ජලිකො, බද්ධාඤ්ජලි ඇත්තේ; යෝ, යමෙක්; නමස්සති, නමස්කාර කෙරේද; සෝ, හේ; ඉතෝ, මෙයින්; චුතෝ, චුතවූයේ; කිං සුඛං, කවරනම් සුඛයක්; ලභතෙ, ලබන්නේද.

950 යො දිසව භික්ඛුං වරණූපපණ්ණං
පුරක්ඛත්වා පඤ්ජලි සො නමස්සති
දිට්ඨෙව ධම්මෙ ලහතෙ පසංසං
සග්ගං ච සො යාති සරීරභෙදා.

යො, යමෙක්; **වරණූපපණ්ණං**, චරණයෙන් යුක්තවූ; **භික්ඛුං**, භික්ෂුවක්හු; **දිසවා**, දැක; **පුරක්ඛත්වා**, අභිමුඛකොට; **පඤ්ජලිකො**, බඩාඳලිව; **නමස්සති**, නමස්කාර කෙරේද; **සො**, හේ; **දිට්ඨෙව ධම්මෙ**, මෙම ආත්මභාවයෙහිම; **පසංසා**, ප්‍රශංසාද; **ලහතෙ**, ලබන්නේය, **සරීරභෙදා**, ශරීරභෙදයෙන් මතු; **සග්ගං**, සවර්ගයටද; **යාති**, යන්නේයි.

951 ලක්ඛී වත මෙ උදපාදි අජ්ජ
යං වාසවං භූතපතිං දදස්සාම
භික්ඛුඤ්ච දිසවාන භවච්ච සක්ක
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

අජ්ජ, අද; **භූතපතිං**, දෙවතාවන්ට සවාම්වූ; **වාසවං**, වාසවනම් ශක්‍රයා; **අදස්සාම**, දුටුමෝද එහෙයින්; **මෙ**, මට; **වත**, එකාන්ත යෙන්; **ලක්ඛී**, ශ්‍රී නොහොත් කුශලයාගේ විපාකදෙන්නට යොග්‍ය වූ ප්‍රඥා, **උදපාදි**, උපන; **සක්ක**, ශක්‍රය; **භික්ඛුඤ්ච**, භික්ෂුවද; **භවච්ච**, තාද; **දිසවා**, දැක; **අනප්පකානි**, බොහෝවූ; **පුඤ්ඤානි**, පුණ්‍යයන්; **කාහාමි**, කෙරෙම්; මෙහී "යං" යනු නිපාත මාත්‍රයි.

952 අඬා හවෙ සෙවිතබ්බා සප්පඤ්ඤෙ
බහුස්සුතා යෙ බහුඤාණවන්තිනො
භික්ඛුඤ්ච දිසවාන මමඤ්ච රාජ
කරොහි පුඤ්ඤානි අනප්පකානි.

බහුස්සුතා, බහුශ්‍රුතවූ; **බහුඤාණවන්තිනො**, බොහෝ කාරණය චින්තනය කරන්නට සමර්ථවූ; **සප්පඤ්ඤෙ**, සප්‍රාඥවූ; **යෙ**, යමෙක් **ඇදිද**; **ඔහු**; **අඬා**, එකාන්තයෙන්; **සෙවිතබ්බා**, සෙවිතව්‍යයහ; **රාජ**, රජ; **භික්ඛුඤ්ච**, මේභික්ෂූහුද; **මමංච**, මාද; **දිසවාන**, දැක; **අනප්පකානි**, නොමඳවූ; **පුඤ්ඤානි**, දශකුසල කර්මපථසංඛ්‍යාත කුශලයන් **කරොහි**, කර.

953 අක්කොධනෝ නිච්චුපසන්නචිත්තෝ
සබ්බාතිථී යාවයොගෝ භවිච්චා
නිහච්ච මානං අභිවාදයිස්සං
සුඛාන දෙවින්ද සුභාසිතානි.

දෙවින්ද, දෙවරාජය; සුභාසිතානි, තාගේ සුභාෂිතයන්; සුත්වා න, අසා; අක්කොධනෝ, ක්‍රොධිනුවූයෙම්; නිච්චං, සතතයෙන්; පසන්නාවිත්තෝ, ප්‍රසන්නවූ සිත් ඇත්තෙම්; සබ්බාතිථී, සියලුආවාවූ ආගන්තුකයන්ගේ; යාවයොගෝ භවිත්වා, යාවතායටම යොග්‍යවී ගෙන-සියලු ආගන්තුකයන් යාවිඤ්ඤ කළ කළ දෙය දෙන්නෙම්යයි සේසි; මානං, මාඤ; නිහච්ච, නසා; අභිවාදයිස්සං, අභිවාදනය කරන්නට යුක්තානට අභිවාදනය කෙරෙම්-මෙතන පටන් රාජ මානය හැර සිල්වතුන් දුටුසැල වදිමිසි කිව්.

89. ඛජ්ජතෙඤ්ඤ ජාතකයයි.*

---

954 යමේතං වාරිජං පුප්ඵං අදින්නං උපසිඞ්ඝසි
එකඞ්ගමෙතං ථෙය්‍යානං ගන්ධත්ථෙනොසි මාරිස.

යං, යම්හෙයකින්; වාරිජං, දියෙහි හටගත්තාවූ; අදින්නං, කයින් වචසින් නුදුන්නාවූ; එතං පුප්ඵං, මේ නෙළුම්මල; උපසිංඝසි, සුඹුනෙහිය; එතං, මේ; ථෙය්‍යානං, අදත්තාදාන චෙතනා එන්ගේ; එකං අඞ්ගං, එක්කොටසෙකැ; (එසේහෙයින්) මාරිස, නිදුකැ; ගන්ධත්ථෙනොසි, සුවඳ සොරව්.

955 න හරාමි න භඤ්ජාමි ආරා සිංඝාමි වාරිජං
අථ කෙන නු වණ්ණෙන ගන්ධත්ථෙනොති වුච්චති.

වාරිජං, පදමය; න හරාමි, නොගෙන යම්; න භඤ්ජාමි, නොකිඳිමි; ආරා, දුරින්; සිංඝාමි, ආඝ්‍රාණය කෙරෙම්; අථ, එසේකල්හි; කෙන නු වණ්ණෙන, කවර කාරණයකින්; ගන්ධත්ථෙනොති, ගඳ සොරහි කියා; වුච්චති, කියනු ලැබේද—මා පද්මයා ගෙන ගියාත් නැත කඩා ගත්තාත් කැත දුර සිට සුඹපි පමණකින් ගඳ සොරයි මට කුමට කියයි දැයි විවාළෝ.

---

* චිජාඛර ජාතකං—මරම්ම.

956 යොයං භිසානි ඛණති පුණ්ඩරිකානි හඤ්ඤති
එවං ආකිණ්ණකම්මන්තෝ භාසමා එසෝ න වුච්චති.

යො, යමෙක්; යං, යම් හෙයකින්; භිසානි, නෙලඹු දැලිද; ඛණති, කණියිද; පුඩරිකානි, පෙළනෙලුම්; හඤ්ඤති, බිඳියිද; එවං, එසේ; ආකිණ්ණකම්මන්තෝ, දරුණු කර්මාන්ත ඇති; එසෝ, මේතෙම; භාසමා, කුමක් හෙයින්; න වුච්චති, සොරයි නොකියනු ලැබේද;- එවිගස පිලට බැස නෙළඹු දැලි උදුරා මල් බිඳිනා එකාකු දැක මුට සොරයි නොකියා මල ආශ්‍රාණය කළ පමණකින් මට සොරයි කුමකට කියයි දැයි සේසි.

957 ආකිණ්ණලුද්දෝ පුරිසෝ ධාතිවෙලංව මක්ඛිතෝ
භාසමිං මෙ වචනං නත්ථි තව අරහාමි වත්තවේ.

ආකිණ්ණ, ආකීර්ණවූ; ලුද්දෝ, රෞද්‍ර බව ඇති-නිත්‍යයෙන් දරුණු කම් කරන්නාවූයයි සේසි; පුරිසෝ, පුරුෂයා; ධාතිවෙලං ඉව, මලමූත්‍රාදීන් මිශ්‍රව අතිභාලුභවූ කිරිමාගැණියකගේ වස්ත්‍රයක් මෙන්; මක්ඛිතෝ, පාපයෙහි වැකුණේමය; (එසේ හෙයින්) භාසමිං, (පාපයන් ඇති කළහවූ) ඒ පුරුෂයා කෙරෙහි; මෙ, මාගේ; වචනං, වචනයෙක්; නත්ථි, නැහැ; තව, තට වූකලි; වත්තවේ, කුමකුත් කියන්නට; අරහාමි, සුදුස්සෙමි— පාපපූතිභාවයෙහි නිග්‍රහ පරිග්‍රහාදි කිසි වචනයක් නොකියමි; ශ්‍රමණයෝ වූකලි අවවාද කැමතිවන්නාහ, එසේහෙයින් තොප වැනි නිෂ්පාපිත සාමීන් මඳද දෙෂයක් කරගන්නා දිටිම් නම් කුමකුත් කියන්නට සුදුස්සෙමියි සේසි-එසේ මැයි;-

958 අනඝණස්ස පොසස්ස නිච්චා සුචිගවේසිනෝ
වාලග්ගමත්තං පාපස්ස අඛමත්තංව ඛායති.

අනඝනස්ස, නිර්දෙෂවූ; නිච්චං, සතතයෙන්; සුචිගවේසිනෝ, පරිශුඛවූ ගුණධර්මයන් සොයන සුළුවූ; පොසස්ස, පුරුෂයාගේ; පාපස්ස, පාපය සම්බන්ධව; වාලග්ගමත්තං, වාලාග්‍ර මාත්‍රවූයෙකුදු හෙවත් කෙසගක් සාදරුණුවූ දෙෂයක්; අඛමත්තං ඉව, අග්‍රමාත්‍රව; හෙවත් මහාමෙෂප්‍රමාණව; ඛායති, වැටහෙන් නේසි-යමෙක් නිෂ්පාපීව වෙසේ නම් ඔහුගේ මඳ දෙෂයකුත් කිසි රෂ්ඨියෙහි කෘෂණයක්සේ මහමෙර සේ ලොකයහට වැටහෙන් නේ සයි යන අභිප්‍රායයි.

959 අඹං මිං යක්ඛ ජානාසි අථො මං අනුකම්පසි
පුනපි යක්ඛ වජ්ජාසි යදා පස්සසි එදිසං.

යක්ඛ, යක්ෂය; අඩා, එකාන්තයෙන්; මං, මා; ජානාසි, දන්නෙහි හඳුනන්නෙහිය යි සේසි; අථො, අනන්තරයෙන්; මං, ඔව; අනුකම්පසි, අනුකම්පා කෙරෙහි; යක්ඛ, යක්ෂය; යදා, යම් කලෙක්හි; එදිසං, මේබඳු වරදෙක්; පස්සසි, දකීද; (එකල්හි) පුනපි, නැවතද; වජ්ජාසි, අවවාද කිරිය.

960 නෙව තං උපජීවාමි නපි තෙ හතකම්මසෙ
තථමෙව භික්ඛු ජානෙය්‍ය යෙන ගච්ඡෙය්‍ය සුග්ගතිං.

භික්ඛු, තපස්විය; තං, තා; නෙව උපජීවාමි, නොදනිමි; තෙ, තාගේ; නපි හතකම්මසෙ, නොදබැලයෙන් ජීවත් වමිහ; යෙන, යම් ගුණ ධර්මයක් කරණකොට ගෙන; සුග්ගතිං, සුගතියට; ගච්ඡෙය්‍ය, තෝ යන්නෙහිද; (එපරිද්දෙන්ම) තථමෙව, තෝම, ජානෙය්‍ය, දනු.

890 හිංසපුප්ඵ ජාතකයයි.

---

961 සුසුඛං වත ජීවන්ති යෙ ජනා විසාසාදිනො
දිඨෙව ධම්මෙ පාසංසා සම්පරායෙ ච සුග්ගති.

යෙ ජනා, යම් ජනකෙනෙක්; විසාසාදිනො, භුක්තා නිරෝගය කන්නාහුද (ඔහුද); වත, එකාන්තයෙන්; සුසුඛං, අතිශයෙන් හෙවත් සුවසේ; ජීවන්ති, ජීවත් වෙත්; දිඨෙව ධම්මෙ, මෙම ආත්මභාවයෙහි; පාසංසා, ප්‍රශංසාහී වෙති; සම්පරායෙ ච, පරලොවද; සුග්ගති, සුගතිය වන්නේයි.

962 සුවස්ස භාසමානස්ස න නිසාමෙථ පණ්ඩිතා
ඉදං සුණොථ සොදරියා අමෙඛවායං පසංසති.

පණ්ඩිතා, ප්‍රාඥයෙනි; භාසමානස්ස, බණන්නාවූ; සුවස්ස, ගිරවුගේ වචනය; න නිසාමෙථ, නොඅසව්; සොදරියා, මල්බැයෙනි; ඉදං, මේ වචනය; සුණොථ, අසව්; අයං, මේ තෙම; අමෙඛ එව, අඥවම; පසංසති, ප්‍රශංසා කෙරෙයි.

963 නාහං තුමෙඛ පසංසාමි කුණපාදෙ සුණොථ මේ
උච්චිට්ඨභොජිනො තුමෙඛ න තුමෙඛ විසාසාදිනො

කුණපාදා, කුණප නඝණය කරන්නෙනි; මේ, මාගේ විචිත්‍රය; සුණෝථ, අසව්; අහං, මම; තුමෙහ, තොපට; න පසංසාමි, ප්‍රශංසා නොකෙරෙමි; තුමෙහ, තෙපි හැම්දෙන; උච්චිඨහොජිනෝ, උච්ඡිට්ඨභොජීහු-ඉදුල්බත් කන්නාහ සි සේසි; තුමෙහ, තෙපි; නවිඤ්ඤාදිඤ්ඤෝ; ඥානාවිශෙෂයක් නාන්නාහුනම් නොවි.

964 සත්තවස්සා පබ්බජිතා
මේඣාරඤ්ඤස්මි සිඛණ්ඩිනෝ
විහාසෙනෙව යාපෙන්තා
මියමෙ භොතෝ ගාරයා
කෙ නු භොතෝ පසංසිකා.

මේඣාරඤ්ඤස්මි, මෙඛ්‍යාරණ්‍යයෙහි; සිඛණ්ඩිනෝ, කුඩිමිඹිඇත්තාවූ; පබ්බජිතා, ප්‍රව්‍රජිතවූ අපට; සත්තවස්සා, සප්තවර්ෂයක් ඉක්මුණාහ-මේ වල අප තපස් කරන්නේ මෙතෙකට සත්අවුරුද්දයි සේසි; විහාසෙන එව, සිංහ ව්‍යාඝ්‍රයන්ගේ හුඬතැතිරෙකයෙන්ම; යාපෙන්තා, යපෙන්නාවූ; මයං, අපි; මෙ ඉදින්; භොතෝ, භවත්හට; ගාරයා, නිඳුහිවූමෝ නම්; භොතෝ, භවතුන්ට; පසංසිකා, ප්‍රශංසාවට සුදුස්සෝ; කෙනු, කවුරුද-මෙසේ ගුණ ඇති අපට ප්‍රශංසා නොකරවු නම් කවුරුනට ප්‍රශංසා කරවුදැයි සේසි.

965 තුමෙහ සීහානං ව්‍යග්ඝානං වාළානඤ්චාවසිට්ඨකං
උච්චිට්ඨෙනෙව යාපෙන්තා මඤ්ඤේ විහාසාදිනෝ.

තුමෙහ, තෙපි හැම්දෙනම; සීහානං, සිංහයන්ගේද; ව්‍යග්ඝානං, ව්‍යාඝ්‍රයන්ගේද; වාළානං, අවශෙෂ ව්‍යාලමෘගයන්ගේද යන මෙකියන් සතුන්ගේ; අවසිට්ඨකං, අවශිෂ්ටවූ යම් භොජනයෙක් ඇද්ද; උච්චිට්ඨෙන එව, උච්ඡිෂ්ටයෙන් ගෙවත් සිංහයන්ගේ ඉදුලෙන්ම; යාපෙන්තා, යපෙන්නාවූ තෙපි හැම්දෙන; විහාසාදිනෝ, විහාසාදීම්හයි; මඤ්ඤේ, සිතව්.

966 යෙ බ්‍රාහ්මණස්ස සමණස්ස අඤ්ඤසෙව වනිබ්බිනෝ
දඬ්ඪාන සෙසං භුඤ්ජන්ති තෙ ජනා විහාසාදිනෝ.

යෙ, යම්කෙනෙක්; බ්‍රාහ්මණස්ස, ප්‍රහීණ පාපඇති බ්‍රාහ්මණයක් හටද; සමණස්ස, සමිත පාපඇති ශ්‍රමණයක් හටද; අඤ්ඤස්ස එව, මොවුන් කෙරෙන් පිටත් අන්‍යවූ යම් දිලිඳෙක් හටද; වනිබ්බිනෝ, ඒ ඒ වස්තූන් ඉෂ්ඨ කරන වනික්-ජනයක් හටද; දඬ්ඪාන,

(ආහාරාදි) ප්‍රත්‍යයන් දී; සෙසං, (එයින්) අවශිෂ්ටය; භුඤ්ජනි, අනුභව කෙරෙද්ද; තෙ ජනා, එසේවූ ජනයෝ; වීසාසාදිකෝ, විසංසාදිහු නම් වෙත්.

391 විසාසාද ජාතකය.

---

967 පණීතං භුඤ්ජසෙ භත්තං සපිං තෙලඤ්ච මාතුල
අථ කෝත්ථ නු වණ්ණෙන්න කිසෝ තිම්මසි වායස.

මාතුල, මසිල; වායස, කවුඩුව; පණීතං, ප්‍රණීතවූ; භත්තං, (මනුෂ්‍යයන්ට සමපාදිත) බත; භුඤ්ජසෙ, අනුභව කෙරෙහි; සප්පිං, සර්පිෂද; තෙලං, තෙල්ද අනුභව කෙරෙහි, අථ, එසේ කල්හි; කෙත්ථ නු වණ්ණෙන්න, කවරතම් කාරණයෙකින්; ත්වං, තෝ; කිසෝ අසි, කෘශවීද.

968 අමිත්තානමජ්ඣෙ වසතෝ තෙසු ආමිසමේසතෝ
නිච්චං උබ්බිග්ගහදයස්ස කුතෝ කාකස්ස දළ්හියං.

අමිත්තානමජ්ඣෙ, සතුරන් මධ්‍යයෙහි; වසතෝ, වසන්නාවූ; තෙසු, ඔවුන් අතුරෙහි; ආමිසං, ආමිසය; එසතෝ, එෂණය කරන; නිච්චං, සතතයෙන්; උබ්බිග්ගහදයස්ස, උවිග්ගවූ සිත් ඇති; කාකස්ස, කවුඩුවාගේ; දළ්හියං, දළ්හ බවෙක් හෙවත් මාංස රුධිර දෙදෙනාගේ අධිකාවශයෙන් පුෂ්ටියෙක්; කුතෝ, කොයින්ද.

969 නිච්චං උබ්බෙධිතෝ කාකා වඩ්කා පාපෙන කම්මුනා
ලඩ්ඩෝ පිණ්ඩෝ න පිණෙති කිසෝ තෙනසමි වච්චක.

වංකා, වක්‍රවූ ග්‍රීවා ඇති හෙයින් වංකයයි කියනලද; කාකා, කවුඩුවෝ; නිච්චං, සතතයෙන්; උබ්බෙධිතෝ, උත්‍රසතයහ; (එසේවූ ඒ කාකයන්); පාපෙන කම්මුනා, මනුෂ්‍යසන්තානය හැරගෙන කරන පාපකර්මයෙන්; ලඩ්ඩෝ, ලබන ලද; පිණ්ඩෝ, පිඬඟ; නපිණෙති, නොපිණවයි; වච්චක, වටුව; තෙනා, ඒ කාරණයෙන්; කිසෝ අසමි, කෘශවීමි.

970 ලුඛානි තිණබීජානි අපසිනෙහානි භුඤ්ජසි
අථ කෝඤ්ච නු වණ්ණෙන්න ථූලෝ තිම්මසි වච්චක.

වච්චකා, වටුව; ලූඛ නී, රූක්ෂවූ; අපපයිතෙහාතී, ඔජෝරහිතවූ; ඛීණබීජාති, තෘෂ්ණාබීජයන්; භුජසි, අනුභව කෙරෙහි; (එතකුදු වුවත්;) වඃ, හෝ; කෙන නු වණ්ණෙන, කවරතම් කාරණයෙකින් ථූලා අසි, සම්පූර්ණ මාංස රුධිර ඇත්තෙහිද.

971 අපපිච්ඡාඅපපවිත්තාය අවිදූරගමනෙන ච
* ලඛ්ඨලඛ්ඛෙන යාපෙතෙතා ථූලෝ තෙනයම්පි වායස.

වායස, කාකය; අපපිච්ඡා, ආහාරයෙහි අල්පෙච්ඡතායෙන්—භුදෙක් තෘෂ්ණා රහිත බැවින් සිරුර ඇපීමට වශයෙන් අහර ගන්නා බැවිනැයි සේසි; අපපවිත්තාය, (අද කොහි ආහාර ලබම්ද සෙට කොහි දැයි මෙසේ ආහාර) චින්තනය නැතිහෙයින්; අවිදූර ගමනෙන ච, (දැසවල් තම් තැන අසවල්ම්හිරක් ලබනෙම් යි නොසිතා) දුර නොවූ ගමන් යාමෙන්ද; ලඛ්ඨලඛ්ඛෙන, (රූක්ෂව හෝ ප්‍රණීතව හෝ) ලත් ලත් දෙයින්; යාපෙතෙතා, ශරීරයාපනය කරන්නෙම්;තෙන, ඒ(සතර)කාරණයෙන්; ථූලෝ අසම්, සථූල වීමි.

972 අප්පිච්ඡස්ස හි පොසස්ස අපපවිත්තිසුඛස්ස ච
සුසංගණිතපමාණස්ස වුත්තී සුසමුදානයාති.

අපපිච්ඡස්ස, අලෙච්ඡවූ; අපපවිත්තිසුඛස්ස ච; ආහාරචින්තා රහිත හෙයින් අල්පවිත්තිවූ ආර්‍යයන්ගේ සැපයෙන් සමන්විතවූ; සුසඞ්ගහිත පමාණස්ස, (මෙතෙක් වළඳා දිරවන්ට හැකි වන්නේය යි මෙසේ මනාකොට ගන්නා ලද ආහාර ප්‍රමාණ ඇති; වුත්තී, (මෙබදු පුද්ගලයාගේ) ජීවිකාවෘත්තිය; සුසමුදානයා, සැපසේ නිපද වන්ට හැකිවන්නේය.

392 වච්චකජාතකයයි.

---

973 චිරස්සං වත පස්සාම සහායං මණිධාරිනං
සුකතාය මස්සුකුත්තියා සොභතෙ වත මේ සඛා.

මණිධාරිනං, මාණික්‍යයක් ධරන්නාවූ; සහායං, සහලුවිඤ්ඤු; චිරස්සං, කාලකින්; වත, එකාන්තයෙන්; පස්සාම, දක්නෙමු; සුකතාය, මොනවට කරන ලද; මස්සුකුත්තියා, සමශ්‍රැක්‍රියා යෙන් උපලක්ෂිතවූමෙසඛා, මාගේ සහලු තෙම; සොභතෙ, හොබනේය.

---

* ලඛ්ඨාලඛ්ඛෙන—මරමම

974 * පරූළ්හකච්ඡනඛලෝමෝ අහං කාමේසු ව්‍යාවටෝ
චිරස්සං නහාපිතං ලබ්භා ලෝමං † තමපහාරයිං.

කාමේසු, රාජකාරියේයෙහි; ව්‍යාවටෝ, ව්‍යාපෘතවූ; අහං, මම; පරූළ්හ, වැඩුණාවූ; කච්ඡනඛලෝමෝ, කිසිලිතිය රොම ඇත්තෙම්; චිරස්සං, කලකින්; නහාපිතං ලබ්භා, කප්පාවැඩීමියෙකු ලදින්; තං ලෝමං, ඒ ලොමය; අපහාරයිං, (අද) දුරුකරවූයෙමි.

975 යන්නූ ලෝමං අහාරෙසි දුල්ලභං ලබ කප්පකං
අථ කිං වරහි තෙ සම්ම ‡ කණ්ණෝ කිණකිණායති.

යන්නූ, යම් හෙයකින්; දුල්ලභං, දුර්ලභවූ; කප්පකං, කප්පාවැඩීමියෙකු; ලබ්භා, ලදින්; ලෝමං, ලොමය; (කච්ඡාදියෙහි පියාපත්;) අහාරෙසි, දුරුහෙළෙහි; අථ යලිත්; සම්ම, යහළුව; වරහි, දුන්; කිං ව, කුමක්; කණ්ණෝ, බොටුවෙහි; කිණකිණායති, කිණිකිණි යන අනුකරණ පවත්වන්නේද යි කාකයාට පරිහාස කෙළේ.

976 මනුස්සසුඛුමාලානං මණී කණ්ණේසු ලම්බති
තෙසාහමනුයිකඛාමි මා තුවං මඤ්ඤි දවාකතං.

මනුස්සසුඛුමාලානං, සිවුමැලි මනුෂ්‍යයන්ගේ; කණ්ණේසු, බොටුවෙහි; මණී, එක් මාණික්‍යරත්නයක්; ලම්බති, ලම්බමානවෙයි; (එහෙයින්); අහං, මම; හෙයං අනු, ඒ මනුෂ්‍යයන්ටඅනුව; සිඝඛාමි, හික්මෙම්; හෙවත් පිළිපදිමි; තුවං, තුබ; දවාකතං, කෙළි පිණිස කරනලද්ද කැයි, මා මඤ්ඤි, නො සිතව.

977 සචෙපි මං පිහයසි මස්සුකුත්තිං සුකාරිතං
කාරයිස්සාමි තෙ සම්ම මණිඤ්චාපි දදාමි තෙ.

සම්ම, සබඳ; සචෙපි, ඉදින්; මං, මට; සුකාරිතං, මොනවට කරන ලද; මස්සු කුත්තිං, සමශ්‍රු කෘත්‍යය; පියඛසි; කැමැත්තෙහි නම්; තෙ, තට; කාරයිස්සාමි, (එබන්දක්) කරවන්නෙමි; තෙ, තට; මණිඤ්චාපි, (මා ගෙළෙහි බැඳි) මැණිකද; දදාමි, දෙමි.

978 නඛෙඤ්ඤව ඉ මණිනා ඡන්නෝ සුකතාය ච මස්සුයා
ආමන්ත ඛො තං ගච්ඡාමි පියං මෙ තව දස්සනන්ති.

---

* පරූළ්හඝචජා නඛාලෝමා—මරම්ම
† තමපජ්ජ හරාමි—මරම්ම
‡ ඉදං කණ්ඨෙ කිණායති—මරම්ම
§ මණිනෝ—සම්මර.

සිඤ්ඤවේ, තෝම; මණ්ඩා, (මේ) මැණිහට; ජාතෝ සුදුසුය; සුභතාය, මොනවට කරනලද; මස්සුයා ච, සමශ්‍රු කර්මයටද (තෝම සුදුසුය); තව, (සබඳ) තාගේ, දස්සනං, දැකීම; මෙ, මට; පියං, ප්‍රියය; එහෙත්; තං, තට; ආමන්තා බො, අමන්ත්‍රණය කොට; ගච්ඡාමි, යෙමි කියේය.

393 සාඛ ජාතකයයි.

දෙවන සෙනක වගීයයි.

ෂට්ක නිපාතයයි.

---

979 දියඩ්ඪකුක්කු උදයෙන කණ්ණිකා
චිදත්තියෝ අට්ඨපරිකඛිපන්ති නං
යා සිංසපා සාරමයා අපෙග්ඝුකා
කුහිං සීතා උපරිතෝ න ඛංසති.

කණ්ණිකා, කැණිමඬල; උදයෙන, උසින්; දියඩ්ඪකුක්කු; යෙළ රියනෙක; නං, ඒ; (කැණිමඬල) අට විදත්තියෝ, අටවිය තෙක්; පරිකඛිපන්ති, පිරිකෙව් කෙරෙත්—වටින් අටවියතෙක යි සේසි; සාරමයා, හරමුවා; අපෙග්ඝුකා, එළ නැති; යා සිංසපා, හින් සලමුවා යම් කැණිමඬලක් වේද; (ඕනොමෝ) කුහිං, කොහි, සීතා, පිහිටියා; උපරිතෝ, මත්තෙන්; න ඛංසති, කොහේද.

980 යා තිංසති සාරමයා * අනුජ්ජුකා
†පරිකිරිය ගොපාණසියෝ ‡ සමඞ්ගිතා
ඨිතා සඞ්ඝහිතා බලසා ¶ පපිළිකා
සමං සීතා උපරිතෝ න ඛංසති.

අනුජ්ජුකා, සෘජු නොවූ; සාරමයා, හරමුවා; යා තිංසතී ගොපාණසියෝ, තිසක් පමණවූ යම් ගොණැස් කෙනෙක්; පරිකිරිය,

---

* අපෙග්ඝුකා—මරම්ම. § තානි සුසඞ්ගතිතා—මරම්ම.
† පකිරියා—මරම්ම. ‡ සබ්බං සීතා—මරම්ම. ¶ පිළිතා—මරම්ම.

පිරිවරන ලදුව්; සමඞ්ගීතා, සමබැවින් සිටියාහුද; තා, ඔහුතුම්; ඛලඝා, බලයෙන්; පපිළිතා, පෙලුනලද්දාහු; සඞ්ගඝිතා, මොනවට එකාබඳව; සමං ඝිතා, සමව පිහිටියාහු; උපරිතො, මත්තෙන්; න ධංසති, (ඉධංඝතති) නොහෙත්.

981 එවං මිත්තෙහි දළ්හෙහි පණ්ඩිතෝ
අහෙජ්ජරූපෙහි සුවිහි මන්තිහි
සුසඞ්ගහිතෝ සිරියා න ධංසති
ගොපාණසිභාරවහාව කණ්ණිකා.

එවං, මෙසේ; පණ්ඩිතෝ, නුවණැති රජතෙමේ; දළ්හෙහි, මිත්තෙහි, දෘඪමිත්‍රවූ; අහෙජ්ජරූපෙහි, නොබිඳෙන සුලු වූ; සුවිහි, පරිශුඛසමාචාර ඇති; මන්තීහි, මන්ත්‍රීන්ගෙ; සුසඞ්ගහිතෝ; මනාකොට සම්බන්ධවූයේ; ගොපාණසිභාරවහා—ගොපාණසි, ගොණැස්සගේ; භාරවහා, බරඋසුලන්නාවූ; කණ්ණිකා ඉව, කැණිමඬල මෙන්; සිරියා, ලක්ෂ්මියෙන්; න ධංසති, නොපිරිහේ—යම්සේ ගොණැස්බර උසුලන්නාවූ කැණිමඬල නොවැළෙඳ; එසේම යටකී නොබිඳෙන සිත් ඇති මන්ත්‍රීන්ගෙ එක්ව විසීමෙන් රජතෙමේ රාජ්‍යශ්‍රියෙන් නොපිරිහේ" යි සේසි.

982 ඛරත්තවං* මෙල්ලං යථාපි සත්ථවා
අනාමසනෙනාපි කරොති තිත්තකං
සමාහරං† සාධු කරොති පත්තිව
‡ අසාධු කසිරං 4 තනුවඛ්මුඛරං.

යථාපි, යම්සේ; සත්ථවා, ශස්ත්‍ර ඇත්තේ; ඛරතවං, තදවූලෙල්ල ඇති; මෙල්ලං, ලප්නාරඹ—"මෙලං" යි හෝ පාඨයි, අර්ථමේ මැයි; අනාමසනෙනාපි, (පිට ලෙල්ල තුනී කොටද) නොසහින්නේ; තිත්තකං කරොති, (මේඵලය) තික්තරස ඇත්තක් කෙරේද; සමාහරං, පිව ලෙල්ල සෑස ඇතුළත ඇඹුලද ඔඟැර නොනික්මවන්නේ; සාධුකරොති, යහපත් කෙරේද නොහොත් මධුර කෙරේද; පත්තිව, මහරජණෙති; තනුවඛං, තුනීවූ ලෙල්ල; උඛරං, උදුරන්නේ; අසාධු කසිරං, අයහපත් කරන්නේද නොහොත් අම්බිරි කරන්නේද.

---

*බෙල්ලං-ම්රම්ම. † සාධු-ම්රම්ම. ‡ අසාධු-ම්රම්ම. 4 තනුඛඛ-ම්රම්ම.

983 එවම්පි ගාමනිගමෙසු පණ්ඩිතෝ
අසාහසං රාජධනානි සඞ්කරං
ධම්මානුවුත්තිං පටිපජ්ජමානෝ
ස එති කසිරං අවිහෙඨයං පරං.

එවම්පි, මෙසේ; **පණ්ඩිතෝ**, නුවණැති රජතෙමේ; **අසාහසං**, නොසැහැසිව; **ගාමනිගමෙසු**, ගම්නියම්ගම්හි; **රාජධනානි**, රජුන් විළිබඳ ධනයන්—කරවුවර" යි සේසි; **සඞ්කරං**, ගන්නේ; **ධම්මානුවුත්තිං**, දහම් අනුව පැවැත්මෙහි; **පටිපජ්ජමානෝ**, පිළිපදනේ; **පරං**, අන්‍යයා; **අවිහෙඨයං**; නොපෙළන්නේ; **සෝ**, හෙතෙමේ; **එති**, (තමන්ගේ හා අනුන්ගේ) වැඩිය; **කසිරං**, කරන්නේසි—මෙහි තෘෂ්ණාවගේ වශඟයට නොගොස් අගතිගමන හැර රට නොපෙළා වේයන්ගේ තුඹස් බැඳීම මෙන්ද මී මැස්සන්ගේ මී බැඳීම මෙන්ද කරවුවර ගතයුතු හෙයින් "අසාහසං" යි වදළෝ, දැන ශීලාදී දශරාජ ධර්මයන්ට අනුව පැවැත්ම "ධම්මානුවුත්ති" නම්.

984 ඔදාතමූලං සුවිවාරිසම්භවං
ජාතං යථා පොක්ඛරණීසු අම්බුජං
පදුමං යථා අගන්ධිනිකාසි එලිමං
න කද්දමෝ නාරජෝ න ඌරි ලිම්පති.

යථා, යම්සේ; **ඔදාතමූලං**, පඬෙරමුල් ඇති; **සුවිවාරිසම්භවං**—සුවි, පිරිසුදුවූ; වාරි, ජලයෙහි; සම්භවං, හටගත්තාවූ; **පොක්ඛරණීසු**, පුෂ්කරණීන්හි; **ජාතං**, හටගත්තාවූ; **අම්බුජං**, අම්බුජ සඤ්ඤාතවූ; * **අග්ගිනිකාසි**, හිරු කිරණ ඇවිටගෙන; **එලිමං**, විවෘයාවූ; **පදුමං**, පියුම්; **කද්දමෝ**, මඩහෝ මඩෙහි; **න ලිම්පති**, නොවකාද හෝ(නොවැකේද);**න රජෝ**; දුහුවිලි හෝ දුහුවිලියෙහි නොවකාද හෝ නොවැකේද;**වාරි,ජලය** හෝ ජලයෙහි;**න ලිම්පති**, නොවකාද හෝ නොවැකේද—ලෙපති" කියා හෝ පාඨයි දෙවෙනි "යථා" ශබ්දය පාදපූරණය පිණිසයි.

985 එවම්පි වොහාරපුච්ඡං අසාහසං
විසුඛනම්මන්තමපෙතපාපකං
න ලිම්පති ධම්මකිලෙස තාදිසෝ
ජාතං යථා පොක්ඛරණීසු අම්බුජන්ති.

---

* අග්ගිනෝ නිකාසං (සදිසත්තං) අස්ස අත්ථීති අග්ගි නිකාසී. සූරියෝ.

එවමපි, මෙසේ; වොහාරසූචිං, (පෙර දැහැම් රජුන් විසින් ලියවා තබන ලද) විනිශ්චය විවිධාරයෙන් විවිසුද්ධවූ—අලුතින් හැර දැහැමින් විනිශ්චය කරන්නාවූ සි සේයි; අසංහසං, (ඒ ඒ විනිශ්චයෙහි පිහිටි හෙයින්ම) සාහස ක්‍රියාරහිතවූ; විසුඛ කම්මන්තං, එහෙයින්ම විවිසුද්ධවූ කර්මාන්ත ඇති; අපෙත පාපකං, පහවූ පාපකර්ම ඇති රජහු, කම්මයිලෙසො, පාණාති පාතාදි කම් කෙලෙස් හෙමේ; න ලිම්පති, නොවිකා—කවර හෙයිනයත්? පොක්ඛරණිස්ස, ප්‍රුක්ඛරණීන්හි; ජාතං, හටගත්තාවූ; අම්බුජං, පියුම්; යථා, යම්සේද; (එසේම්) තාදිසො, එබදුවූ රජතෙමේ අනුපලිත්ත නම්වේ.

894. කුසකූ ජානකයයි.

---

986 යථා වාපො නිත්තමති ජියා වාපි නිකුජති
හඤ්ඤතෙ නුත මනොජෝ මිගරාජ සඛා මම.

යථා, යම් ආකාර යෙකින්; වාපො, දුන්න; නිත්තමති, කැමේද; ජියා වාපි, දුනුදිය තොමෝ; නිකුජති, පොළොන ලද්දී හඬාද; (මෙකාරණයෙන්) මනොජෝ, මනොජනම්වූ; මම, මාගේ; සඛා, යහලුවූ; මිගරාජ, සිංහ රාජයා; හඤ්ඤතෙ, ශරයෙන් පහරන ලැබෙයි කියා; නූන, හඟිමි.

987 හඤ්ඤති වතන්තානි පක්කමාමි යථා සුඛං
නෙතාදිසා සඛා හොන්ති ලඛා මෙ ජීවතො සඛා.

හඤ්ඤ, එබැවින්; ඉදානි, දැන්; වතන්තානි, වකාන්තරයට; යථාසුඛං, සුවයේ; පක්කමාමි, යෙමි; එතාදිසා, මෙබඳුවූ මළ ජනයෝ; සඛා න හොන්ති, යාචූතම් කොවෙති; ජීවතො; ජීවත්ව කොමිය ඉන්නාවූ; මෙ, මට; සඛා, යාළුවෝ; ලඛා, ලැබෙන්නාහුයි—කොමිය හුන්නෙමි මිතුයන් ලබන්නෙමි වේදැයි කියා කැමති වලකට ගියේයයි සේ.

988 න පාපජන සංසෙවී අචවන්ත සුඛ මේධති
මනොජං පස්ස සෙමානං ගිරියස්සානුසාසනී.

පාපජන, ලාමක ජනයා; සංසෙවී, සෙවියේ; අචවන්ත, බොහෝ කලක්; සුඛං, සුව; න එධති, නොලැබෙයි සේයි; සෙමානං, ශරප්‍රහාරය ලදින් හෝනාවූ; මනොජං, මනොජයා; පස්ස,

බල; හිරියස්ස, හිරියත්‍යම් ශෘගාලයාගේ; අනුසාසනී; අනුශාසත්‍යා මෙබඳුයි— මෙසේවූ විපත්තියට පමුණුවන්නීයයි සේයි, යමෙක් ස්ත්‍රීයාහා එක්ව විසීද එසේවූයේ ශෘගාලයා එක්ව උගේ වචන යෙන් යුක්තව විනාශයට පැමිණි සිංහ පොතකයාමෙන් විනාශයට යන්නේ යයි සේයි.

989 න පාප සම්පවංකෙන මාතා පුත්තෙන්න නන්දති
මනොජං පස්ස සෙම්හනං අවජ්ඤනං සමහි ලොහිතෙ

ගෙහෙ, ගිහිගෙයි; වසතෝ, වසන්නාවුගේ; යාරති, යම් පවත්නා රතියෙක් ඇද්ද; එසා, මෝ තොමෝ; රජ්ජුවාලම්බනී, එළෙන්නාවූ; රජ්ජු ඉව, රජ්ජුවක් වැන්නීය; එතම්පි, මෙද; ඡෙත්වාන, සිඳ; අනපෙක්ඛිනෝ, අපෙක්ෂාවක් නැති; ධීරා, ධීරයෝ; කාමසුඛං, පවත්නා කාමසුඛය; පහාය, හැර; වජන්ති, තපසටයෙත්;-"ව"යන්න නිපාතයි-ගිහිගෙයි වසන්නාහුගේ පවත්නා රතියනම් රොගී කෙනෙක්තවූ එල්බගෙන පෙරලෙ ගන්නට බැඳුණු රැණ තබා එල්බ

ගෙන පෙරලෙන රෝහිතව යම් පමන සුඛාස්වාදයක්දේද එම පමන අල්පාස්වාදයක් ඇත්තේය යන අභිප්‍රායයි.

498 සුසිම ජාතකයයි.

1098 අහං දසසතං ව්‍යාමං උරගම්හිදස ආගතා
තඤ්ච මඤ්ච මහාකායං ධාරයං නපජෙවධයි.

අහං, මම; දසසතංව්‍යාමං, දහසක් ව්‍යාම පමණ දිග්වූ; උරගං, නයකු; ආදාය, ගෙන; ආගතොං, ආයෙම්; මහාකායං, මහා ශරීර ඇති; තඤ්ච, ඒසා නයිද, මඤ්ච, මා ද; ධාරයං, ධරන්නෙහි; නපජෙවධයි, නොවෙව්ලයි.

1099 අපිමං බුද්දකං පක්ඛිං අපපමංස තරංමයා
ධාරයං ව්‍යාධසෙ භීතො කිමත්ථං නොවසිම්බලි.

කොවසිම්බලි, කොවසිම්බලිය; අථ, එසේ කල්හි; මයා, ඒවිද වඩා; අපපමංසතරං, ඉතාමදවූ මාංස ඇති; ඉමං උදකං පක්ඛිං, මේ ක්‍ෂුද්‍රවූ පක්ෂියා; ධාරයං, ධරන්නෙහි; භීතො, භයපත්වූයෙහි; කිමත්ථං, කවර කාරණයකින්; ව්‍යාධසෙ, වෙව්ලයිද;- කදු අතු මහත් හෙයින් නොවසිම්බලි නම්විය නොවසිම්බලියයි කියා එහි වසන දෙවතාවාට ආමන්ත්‍රණය කොළෝ.

1100 මංස භකෙඛා තුවං රාජ ඵලභකෙඛා අයං දිජො
අයං නිග්‍රොධ බීජානි පිලක්ඛ දුම්බරානිව
අස්සත්ථානිව භකෙඛඩා ඛණ්ඩ මේ ඔදඤ්ඤසති.

රාජ, රජ; තුවං, තෝ; මංසභකෙඛා, මස්කන්නෙහි; අයං දිජො, මේ පක්ෂියා; ඵලභකෙඛා, වෘක්ෂඵල භක්ෂණය කරන්නේය; අයං, මේ පක්ෂියා; නිග්‍රොධ බීජානි, න්‍යග්‍රොධ බීජයන්ද; පිලක්ඛ, පුලිල ඵලයන්ද; උදුම්බරානිව, දිඹුල් ඵලයන්ද; අස්සත්ථානිව, ඇසතු ඵලයන්ද; භකෙඛඩා, අනුභවකොට; මේ, මාගේ; ඛණ්ඩ, කඳ; ඔදඤ්ඤසති, වළඳිමය හෙලන්නේය.

1101 තෙ රුක්ඛා සංවිරුහන්ති මම්පසෙසනිවානජා
නො මං පරියොනන්ධන්ති අරුක්ඛ විවං කරිසසරා.

මම, මාගේ; පසෙස, පාර්ශ්වයෙහි; නිවාතජා, වාතරහිත සථාන යෙහි ජාතවූ; තෙ, නෘග්‍රොධාදිවූ; රුක්ඛා, වෘක්ෂයෝ; සංවිරූහනති, හටගනිති; තෙ, එසේම වැඩියාවූ ඔහු; මං, මා; පරියොනන්ධිස්සන්ති, වැලඳ ගනිති; මං, මා; අරුක්ඛං, වෘක්ෂ නැත්තහු; කරිස්සරෙ, කෙරෙති; වැලඳගත මාගේ ගස මරන්නාහුයයි සේයි.

1102 සන්තිඅඤ්ඤැපි රුක්ඛාසෙ මූලිනො ඛන්ධිනො ද්‍රුමා
ඉම්නා සකුණ ජාතෙන ඛීජමාහරිතා හතා.

ඛීජං, නාග්‍රොධාදිවූ බිජුවට; ආහරිතා, ගෙනහැර; ඉම්නා සකුණජාතෙන, මේ සකුණ ජාතීන් විසින්; හතා, නසනලදැ; මූලිනො, සම්පන්න මූල් ඇති; ඛන්ධිනො, සම්පන්න කඳුඇති; ද්‍රුමා, ද්‍රුම සඛ්‍යාතවූ; අඤ්ඤැපි රුක්ඛා, යෙසු වෘක්ෂමූලයෝද; සන්ති, ඇත්තාහ.

1103 අජ්ඣාරුළහාති වඤ්චන්ති බ්‍රහන්තමපි වනස්පතිං
තසමා රාජ පවෙධාමි සම්පස්සං නාගතං භයං.

රාජ, රජ; බ්‍රහන්තමපි, මහත්දවූ; වනස්පතිං, වනජෙෂ්ඨ වෘක්ෂයා; අජ්ඣාරුළහ, අඛ්‍යාරුඝව; හෙවත් අභිභවා; අභිවඤ්චන්ති, වඤ්චති; තසමා, එසේ හෙයින්; අනාගතං භයං, අනාගත භය; සම්පස්සං, බලන්නෙම්; පවෙධාම්, වෙව්ලම්.

1104 සංකෙය්‍ය සංකිතබ්බානි රක්ඛෙය්‍යා නාගතං භයං
අනාගත භයා ධීරෙ උභො ලොකෙ අවෙක්ඛති.

සංකිතබ්බානි, ශාංකාකටයුත්තවුන්; සංකෙය්‍ය, ශාංකා කරන්නේය; අනාගතං, නො ආවාවූ; භයං, භය; රක්ඛෙය්‍ය, තමා කරා වැද්ද නොදෙමියි රක්ෂාකරන්නේය; ධීරෙ, ධීරයා; අනාගතභයා, අනාගත භය හෙතුකොටගෙන; උභොලොකෙ, දෙලොව; අවෙක්ඛති, බලන්නේයි.

407 කොටසිම්බලි ජාතකයයි.

1105 රාජා අපුච්ඡි විධුරං ධම්මකාමෝ සුධම්මිලෝ
අථ බ්‍රාහ්මණ ජානාසි කෝ එසෝ බහු සොචති.

ධම්මකාමෝ, ධර්මකාමීවූ ශෙවත් සුවරිත ධර්මයෙහි ප්‍රියවූ; සුධම්මිලෝ රාජා, සුධම්මිල ගොත්‍ර ඇති ධනඤය කොරව්‍ය නම් රජ හෙම්; විධුරං, විධුර පණ්ඩිතයන්; අපුච්ඡි, (අනිකුදු රජහු මේයේ පැරදි විරුදුයි) විචාළේය;-බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; සෝ එසෝ, හුද කලාවූ සාවරෙක්; බහු සොචති, බොහෝ ඩොට නොයෙක් කරුණෙන් ශොක කෙරේදුයි; ජානාසි අපි, දන්නෙහි දුයි--යෙපු උපාඛ්‍යායාථාවෙහුදු විචාළේ.

1106 බ්‍රාහ්මණෝ අජයූථෙන * බහුතෙජෝ වනෙ වසං
ධූමං අකාසි වාසෙට්ඨො රත්තින්දිවමතන්දිතෝ.

අජයූථෙන, එළුන සමූහයෙන් යුක්තාව; බහුතෙජෝ, බොහෝ දර ඇතිව; වනෙ වසං, වෙනෙහි වසන්නාවූ; වාසෙට්ඨෝ බ්‍රාහ්මණෝ, වාසෙට්ඨ ගොත්‍ර ඇති බ්‍රාහ්මණ තෙමේ; රත්තින්දිවං, අහොරාත්‍රයෙහි; අතන්දිතෝ, අනලස්ව; ධූමං අකාසි, (මැසි උවදුරු ගරණා පිණිස) ගිනිදුම් කෙළේය.

1107 තස්ස තං ධූමගන්ධෙන සරහා මකසට්ඨිතා
වස්සාවාසා උපගඤ්ඡුං ධූමිනාරිස්ස සන්තිකෙ.

තං (තෙන) ධූමගන්ධෙන, ඒ ගිනිදුම් ගඳින්; මකසට්ඨිතා, මැසි මදුරුවන්ගෙන් උපද්‍රවය පෙළනාවූ; සරහා, සරහ මෘගයෝ; තස්ස ධූමකාරිස්ස, ගිනිදුම් කරන්නාවූ ඒ බ්‍රාහ්මණයාගේ; සන්තිකෙ, සමීපයට; වස්සාවාසා, වර්ෂාඍතු කාලයෙහි විසිම පණිස; උපගඤ්ඡුං, පැමිණියාහුය.

1108 සරභෙසු මනං කත්වා අජා සෝ † නාවබුජ්ඣති
ආගච්ඡන්තී වජන්තී වා නස්ස හා විනසුං අජා.

සෝ, ඒ බ්‍රාහ්මණ හෙම; සරභෙසු, සරහමිගයන් කෙරෙහි; මනං කත්වා, සෙනහ උපදවා; ආගච්ඡන්තී, ගොදුරු පිණිස ඇදිරි වනයෙන් එන්නාවූද; වජන්තී වා, ගොවුදෙන් නික්ම වකයට යන්නාවූද; අජා, එළුවන්; නාවබුජ්ඣති, මේතෙක් දෙන ආවාහුය මේ තෙක් දෙන ගියාහුයයි සඤ්ඤාවක් නොදනී; තස්ස, එසේ ප්‍රත්‍යවෙක්ෂා නැති ඔහුගේ; හා අජා, සිංහ උපද්‍රව ආදියෙන් නොරක්නා ලද්දේ එළුවෝ; විනසුං, සිංහ උපද්‍රවාදියෙන් විනාශවූහ.

* බහුතෙජෝ-සිංහල පොත්. † නාව බුජ්ඣති-සියළුපොත්.

1109 සරභා සරදෙ කාලෙ පහීනමකසෙ එනෙ
පාවිසුං ගිරිදුගහානි නදිනං පභවානි ච.

සරභා, සරභමෘගයෝ; පහීනමකසෙ, මැසිමදුරුවන් ප්‍රහීනවූ; එනෙ, වනය ඇති; සරදෙ කාලෙ, ශරත්කාලයෙහි; නදිනං, (පළිත යෙන් ගැටගත්) ගඩොළුවන්ගේ; පභවානි ච, ප්‍රභවස්ථානවූ; ගිරි දුගහානි, ගිරිදුර්ගයන්ට; (උස් මහත් පළිත කඳුරැලි තිසා යන්ට දුෂ්කර ස්ථානවලට) පාවිසුං, පිවිසියාහුය.

1110 සරභෙ ච ගහෙ දිසවා අජා ච විභවං ගතා
කිසො විවණ්ණා ආසි පණ්ඩුරොගී ච බ්‍රාහ්මණො.

ගතෙ, එයින් නික්ම වනයට ගියාවූ; සරභෙ ච, සරභමෘගයන්ද; විභවං ගතා, විනාසයට පැමිණියාවූ; අජා ච, එළුවන්ද; දිසවා, දැක; බ්‍රාහ්මණො, ඒ අජපාල බ්‍රාහ්මණ තෙම, කිසො, ශොකයෙන් මඩනා ලද්දව කෘශවූ; විවණ්ණා, දුර්වර්ණවූ සරීර ඇතිව; පණ්ඩුරොගී ච ආසි, හටගත් පාණ්ඩුරොග ඇත්තෙක්ද විය.

1111 එවං * යො සන්තිරං භවා ආගන්තුං කුරුතෙ පියං
සො එකො බහු සොචති ධම්මකාරීව බ්‍රාහ්මණොති

එවං, මෙපරිදිදෙන්; යො, යමෙක්; සන්තිරං භවා, සවකිය ජනයා තිකුත්සොට හැර; ආගන්තුං, ආගන්තුකජනයා; පියං කුරුතෙ, ප්‍රිය කෙරේද; සො, තොපවැනි හෙතෙම; එකො, හුදකලාව; ධම්මකාරී බ්‍රාහ්මණො ඉව, (මාවිසින් තොපට මේ දක්වනලද) ධම්මකාරී බ්‍රාහ්මණයා මෙන්; බහු සොචති, බොහෝවින් ශොක කෙරෙයි.

408 ධම්මකාරී ජාතකය.

1112 කොධ ජාගරතං සුත්තො කොධ සුත්තෙසු ජාගරො
කො මමෙතං විජානාති කො තං පරිහරාති මෙ.

ඉධ, මේ ලොකයෙහි; කො, කවරෙක් තෙම; ජාගරතං, නිදි වර්ජිත කරන්නවුන් අතුරෙහි; නොහොත් අන්‍යයා නිදිවර්ජිත

* යෙ සංතිරංභාවා--සම්භර,

කරද්දී; සුඉහනා, සයනය කෙළේද; ඉධ, මේ ලොකයෙහි; කො, කවරෙක් තෙම; සුතෙනසු, සයනය කළවුන් අතුරෙහි; නොකොත් අන්‍යයා සයනය කරද්දී; ජාගරො, නිදිවර්ජිත කෙළේද; කො, කවරෙක් තෙම; මම,මාගේ; එතං, මේ ප්‍රශ්නය; විජානාති, දනීද; කො, කවරෙක් තෙම; මෙ, මා විසින් පුළුවුස්නාලද; තං, ඒ ප්‍රශ්නය; පටිහණාති, ප්‍රකාශකරන්ට පොහොසත් වේදැයි විචාරයි.

1113 අහං ජාගරතං සුතෙනා අහං සුතෙනසු ජාගරො
අහමෙතං විජානාමි අහං පටිහණාමි තෙ.

ජාගරතං, නිදිවර්ජිත කරන්නවුන් අතුරෙහි; අහං, මම; සුඉතනා, සයනය කරන්නෙමි; සුතෙනසු, සයනය කරන්නවුන් අතුරෙහි, අහං, මම; ජාගරො, නිදිවර්ජිත කෙරෙමි; අහං, මම; එතං, මේ ප්‍රශ්නය; විජානාමි; දනිමි; අහං, මම, තෙ, තා විසින් විචාරනලද ප්‍රශ්නය; පටිහණාම්, තට ප්‍රකාශ කරන්ට පොහොසත් වෙමි.

1114 කථං ජාගරතං සුතෙනා කථං සුතෙනසු ජාගරො
කථං එතං විජානාසි කථං පටිහණාසි මෙ.

කථං, කවර පරිද්දෙකින් (හොප;) ජාගරතං, නිදිවර්ජිතකරන්නාවූ සත්වයන් අතුරෙහි; සුතෙනා, සයනය කෙළෙහිද; කථං, කවර පරිද්දෙකින් (හොප); සුතෙනසු, නිදන්නාවූ සත්වයන් අතුරෙහි; ජාගරො, නිදිවර්ජිත කෙළෙහිද; කථං, කවර පරිද්දෙකින්; එතං, මේ ප්‍රශ්නය; විජානාසි, දන්නෙහිද; මෙ, මාවිසින් පුළුවුස්නාලද ප්‍රශ්නය; පටිහණාසි, (මට) ප්‍රකාශ කරන්ට පොහොසත් වෙහිද?.

1115 යෙ ධම්මං නප්පජානන්ති සඤ්ඤමොනි දමොනි ච
තෙසු * සුපපමාණෙසු අහං ජඤ්ඤාම් දෙවතෙ.

යෙ, යම් සත්වකෙනෙක්; සඤ්ඤමොනි, මේ ශීලසංයමයයි කියාද; දමොනි ච, මේ ඉන්ද්‍රිය දමනයයි කියාද; ධම්මං, තවවිධ ලොකොත්තර ධර්මය; නප්පජානන්ති, නොදන්නාහුද; හොසු, ඒ සැවගන්; සුපපමාණෙසු, කෙලස නිද්‍රා වශයෙන් නිදන කල්හි; දෙවතෙ, දෙවතාව; අහං, මම; ජඤ්ඤාම්, අප්‍රමාද වශයෙන් නිදිවර්ජිත කරමි.

* සුඉතපපමාදෙසු—මරම්ම.

1116 යෙසං රාගො ච දෝසො ච අවිජ්ජා ච විරාජිතා
සෙතසු ජාගර්හ මානෙසු අහං සුතෙකාසම්මි දෙවතෙ.

දෙවිතෙ, දෙවතාව; යෙසං, යම්බඳු මහා ක්ෂීණාශ්‍රව තෙනකුන් ගේ; හෙවත් යම්බඳු මහා ක්ෂීණාශ්‍රව තෙනෙකුන් විසින්; රාගොව, තෘෂ්ණා ලොභ සඞ්ඛ්‍යාත රාගයද; දෝසොව, තවවිධ ආඝාත වස්තු සමූහව මෙෂයද; අවිජ්ජාව, අට හැතෙක්හි නොදන්ම යයි කියන ලද අවිද්‍යාවද යන මේ කෙලෙසයෝ; විරාජිතා, ප්‍රහීනවූවාහුද හෙවත් ප්‍රහීන කරන ලදුහුද; නෙසු, ඒ ආර්‍යයන්; ජාගර මානෙසු, සති ප්‍රකාරයෙන් නිදිවර්ජිත කරන සැල්හි–ඒ ආර්‍යයන් විෂ්‍රිබඳව; අහං, මම; සුතෙකා අසමි, සයනය කෙළෙමි.

1117 එවං ජාගරතං සුතෙකා එවං සුතෙකසු ජාගරෙ
එවමෙතං විජානාමි එවං පටිහණාමි තෙ.

එවං, මෙසේ මේ කාරණයෙන් මම; ජාගරතං, නිදිවර්ජිතකරන් නවුන් අතුරෙහි; සුතෙකා, නිදන්නෙමි වමි; එවං, මෙසේ; සුතෙකසු, නිදන්නවුන් අතුරෙහි; ජාගරෙ, නිදිවර්ජිත කරන්නෙමි වෙමි; එවං, මේසේ; එතං, මේ ප්‍රශ්නය; විජානාමි, දනිමි; එවං, මෙසේ; තෙ, තාවිසින් විචාරණලද ප්‍රශ්නය; පටිහණාමි, (තට ප්‍රකාශ කරන්ව) පොහොසත්මි.

1118 සාධු ජාගරතං සුතෙකා සාධු සුතෙකසු ජාගරෙ
සාධුමෙතං විජානාසි සාධු පටිහතාසි මෙනි.

සාධු, යහපත් මෙනට; ජාගරතං, නොනිදන්නවුන් අතුරෙහි; සුතෙකා, සයනය කෙළෙහි; සාධු, යහපත්නොට; සුතෙකසු, සයනය කරන්නවුන් අතුරෙහි; ජාගරෙ, නොනිදන්නෙහි; සාධු, යහපත්නොට; එතං, මේ ප්‍රශ්නය; විජානාසි, දන්නෙහි; සාධු, යහපත්ව; මෙ, මාවිසින් විචාරණලද ප්‍රශ්නය; පටිහතාසි, විසඳන්ට පොහොසත් වෙහි සී බොධිසත්ත්වයන්ට සතුති කළා.

409 ජාගර ජාතකයයි.

1119 න සීරජෙ අතොමදසිසු
පාරිවරියා බුඩෙසු අපපිකා *
සුඛාය අලොණාය ච
පසස එලං කුම්මාසපිණ්ඩියා.

---

* අප්පකා—මරමිණ.

අනන්තමිදස්සිහු, අනවමිදර්ශීවූ; (අලාමිසාවූ ප්‍රත්‍යෙක්ෂකොට ඤානය දුවූ හෙයින් ප්‍රත්‍යෙක බුඩවරයෝ "අනවමිදර්ශි"නම්වෙත්) බුදුසු, පසේ බුදුවරයන් කෙරෙහි; (පථවිතලද) පාරිවරියා, පරිචයනීා පොහෝ;-මෙහි 'පරිවයනීා" නම් අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකම්මාදි ප්‍රභෙදවූ සාමීචි ක්‍රියාවද, පැමිණිය වුන් දැන තමන් සහ සවලපවූ හෝ බොහෝවූ හෝ රූපාවූ හෝ ප්‍රණීතවූ හෝ මෙබඳු ධර්මය සිත් පහදවා ගුණ සලකා තුන් වෙතනා වෙසෙසින් පිරිසුදුසොට තම්පල අදහා පරිත්‍යාග ක්‍රියාවද වේ; අපිසා, සවලපවූවා; න අත්ථි කිර, නොම ඇත; සුතඛාය, තෙල් රහිතවූද; අලොණිකාය ච, පැණි රහිතවූද;-පැණි නැති හෙයින් මේහි "අලොණිකා"යි කියනලදුු; කුම්මාසපිණ්ඩියා, කොමුපිඬු දිම පිළිබඳ; එලං, එලඝ; පසස, බල.

1120 ගතිගවාසසා * ව මේ බහූ
ධනධඤඤ පථවී ච කෙවලා
නාරියෝ විමා අවජරූපමා
පසස එලං කුම්මාසපිණ්ඩියා.

මේ, මට; ගතිගවාසසාව, ඇත් ගොන් අස්හුද; ධනධඤඤ, ධනධාන්‍යයෝද-මුක්තාදි ධනයද සපථවිඣ ධාන්‍යයද යි සේසි; කෙවලා, සියලු; පථවී ච, පොළොවිද-මේහි සම්සතහූතිණ්ඩලය තමන් දැනට පැමිණියාක් මෙන් සිතා "පථවී ච කෙවලා"යි කියා; අවජරූපමා, දෙවඟනන් වැනිවූ; ඉමා නාරියෝ ච,මේ වරඟනෝද; බහූ, බොහෝ වෙත්; කුම්මාසපිණ්ඩියා, කොමුපිඬු දීම පිළිබඳ; එලං, එලඝ, පසස, බල.

1121 අභික්ඛණං රාජකුඤ්ජර
ගාථා භාසසි කොසලාධිප
පුච්ඡාමි තං රඨවඩන
බාළහං පිතිමනෝ පභාසසි.

කොසලාධිප, කුශලාධිපතිය; රාජකුඤ්ජර, රාජෝත්තමය; අභික්ඛණං, නිතොර; ගාථා, ගාථාවන්; භාසසි; කියන්නෙහිය; රඨවඩන, රට වඩිනය කරන තානැත්ත; තං, තා; පුච්ඡාමි, විවාරම්; බාළහං, අතිශයෙන්; පිතිමනෝ, සතුටින් යුත් සිත් ඇත්තේ; පභාසසි, (මේ ගාථාවන්ගේ අර්ථ) කිය.

* විසෙඩ—මිරණ්ඩි.

1122 ඉමස්මිංයෙව නගරෙ කුලෙ අඤ්ඤතරෙ අහුං
පරකම්මකරො ආසිං භතකො සීලසංවුතො.

ඉමස්මිං නගරෙ එව, මේ බුද්ධරම; අඤ්ඤතරෙ කුලෙ, (නාම යෙන් හෝ ගොත්‍රයෙන් හෝ ප්‍රකට නොවූ) එක් වෛශ්‍යකුල යෙක්හි; අහුං, උපන්නෙමි; පරකම්මකරො, (ඒ කුලයෙහි උපන්නා වූද මම දිළිඳු ගෙයින්) අනුන්ගේ වැඩ කොට ජීවිකා කරන්නාවූ; භතකො, අනුන් බැලයෙන් පොෂිත වන්නාවූ; සීලසංවුතො, පඤ්චශීල සංවරයෙහි පිහිටියෙක්; ආසිං, මම්-බැලයෙන් ජීවත් වන්නේද දෙවැනිලැස්ස හැර ශීලසම්පන්නා මම් යි සේසි.

1123 කම්මාය නික්ඛමන්තාහං චතුරො සමණාදසං
ආචාරසීලසම්පන්නෙ සිනිහුතෙ අනාසවෙ.

කම්මාය, (එදවස කටයුතු) කෘත්‍යය කරණු පිණිස; නික්ඛමන්තා, නික්මුණාවූ; අහං, මම්; ආචාරසීලසම්පන්නා, ආචාර යෙන් හා ශීලයෙන් යුක්තවූ--මෙහි එක්විසි අනෙෂණයෙන් ජීවිකා කිරීම අනාචාර නම්, ඊට ප්‍රතිපක්ෂවූ ආචාරයෙන් හා මාගීඵලාගත ශීලයෙන් යුක්තාවූයයි සේසි; සිනිහුතෙ, (රාගාදිපරිදාහ ව්‍යපගමන යෙන් හා එකාදශාග්නිනිර්වාපණයෙන්ද) සිහිල් බවට පැමිණි; අනාසවෙ, කාමාස්‍රවාදි චතුරාස්‍රව රහිතවූ; චතුරො සමණෙ, ශමිත පාප ඇති ප්‍රව්‍රජිතයන් සතර දෙනකුන්; අද්දස., දුටුයෙමි.

1124 තෙසු චිත්තං පසාදෙත්වා නිසිදෙත්වා පණ්ණසන්ථතෙ
අදං බුද්ධානං කුම්මාසං පසන්නො සකෙහි පාණිහි.

තෙසු, ඒ ප්‍රත්‍යෙක බුඩවරයන් කෙරෙහි; චිත්තං, සිත; පසාදෙත්වා, පහදවා; පණ්ණසන්ථතෙ, කොළ ඇතිරියෙහි; නිසිදෙත්වා, වඩා හිඳුවා; බුද්ධානං, ඒ ප්‍රත්‍යෙක බුඩවරයන්ට; පසන්නො, පහන් වූයෙමි; සකෙහි පාණිහි, සිය අතින්; කුම්මාසං, කොමු පිඬු; අදං, දුනිමි.

1125 තස්ස කම්මස්ස කුසලස්ස ඉදං මේ එදිසං ඵලං
අනුහොමි * ඉදං රජ්ජං ජිතං ධරණිමුත්තමං.

මෙ, මාගේ; කුසලස්ස, (ආරෙගාානවද්‍යතයෙන්) කුශල නම්වූ; තස්ස කම්මස්ස, ඒ කර්මයාගේ; ඉදං ඵලං, මේ විපාකඵලය; එදිසං,

* අනුභොමි—මරම්ම.

මේඛිදුය; පිහා, සියලුසම්පතින් සෙවිළුවූ; උත්තමං ධරණිං, උතුම්වූ පෘථිවියෙන් යුක්තවූ; ඉදං රජ්ජං, මේ රාජ්‍යය; අනුභොමි; අනුභව කෙරෙමි.

1126 දද භුසඤ්ඤ * මා ව පමාදෙ,
චිකිච්ඡං වත්තය කොසලාධිප
මා රාජ අධම්මිකො අහු
ධම්මං පාලය කොසලාධිප.

කොසලාධිප, කුශලාධිපතිය; දද භුසඤ්ඤ,(අනුන්ට හමින් සතු දේ) දැනය කොටම අනුභවකරු; මා ව පමාදෙ, (දැනාදී ප්‍රමාදයා යෙහි) ප්‍රමාද නොව; චිකිච්ඡං, ප්‍රකිරූප දෙශවාසාදී චතුර්විධ ධර්ම චක්‍රය; වත්තය, පවත්වව-ප්‍රියවිරිය තෙමේ දෙසකින් යේ, මේ ගිරැර වනාහි "ප්‍රතිරූප දෙශවාසා"දී මේ සිවුසකින් දෙව්ලෝ යේ, එහෙයින් ඔහු "ධම්මචක්‍ර" සඤ්ඤාවට ගියෝ; හෝ ඒ සතළුවක් වව" යි සේසි; රාජ, රජ; මා අධම්මිකො අහු, නහමක් අධාර්මික වව-යම්සේ සමහරු ශත්‍රුයෙන් අගතියට යන්නාහු ලොව උක්යකු රෙහි පෙළාමෙන් ධනයම් රැස්කරන්නාහු අධාර්මික වෙත්ද එසේ නොව නහමක් නොදැහැමිවව" යි සේසි; කොසලාධිප, කුශලාධිපයා සය ඇතිය; ධම්මං, (දන් සිල් ආ දසරජ) දහම්; පාලය, රකු-නහමක් හරැ" යි සේසි.

1127 සොහං තදෙව පුනපපුනං
වට්ටං ආවරිස්සාමි සොහණෙ
අරියාචරිතං සුකොසලෙ
අරහනෙතා මෙ මනාපා † පසසිතුං.

සොහණෙ, සොඳුර; සුකොසලෙ, කොසොල් රජහුගේ යහපත් දුව; සො අහං, හේ මම; පුනපපුනං, නැවත නැවත; අරියාචරිතං, (බුඩාදි) ආර්‍යයන් විසින් පුරුදු කරන ලද; තං එව වට්ටං, එම මඟ; ආව රිස්සාමි, හැසිරෙම්; අරහනෙතා, (කෙලෙසුන් හෙරෙන් දුරුවූ හෙයින්ද සංසාරචක්‍රයාගේ අර කැපූ හෙයින්ද සතුරන් නැසූ හෙයින්ද ප්‍රත්‍යය ලැබීමට සුදුසු හෙයින්ද) "රහත්" යන නම් ඇති ප්‍රත්‍යෙක බුඩවරයෝ; මෙ, මට; පසසිතුං, දක්නට; මනාපා, මනාප වෙත්-සොඳුර ඇ සොසොල් රජදුව හේ මම මැවිසින්

* දදාඤ්ඤ—ම්‍රවම්. † මනාපාව- ම්‍රවම්.

දන් දෙන ලදුයි භෘත්‍යයනට නොපැමිණ නැවත නැවත ආයාචි යන් විසින් දුරුදු කරන ලද ඒ දාන මාගීයෙහිම හැසිරෙන්නෙමි, ඉට පිනාගි අග්‍රදක්ෂිණීය යොයින් රහත්හු මහාපදක්‍ෂීන ඇතියහ, පිළිරුද්‍ය දෙනු කැමැති හෙයින් මවුන්ම දක්නට රිසියෙමි"යි සේසි.

1128 ඉදම් මිය අවිදූරුපපන්නා
මජ්ඣේඩ නාරිගණස්ස සොභති;
කිං කම්මං අකාසි භද්දකං
කෙනාසි වණ්ණවති සුසොසලේ.

සුසොසලේ, (සොඳුර) කොසල්රජුගේ යහපත්දුව; අවිදූරූ පපන්නා, (නිතර රූපසම්පත්තියෙන්) දෙවඟනක් වැන්න; දෙවී මිය, (ත්‍රිදශපුරයෙහි සක්දෙවිරජ්ජුගේ එක්තරා) දෙවියක් මෙන්; නාරි ගණස්ස මජ්ඣේඩ, මේ වැඩඉනගේ මැද; සොභති, හොබනේනිය; භද්දකං, කල්‍යාණවූ; කිං කම්මං, (පුළුවිසයෙහි) කිනම් කම්මයක්; අකාසි, කෙළේනිද; කෙන, කවර කාරණයකින්; වණ්ණවති ආසි, වර්ණ ඇත්තියක් වීද?

1129 අභිරූප කුලස්ස ඛත්තිය
දස්සනං * පරමපසාදියා අහුං; †
සඤ්ඤතා ‡ ධම්මජීවිනී
සීලවති ච අපාපදස්සනා.

ඛත්තිය, ක්ෂත්‍රිය ස්ත්‍රොත්‍ර ඇති; (මහරජ) අහං, මම; අභිරූප කුලස්ස, (එක්තරා) හොළොඹ කුලයකගේ; පරපෙසසියා, අනුන් කෙරෙහි ඒ ඒ කෘත්‍යය කරණු පිණිස යැවියයුතු පෙණහාරිකා වූ; දස්සා, දැසියක්; අහුං, වීමි; "දාසී අහං" යි හෝ පාඨයි; සඤ්ඤතා (දැසිහු වනාහි දැසිල වෙත්, මම වනාහි) තුන් දොරින් සංයතවූ; ධම්මජීවිනී, (පරවඤ්චනාදිය නොකොට) දහඅමින් ජීවත් වනලද ජීවිකා ඇති; සීලවතී, ආචාරසම්පන්නවූ ගුණවත්වූ; අපාපදස්සනාව, යහපත් දැකුම් ඇති ප්‍රියසුභාව ඇත්තී සක්ද; (අහුං), වීමි.

1130 උඩ්ඩවහත්තා අහං තදා
වරමානස්ස අදාසිං භික්ඛතෝ;
චිත්තා සුවත්ථා සයං අහං
තස්ස කම්මස්ස ඵලං මවෙදිසත්තී.

---

* දස්සනං—බුරා. † අහු—බුරෙ ‡ සඤ්ඤතා ච—බුරෙ.

අහං, මම; තදා, එකල්හි; උඩවහන්නං, (තමන්ට පැමිණි නොවස් වශයෙන්) උදුරාලූද භාගභෙත්තය; වරමානසස, හැඩෙරෙන්නාවූ; භික්ඛවෝ, බුන් කෙලෙස් ඇති පසේබුදු තෙනකුන්ට; විත්තා, භූතවූයෙම්; සුවනා, සොම්නස් ඇත්තී; (සම්පල අදහා) සයං, තොමෝම; අහං, මම; අදාසිං, දුනිමි; මම, මාගේ; තස්ස කම්මස්ස, ඒ (එකහිඤ්ඤාදාන) කර්මයාගේ; ඵලං, විපාකය; එදිසං, මෙබඳුය—මහරජ මේ පූර්වයෙහි සැවැත්නුවර එක්තරා බොළඹ බුලයක්හුගේ දාසියක්වැ තමන් ලද බත් නොවස ගෙන නික්මෙන්නී එක් පසේබුදුතෙනකුන් පිඬු පිණිස හැසිරෙන්නා දැක තමන්ගේ තෘෂ්ණාව මැලවා සංයතාදිගුණයෙන් යුක්තව සම්පල අදහා උන්වහන්සේට ඒ බත දුනිමි, මේ මම ආයු අ.නිතාක් සිට කලුරිය නොට සැවැත්නුවර නොසොල් රජ්ජුගේ අගමෙහෙසිය කුස ඉපද දැන් ඔබගේ පාදයන් පරිතරණය කෙරෙමින් මෙබඳුවූ සම්පත්තිය අනුභව කෙරේම්, ඒ මාගේ කර්මයාගේ ඵලය මෙබඳුය"යි සේසි.

410 කුම්මාසපිණ්ඩ ජාතකය.

1131 ආගමිස්සති මේ පාපං ආගමිස්සති මේ භයං;
තදා හි චලිතා සාඛා මනුස්සෙන මිගෙන වා.

මේ, මට; පාපං, අනිෂ්ටයක්; ආගමිස්සති, එන්නේය; මේ, මට; භයං, විපත්තාත්‍රාසනයත්; ආගමිස්සති, එන්නේය; (ඊට හෙතු කවරේද යත්?) තදා හි, එකල්හි වනාහි; සාඛා, ශාඛා නොමෝ; මනුස්සෙන, මිනිසෙක් විසින් හෝ; මිගෙන වා, මෘගයෙක් විසින් හෝ; චලිතා සම්පිතදැසි; (නොපැනේ.)

1132 භීරුයා නූන මෙ කාමෝ අවිදූරෙ වසන්තියා;
කරිස්සති කිසං පණ්ඩුං සාව සාඛා පරන්නපං.

භීරුයා, බියවන සුලුවූ; (සත්‍රිය වනාහි සවල්ප මාත්‍රයෙන්ම බිය වේ, එහෙයින් "භීරු" යයි කියනු ලැබේ.) අවිදූරෙ, නුදුරෙහි—මෙයින් කිප යොදුනෙකින් මත්තෙහියයි සේසි; වසන්තියා, වසන්නාවූ; (මාගේ බැමිණිය කෙරෙහි) මෙ, මට; කාමෝ, කාමය හෙමේ; (උපන්නේද) (සෝ, හෙහෙම) නූන, එසාත්තයෙන්; පරන්නපං, පරන්නප නම් දැසයා; (බියගැන්වූ) සා සාඛා ඉව, ඒ ශාඛාව මෙන්; (මා) කිසං, කෘශවූවෙක්ද; පණ්ඩුං, පඬුවන් වූවෙක්ද; කරිස්සති, කරන්නේය.

1133 සොචයිස්සති මං කන්තා ගාමෙ වසමනින්දිතා
කරිස්සති කිඤං පණ්ඩුං සාව සාඛා පරන්තපං.

කන්තා, මා ප්‍රියවූ බිරිඳ; ගාමෙ වසං, ගම වසන්නී-බරණැස වසන්නී යයි සේසි; අනින්දිතා, අගර්හිතවූවා-උත්තම රූපධාරිණී වූවායයි සේසි; මං, මා; සොචයිස්සති, ශොක ඉපදවීමෙන් හුඟක් කරවන්නේය; සා සාඛා, ඒ ශාඛා තොමෝ; පරන්තපං ඉව, පරන්තප නම් දැඩියා (බිය කළාක්) මෙන්; කිසං, (මා) කෘශවූවෙක්ද; පණ්ඩුං, පඬුවන්වූවෙක්ද, කරිස්සති, කරන්නේය.

1134 තයා මං හසිතාපඞ්ගි මිතානි භණිතානි ච
කිසං පණ්ඩුං කරිස්සන්ති සාව සාඛා පරන්තපං.

' අසිතා අපඞ්ගි, කෘෂණවූ ඇස් කොළවර ඇත්තිය; තයා හි, තී විසින් වනාහි; (පවත්වන) මිතානි, මඳ සිනාද; භණිතානි ච, මියුරු තෙපුල්ද; මං, මා; සා සාඛා, ඒ ශාඛා තොමෝ; පරන්තපං ඉව, පරන්තප දැසයා මෙන්; කිසං, කෘශවූවෙක්ද; පණ්ඩුං, පඬුවන්වූ වෙක්ද; කරිස්සන්ති, කරන්නාහ-"පකාර" "ව"කාරකොට "වඞ්ගි" කියාද පාඨමැසි.

1135 අගමා නූන සො සද්දෙ අසංසී නූන සො තව
අක්ඛාතං නූන තං තෙන් සො තං සාඛමභාපයී

සො සද්දෙ, ඒ ශාඛා ශබ්දය තෙමේ; අගමා, තා කරා පැමිණියේයයි; නූන, සිතම්; සො, ඒ ශබ්දය තෙමේ; තව, තට; අසංසී, සැළකෙළේයයි; නූන, සිතම්; යො, යම් ශබ්දයෙක් තෙමේ; තං සාඛං, ඒ ශාඛාව; අභාපයී, සෙලවිද; තෙන, ඒ ශාඛා ශබ්දය විසින්; තං, (තාගේ) ඒ පියා මැරූ කාරණය; අක්ඛාතං, කියන ලද්දේයයි; නූන, සිතම්.

1136 ඉදං ඛො තං සමාගම්ම මම බාලස්ස චින්තිතං
තදු හි චලිතා සාඛා මනුස්සෙන මිගෙන වා.

බාලස්ස, බාලවූ; මම, මා විසින්; චින්තිතං, පරිවිතර්කිතවූ; ඉදං ඛො, මෙය වනාහි—ඒ ශාඛා ශබ්දයෙන් මට භයක් උපදින්නේයයි කරනලද විතර්කණයයි සේසි; තං, තා කරා-තාහා සමඟයයුතු තැනි; සමාගම්ම, පැමිණියේය; (කුමක් හෙයිනයත්?) තදුහි, එකල්හි වනාහි; චලිතා, කම්පිතවූ; සාඛා, ශාඛා පොළොව්; මනුස්සෙන, මිනිසෙක් විසින් හෝ; මිගෙන වා, මෘගයෙක් විසින් හෝ; (කම්පිතවූදැයි නොපැණිනි.)

1137 තථෙව ත්වං අවෙදෙසි අවජ්ඣි පිතරං මම
හන්ත්වා සාඛාහි ඡාදෙත්වා ආගම්ඡසති තෙ භයන්ති.

මම්, මාගේ; පිතරං, පියා; අවජ්ඣි,(තෝ)මැරුවෙහිය; හන්ත්වා, නසා; සාඛාහි, ශාඛායෙන්; ඡාදෙත්වා, වසමින්; තෙ, තට; භයං, බියක්; ආගම්ඡසති. පැමිණෙන්නේයයි; තථා එව, එසේම; ත්වං, තෝ; අවෙදෙසි, දැනගත්තෙහිය-තෝ මා පියරජහු නහන්ට යමැසි විශ්වාස කරවා නහන්නාවූ මපියාණන් මරා සඩහඬතොට සිද වළලා ඉදින් යමෙක් දැනගන්නේද මවද මෙබඳුවූ භයක් පැමිණෙන්නේයයි වඤ්චා කෙළෙහිය, තාගේ ඒ මේ මරණ භය දැන් එසේම පැමිණියේයයි සේසි.

411 පරනන්ප ජාතකයයි.

දෙවෙනි ගන්ධාර වගීයයි.

සප්තක නිපාත වණ්ණනාව නිමියේයි.

1138 ඔදුතවත්ථා සුවිඅල්ලකෙසා
කච්චානි කිං කුමහිමවිස්සසිත්වා *
පිඨා තිලා ධොවසි තණ්ඩුලානි
තිලොදනො හොහිති † කිස්ස හෙතු.

කච්චානි, කාත්‍යායනිය; ඔදුතවත්ථා, (හඳනාලද) සුදුවත් ඇත්තී;සුවිඅල්ලකෙසා-සුවි,පිරිසිදුවූ; අල්ලකෙසා, තෙත්වූ කෙහෙ ඇත්තී; කුමහිං, පියන්තලිය; අවිස්සසිත්වා, (මිනිස් හිස් උදුනට) නංවා; තිලා පිටඨා, තල පිටියෙන්; තණ්ඩුලානි; සහල්; කිං ධොවසි, කිම දෝනෙහිද? තිලොදනො, තල බත; කිස්ස හෙතු, කුමකට; හොහිති, වන්නේද?- කිම තෙමේ කන්නේද? නොහොත් අන් කරුණක් ඇත්තේද? යි සේසි.

---

* මඤ්ඤිත්වා-බුරම. මපස්සයිත්වා—අටුවා. † හෙස්සති—බුරම.

1139 න ඛො අයං බ්‍රාහ්මණ හොජනහේතු
තිලොදනො හොහිති සාධු පසන්න
ධම්මො මතො තස්ස බහූනමජ්ජ *
අහං කරිස්සාමි සුසානමජ්ඣෙ.

සාධුපසන්න, යහපත් නුවණ ඇති; බ්‍රාහ්මණ, බමුණ; අයං තිලොදනො ඛො, මේ තල බත වනාහි; හොජනහේතු, (මාගේ) බොජුන් පිණිස; න හොහිති, නොවන්නේය; (වැලි කුම්මයයන්?) ධම්මො, දහම්;-ජෙෂ්ඨාපචායන ධම්මය හා ත්‍රිවිධ සුචරිත ධම්මයද" යි සේසි; මතො, මළේය; තස්ස, ඒ ධම්මයට; සුසානමජ්ඣෙ, සොහොහොන් මැද; අහං, මම්; බහූනමජ්ජ, මේ මතක බත, කරිස්සාමි, කරන්නෙමි.

1140 අනුවිච්ච කච්චානි කරොහි කිච්චං
ධම්මො මතො කොනු තවෙත † සංසී
සහස්ස නෙත්තෙතා අතුලානුභාවො
න මීයති ධම්මවරො කදාචි.

කච්චානි, කාත්‍යායනිය; අනුවිච්ච, (පරීක්ෂාකොට) දැන; කිච්චං, මේ කෘත්‍යය; කරොහි, කරව; ධම්මො, ධම්මය තෙමේ; මතො, මළේයයි; එතං, මේ කාරණය; තව, හට; කොනු, කවරෙක් වනාහි; සංසී, කියේද? අතුලානුභාවො, අසමවූ ආනුභාව ඇති; සහස්ස නෙත්තෙතා, (දහසක් නෙත් ඇති) ශක්‍ර තෙමේ; ධම්මවරො, උතුම් ධම්මය; කදාචි, කිසිකලෙකත්; න මීයති; නොමියේයයි; (කියේය).

1141 දළහපමාණං මම එත්ථ බ්‍රහ්මෙ
ධම්මො මතො නත්ථි මමේත්ථ කඞ්ඛා
යෙ යෙව දුනි පාපා භවන්ති
තෙ තෙව දුනි සුඛිතා භවන්ති

බ්‍රහ්මෙ, බමුණ; ධම්මො, දහම්; මතො, මළේයයි; එත්ථ, මෙහිලා; මම, මාගේ; දළහං පමාණං, දැඩවූ (සති ඉවූ) ප්‍රමාණය; (වේ) මම, මට; එත්ථ, මෙහිලා; කඞ්ඛා, සැකක්; නත්ථි, නැත්තේය; (ඊට කාරණා කිමයත්?) දුනි, දුන්; යෙ යෙව, යම් කෙනෙක් යම් කෙනෙක්ම; පාපා භවන්ති, පාපයෝ වෙත්ද? තෙ තෙව, ඔහු ඔහුම; දුනි, දැන; සුඛිතා භවන්ති, සුවපත්වූවෝ වෙත්.

---

* බහූනාමජ්ජ—බුරුම. "බහූනමජ්ජ"යි සිංහල අකුරු පොත්වල ආ හෙයින් අට්ඨකථායෙහි පේනඅර්ථයත් සමඟඅර්ථයෙදූනමුත් පරීක්ෂාසළයුතුව තිබේ.

† තවෙවං-බුරුම.

1142 සුණිසා හි මයහං වඤ්ඣා අහොසි
සා මං වධිඞ්වාන විජයි පුත්තං
සාදුනි සබ්බස්ස කුලස්ස ඉස්සරා
අහං පනම්හි * අපවිඞා එකිකා.

මයහං, මාගේ; සුණිසා හි, යෙහෙළිණිය වනාහි; වඤ්ඣා අහොසි, වඳ වුව; සා, ඕතොමෝ; මං, මා; වධිඞ්වාන, තලා; පුත්තං, පුතෙකු; විජයි, වැදුවා; සා ඕතොමෝ; ඉදානි, දැන්; සබ්බස්ස, සියලු; කුලස්ස, කුලයට; ඉස්සරා, ඊශ්වරී; (වුවා) අහං පන, මම වනාහි; අපවිඞා, (බැහැර) දමන ලද්දෙම්; එකිකා අම්හි, අනාථව වෙසෙම්.

1143 ජීවාමි වොහං නාහං මතොසම් †
තවෙව අත්ථාය ඉධාගතොසම්
යා තං වධිත්වාන විජයි පුත්තං
සහාව පුත්තෙන කරොම් ‡ හසමං.

අහං, මම; ජීවාමි, ජීවත් වෙමි–"වොං" යනු නිපාත මාත්‍රයි; අහං, මම; න මතොං අසමි, මළේ නොවෙමි; තව අත්ථාය එව, නි පිණිසම; ඉධ, මෙහි; ආගතොසම්, ආයේ වෙමි; යා, යම් යෙහෙලිණියක හොමෝ; තං, තී; වධිඞ්වාන, තලා; පුත්තං, පුතෙකු; විජයි, වැදුවාද? පුත්තෙන සහ එව, පුතු හා සමඟම; (ඇය) හසමං කරොම්, හළු කෙරෙම්; (කියේය).

1144 එතඤ්ච හි තෙ රුචති දෙවරාජ
මමේව අත්ථාය ඉධාගතොසි
අහඤ්ච පුත්තෙන සුණිසා ච නත්තා
සමෙමාදමානා කරමාවසෙම.

දෙවරාජ, දෙවියන්ට රජවූ ශක්‍රය; එතං ච, මේද; තෙ, තට; රුචති, රිසිවේ; මම අත්ථාය එව, මා පිණිසම; ඉධ, මෙහි; ආගතොසි, (තෝ)ආයේ වෙහි; අහං ච, මමද; පුත්තෙන, පුත්‍රයා; සුණිසා ච, යෙහෙළිද; නත්තා, මුණුබුරාද; සමෙමාදමානා, සතුටු වෙමින්; කරං, ගෙහි; ආවසෙම, වෙසෙමු.

---

* පන ඞි-බුරුම.
† න මතොහමස්මි-බුරුම.
‡ කරොඞි-බුරුම.
§ එවඤ්ච-බුරුම.

1145 එතඤ්ච * තෙ රුච්චති කාතියානී
භතාපි සන්තා න පජහාසි ධම්මං
තුවඤ්ච පුත්තෙතා සුණිසා ච නත්තා
සමෙමාදමානා ඝරමාවසෙථ.

කාතියානී, කාත්‍යායනීය; තෙ, තිට; එතං ච, මෙද; රුච්චති, රිසිවේ; භතා සන්තා අපි, තලනු ලැබුවාවූම නීද; ධම්මං, (තීගේ පුතුන් කෙරෙහි මෛත්‍රී) ධර්මය; න ජහාසි, නො හළෙහිය-මෙසේ ඇති කල්හි යම්සේ නී කැමැති වෙහිද එසේ වේවා; මම තීගේ මේ ගුණයෙහි පැහැදුනෙම් යයි සේසි; එවං ච, නීද; පුත්තෙතා, පුත්ද; සුණිසා ච, යෙහෙලිද; නත්තා, මුණුබුරුද; සමෙමාදමානා, සතුටු වෙමින්; ඝරං, ගෙහි; ආවසෙථ, වෙසෙව්.

1146 සා කාතියානී සුණිසාය සද්ධිං
සමෙමාදමානා ඝරමාවසිත්ථ
පුත්තෙතා ච නත්තා ච උපඨහිංසු
දෙවානමින්දෙන අධිගහිතාති.

(මේ අභිසම්බුද්ධ ගාථාසි) සා කාතියානි, ඒ කාත්‍යායන ගොත්‍ර ඇත්තී; සුණිසාය සද්ධිං, යෙහෙලිණිය හා සමඟ; සමෙමාදමානා, සතුටුවෙමින්; ඝරං, ගෙහි; ආවසිත්ථ, වූසු; දෙවානමින්දෙන, දෙව් ගන්ට අධිපතිවූ ශක්‍රයා විසින්; අධිගහිතා, අධිගෘහීතවූ; පුත්තෙතා ච, පුත්ද; නත්තා ච, මුණුබුරුද; උපඨහිංසු, (ඇයට) උපස්ථාන කළාහුය.

412 කාවාරි ජාතකයයි.

1147 ඉදං පුරෙ තිණ්ණමාහු † බහුමච්ඡං මහොදිකං ‡
ආවාසො ඔකරාජස්ස පෙත්තිකං භවනං මම
ත්‍යජ්ජ හෙතෙන § යාපෙම ඔකං න විජහාමසෙ ¶.

ඔකරාජස්ස, කොක් රජුට; ආවාසො, නිවෙස්වූ; මම, මාගේ; පෙත්තිකං භවනං, පියසතු ගෙයවූ; ඉදං, මෙය-මගුල් පොකුණයයි සේසි; පුරෙ, පෙර; තිණ්ණෙණ, උදකතුම්බයෙන් උදකය පිවිසි කල්හි; බහුමච්ඡං, බොහෝ මසුන් ඇත්තේයයිද; මහොදිකං,

* එවඤ්ච-බුරුම.
† නින්නමාහු-බුරුම.
‡ මහොදකං-බුරුම.
§ තිත්ථෙන-බුරුම.
¶ ඔක්කන්තා න ජහාමසෙ-බුරුම.

බොහෝ දිය ඇත්තේයයිද; ආහු, කියත්; තෙ, ඒ අපි; අජ්ජ, අද; හෙතෙන, මැඩියෙක් පමණෙකින්; යාපෙම, යැපෙමු; (මේසේ ජීඝඤ්ඤායෙන් පිඬිතවුවද) වාසසථානය, න විජහාමසෙ, නොහරිමු.

1148 කො දුතියං අසිලස්ස බබ්බුරස්සකම්හි හෙඨයති*
කො මෙ පුත්තෙන කුලාවඤ්ච මඤ්ච සොත්තිං කරිස්සති.

අසිලස්ස, අඟිලවූ; බබ්බුරස්ස, බබ්බුරනම් ඇත් ගොව්වාගේ; අකම්හි, ඇස; කො, කවරෙක් තෙමේ; හෙඨයති, බිඳිද; සො, කවරෙක් තෙමේ; මෙ, මාගේ; පුත්තෙන, පුත්‍රයන්ද; කුලාවඤ්ච, කුඩුවද; මංච, මාද; සොත්තිං, කරිස්සති, (රූඪ) සෙත් කරන්නේද?

1149 සබ්බා පරික්ඛතා † එග්ගු යාව තස්සා‡ගති අහු
ඛීණහක්ඛා මහා රාජ සාරෙ න රමති ගුණෙ§?

යාව, යම්තාක්; තස්සා, ඒ එළය පිළිබඳ; ගති, නිඝණ්ඨුයෙක්; අහු, වූද; සබ්බා එග්ගු, සියලු එළය; පරික්ඛතා, කතලද්දිය; මහා රාජ, මහරජ; ඛීණහක්ඛා, ක්ෂයවූ කෑ යුතුදේ ඇති-එළයයි සේසි; ගුණෙ, කඳපළු තෙමේ; සාරෙ, හරෙහි; න රමති, නො ඇලේ.

1150 සා නූනාහං ඉතො ගන්ත්වා රඤ්ඤෝ මුත්තා නිවෙසනා
අත්තානං රමයිස්සාමි දුමයාඛනිකෙතිනී

සා අහං, ඒ මම; ඉතො ගන්ත්වා, මෙයින් ගොස්; රඤ්ඤෝ නිවෙසනා, රජනිවෙසින්; මුත්තා, මුක්තවූවා; දුමසාඛනිකෙතිනී, සුපිපි රුක් අතු නිවෙස්කොට ඇත්තී; අත්තානං, තමා, රමයිස්සාමි නූන (කවර දවසක) අභිරමණය කරවන්නෙම් දෝහෝ.

1151 සො නූනාහං ඉතො ගන්ත්වා රඤ්ඤෝ මුත්තෙනා නිවෙසනා
අගෙහාදඤානි පාසිස්සං ‖ යූථස්ස පුරතො වජං.

සො අහං, හේ මම; ඉතො ගන්ත්වා, මෙයින් ගොස්; රඤ්ඤෝ, රජහුගේ; නිවෙසනා, නිවෙසින්; මුත්තෙනා, මුක්තවූයෙම්; යූථස්ස, මෘගසමූහයාගේ; පුරතො, ඉදිරියෙහි; වජං, යන්නේම්; අගෙහාදඤානි, උතුම් දිය-අන් මුවන් විසින් පළමු නො බොන ලද නො ඉදුල් පැන් යයි සේසි; පාසිස්සං නූන, (කවර දවසක) බොන්නෙම් දෝහෝ.

---

* ඝිඤති-බුරුම.
† පරික්ඛයා-බුරුම,
‡ තස්ස-සපොත්.
§ ගුණෙ-බුරුම.
‖ පිසසාමි-බුරුම.

1152 තං මං කාමේහි සම්මත්තං * රත්තං කාමේසු මුච්ඡිතං
ආනයි භරතෝ † ලුද්ධෝ, බාහිකෝ භද්දමත්තු තෙ.

බාහිකෝ, බහි රට වැසි; භරතෝ ලුද්ධෝ, භරත නම් වැදි තෙමේ; කාවෙහි, පස්කම් සැපයින්; සම්මත්තං, පරිපූර්ණ වූ; රත්තං, රාගයෙන් රක්තවූ; කාමේසු, කාමයන්හි; මුච්ඡිතං, මුසපත්වූ; තං මං, ඒ මා; ආනයි, (මෙහි) ගෙන ආයේය; තෙ, තට; භද්දං, යහපතෙක්; අත්තු වේවා-ඉහරජ ඉදින් මා මෙයින් මුදවන්නේ නම් නොපට භද්‍රයක් වේවා යයි සේසි.

1153 අඞ්ගාර නිම්ඝායං‡ තුඛෙන උපරි පබ්බතෙ
සා මං සණ්හාහි මුදුනා මා පාදං ඛණියසමනි§?

අඞ්ගාර නිම්ඝායං, අඟුරෙන් සරන අඳුරෙහි; තුඛෙන, නියුණුවූ; උපරිපබ්බතෙ, පව්ව-ඇය මහුයෙහි; සා, ඒ (මාගේ බිරිඳවූ) කිදුරී තොමෝ; අසමනි, ගලෙහි; පාදං, පය; මා ඛණී, නොඉක් කැණුයි; (මෙහි යකාර ආගමයි) සණ්හාහි, මවූ; මුදුනා, මොළොක්වූ; (වව්‍යායෙන්) මං, මා; (යාචි, යාචිඤ්ඤ හෝ) ඒ කිදුරී තොමෝ මොළොක් වදනින් හිමි! පමාතොව!! යම්සේ පැකිලී තොපපා ගලෙහි නොකැණේද එසේ බසුවයි අත ගෙන බැස්වූයයි සේයි

1154 අසංසයං ඤාතිඛයන්තදස්සී
න ගබ්භසෙය්‍යං පුනරාවජ්ජිස්සං
අයං හි මෙ අන්තිමා ගබ්භසෙය්‍යා¶
ඛීණෝ මෙ සංසාරෝ පුනබ්භවායාති.

ඤාතිඛයන්තදස්සී, (ඤාතියගේ ක්ෂයාන්ත සඞ්ඛ්‍යාත නිවන් දුටු හෙයින්) ඤාතික්ෂයාන්තදර්ශිවූ; (මම) අසංසයං, නිසැකවැ; ගබ්භසෙය්‍යං, ගැබයහනට; පුන, නැවත; න ආවජ්ජිස්සං, නොපැමිණෙන්නෙමි; අයං හි, මෝ තොමෝ වන්හි; මෙ, මාගේ; අන්තිමා, කෙළවරෙහිවූ; ගබ්භසෙය්‍යා, ගර්භශෛය්‍යාව: (වේ) මෙ, මාගේ; පුනබ්භවාය, නැවත උපදීම පිණිස; (පැවැති) සංසාරෝ, (සාදිළිවෙළයයි කියනලද) සසර; ඛීණෝ, ක්ෂය වී.

413 අඤ්ඤදද ජාතකයයි.

---

* සම්පත්තං-පොත්. ‡ නිම්ඝායං-බුරුම. § ඛිලියසමනී-බුරුම.
† වනතෝ-බුරුම. ¶ පවජ්ජිවගබ්භසෙය්‍යා-බු.

1155 ඉදං සුවණ්ණකායූරං මුත්තා වෙළුරියා බහූ
සබ්බං හරස්සු භද්දන්තෙ මඤ්ච දුසිනි සාවය.

භද්දන්තෙ, පින්වත; ඉදං සුවණ්ණකායූරං, මේ ගෙළ පලඳනා ආභරණයද; බහූ, බොහෝවූ; මුත්තා, මුතුද; වෙළුරියා, වෙරළු මිණිද; (සත) සබ්බං, සියල්ල; හරස්සු, ගනු; මං ච, මාද; දුසි ඉති, දූසියකැයි; සාවය, (මහජනයා මැද) අස්වව.

1156 ඔරොපයස්සු කල්‍යාණි මා බහූං * පරිදෙවසි
න චාහං අභිජානාමි අහන්තා ධනමාහතං.

කල්‍යාණි, සොඳුර; ඔරොපයස්සු, (තිගේ මේ පලඳනාව) මුදා තබව; බහූං, බොහෝ; මා පරිදෙවසි, නහමක් වැලපෙව; අහන්තා, (නී) නොමරා; ආහතං, ගෙන එන ලද; ධනං, ධනය; අහං, මම; න ච අභිජානාමි, නොම දනිමි–නොගනිමි යයි සේසි.

1157 යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං
න චාහං අභිජානාමි අඤ්ඤං පියතරං තයා.

යතො, යම් කලෙක පටන්; අත්තානං, තමා; සරාමි, සිහි කෙරෙම්ද; යතො, යම් කලෙක පටන්; විඤ්ඤුතං, විඥඋවට; පත්තොස්මි, පැමිණියේ වෙම්ද; අහං, මම; තයා, තට වඩා; පියතරං, අතිශයින් ප්‍රියවූ; අඤ්ඤං, අනිකෙකු; න ච අභිජානාමි, නොම දනිමි.

1158 එහි තං උපගූහිස්සං † කරිස්සං ච තං‡ පදක්ඛිණං
නහිදානි පුනා § අත්ථි මම තුය්හං ච සඞ්ගමෝ.

එහි, එව; තං, තා; උපගූහිස්සං, වැලඳ ගන්නෙමි; තං, තා; පදක්ඛිණං ච කරිස්සං, ප්‍රදක්ෂිණාද කරන්නෙමි; ඉදානි, දැන්; පුන, නැවත; මම; මාගේද; තුය්හං ච, තාගේද; සඞ්ගමෝ, එක්වීමෙක්; නහි අත්ථි, නොම ඇත්තේය.

1159 නහි සබ්බෙසු ඨානෙසු පුරිසෝ හොති පණ්ඩිතෝ
ඉත්ථිපි පණ්ඩිතා හොති තත්ථ තත්ථ විචක්ඛණා.

සබ්බෙසු ඨානෙසු, සියලු තන්හි; පුරිසෝ, පුරුෂතෙමේ; නහි පණ්ඩිතෝ හොති, පණ්ඩිත නොම වේ; පණ්ඩිතා, පණ්ඩිතවූ; ඉත්ථී අපි, අඟනද; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; විචක්ඛණා හොති,

---

* බාළ්හං-බුරුම.
† උපගූය්හිස්සං-බුරුම
‡ කරිස්සං ච-බුරුම.
§ පුන-බුරුම.

විවක්ඛණ වේ; (නොහොත්) ඉත්ථිපි, ස්ත්‍රී තොමෝ ද; පණ්ඩිතා, පණ්ඩිතද; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; විවකඛණා, විවක්ඛණද; හොති, වේ.

1160 නහි සබ්බේසු ඨානෙසු පුරිසෝ හොති පණ්ඩිතෝ
ඉත්ථිපි පණ්ඩිතා කොති ලහුමත්ථ විචින්තිකා. *

සබ්බේසු ඨානෙසුයි–සියේ. ලහුං, ලුහුවෑ (ශීඝ්‍රවෑ;) අත්ථවිචින්තිකා, කරණ්ඩ සිතන්නීවූ; ඉත්ථි අපි, අහනද; පණ්ඩිතා හොති, පණ්ඩිත වේ.

1161 ලහුඤ්ච වත ඛිපඤ්ච නිකඨෙ සමචෙතසී
මිගං පුණ්ණාය තෙනෙව සුලසා † සන්තුකං වධී.

වත, එකාන්තයෙන්; ලහුං ච, අදඬවද; ඛිපං ච, ශීඝ්‍රවද–බෝකල් නොඅවා යයි සේසි; නිකඨෙ, සමීපයෙහි; (සිටම) සමචෙතසී, (ඔහු මරණ උපාය) සිතූ; පුණ්ණාය තෙනෙ, පූරිත ධනුයෙහි; මිගං ඉව, මුවා මෙන්; සුලසා, සුලසා තොමෝ; සන්තුකං, සන්තුක නම් සොරහු; වධි, මැරිය–යම් කලෙක්හි දඬුවූ මුව වැදි තෙමේ ආකර්ණී පූර්ණධනුයෙහි වහා මුවා මරාද එසේම සුලසා තොමෝ සන්තුක නම් සොරහු මැරී යයි සේසි.

1162 යොධ උපනිතං අත්ථං න ඛිපමනුබුජ්ඣති
සෝ හඤ්ඤති මන්දෘ ‡ මති වොරොව ගිරිගබ්භරෙ.

ඉධ, මේ සත්ත්වලොකයෙහි; යෝ, යමෙක් තෙමේ; උපනිතං, තමන් වෙත හුණු; අත්ථං, කාරණය; ඛිපං, වහා; න අනුබුජ්ඣති, නොදනිද; මන්දමතී, මඳනුවණැති; සෝ, ඒ තෙමේ; ගිරිගබ්භරෙ, පර්වතගහවරයෙහි; වොරෝ ඉව, සොරහු මෙන්; හඤ්ඤති, නැසේ.

1163 යොධ ද්‍වි උපනිතං අත්ථං ඛිපමෙව නිබොධති
මුච්චතෙ සන්තුසම්බාධා සුලසා § සන්තුකාමිවාති.

ඉධ, මේ ලොකයෙහි; යෝ, යමෙක් තෙමේ; උපනිතං, (තමන් වෙත) හුණු; අත්ථං, කාරණය; ඛිපං එව, වහාම; නිබොධති, දනීද; [ගෙතෙමේ] සුලසා, සුල්සා තොමෝ; සන්තුකා ඉව, සන්තුකනම් සොරුගෙන් (මිදුණාක්) මෙන්; සන්තුසම්බාධා, ශත්‍රුසංකටයෙන්; මුච්චතෙ, මිදේ.

* ලහු අත්ථං විචින්තිකා-බුරුම. † සුලසාය-පොත්.
‡ මිනා-පොත්. § සොච-පොත්. ¶ සුලසාය-පොත්.

1164 භුසං හි කුඩ්ඩොති අවෙක්ඛියාන
න තාව දණ්ඩං පණයෙය්‍ය ඉස්සරෝ
අඤානසෝ අපපතිරූපමත්තනෝ
පරස්ස දුක්ඛානි භුසං උදීරයෙ.

භුසං හි, අතිශයින්ම; කුඩ්ඩොති, (මම) කිපියෙමියි; අවෙක්ඛියාන, බලා; ඉස්සරෝ, පෘථිවීශ්වර තෙමේ; තාව, පළමුකොට; දණ්ඩං, දඬුවම්; න පණයෙය්‍ය, නොපවත්වන්නේය; (කුමක් හෙයින්ද යත්?) අඤානසෝ, අකාරණයෙන්; අත්තනෝ, තමා රජ බවට; අපපතිරූපං, නුසුදුසුවූ මෙතෙක් දෙය (කරවයි;) පරස්ස, අන් හට; භුසං දුක්ඛානි, බලවත් දුක්; උදීරයෙ, කියන්නේය–දරුව පෘථිවීශ්වර රජතෙමේ වනාහි මම අතිශයින් බලවත් ක්‍රොධයෙන් අභිභූත යෙමියි දැන අෂ්ට වසතුකාදි ප්‍රභෙදවූ දණ්ඩය අන්හට පවත් වන්නේය, කුමක් හෙයිනයත්? ක්‍රොධිවූයේ වනාහි අෂ්ට වසතුකය ෂොඩශවසතුක කොට අකාරණයෙන් තමන්ගේ රාජ භාවයට සුදුසු නොවූ මේ මෙතෙක් දෙය ගෙන එව; මෙය හෝ කරවයි අන් හට බලවත් දුක් කියන්නේයයි සේයි

1165 යතෝ ව ජානෙය්‍ය පසාදමත්තනෝ
අත්ථං නියුඤ්ජෙය්‍ය පරස්ස දුක්කතං
තදුයමත්ථෝති සයං අවෙක්ඛිය
අථස්ස දණ්ඩං සදිසං නිවෙසයෙ.

යතෝ ව, යම් දවසෙක; අත්තනෝ, තමන්ගේ; පසාදං, (අන්‍යයා හෙරෙහි) ප්‍රසාදය; ජානෙය්‍ය, දන්නේද; පරස්ස, අන්‍ය යාගේ; දුක්කතං අත්ථං, දුෂ්කෘතවූ කාරණය; නියුඤ්ජෙය්‍ය, පරිෂ්කාරන්නේද; තදා, එකල්හි; අයං අත්ථෝ ඉති, මෙයම ඔහුගේ දෙෂයයි; සයං, තෙමේ; අවෙක්ඛිය, බලා; අථ, ඉක්බිති; අස්ස, අපරාධකාරකවූ ඔහට; සදිසං දණ්ඩං, තමාගේ දෙෂයට අනුරූපවූ දඬුවම්; නිවෙසයෙ, පිහිටුවන්නේය– අෂ්ටවසතුක හෙතුයෙන් සොළොස් කහවණුවක්ද ගන්නේයයි සේයි.

1166 න චාපි ඛිපෙති පරං න අත්තනං *
අමුච්ඡිතෝ යෝ නයතෙ නයානයං
යෝ දණ්ඩධාරෝ භවතීධ ඉස්සරෝ
සවණ්ණ ගුත්තෝ සිරියා න ධංසති.

---

* පරම්පි අත්තානං-බුරුම්,

අමුච්ඡිතෝ, (ඡන්දාදිවූ අගතිකෙලෙසයන් විසින්) අනනුභූතවූ; යෝ, යමෙක් තෙමේ; නයානයං, නීතිය හෝ අනීතිය; නඝතෙ, පරීක්ෂා කෙරේද; (හෙතෙම) පරංපි, අන්‍යයාද; නව ඛාපෙති, නොම දවසි; අත්තානං, තමාද; න, නොම දවසි-ඡන්දාදි වශයෙන් වනාහි අහෙතුක දඬුවම් පවත්වමින් මෙරමාද ඒ දණ්ඩයෙන් දවසි පෙළෙයි; තන්නිද්‍ධනපාපයෙන් තමන්ද දවසි පෙළයි, මේ තෙමේ වනාහි මෙර මාද තමන්ද නොදවසි; ඉධ, මේ සත්වලොකයෙහි; යෝ ඉස්සරෝ, යම් පෘථිවීශ්වරයෙක් තෙමේ; දණ්ඩධාරෝ භවති, (දෙෂයට සුදුසු දඬුවම් පවත්වමින්) දණ්ඩධාරී වේද; වණ්ණ ගුත්තෝ, (ගුණ වර්ණයෙන් හා යශවර්ණයෙන්) රක්ෂිතවූ; සෝ, ඒ රජ තෙමේ; සිරියා, රාජ්‍යලක්ෂ්මියෙන්; න ඛංසති, නොපිරිහේ.

1167 යේ ඛත්තියා සෙ අනීසමම්කාරිනෝ
පණෙන්ති දණ්ඩං සහසා පමුච්ඡිතා
අවණ්ණසංයුත්තා † ජහන්ති ජීවිතං
ඉතෝ විමුත්තාපි ච යන්ති දුග්ගතිං.

අනිසම්මකාරිනෝ, අපරීක්ෂා කාරිවූ;යෙ ඛත්තියා,යම් ක්ෂත්‍රිය කෙනෙක්-"සෙ" යනු නිපාත මාත්‍රයි; සහසා, සැහැසිව; පමුච්ඡිතා, මුළුසපත් වූවාහු; දණ්ඩං, දඬුවම්; පණෙන්ති, පැවැත්වූද; අවණ්ණ සංයුත්තා, අවර්ණයෙන් යුක්තවූ;(ඔහු) ජීවිතං, දිවි; ජහන්ති, හරින්; ඉතෝ, මොබින්; විමුත්තා අපි ච, මුක්තවූවාහුද; දුග්ගතිං, දුර්ගතියට යන්ති, යෙත්.

1168 ධම්මෙ ච යෙ අරියපවෙදිතෙ රතා
අනුත්තරා තෙ වවසා මනසා කම්මනා ච
තෙ සන්නිසොරච්චෙ සමාධි සණ්ඨිතා
වජන්ති ලොකං උභයං තථාවිධං.

යෙ, යම් ක්ෂත්‍රිය කෙනෙක්; අරියපවෙදිතෙ, ආචාර ආර්‍යවූ ධාර්ම්මික රාජයන් විසින් ප්‍රකාශ කරණලද; ධම්මෙ ච, (දශවිධරාජ) ධර්ම්මයෙහි; රතා, ඇලුණාහුද; තෙ, ඒ රජහු; වවසා, විර්‍යායෙන්ද; මනසා,සිතින්ද; කම්මනා ච, ක්‍රියායෙන්ද; අනුත්තරා, ජෙෂ්ඨයහ; සන්නිසොරච්චෙ සමාධිසණ්ඨිතා,සන්නි,(අගතිප්‍රහාණයෙන් කෙලෙස) නාන්නියෙහිද; සොරච්චෙ, (සෞශීල්‍ය සඞ්ඛ්‍යාත) සුරතභාවයෙහිද;

---

† අවණ්ණසංයුත්තං ව-සුරා.

සමාධි,(එකාග්‍රතා සඞ්ඛ්‍යාත)සමාධියෙහිද; සණ්ඨිතා, පිහිටියාවූ;තෙ තථා විධා; ඒ එබඳු දෑහැම් රජහු; උභයං ලොකං, උභයලොකයට; වජනති, යෙත්-දෑහැමින් රජකොට මිනිස් ලොවින් දෙව් ලොවටද දෙව් ලොවින් මිනිස් ලොවටද යෙත් නිරයාදියෙහි වනාහි නොඋපදිත් යයි සේසි.

1169 රාජහමසමි නරපමද්දන*මීසසරෝ
සවෙපි කුජ්ඣාමි ඨපෙමි අත්තනං†
නිසෙධයන්තෝ ජනතං තථා විධං
පණෙමි දණ්ඩං අනුකම්ප යොනිසෝ.

අහං, මම; නරපමද්දනං,නරනාරීන්ට;ඉස්සරෝ, සවාමිවූ; රාජා අසමි, රජවෙමි; සවෙපි කුජ්ඣාමි, ඉදින් කුපිතවෙමි නමුදු; (ක්‍රොධ වශයෙන් නොගොස්) අත්තානං, තමා; ඨපෙමි. (පුරාතන රජුන් විසින් සථාපිතවූ නීතිධම්මයෙහිම.) පිහිටුවමි-විනිශ්චය ධම්මය නොබිඳිමි සි සේසි; තථා විධං ජනතං, එබඳුවූ (විප්‍රතිපන්න) ජනතාව; නිසෙධයං,(අයථාමාගී ගමනයෙන්) වළක්වමින්; යොනිසෝ, නුවණින්; අනුකම්ප, අනුකම්පා කොට; දණ්ඩං, දඬුවම්; පණෙමි, පවත්වමි.

1170 සිරී ව ලක්ඛී ව තමෙව ඛත්තිය
ජනාධිප මා විජහි ‡ කුදාචනං
අක්කොධනෝ නිච්චපසන්නචිත්තෝ
අනිඝෝ තුවං වස්සසතානි පාලය.

ජනාධිප, ජනනායකවූ; ඛත්තිය, ක්ෂත්‍රියය; සිරී ව, පරිවාර සම්පත්තියද; ලක්ඛී ව, ප්‍රඥාවද යන; තං එව, එයම; කුදාචනං, කිසි කලෙකත්; මා විජහි, අත්නොහරව; අක්කොධනෝ, ක්‍රොධි නුවූ යේ; නිච්චපසන්නචිත්තෝ, නිරතුරුව පහන්වූ සිත් ඇත්තේ; අනීඝෝ, නිදුක්වූයේ; තුවං, නෝ; වස්සසතානි, හවුරුදුසියයක්; පාලය, (රට) රකු.

1171 ගුණෙහි එතෙහි උපෙත ඛත්තිය
සිතමරිය වත්ති § ද්වි සුවඥෝ අකොධනෝ
සුඛී අනුප්පීළ පසාස මෙදිනිං
ඉතෝ විමුත්තෝපි ච යාහි සුගතිං.

---

* නරපදන-පොත්.
† අත්තානං-බුරුම.
‡ විජහිතං-බුරුම.
§ සිතඅරියවුත්ත-බුරුම.

එතෙහි ගුණෙහි, මේ ගුණයෙන්; උපෙත, යුක්තවූ; ඛත්තිය, ක්ෂත්‍රියය; සිතඅරියවත්හි, පිහිටි ආර්‍යවෘත්ත ඇතියේ-මෙහි "අරිය වත්හි" නම් දශරාජධර්ම සඞ්ඛ්‍යාත පොරණ රජවතසි; සුවවෝ, සුවවවූයේ; අක්කොධනෝ, අක්‍රෝධිවූයේ; සුඛී, සුවපත්වූයේ; අනුප්පීළං, (ජනයා) නොපෙළන්නේ; මෙදිනිං, පොළෝ- රට වැසියා සි සේසි; පසාස, අනුශාසනාකර; ඉතෝ, මෙයින්; විමුත්තෝපි ච, මුකතවූයේද-ව්‍යුතවූයේද' සි සේසි, සුගතිං, සුගතියට; යාහි, යා.

11;2 එවං සුනීතෙන * සුභාසිතෙන
ධම්මෙන සූතයෙන උපායසෝ නයං
නිබ්බාපයෙ සංඛුභිතං මහාජනං
මහාව මෙඝෝ සලිලෙන මෙදිනිනහි.

එවං, මෙසේ; සුනීතෙන, මනා නයින්ද; සුභාසිතෙන, යහපත් වචනයෙන්ද; ධම්මෙන, (දශකුශල කර්ම්මපථ) ධර්ම්මයෙන්ද; සූතයෙන, නීත්‍යයෙන්ද; උපායසෝ සා, උපායකෞශල්‍යයෙන්ද; නයං, රාජ්‍යය අනුශාසනා කරන [ධාර්ම්මික රජතෙමේ] සංඛුභිතං මහා ජනං, [මේ ප්‍රතිපත්තියෙන් කායික චෛතසික දරථය දුරුකරමින් කායික චෛතසික දුඃඛයෙන්] කැළඹුණාවූද මහජනයා; මහා මෙඝෝ, මහවැස්සෙක්; සලිලෙන, ජලයෙන්; මෙදිනිං ඉව, පොළෝ නිවන්නක් මෙන්; නිබ්බාපයෙ, නිවා සන්සන්නේය-තෝද එසේම නිවා සන්සවාසි දක්වමින් මෙසේ කී.

415 සුමඞ්ගල ජාතකයයි.

1173 අඞ්ගාරජාතා පථවී කුක්කුලානුගතා මහී
අථ ගායසි වත්තානි න තං තපති ආතපෝ.

මහී, මහිසඞ්ඛ්‍යාතවූ; පථවී, පෘථිවී තොමෝ; අඞ්ගාරජාතා, පහවූ ගිනිසිළු ඇති අඟුරු මෙන් උණුවූවා; කුක්කුලානුගතා, උණුඅළු බදු උණුවාළුකා අනුගතවූවා; අථ, එතකුදුවුව; වත්තානි, අයොගවත් [ආරොපණයකොට] ගායසි, ගී ගායෙහි; ආතපෝ, අව්වූ; තං, තා, න තපති, නොතවා.

1174 උඞ්ගං තපති ආදිච්චෝ අධෝතපති වාලුකා.
අථ ගායසි වත්තානි න තං තපති ආතපෝ.

* සුනීතෙන—පොත්.

උඹං, උඹ; ආදිච්චා, සූයන්හෙමේ; තපති, තවා; අධෝ, යට; වාලුකා, වැලි; තපති, තවා; අථ, එහකුදුවුව; එතානි, අයොග වත්; (අරොපණියකොට)' ගායති, හී ගානෙහි; ආතපෝ, අව්ව; තං, තා; න තපති, නොතවා.

1175 න මං තපති ආතපෝ ආතපපා * තපයන්ති මං
අට්ඨහි විවිධා රාජ තෙ තපන්ති න ආතපෝ.

ආතපෝ, අව්ව; මං, මා; න තපති, නොතවා; ආතපපා, වසතු කාම කෙලෙශ කාමයෝ; (ඔහු වනාහි පුරුෂයා තවත්) මං, මා; තපයන්ති, තවත්; එහෙයින් "ආතපප" යයි, කියන ලදහ; රාජ, මහරජ; [මට] විවිධා අට්ඨ හි, [වසතුකාම කෙලෙශකාමයන් නිසා කටයුතු නානා කෘත්‍යසඞ්ඛ්‍යාත] විවිධාර්ථයෝ ඇත්තාහ; තෙ, ඔහු; තපන්ති, [මා] තවත්; ආතපෝ, අව්ව; න, නොතවා.

1176 අද්දසං කාම තෙ මූලං සඞ්කප්පා කාම ජායසි
න තං සඞ්කප්පයිස්සාමි එවං කාම න හොහිසි. †

කාම, කාමය; තෙ, තාගේ; මූලං, මුල; අද්දසං, [මම] දුටුයෙමි; කාම, කාමය; සඞ්කප්පා, [කාම] විතර්කය හෙතුකොටගෙන; ජායසි, [තෝ] උපදනෙහිය; [එහෙයින්] තං, තා; න සඞ්කප්පයිස්සාමි, සඞ්කල්පනය නොකරන්නෙමි; එවං, මෙසේ ඇති කල්හි; කාම, කාමය; [තෝ] න හොහිසි, [මාගේ අනන්තරයෙහි] නොවන්නෙහිය-නො උපදින්නෙහිය යි සේසි.

1177 අප්පාපි කාමා නාලං බහූනිපි න තපති
අහහා ‡ බාල ලපනා ‖ පරිවජ්ජේථ ජගතෝ.

අප්පාපි කාමා, සවල්පවූත් වසතුකාම කෙලෙශ කාමයෝ; න අලං, පර්‍යාප්ත රහිතයහ; බහූහිපි, බොහෝවූ වසතුකාම කෙලෙශ කාමයන් කරණකොට ගෙනද; න තපති (පාඨක් ජනතෙම) තෘප්තියට නොයේ; බාලලපනා, මාගේ රූපය මාගේ ශබ්දය යනාදීන් අඥාන ව්‍යවහාරයට කාරණ හෙයින් "බාලලපනා" නම්වූ කාමයෝ; අහහ, බෙදයහ; ජගතෝ, සත්ත්ව බොධිපාක්ෂික ධර්ම භාවනානු යොගීවූයේ විදසුන් වැඩීමෙන් පිළිදගුම් කරන්නාවූ කුලපුත්‍රතෙම; පරිවජ්ජේථ, (පරිඤ්ඤයාදී වශයෙන් දැන) දුරු කරන්නේය.

---

* ආතපා-බුරුම. † න හෙඨිසි-බුරුම. ¶ පරිච්ජේජ්ථ-පොත්.
‡ අහාහා—බුරුම.

1178 අපපස්ස කම්මස්ස ඵලං මමේදං
උදයෝ* අජ්ඣගමා මහත්ත පත්තං
සුලබ ලාභෝ වත මානවස්ස
යෝ පබ්බජී කාමරාගං පහාය.

*උදමයා, උදයනම්වූ මම; මහත්තපත්තං, මහත් බවට ගියාවූ ඉසුරට, අජ්ඣගමා, පැමිණියෙම්ද; ඉදං, මෙය; මම, මාගේ; අපපස්ස කම්මස්ස, සවලපවූ කම්යාගේ; ඵලං, විපාකය වේ; යෝ, යමෙක් තෙමේ; කාමරාගං, වස්තුකාම කෙලෙශ කාමයන් කෙරෙහි පැවති ආලය; පහාය, හැරපියා; පබ්බජී, පැවිදිවිද; මානවස්ස, මා යහළු මානවකයා හට; සුලබ ලාභෝ, හේ පැවිද්ද යහපත් ලාභයෙක්මී.

1179 තපසා පජහන්ති පාපකම්මං
තපසා නහාපිත කුම්භකාර භාවා
තපසා අභිභුය්‍ය ගංගමාල
නාමෙනාලපඤ්ජ බ්‍රහ්මදත්තාති.

තපසා, (යම් සත්තකෙනෙක් තුමූ තමා විසින් රක්නාලද) තපොගුණය කරණකොට ගෙන; පාපකම්මං, අකුසලකර්මය; පජහන්ති, යම්සේ දුරුකෙරෙද්ද; (එසේ) තපසා, තපොගුණයෙන්; නහාපිත කුම්භකාරභාවං, නපුකුඹල් බැව්; පජහන්ති, දුරුකෙරෙද්ද; ගංගමාල, ගංගමාලය; තපසා, තපොගුණයෙන්; අභිභුය්‍ය, මැඩ; බ්‍රහ්මදත්ත, බ්‍රහ්මදත්තයි; අජ්ජ, අද; නාමෙන, නමින්; ආලපසි, අව්හානය කෙරෙහිද.

1180 සන්දිට්ඨික මෙව† පස්සථ
ඛන්තිසොරච්චස්ස යෝ විපාකෝ
යෝ සබ්බජනස්ස වන්දිතෝ අහු
තං වන්දම සරාජිකා සමච්චා.

ඛන්තිසොරච්චස්ස, අධිවාසන ක්ෂාන්තියගේ හා සුරත භාවයාගේ; යෝ විපාකෝ, යම්බඳු විපාකයෙක් වේද; සන්දිට්ඨිකං එව, ඒ සාන්දෘෂ්ටික විපාකයම; පස්සථ, බලනු මැනව; යෝ, යමෙක් තෙමේ; සබ්බජනස්ස, සියළු ජනයා විසින්; වන්දිතෝ අහු, නමස්කාර කරන ලද්දේ වීද; තං, ඔහු; සරාජිකා, රජුන් සහිතව; සමච්චා, ඇමතියන් සහිතව; වන්දම, ප්‍රණාම කරම්හ.

---

* උදයෝ අජ්ඣාගමා-බුරුම්. † මෙව අම්මපස්සථ-බුරුම්.

1181 මා කිඤ්චි අවචුත්ථ ගඞ්ගමාලං
මුනීනං මොනපථෙසු සික්ඛමානං
එසො හි අතරි අණණවං
යං තරිත්වා වරන්ති වීතසොකා.

මුනීනං, අගාරිකාදි මුනීන් අතුරෙහි; මොනපථෙසු, ශික්ෂාත්‍රය සඞ්ගෘහීත සත්ත්ශිස් බෝධිපාක්ෂික ධර්මසඞ්ඛ්‍යාත මෞනපථයෙහි; සික්ඛමානං, පූර්භාග ප්‍රතිපද වශයෙන් හික්මෙනු ලබන්නාවූ; ගඞ්ගමාලං, පූර්වනාම වශයෙන් ගඞ්ගමාල නම්වූ පසේ බුදුන්ට; කිඤ්චි, කිසිවක්; මා අවචුත්ථ, ආක්‍රොශ වශයෙන් නොකියව්; යං, යම් සංසාර මහාර්ණවයක්; තරිත්වා, තරණය කොට; වීතසොකා, පහවූ ශොකාදී සංසාරදුක්ඛයන් ඇතිව; වරන්ති, හැසිරෙද්ද ඒ සංසාර මහාර්ණවය; එසො හි, මේ ප්‍රත්‍යෙක මුනි තෙම වනාහි; අතරි, තරණය කෙළේය.

416 ගඞ්ගමාල ජාතකය යි.

1182 ධම්මො හවෙ හතො හන්ති
නාහතො හන්ති කිඤ්චනං
තස්මා හි ධම්මං න හනෙ
මා තම්පි ධම්මො හතො හනී.

හවෙ, එකාන්තයෙන්; ධම්මො, සත්‍යධර්මය තෙම; හතො, මුසවා කිමෙන් නසන ලද්දේ; හන්ති, ජ්‍යෙෂ්ඨාපචායන ධර්මය නෙමේම කැසේ; අහතො, ධර්මය නොනසන ලද්දේ; කිඤ්චනං, කිසිවක්; න හන්ති, නොකැසේ; තස්මා හි, එහෙයින්, ධම්මං, සත්‍යධර්මය; න හනෙ, නො නසන්නේය; තම්පි, තුඹවහන්සේ; ධම්මො හතො, ධර්මය නසනලදුයේ; මා හනී, නොකැසෙහි.

1183 අලිකං භාසමානස්ස අපක්කමන්ති දෙවතා
පූතිකාච මුඛං වාති *සඝඤ්ඤානා ච ධංසති
යො ඤානං පුච්ඡිතො පඤ්හං අසඤ්ඤථා නං වියාකරෙ.

පුච්ඡිතො, විචාරණ ලද; යො, යමෙක් තෙම; ඤානං, දන්නේ; පඤ්හං, පැන; අසඤ්ඤථා, අන්පරිද්දකින්; වියාකරෙ,

* සඤ්ඤාච-මරම්ම.

ප්‍රකාශ කෙරේද; (එසේ) අලිකං භාසමානස්ස, මුසවා කියන්න හුගේ; දෙවතා, දෙවියෝ; අපකකමන්ති, පහව යෙත්; මුඛං ච, මුඛයද; පූතිකං වාති, දුගඳ හමයි; සඝඤ්ඤානා ච, අහස තමා සිටි තැනින්ද; ධංසති, ගිලිහී වැටේ.

1184 සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ
මුසා වෙ භාසසෙ රාජ භූමියං තිඨ චෙතිය.

චෙතිය, චෙතිය නම් වූ; රාජ, එම්බා මහරජ; සචෙ හි, ඉදින් එනාහි; සච්චං, සබවස; භණසි, කියෙහි නම්; පුරෙ යථා, පෙර මෙන්; හොහි, වෙහි; වෙ, ඉදින්; මුසා භාසසෙ, මුසවා කියෙහි නම්; රාජ, එම්බා මහරජ; භූමියං, (සඝීසථානයෙන් වූනව පතිත) බිමෙහි; තිඨ, සිටිනු මැනව.

1185 අකාලෙ වසසති තසස කාලෙ තසස න වසසති
යො ජානං පුච්ඡිතො පඤහං අඤඤථා නං වියාකරෙ.

යො, යම් රජෙක් තෙම; පඤහං පුච්ඡිතො, පැන පුලුවුස්නා ලද්දේ; ජානං, දැන; නං, එය; අඤඤථා, අන්පරිද්දකින්; වියාකරෙ, විසසජ්ජනය කෙරේද; තසස, ඒ රජහුගේ රාජ්‍යයට; අකාලෙ, නොකල; වසසති, වසී; තසස, ඔහුගේ රාජ්‍යයට, කාලෙ, සුදුසු කල; න වසසති, නොවසී.

1186 සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ
මුසා වෙ භාසසෙ රාජ භූමියං පවිස වෙතිය.

මෙහි අවී 1184 වෙනි ගාථාවෙන් බලා දතයුතුයි.

1187 ජීවතා තසස චිඨා හොති උරගසෙසව දිසමපති
යො ජානං පුච්ඡිතො පඤහං අඤඤථා නං වියාකරෙ.

දිසමපති, මහරජ; පුච්ඡිතො, විචාරණ ලද; යො, යමෙක් තෙම; ජානං, දැන; නං, ඒ; පඤහං, ප්‍රශනය; අඤඤථා, අන් පරිද්දෙකින්; වියාකරෙ, විසඳුද; උරගසස එව, සර්පයාගේ මෙන්; තසස, ඔහුගේ; ජීවතා, දිව; චිඨා හොති; විප්‍රකාර වේ.

1188 සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ
මුසා වෙ භාසසෙ රාජ භියෙය්‍යා පවිස වෙතිය.

මෙහිද අවී පෙර මෙනි.

1189 ජීවනා තස්ස න භවති මච්ඡෙසෙව දිසම්පති
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

දිසම්පති, එම්බා මහරජ; පුච්ඡිතෝ, විචාරණ ලද; යෝ, යමෙක් තෙම; ජානං, දන්නේ; නං, ඒ; පඤ්හං, පැන; අඤ්ඤථා, අන් පරිද්දකින්; වියාකරෙ, විසඳුද; මච්ඡස්ස ඉව, මසුගේ මෙන්; තස්ස, ඔහුගේ; ජීවනා, දිව; න භවති, නොවේ හෙවත් නොපවති.

1190 සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ
මුසා වෙ භාසසෙ රාජ භියෙය්‍යා පවිස වෙතිය.

මෙහිද අර්ථ පෙර මෙනි.

1191 ධියෝ තස්ස පජායන්ති න පුමා ජායරෙ කුලෙ
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

පුච්ඡිතෝ-පෙ-වියාකරෙ, විසඳුද නම්; තස්ස, ඔහුගේ; කුලෙ, ගෘහයෙහි; ධියෝ, සත්‍රීහු (ධිතෘහු); පජායන්ති, උපදිත්; පුමා, පුරුෂයෝ (පුත්‍රයෝ); න ජායරෙ, නූපදිත්.

1192 සචෙ හි සච්චං භණසි-පෙ-පවිස වෙතිය.

මෙහිද අර්ථ පෙර මෙනි.

1193 පුත්තනා තස්ස න භවන්ති පක්කමන්ති දිසෝ දිසං
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

පුච්ඡිතෝ-පෙ-වියාකරෙ, විසඳුද; තස්ස, ඔහුගේ; පුත්තා, පුත්‍රයෝ; න භවන්ති, ඕහට උපකාරී නොවෙත්; දිසෝ දිසං, දිශාත්‍ර දිශාවට; පක්කමන්ති, පලායෙත්.

1194 සචෙහි සච්චං භණසි-පෙ-පවිස වෙතිය.

මෙහිද අර්ථ පෙර මෙනි.

1195 සරාජා * ඉසිනා පතෙතා අන්තලික්ඛචරෝ පුරෙ
පාවෙක්ඛි පඨවිං † වෙසෝ නිහතෙතා පත්තපරියායං.

සරාජා, ඒ වෙහියරජ තෙම; පුරෙ, පූර්වයෙහි; ඉසිනා, කපිල මහර්ෂීන් කරණකොට ගෙන; පතෙතා, (රජබවට) පැමිණියේ;

* ඉසිනා සතෙතා-සමහර පොත්. † ජවෙවා-බුරාම්.

අනාසලිඛවරෝ, ආකාශචාරීව සිට; එසෝ, මෙතෙම; හිතතෙත්තා, පිරිහුණ සවභාව ඇත්තේ; පත්තපරියායං, කාලානුරූප බවට පැමිණ; පඨවිං ච, පෘථිවියටද; පාවෙක්ඛි, පැමිණියේය.

1196 තසමා හි ඡන්දගමනං නප්පසංසන්ති පණ්ඩිතා
අදුඨචිත්තෙනා භාසෙය්‍ය ගිරං සාධු පසංසිතන්ති.

තසමා හි, එසේ හෙයින් වනාහි; ඡන්දගමනං, ඡන්දයෙන් අගතිගාමී වීම; පණ්ඩිතා, ප්‍රාඥයෝ; නප්පසංසන්ති, ප්‍රසංසා නොකරත්; (එහෙයින්) අදුඨචිත්තෙනා, දූෂ්‍යනොවූ සිත් ඇත්තේ; සාධු පසංසිතං; සාධූන් විසින් මැනවැසි සම්මත කරන ලද; ගිරං; සත්‍යවචනය; භාසෙය්‍ය, කියන්නේය.

417 චෙතිය ජාතකයයි.

1197 යෝ ඉන්ද්‍රියානං කාමෙන වසං නාරද ගච්ඡති
සෝ පරිච්චජ්ජුහෝ ලොකෙ ජීවන්තෝ වාපි සුස්සති.

නාරද, එම්බා නාරදය; යෝ, යම්පුරුෂයෙක් තෙමේ; කාමේන, (රූපාදි නිමිත්තානුබ්‍යඤ්ජනවශයෙන් ගැනීමෙන් ඇතිවූත්) ආලය කරණකොටගෙන; ඉන්ද්‍රියානං, (සමාහිත්විප්‍රවාස බැවින්) ඉන්ද්‍රිය යන්ගේ; වසං, වසඟයට; ගච්ඡති, යේද: සෝ, හෙතෙම; ඉහෝ ලොකෙ, දෙව්මිනිස්සුව; පරිච්චජ්ජ, හැරපියා; (නරකයෙහි උපදිව්) ජීවන්තෝ වාපි, ජීවත්වන්නේ නමුදු; සුස්සති, (ඊප්සිතාලාභයෙන් ශෝකාතුරවුයේ) වියලේ.

1198 සුඛස්සානන්තරං දුක්ඛං දුක්ඛස්සාන්නන්තරං සුඛං
සොපි පත්තෝ සුඛං දුක්ඛං පාටිකඞ්ඛ වරං සුඛං.

සුඛස්ස, ඉස්කම් සැපයට; අනන්තරං, අනතුරුව; (ඝාලුරීය ළඟට) දුක්ඛං, නිරුදුකට පැමිණෙත්; දුක්ඛස්ස, සිල්රැකීම් විදසුන් වැඩීම් වසයෙන් පැමිණෙන දුකට; අනන්තරං, අනතුරුව; සුඛං, දිව්‍යමනුෂ්‍යනිර්වාණ වසයෙන් පැවති සැපයට පැමිණෙත්; සෝපි, ඒ ප්‍රසිඛ නාරද ඍෂිතෙමේද; සුඛං, (නෛෂ්ක්‍රම්‍ය) සැපය (නසා); දුක්ඛං, පවත්නා නිශ්‍රිත ඊප්සිතාලාභ දුකඛයට; පත්තෝ, පැමිණියේය, වරං සුඛං, උත්තම ඒ ධ්‍යාන සැපය; පාටිකඞ්ඛ, කැමැතිවනු මැනවි.

1199 කිච්ඡකාලෙ කිච්ඡසහො යො කිච්ඡං නානී වත්තසී
සකිච්ඡනතං සුඛං ධීරො යොගං සමධිගච්ඡති.

යො, යමෙක් තෙමේ; කිච්ඡකාලෙ, කායිකාවෙතසික දුක උපන් කල; කිච්ඡසහො, (දුක් දුරු කරන මනා පිළිවෙත්හි පිළිපන්නේ)දුක් උසුලාද;කිච්ඡං, දුක; න අතිවත්තති,(දුකඛානුවත්තිව අමාගීඵ්‍රනිපණ්ණ නොව) මැඩ විනාශ කෙරේද; සො ධීරො, ඒ ප්‍රාඥ තෙම; කිච්ඡනතං, දුක් කෙළවර වන්නාවූ; සුඛං, නිරාමිස සැපය වූ; යොගං, ධ්‍යානයට; සමධිගච්ඡති, මනාව පැමිනේ.

1200 නහෙව කාමානං කාමා නානත්ථානත්ථකාරණා
න කතං ච නිරං කත්වා ධම්මා වවිතුමරහති.

කාමානං, වසතුකාමකෙලශ කාමයන්ට; නහෙව කාමා, ආසා නොකට යුත්තාහ; නානත්ථා, අර්ථරහිත බැවින්ද; න අත්ථකාරණා, අර්ථයට උපකාර හෝ කාරණා නොවන බැවින්ද වෙත්; කතව, උපදවන ලද්දාවූද ධ්‍යානසමපත්තිය; නිරං කත්වා, විනාශ කොට; ධම්මා, කුශල ධර්මයෙන්; වවිතුං, ව්‍යුතවන්ට; න අරහති, සුදුසු නොවේ.

1201 දුකඛං ගහපතිං සාධු සං විහජ්ජව භොජනං
අහාසො අත්ථලාභෙසු අත්ථව්‍යාපත්ති අව්‍යථො.

ගහපතිං, (ගිහිගෙයි වසන්නාවූ) ගෘහපති ගව; දුකඛං, (භොගොත්පාදනයෙහි අනලස් වීමෙන් ඇති වන්නාවූ) දුක; සාධු, මැනව; සංවිභජ්ජව භොජනං, (ධාර්මිකශ්‍රමණබ්‍රාහ්මණාදීන් විෂයෙහි) බෙදාදී වැළඳීමද; (සාධු, මැනව) අත්ථලාභෙසු, මහත්වූ ඓශ්වර්‍යලාභයෙහි; අහාසො, (ප්‍රමාද වශයෙන්) උඩඟු නොවීමද; (සාධු, මැනව) අත්ථව්‍යාපත්ති, ධනවිනාශයෙහි; අව්‍යථො, කලානතනොවීම්; (සාධු, මැනව).

1202 එතතාවතෙතං පණ්ඩිචචං අපි සො දෙවලොබ්‍රවී
න සිතො කිම්පාපියො යො ඉන්ද්‍රියානං වසං වජෙ.

සො දෙවලො, ඒ දෙවල ඍෂිතෙම; (යං, යම්ක්;) අබ්‍රවී, කීයේද; එතං පණ්ඩිචචං අපි, මේ පාණ්ඩිත්‍යයද; එතතාවතා, මෙපමණෙක්මය; යො, යමෙක් තෙමේ; ඉන්ද්‍රියානං, ඉන්ද්‍රියයන්ගේ; වසං වසඟයට; වජෙ, යන්නේද; ඉතො, මීට වඩා; කිම්, කිසියම්; පාපියො, ලාමක බවෙක්; න, නැත්තේය.

1203 අමිත්තානංව හත්ථේ සිවි පපෙපාති මාමිව
කම්මං විජ්ජව දක්ඛෙය්‍යං විවාහං සීලමද්දවං.

සිවි, එම්බා සිවි මහරජ; අමිත්තානං හත්ථේ ඉව, පසමිතූ රන්ගේ අතට පත්වූ වෙක් වැනි; මාමිව (මම්ව), මා මෙන්; පපෙපාති, විනාශයට යේද; කම්මං, කෘෂිවණිජ් ආදී ජීවන සාධක කෘත්‍යයද; විජ්ජා ව, හස්තිශිල්පාදි ශිල්පයද; දක්ඛෙය්‍යං, ධනොපාර්ජන කෞශල්‍යයද; විවාහං, ආවාහ විවාහ සම්බන්ධයද; සීලමද්දවං, පව ශීලය මෘදු මොලොක් වචනය හිතකැමැති බව හා පාපයෙන් වලක්වන කල්‍යාණමිත්‍ර සම්පත්තියද යන.

1204 එතෙ ච යසෙ හාපෙත්වා නිබ්බත්තෙතා සෙහි කම්මෙහි
සොහං සහස්සජිණෙණාව අබන්ධු අපරායනෝ.

එතෙ ච යසෙ, මෙතෙක් අභිවෘද්ධියක ධර්මයන්; හාපෙත්වා, නසා; සෙහි කම්මෙහි, සවකීය අකුසල කර්මයෙන්; නිබ්බත්තෝ, මනුෂ්‍ය ප්‍රෙතව උපන්නෙමි; සොහං, ඒ මම; සහස්සජිණෙණාව, දහසින් පරදින ලද්දක්හු මෙන්; අබන්ධු, ඥාතීන් රහිතවූ යෙම්; අපරායනෝ, ප්‍රතිඥා රහිතවූ යෙම්.

1205 අරියධම්මා අපක්කන්තෙතා යථා පෙතෝ තථෙවහං
සුඛකාමෙ දුක්ඛාපෙත්වා ආපන්නොසම්ි පදං ඉදං
සෝ සුඛං නාධිගච්ඡාමි සිතෝ භාතුමතී විය'ති.

අරියධම්මා, ආර්‍ය්‍යධර්මයෙන්; අපක්කන්තෙතා, පහව ගියාවූ; අහං, මම; ඉපතෝ, ප්‍රෙත තෙම; යථා එව, යම්සේද; තථා එව, එමෙනි; සුඛකාමෙ, සුවකැමැත්තන්; දුක්ඛාපෙත්වා, දුක්ඛිත කරවා; ඉදං පදං, මේ මනුෂ්‍යප්‍රෙතබවට; ආපන්නොසම්ි, පැමිණියෙමි; සෝ, ඒ මම; භාතුමති, ගින්නෙහි; සිතෝ විය, සිවියාක්හු මෙන්; සුඛං, සැපයට; නාධිගච්ඡාමි, නොපැමිණෙමි.

418 ඉන්ද්‍රිය ජාතකයයි.

1206 ආදිත්තසම්ං අගාරසම්ං යං නීහරති භාජනං
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

අගාරසම්ං, ගෘහය; ආදිත්තසම්ං, ගිනිගත් කල්හි; යං භාජනං, යම්කිසි භාණ්ඩයක්; නීහරති, බැහැර කෙරේද; තං, එය;

තස්ස, ඒ ගෘහ සවාමියා හට; අත්‍ථාය හොති, වැඩ පිණිස වේ; යං, යම් භාණ්ඩයක්; නො ව, එසේ බැහැර නො කරන ලදද; තත්‍ථ, එහි, ඩයහති, හළු වේ.

1207 එවං ආදිපිතෝ ලොකෝ ජරාය මරණේන ච
නීහරෙථෙව දානෙන දින්නං හොති*සුනීහතං.

එවං, එපරිදිදෙන්; ලොකෝ, ලොකය තෙමේ; ජරාය, ජරාවෙන්ද; මරණේ නව, මරණයෙන්ද; ආදිපිතෝ, ගිනිගන්නා ලද්දේය; දානෙන එව, දන් දීමෙන්ම; නීහරෙථ, බැහැර කරන්නේය; දින්නං, දෙනලද්ද; සුනීහතං හොති, මනාකොට රක්‍ෂා කරන ලද්දේ වේ.

1208 යෝ ධම්මලඛස්ස දදාති දානං
උඨානවීරියාධිගතස්ස ජන්තු
අතික්කම්ම සෝ වෙතරණිං යමස්ස
දිබ්බානි ඨානානි උපෙති මච්චෝ.

යෝ ජන්තු, යම් සත්ත්‍වයෙක් තෙම; උඨානවීරියාධිගතස්ස, උඨාවීර්‍යයෙන් ලබන ලද; ධම්මලඛස්ස, ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ පටන් ආරබධ විදර්‍ශනායා දක්වා ලබන ලද ලොවිතුරා දහම් ඇති පුද්ගලයා හට; දානං දදාති, දන්දේද; නොහොත්; යෝ ජන්තු, යම් සත්ත්‍වයෙක් තෙම; ධම්මලඛස්ස, දැහැමින් ලබන ලද; උඨාන වීරියාධිගතස්ස, උඨානවීර්‍යයෙන් ලබනලද වස්තුවෙන්; දානං දදාති, දන්දේද; සෝ, හෙතෙම; යමස්ස, යමයාගේ; වෙතරණිං, වෙතරණී නම් මහානදිය හෙවත් අවමහනිරය හා සොළොස් ඔසුපත් නිරය; අතික්කම්ම, ඉක්මවා; දිබ්බානි ඨානානි, දිව්‍ය සම්පත්තියට; උපෙති, පැමිණේ.

1209 දානඤ්ච යුඛඤ්ච සමානමාහු
අපාපි සන්තා බහුකෙ ජීතන්හි
අපම්පි වෙ සද්දහානෝ දදාති
තෙනෙව සෝ හොති සුඛී පරත්ථ.

දානඤ්ච, දන්දීමද; යුඛඤ්ච, යුඛකිරීමද; සමානං, සමාන්‍යයි; ආහු, කිහු; අපාපි සන්තා, සවලපවුත් පරිත්‍යාග ඇති යහු; බහුකෙ, බොහෝ සතුරන්; ජීතන්හි, දිනත්; (නොහොත්) සන්තා, අලොභාදී කුසල ධම්මයෝ; අපාපි, සවලප වූවාහුද; බහුකේ,

* සුනිඛ්හතං-බුරුම්.

බොහෝවූ ලොභාදී අකුසලයන්; ජිනාතනි, දිනත්; වේ, ඉදින්; අපපම්පි, සවලපයකුදු; සද්දහානෝ, කම්ඵලය අදහමින්; දදාති, දේද; තෙන එව, එහෙයින්ම; සෝ, හෙතෙම; පරත්ථ, පරලෙව්හි; සුඛී හොති, සුවපත් වේ.

1210 විවෙය්‍ය දානං සුගතපපසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ.

විවෙය්‍ය දානං, දක්ෂිණාර්හයන් සොයා දන්දීම; සුගතපපසත්ථං, සම්බුදුයන් වහන්සේලා විසින් පසස්නාලදී; ඉධ ජීවලොකෙ; මේ මනුෂ්‍යලොකයෙහි; යෙ දක්ඛිණෙය්‍යා, යම් දක්ෂිණාර්හී කෙනෙක් වෙත්ද; එතෙසු, උන්වහන්සේලා කෙරෙහි; දින්නානි, දෙනලද දානයන්; සුඛෙත්තෙ, මනාකෙත; වුත්තානි, වපුරනලද; බීජානි යථා, බීජ මෙන්; මහප්ඵලානි, මහත් ඵල වෙත්.

1211 යො පාණභූතානි අහෙඨයං චරං
පරූපවාදා න කරොති පාපං
භීරුං පසංසන්ති න තත්ථ සූරං
භයා හි සන්තොා න කරොන්ති පාපං.

යො, යමෙක් තෙමේ; පාණභූතානි, ප්‍රාණසංඛ්‍යාත භූතයන්; අහෙඨයං, නොපෙළමින්; චරං, හැසිරෙන්නේ; පරූපවාදා, පරාපවාද නිමිත්තෙන්; පාපං න කරොති, පව්නොකෙරේද; භීරුං, පාප භීරුකයා හට; පසංසන්ති, ප්‍රශංසා කෙරෙත්ද; තත්ථ සූරං, එහි දක්ෂයා හට; න, ප්‍රශංසා නොකෙරෙද්ද; සන්තොා, සත්පුරුෂයෝ; භයා හි; බියෙන්; පාපං න කරොන්ති, පව් නොකෙරෙත්.

1212 හීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති.

හීනෙන බ්‍රහ්මචරියෙන, බාහිර තීර්ථායතනයෙහි රක්ෂා කරන ලද්දාවූ හෝ වෛඵුන විරතිමාත්‍රවූ හෝ ලාමක බ්‍රහ්මචර්‍යාවෙන්; ඛත්තියෙ, රජකුලෙහි; උපපජ්ජති, උපදී; මජ්ඣිමෙන ච, ධ්‍යානොපචාරමාත්‍රවූ මධ්‍යම බ්‍රහ්මචර්‍යාවෙන්; දෙවත්තං, දෙව්ඛවට පැමිණේ; උත්තමෙන, අෂ්ටසමාපත්ති සංඛ්‍යාත උත්තම බ්‍රහ්ම චර්‍යාවෙන්; විසුජ්ඣති, බ්‍රහ්මලොකොත්පත්තියෙන් පිරිසිදුවේ, නොහොත්

හීනෙන බ්‍රහ්මචරියෙන, ශාසනගත ඔම්හා බ්‍රහ්මචය්‍යාවෙන්; ඛත්තියෙ, ක්ෂත්‍රිය කුලයෙහි; උපපජ්ජති, උපදී; මජ්ඣිමෙන ච, අනුලොම ඤාණය දක්වා පැවති ආරබ්ධ විදර්ශක ශාසනමාර්ග බ්‍රහ්මචය්‍යාවෙන්; දෙවත්තං, දෙව්බවට පැමිණේ; උත්තමෙන, විදසුන් වඩා රහත් බවට පැමිණීම් සාඛ්‍යාත උත්තම බ්‍රහ්මචය්‍යාවෙන්; විසුජ්ඣති, සියලු සසරදුක් නැසීම් වසයෙන් පිරිසිදුවේ.

1213 අඩා හි ඤානං බහුධා පසත්ථං
ඤානා ච ඛො ධම්මපදංව සෙය්‍යො
පුබ්බෙව් තෙ පුබ්බතරෙව සන්තො
නිබ්බාණමෙවජ්ඣගමුං සපඤ්ඤති.

ඤානං හි, ආම්ස ඤානය වනාහි; අඩා, එකාන්තයෙන්; බහුධා, බොහෝ ප්‍රකාරයෙන්; පත්ථං, පසස්නා ලදී; ඤානා ච ඛො, ඤානය කෙරෙන්ද; ධම්මපදංව, සමථ විදර්ශනා නිර්‍වාණ පය්‍යාප්ති යන ධර්ම පදයම; සෙය්‍යා, උතුම; පුබ්බෙව, පෙරද; පුබ්බතරෙව, ඉතා පූර්‍වයෙහිද; සපඤ්ඤා, සප්‍රාඥවූ; තෙ සන්තො, ඒ කාශ්‍යප වෙස්සභූ ආදී සප්තඥවරයෝ; නිබ්බාණං එව, නිර්‍වාණ ධර්මයටම; අජ්ඣගමුං, පැමිණියාහුය.

419 ආදිත්ත ජාතකයයි.

1214 ගඞ්ගා කුමුදිනී සන්නා සංඛවණ්ණා ච කොකිලා
ජම්බු තාලඵලං දජ්ජා අථ නූන තදා සියා.

(යදා, යම් කලෙක්හි;) ගඞ්ගා, සියලු ගඞ්ගාවෝ; කුමුදිනී සන්නා, සෑඩ වතුරු පියා විල් බවට පැමිණ සොඳමදයෙන් සෑදුම් ලද්දාහු වෙත්ද; කොකිලා, කොවුල් පක්ෂීහු; සඞ්ඛවණ්ණා ච, සකක් සේ සුදුවන් වෙත්ද; ජම්බු, දඹ; තාලඵලං, තල්පක්; දජ්ජා, දෙදී ද; අථ, ඉක්බිති; තදා, එකල්හි; නූන, එකාන්තයෙන්; සියා, සමාගමය වන්නේය.

1215 යදා කඤ්චපලොමානං පාවාරෝ තිවිධෝ සියා
හෙමන්තිකං පාපුරණං අථ නූන තදා සියා.

යදා, යම් කලෙක්හි; කඤ්චපලොමානං, කැසුප් ලොම් පිළිබඳ; තිවිධෝ, කැසුප්හු මූවාය පුලුන්හු මූවාය මිශ්‍රය යන ත්‍රිවිධ වූ;

පාවාරෙ, උතුරුසලුවක්; හෙමනතිකං පාපුරණං සියා, හිමව් පොරොණය වන්නේද; අථ, ඉක්බිති; තදා, එකල්හි; නූන; එකාන්තයෙන්; සියා, සමාගමය වන්නේය.

1216 යදා මකස පාදූනං අට්ටාලෝ සුකතෝ සියා
දළෙහා ච අපපකම්පි ච අථ නූන තදා සියා.

යදා, යම් කලෙක්හි; මකසපාදූනං, මදුරුපා පිළිබඳ; දළෙහා ච, දැඩිවූද; අපපකම්පි ච, නොසැලෙන්නාවූද; අට්ටාලෝ, අටලුවෙක්; සුකතෝ සියා, මොනවට කරන ලද්දේ වන්නේද; අථ, ඉක්බිති; තදා, එකල්හි; නූන, එකාන්තයෙන්; සියා, සමාගමය වන්නේය.

1217 යදා සසවිසාණානං නිසෙසණී සුකතා සියා
සගහසසාරොහණත්ථාය අථ නූන තදා සියා.

යදා, යම් කලෙක්හි; සගහසසාරොහණත්ථාය, දෙව්ලොවට නැඟීම පිණිස; ඍසවිසාණානං, සසවිශාන පිළිබඳ; නිසෙසණී, හිණක්; සුකතා සියා, මොනවට කරන ලද්දී වන්නීද; අථ, ඉක්බිති; තදා, එකල්හි; නූන, එකාන්තයෙන්; සියා, සමාගමය වන්නේය.

1218 යදා නිසෙසණීමාරුයහ චන්දං ඛාදෙය්‍ය මූසිකෝ
රාහුච පරිපාතෙය්‍ය අථ නූන තදා සියා.

යදා, යම් කලෙක; මූසිකෝ, මූසික තෙම; නිසෙසණිං ආරුයහ හිණට නැඟී; චන්දං, සඳ; ඛාදෙය්‍ය, කන්නේද; රාහුච, රාහුග්‍රහ යාද; පරිපාතෙය්‍ය, පලවා හරින්නේද; යූ සේයි.

1219 යදා සුරාඝටං පිත්වා මක්කිකා ගණවාරිනී
අඞ්ගාරෙ වාසං කපෙපය්‍යුං අථ නූන තදා සියා.

යදා, යම් කලෙක්හි; මක්කිකා, මැස්සෝ; සුරාඝටං, රහකලය; පිත්වා, පානය කොට; ගණවාරිනී, සමූහවාරීව; අඞ්ගාරෙ, ගිනිගෙන දිලියෙන අඟුරෙහි; වාසං කපෙපය්‍යුං, වාසය කරන්නාහුද; සෙස්ස පෙරමෙනි.

1220 යදා බිම්බොඨසමපණෙණා ගද්‍රහෝ සුමුඛෝ සියා
කුසලෝ නච්චගීතස්ස අථ නූන තදා සියා.

යදා, යම් කලෙක්හි; බිම්බොඨසමපණෙණා, බිඹුපල වන් අධර ඇති; සුමුඛෝ, සවණීඳුස ප්‍රතිභාග මුඛ ඇති; නච්චගීතස්ස,

නාහ්‍යඝීහ පිණිස; කුසලෝ, දක්ෂවූ; ගද්‍රභෝ, කොටළුවෙක්; සියා, වන්නේද; සෙස්ස පෙරමෙනි.

1221 යදා කාකා උලූකා ච මන්තයෙයුං රහොගතා
අඤ්ඤමඤ්ඤං පිහයෙයුං අථ නූන තදා සියා.

යදා, යම් කලෙක; කාකා, කාව්වුද; උලූකා ච, මහමූහුණුද; රහොගතා, විවිකත්ව ගියාහු; මන්තයෙයුං, මන්ත්‍රණය කෙරෙද්ද; අඤ්ඤමඤ්ඤං පිහයෙයුං, අන්‍යොන්‍ය ප්‍රියවෙද්ද-පෙ-

1222 යදා පලාසපන්නානං ජත්තූනං පිරතරං සියා
වස්සස්ස පටිඝාතාය අථ නූන තදා සියා.

යදා, යම් කලෙක; පලාසපන්නානං, කැලපත් පිළිබඳ; ජත්තූනං, ජත්‍රය; වස්සස්ස පටිඝාතාය, වැසි වැලැක්වීම පිණිස; පිරතරං සියා, සසිරසාරවේද;-පෙ-

1223 යදා කුරරෙසකුණෝ පබ්බතං ගන්ධමාදනං
තුණ්ඩේනාදාය ගච්ඡෙය්‍ය අථ නූන තදා සියා.

යදා, යම් කලෙක; කුරරෙසකුණෝ, උකුසුපක්ෂි තෙම්; ගන්ධමාදනං පබ්බතං, ගන්ධමාදන පර්වතය; තුණ්ඩේන, තුඩින්; ආදාය, ගෙන; ගච්ඡෙය්‍ය, යන්නේද;-පෙ-

1224 යදා සාමුද්දිකං නාවං සයන්තං සපවාකාරං
වෙටෝ ආදාය ගච්ඡෙය්‍ය අථ නූන තදා සියාති.

යදා, යම් කලෙක; සයන්තං, යන්ත්‍රාදී උපකරණ සහිතවූ; සපවාකාරං, එනම් නෞකොපකරණ සහිතවූ; සාමුද්දිකං නාවං, මහනැවක්; වෙටෝ, ගම්දරුවෙක්; ආදාය, ගෙන; ගච්ඡෙය්‍ය, යන්නේද;-පෙ-

420 අඤ්ඤාන ජාතකයයි.

1225 ඛමනීයං යාපනීයං කච්චි මාතුල තෙ සුඛං
සුඛං තෙ අම්මා අච්ච සුඛකාමා හි තෙ මයං.

මාතුල, මයිල; කච්චි, කිම්; ඛමනීයං, සහනය කළ හැකිද; යාපනීයං, ඉරියව් පැවැත්විය හැකිද; තෙ, තට; සුඛං, සැපද; තෙ,

තාගේ; සුඛං, සුව; අම්මා, මව්; අවච,(අද)විවාළිය; මයං, අපි ද; තෙ, නට; සුඛකාමා හි, සුව කැමැත්තාහුම වෙමු.

1226 නඞ්ගුළුං මෙ අවක්කමම හෙඨයිත්වාන එලිකෙ
සාජ්ජ මාතුලවාදෙන මුච්චිතබ්බානු මඤ්ඤසි.

එලිකෙ, එලිය; මෙ, මාගේ; නඞ්ගුළුං, වාලධිමණ්ඩලය; අවක්කමම, ආක්‍රමනය කොට; හෙඨයිත්වාන, බලාත්කාර කොට; සා, ඕ; අජ්ජ, අද; මාතුලවාදෙන, මාතුලය යන වචනයෙන්; මුච්චිතබ්බා, මිදිය යුතුයයි; මඤ්ඤසි නු; හඟිද.

1227 පුරත්ථාභිමුඛෙ නිසින්නොසි අහං තෙ මුඛමාගත්‍ය
පච්ඡතො තුයහං නඞ්ගුළං කථං ඛොහං අවක්කමිං.

පුරත්ථාභිමුඛෙ, පූර්වදිසාභිමුඛව; නිසින්නොසි, හුන්නෙහිය; අහං, මම; තෙ, නුඹවහන්සේගේ; මුඛං, අභිමුඛයෙන්; ආගතා, ආම්; පච්ඡතො, පසුපසින්; තුයහං නඞ්ගුළං, තා වාලධිය වෙයි; කථං ඛො, කෙසේ නම්; අවක්කමිං, ආක්‍රමනය කෙළෙම්ද.

1228 යාවතා චතුරෙ දීපා සසමුද්දා සපබ්බතා
තාවතා මයහං නඞ්ගුළං කථං ඛො ත්වං විවජ්ජසි.

සසමුද්දා, සමුද්‍ර සහිත; සපබ්බතා, පර්‍වත සහිත; චතුරෙ දීපා, සිව්දිව්; යාවතා, යම්තාක්ද; මයහං නඞ්ගුළං, මාගේ වාලධි මණ්ඩලය; තාවතා, ඒතාක්ම; කථං ඛො, කෙසේ නම්; ත්වං, නී; විවජ්ජසි, (ආක්‍රමනය නොකර)හරනෙහිද.

1229 පුබ්බෙව මෙ තං අක්ඛංසු මාතාපිතා ච භාතරෙ
දීඝං දුඨස්ස නඞ්ගුළං සාමහි වෙහාසයාගතා.

දුඨස්ස, දුෂ්ටයාගේ; නඞ්ගුළං, වාලධිය; දීඝං, දික්ය යන; තං, ඒ කාරණය; මාතාපිතා ච, මාතාපිතෘහුද; භාතරෙ ච, භ්‍රාතෘහුද; පුබ්බෙව, පෙරම; අක්ඛංසු, කීහු; සා අහං, හේ මම; වෙහාසයා, අහසින්; ආගතා, ආම්.

1230 තව දිසවාන ආයතනිං අන්තලික්ඛමහි එලිකෙ
මිගසඞ්ඝා පලාසිත්ථ භක්ඛා මෙ නාසිතො තයා.

එලිකෙ, එළිය; අන්තලික්ඛමහි, අහසෙහි; ආයතනිං ච, එන්නාවූද; තා, නී; දිසවාන, දැක; මිගසඞ්ඝා, මුවගණයා; පලාසිත්ථ,

පැන හියේය; තයා, තී විසින්; මේ, මාගේ; හකෙඛා, ගොදුර; නාසිතොා, නසන ලද්දේය.

1231 ඉවෙවවං විලපන්තියා එලකියා රුහංඝසෝ
ගලඝං අඛ්වමදදි නත්ති දුඛෙ සුභාසිතං.

ඉති, මෙසේ; එවං විලපන්තියා, එසේ වවලප්නා; එලකියා, එලියගේ; ගලඝං, ගෙල; රුහංඝසෝ, ලොහිතපානය කරන්නාවූ දිවිතෙමේ; අඛ්වමදදි, බැහැ පෙලී; දුඛෙ, දුෂ්ටයා කෙරෙහි; සුභාසිතං, සුභාෂිත වචනයෙක්; නත්ති, නැත්තේය.

1232 නෙව දුඛෙ නයෝ අත්ති න ධම්මෝ න සුභාසිතං
නික්කමං දුඛෙ යුඤ්ජේථ සෝ ව සඛ්හි න රඤ්ජති.

දුඛෙ, දුෂ්ටයා කෙරෙහි; නයෝ, කරුණක්; නෙව අත්ති, නැත්තේය; ධම්මෝ, සවභාව ධර්මයෙක්ද; නෙව අත්ති, නැත්තේය; සුභාසිතං, යහපත් වචනයෙක්; න අත්ති, නොම ඇත්තේය; දුඛෙ, දුෂ්ටයා කෙරෙහි; නික්කමං, පරාක්‍රමය; යුඤ්ජේථ, යොදන්නේය; සෝව, ඒ දුෂ්ටපුද්ගල තෙමේ ද; සඛ්හි, සාන්තගුණය; න රඤ්ජති, ප්‍රිය නොකෙරේ.

421 දිපි ජාතකයයි.

පළමුවෙනි කච්චානි වග්ගයයි.

අට්ඨක නිපාතයයි.

1233 පරිසංකුපථෝ නාම ගිජ්ඣපත්තෝ සනන්තනෝ
තත්‍රාසි මාතාපිතරෝ ගිජ්ඣිකා පොසෙසි ජිණ්ණකෙ.

පරිසංකුපථෝ නාම, හාත්පස හුලින් කරනලද හෙයින් සංකුපථ නම්වූ; සනන්තනෝ, පැරණිවූ; ගිජ්ඣපත්තෝ, ගිජුකුළ මූදුනැ මගෙක්; ආසි, විය; තත්‍ර, එහි; ගිජ්ඣිකා, ගිජුලිහිණියෙක් තෙමේ, ජිණ්ණකෙ, මහලු; මාතාපිතරෝ, මව්පිය්න්; පොසෙසි, පොෂණය කෙළේය.

1234 තෙසං අජගරං මෙදං අවචහාසි බහුත්තසෝ
පිතා ච පුත්තං අවච ජානං උච්චං පපාතිනං
සුපත්තං පක්ඛසම්පණ්ණං තෙජසිං දූරගාමිනං.

තෙසං, ඔවුන්ට; අජගරංමෙදං, අජගරමෙදය (වුරුණුතෙල් සහිත පිඹුරුමස); බහුත්තසෝ, බොහෝ සෙයින්; අවචහාසි, කීයා ය; පිතා ච, පිය තෙමේ ද; ජානං, දන්නේ; උච්චං පපාතිනං, උස්ව පැනයන්නාවූ; තෙජසිං, මහත් බලඇති; දූරගාමිනං, ඉතා දුරයන්නාවූ; පක්ඛසම්පණ්ණං, පක්ෂබල සමන්විතවූ; සුපත්තං, සුපත්තනම් වූ; පුත්තං, පුත්‍රයාහට; අවච, මෙසේ කී.

1235 පරිපලවන්නං පඨවිං යදා තාත විජානහෙ
සාගරෙන පරික්ඛිත්තං චක්කංව පරිමණ්ඩලං
තතෝ තාත නිවත්තස්සු මාසසු එත්තෙතා පරංගමී.

තාත, දරුව; යදා, යම්කලෙක; සාගරෙන පරික්ඛිත්තං, සයුරෙන් පිරිකෙව් කරනලද; චක්කංව පරිමණ්ඩලං, රියසක්සේ වටවූ; පරිපලවන්නං, (දියෙහි නෙලුම් පතක්මෙන්) සැලෙන්නාවූ; පඨවිං, පෘථිවිය; විජානහෙ, දනීද (දකීද); තාත, දරුව; තතෝ, එසින්; නිවත්තස්සු, නවතුව; එත්තෙතා පරං, ඉන්ඔබ; මාසසු ගම්, නහමක් යා.

1236 උදපත්තෙතාසි වෙගෙන බලී පක්ඛී දිජුත්තමෝ
ඔලොකයනෙත්තා චක්ඛූඬෙහා පබ්බතානි වතානි ච.

බලී, බලඇත්තාවූ; පක්ඛී, පියාපත් ඇති; චක්ඛූඬෙහා, චඬකාක්‍රීව ඇති; දිජුත්තමෝ, පක්ෂිරාජ තෙම; පබ්බතානි, පර්වතයන්ද; වතානි ච, ආරණ්‍යයන්ද; ඔලොකයනෙත්තා, බලන්නේ; වෙගෙන, ජවයෙන්; උදපත්තෙතා අසි, අහසට පැනනැංගේය.

1237 අද්දසං පඨවිං ගිජ්ඣා යථාඨාසි පිතුස්සුතං
සාගරෙන පරික්ඛිත්තං චක්කංව පරිමණ්ඩලං.

යථා, යම්සේ; ඨාසි, යවසි කියා; පිතුස්සුතං, පියාහෙරෙන් අසන ලදද; (එසේවූ) සාගරෙන පරික්ඛිත්තං, සයුරෙන් වටකරන ලද; චක්කංව, රියසක්මෙන්; පරිමණ්ඩලං, වටවූ; පඨවිං, පෘථිවිය; ගිජ්ඣා, ගිජුලිහිණි තෙම; අද්දසං, දුටුයේය.

1238 තව සෝ සමතික්කම්ම පරමෙවච්චවත්තථ
තව චාහාසිඛා තික්ඛා අච්චහාසි බලී දිජං.

සෝ, හෙතෙම; තංව, ඒ පිතෘහුගේ අවවාදයද; සමතික්කමම, ඉක්මවා; පරං එව, ඇතම; අනිවත්තනථ, ඉක්මවා ගියේය; බලී, බලැති; තව දිජං, ඒ පක්ෂීහුද; නිකඛා, නීසඝණවූ; වාහසිඛා, වලා මඬුලු; අවවහාසී, පැහැර ගත්තේය.

1239 නාසක්ඛානිගතෝ පොසෝ පුනරෙව නිවත්තිතුං.
මිජෝ ව්‍යසනමාපාදී වෙරම්බානං වසං ගතෝ.

වෙරම්බානං වසං ගතෝ, වෙරඹවාතයාගේ වසතයට ගියාවූ; අතිගතෝ, පක්ෂීන්ගේ ගමන මාර්ගය හෝ පියා විසින් කියනලද මාර්ගය ඉක්මවා ගියාවූ; මිජෝ පොසෝ; පක්ඛිරාජ තෙම; පුන, නැවත; නිවත්තිතුං, නවතින්ට; නාසක්ඛි, නොහැකි වී; ව්‍යසනං, විනාසයට; ආපාදි එව, පැමුණුනේමය.

1240 තස්ස පුත්තා ච දුරා ච යෙවඤ්ඤෙ අනුජීවිනෝ
සබ්බෙ ව්‍යසනමාපාදුං අනොවාදකරෝ මිජෝ.

අනොවාදකරෝ, අවවාදයට අනුවිළිනොපදනාවූ; මිජෝ, යම් ගිජුලිහිණියෙක් වීද; තස්ස, ඔහුගේ; පුත්තා ච, පුත්‍රයෝද; දුරා ච, භාර්‍යාවෝද; අඤ්ඤෙ, සෙසු; අනුජීවිනෝ, පිරිවරජනයෝද යන; යෙව, යම් සොනෙක් ඇද්ද; සබ්බෙ, සියල්ලෝ; ව්‍යසනං, විනාශයට; ආපාදුං, පැමිණියාහුය.

1241 එවමපි ඉධ වුඩ්ඪානං යොවාක්‍යං නාවබුජ්ඣති
අනිසිම්වරෝදිතෙනා ගිජෙඣාවාතිත සාසනෝ
සබ්බෙ ව්‍යසනං පපෙපානති අත්වා වුඩ්ඪසාසනානති.

එවමපි, මෙසේම; ඉධ, මේ ලොකයෙහි; යෝ, යමෙක් තෙමේ; වුඩ්ඪානං, වෘඩයන්ගේ; වාක්‍යං, වචනය; නාවබුජ්ඣති, අවබොධ නොකෙරේද; අනිසිම්වරෝ, සීමොල්ලඛ්‍යනයනොට හැසිරෙන්නාවූ; උදිතෙනා, කියනලද අවවාද ඇති; අතිත සාසනෝ, ඉක්ම වනලද අනුශාසනා ඇති; ගිජෙඣාව, ගිජුලිහිණිහුසේ; වුඩ්ඪසාසනං, වෘඩයන්ගේ අවවාදය; අත්වා, නොකොට; සබ්බෙ, සියල්ලෝ; ව්‍යසනං, විනාශයට; පපෙපානති, පැමිනෙත්.

422 ගිජ්ඣ ජාතකයයි.

1242 පුථුසද්දෝ සමජනෝ න බාලෝ සොව් මඤ්ඤථ
සඞ්ඝසම්මිං හිජ්ජමානසම්මිං නාඤ්ඤං හියේ‍යා අමඤ්ඤුරෑං.

පුථුසද්දෝ, හාත්පස පතලාවූ මහාශබ්ද ඇති; සමජනෝ, එතෙසින්ම සමානවූ ජන තෙම; සොව්, කිසිවෙක්; බාලෝ, බාල යයි; න මඤ්ඤථ, නොදත්තේය; සඞ්ඝසම්මිං, සඞ්ඝයා; හිජ්ජමානසම්මිං, බිඳෙන කල්හි; අඤ්ඤං, අනිකක්; හියේ‍යා, බොහෝ සෙයින්; න අමඤ්ඤුරෑං, නොදත්හ.

1243 පරිමුට්ඨා පණ්ඩිතා භාසා වාචාගොචර භාණිනෝ
යා විචජනති මුඛායාමං යෙන නීතා නතං විදූ.

පරිමුට්ඨා, අඥානයෝ; පණ්ඩිතා භාසා, පණ්ඩිතමානී බැවින් වාගාඩම්බර ඇතියහ; වාචාගොචර භාණිනෝ, අසං වුතවාර ඇතිවන බැවින් මුඛාරූඪ වූවක්ම කියන සුළුවෙති; යාවිචජනති මුඛායාමං, යම්තාක් කෑමැතිවෙද්ද ඒතාක් මුව අයාසිට; යෙන, යම් හණ්ඩනයකින්; නීහා, මේ නිර්ලජ්ජී භාවයට පමුණුවනලදද; නං, එය; නවිදූ, නොදත්තේය.

1244 අක්කොසච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං උපනයහන්ති වෙරං තෙසං න සම්මති.

මං, මට; අක්කොසච්ඡි, ආක්‍රොශ කෙළේය; මං, මට; අවධි, පහළේය; මං, මා; අජිනි, පැරදවිය; මෙ, මා සතුදැ; අහාසි, පැහැර ගත්තේයයි; (යෙක්තුමූ) තං, ඒ වෛරය; උපනයහන්ති, නැවත නැවත බඳිද්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, වෛරය; න සම්මති, නොසන් සිඳේ.

1245 අක්කොසච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනයහන්ති වෙරං තෙසූපසම්මති.

මං, මට; -පෙ- න උප නයහන්ති, නොබඳිද්ද; -පෙ- උපසම්මති, සංසිඳේ.

1246 නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං.
අවෙරෙන ච සම්මන්ති එස ධම්මෝ සනන්තනෝ.

ඉධ, මේ ලොකයෙහි; වෙරානි, වෛරයෝ; වෙරෙන, වෛරයෙන්; කුදාචනං, කිසිකලෙකත්; න සම්මන්ති, නොසන් සිඳෙත්; අවෙරෙන ච, අවෛරයෙන්ම; සම්මන්ති, සංසිඳෙත්; එසෝ, මේ

අවෙරයෙන් වෙර සංසිදුවීම; සනන්තනෝ ධම්මෝ, බුද්ධාදී උතුමන්ගේ පෞරාණික ධර්මයෙකි.

1247 පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති තතෝ සම්මන්ති මෙධගා.

එත්ථ, මේ සභාවය; පරෙ, අන්‍යයෝ; නොහොත් මාගේ නොවන්නෝ; මයං, අපි; යමාමසෙ, මරුමුවට යම්හයි නොහොත් කලහ කිරීමට යත්න කරම්හයි; න විජානන්ති, නොදනිත්; තත්ථ, එහි; යෙ ච, යමෙක් තුමූ වනාහි; විජානන්ති, අපිකලහ කිරීමට යත්න කෙරෙමුයයි දනිද්ද; තතෝ, ඒ හෙතුවෙන්; මේධගා, කලහයෝ, සම්මන්ති, සංසිඳෙත්.

1248 අසිවජ්ඣ, පාණහරා ගවාසසධනහාරිනෝ
රඤ්ඤං විලුම්පමානානං තෙසම්පි හොති සඞ්ගති
කසමා තුම්හාකං නො සියා.

අඤ්ඣ, ඇවසිදිනාවූ, පාණහරා, දිවි හොර කරන්නාවූ; ගවාසසධනහාරිනෝ, ගවාශ්වාදීන් හා රන් රුවන් ආදී ධන යන්ද පැහැරගන්නාවූ; රඤ්ඤං, සබකියරට; විලුම්පමානානං, පැහැර ගන්නාවූ; තෙසම්පි, ඒ රජදරුවන්ගේද; සඞ්ගති, එක්වීම; හොති, වේ; කසමා, කුමක් හෙයින්; තුම්හාකං, නොපගේ සමගිය; නො සියා; නොවන්නේද?

1249 සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනෝ සතිමා.

නිපකං, නුවණැති; සද්ධිං චරං, සමඟ හැසිරෙන; සාධු විහාරිං, මනා හැසුරුම් ඇති; ධීරං, ධෘතිමත්වූ; සහායං, කල්‍යාණ මිත්‍රයෙකු; සචෙ ලභෙථ, ඉදින් ලබන්නේ නම්; සබ්බානි පරිස්සයානි, සියළු පිරිපත්; අභිභුය්‍ය, මැඩ; තෙන, ඔහු හා; අත්තමනෝ, සතුටු සිත් ඇත්තේ; චරෙය්‍ය, හැසිරෙන්නේය.

1250 නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං
රාජාව රඤ්ඤං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරණ්ණෙඋඤ්ඣව නාගා.

නිපුකං,-පෙ-නො වෙ ලහෙථ, ඉදින් නොලබන්නේ නම්; විජිතං, දිනන ලද; රඤ්ඤං, රට; පහාය, හැරපියා(වනගතවූ); රාජා ඉව, මහාජනක රජහු මෙන්ද; අරඤ්ඤේ, (රක්ෂිත) වනයෙහි(හුදකලාව වසන); මාතඞ්ගා, මාතඞ්ග නම් වූ; නාගො ඉව, (පාරිලෙය්‍යක) ඇතු මෙන්ද; එකො, එකලාව; චරෙ, හැසිරෙන්නේය.

1251 එතස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා
එකො චරෙ න්‍ව පාපානි කයිරා
අපෙපාසසුකෙකා මාතඞ්ගරඤ්ඤේ‍ව නාගො.

එතස්ස, එකලාභුගේ; චරිතං, හැසිරීම; සෙය්‍යො, උතුම; බාලෙ, අඥානයා කෙරෙහි; සහායතා, සහාය බවෙක්; නත්ථි, නැත්තේය; අරඤ්ඤේ,-පෙ-අපෙපාසසුකෙකා, උතසාහ රහිතව; එකො, එකලාව; චරෙ, හැසිරෙන්නේය.

423 කොසම්බ ජාතකය.

1252 දුමෝ යදා හොති ඵලූපපන්නො
භුඤ්ජන්ති නං විහගා සම්පතන්තා
ඛීණන්ති ඤත්වාන දුමං * ඵලච්චයෙ
දිසො දිසං යන්ති තතො විහඞ්ගමා.

යදා, යම් කලෙක්හි; දුමෝ, වෘක්ෂ තෙම; ඵලූපපන්නො, හටගත් ඵල ඇත්තේද; (එකල්හි) නං, එය; විහගා, පක්ෂීහු; සම්පතන්තා, සාඛාවෙන් සාඛාවට යන්නාහු; භුඤ්ජන්ති, අනුභව කෙරෙත්; ඵලච්චයෙ, ඵලාවසානයෙහි; දුමං, දුමය; ඛීණං ඉති, ක්ෂීණයයි; ඤත්වාන, දැන; විහඞ්ගමා, පක්ෂීහු; තතො, එයින්; දිසො දිසං, දිසාහු දිසාවට; යන්ති, යෙත්.

1253 චරං චාරිකං ලොහිතතුණ්ඩ මාචරි
කිං ත්‍වං සුකඛ දුමමහි ඛායසි
තදිඞ්ඝ බ්‍රූහි වසනත්‍ථසන්හිත
කසමා සුව සුකඛ දුමං න රිඤ්ඤසි.

ලොහිතතුණ්ඩ, ලේවන් තුඩු ඇති පක්ෂි රාජෝත්තමය; චරං චාරිකං, සැරි සරමින්; ආචරි, හැසුරුනෙහි; සුව; කිර පක්ෂිය; ත්‍වං,

* ඵලව්වයෙන-මරම්ම.

තෝ; සුකඛදුමම්හි, වියලිගිය රුකෙහි; කිං කායසි, කිම් චින්තා කුලී භූතයෙහි; ඉඞ්ඝ, එහෙයින්; තං, එය; බ්‍රූහි, කියව; වසන්තා සන්නිහ, ගිරා සමූහයාගෙන් ගැවසීගත් වසන්ත වනයට බදු වෂී ඇති; සුව, කිර පක්ෂිය; කසමා, කුමක් හෙයින්; සුකඛදුමං, වියලි රුක; න රිඤ්ඡසි, නොහරණෙහිද.

1254 යේ වෙ සඛිනං සඛාරො භවන්ති
පාණච්චයෙ සුඛදුකඛසු හංස
ඛීණා අඛීණමපි න තං ජහන්ති
සන්තො සතං ධම්මමනුස්සරන්තා.

හංස, එම්බා හංසරාජය; වෙ, ඉදින්; සඛිනං, යහළුවන්ට; යෙ සඛාරො භවන්ති, යම්කිසි යහළු කෙනෙක් වේද්ද ඔහුතුමූ; පාණච්චයෙ, ප්‍රාණත්‍යාගයෙහිද; සුඛදුකඛ, සුව දුක් දෙක්හිද; ඛීණං, පිරිහිනැසි කියාද; අඛීණං ඉති, නොපිරිහිනැසි කියාද; (තෙ)සන්තා, (ඒ) සත්පුරුෂයෝ; සතං ධම්මං, සත්පුරුෂයන්ගේ ප්‍රවෙනි ධර්මය; අනුස්සරන්තා, සිහි කරන්නාහු; න ජහන්ති, නොපියත්.

1255 සොහං සතං අඤ්ඤතරොසම්හි හංස
ඤාති ච මෙ හොති සඛා ච රුකඛා
තං නුස්සහෙ ජීවිතස්සා පහාතුං
ඛීණන්ති ඤත්වාන න සො සධම්මො.

හංස, (එම්බා) හංසරාජය; සො අහං, ඒ මම; සතං, සත්පුරුෂයන් පිළිබඳ; අඤ්ඤතරොසම්හි, එක්තරා එකෙක්මි; මෙ, මට; රුකඛා, මේ රුක; ඤාති ච හොති, ප්‍රිය බැවින් නෑද වේ; සඛා ච, සහචරණාදියෙන් යහළුද වේ; ඛීණං ඉති, පිරිහිනැයි කියා; ඤත්වා, දැන; ජීවිතස්සා, දිවි ප්‍රයොජනයෙට ඇත්තේ; හං, එය; පහාතුං, හරණට; න උස්සහෙ, උත්සාහ නොකරමි; සො, ඒ පිරිහිනැයි කියා අත්හැරීම; න සධම්මො, සත්පුරුෂ ධර්මය නොවේ.

1256 සාධු සඛ්‍යං කතං හොති මෙත්තිසඛ්‍යනිස්සිතං
සචෙ තං ධම්මං රොචෙසි පාසංසොසි භජන්තං.

සඛ්‍යං, යහළු බව ද; මෙත්ති, මෛත්‍රියද; සඛ්‍යනිස්සිතං, පිරිස්මැද සමාගමයද; සාධු, මනාහොට; කතං හොති, කරනලද්දේ වේ; සචෙ, ඉදින්; තං ධම්මං, මෙකියන ධර්මතුන; රොචෙසි, රුචිකෙරෙහි නම්; භජන්තං, පාඥයින්ගේ; පාසංසො අසි, ප්‍රශංසාහි වෙහි.

1257. සො තෙ සුව වරං දම්මී පත්තයාන විහඞ්ගම්
වරං වරස්සු වක්කඞ්ග යං කිඤ්චි මනසිච්ඡසි.

පත්තයාන, පියාපත් යානාකොට ඇති බැවින් පත්තයාන නම් වූ; විහඞ්ගම, ආකාශචාරී බැවින් විහඞ්ගම නම් වූ; වක්කඞ්ග, වඞ්කග්‍රීව ඇතිවන බැවින් වක්කඞ්ග නම් වූ; සුව, එම්බා කීර පක්ෂි රාජය; සො (අහං), ඒ (මම); තෙ, තට; වරං, වර; (කැමති දෑ) දම්මී, දෙමි; මනසි, සිත්හි; යං කිඤ්චි, යම් කිසිවක්; ඉච්ඡසි, කැමැත්තෙහි නම්; වරස්සු, ඒ වරය ඉල්වව.

1258 වරං වෙ මෙ හංස තුවං දදෙය්‍ය
අයං ච රුක්ඛා පුනරායුං ලභෙථ
සො සාඛවා එලිමා සංවිරූළ්හො
මධුක්ඛිකො තිඨතු සොභමානො.

හංස, එම්බා හංසරාජය; තුවං, නුඹවහන්සේ; වෙ, ඉදින්; මේ, මට; වරං දදෙය්‍ය, වර දෙන්නේ නම්; අයං රුක්ඛා, මේ දිඹුල් රුක; පුන, නැවත; ආයුං ලභෙථ, ආයුෂ ලබාවා; සො, ඒ; සාඛවා, සම්පන්න සාඛා ඇත්තේ; එලිමා, එල ඇත්තේ; සංවිරූළ්හා, හාත් පස පත්‍රපලාස සංඡ්ඡන්නවූයේ; මධුක්ඛිකො, මධුර එල ඇත්තේ; සොභමානො, හොබනේ; තිඨතු, සිටීවා.

1259 තං පස්ස සම්ම එලිමං උළාරං
සඤාව තෙ හොති උදුම්බරෙන
සො සාඛවා එලිමා සංවිරූළ්හා
මධුක්ඛිකො තිඨතු සොභමානො.

සම්ම, යහළුව; උළාරං, මහත් වූ; එලිමං, එල ඇති; තං, ඒ වෘක්ෂය; පස්ස, බලව; උදුම්බරෙන සඤාව, දිඹුල් රුක හා සමහම; තෙ, තාගේ වාසය; හොතු, වේවා; සො, ඒ දිඹුල්රුක; සාඛවා,-පෙ-තිඨතු, සිටීවා.

1260 එවං සක්ක සුඛී හොහි සහ සබ්බෙහි ඤාතිභි
යථාහමජ්ජ සුඛිතො දිස්වාන සඵලං දුමං.

සක්ක, එම්බා ශක්‍ර දෙවෙන්ද්‍රය; අහං, මම; සඵලං දුමං, එල සහිත ද්‍රුමය; දිස්වාන, දැක; අජ්ජ, අද; යථා සුඛිතො, යම්සේ සුවපත්වූ යෙම්ද; එවං, එසේ; සබ්බෙහි ඤාතිභි සහ, සියළු ඤාතීන් හා සමහ; සුඛී හොහි, සුවපත් වෙහි.

1261 සුවසස ච වරංදත්වා කත්වාන සඵලං දුමං
පක්කාමි සහ භරියාය දෙවානං නන්දනං වනං.

දුමං, උදුම්බර දුමය; සඵලං කත්වා, සම්පන්න ඵල කොට; සුවසස ච, කිර පක්ෂිහටද; වරං දත්වා, වරප්‍රදානය කොට; සහභරියාය, සුජානම් බිරින්ද හා සමඟ; දෙවානං, දෙවියන්ගේ; නන්දනං වනං, නන්දන නම්වූ උයනට; පක්කාමි, ගියේය.

424 මහාසුව ජාතකයයි.

1262 සනනි රුක්ඛා හරිතපත්තා දුමා නෙකඵලා බහූ
කසමානු සුකෙඛ කොලාපෙ සුවසස නිරතො මනො.

හරිතපත්තා, නීලවර්ණ පත්‍ර ඇති; රුක්ඛා, වෘක්ෂයෝ; සනති, ඇත්තාහුය; බහුඵලා, බොහෝ ඵල ඇති; නෙකදුමා, නොයෙක් වෘක්ෂයෝ; සනති, ඇත්තාහුය; කොලාපෙ, හඬන්නාවූ; සුකෙඛ, වියලි රුකෙහි; කසමානු, කුමකින් වනාහි; සුවසස, ගිරවාගේ; මනො, සිත; නිරතො, ඇළුනේද.

1263 ඵලසස උපභුජිමහ නෙකවසසගණෙ බහූ
අඵලම්පි විදිත්වාන සාව මෙත්ති යථා පුරෙ.

බහූ, බොහෝ; නෙකවසසගණෙ, නොයෙක් සිය ගණන් හවු රුදු; ඵලසස, ඵලය; උපභුජිමහ, අනුභව කෙළෙමු; අඵලම්පි, ඵල නැති රුකද; විදිත්වාන, දැන; පුරෙ, පෙර; යථා මෙත්ති, යම්සේ මිත්‍රබවක් ඇද; සා එව, ඵලගින කලද එමැයි.

1264 සුකඛං ච රුක්ඛං කොලාපං ඔපත්තං අඵලං දුමං
ඔහාය සකුණා යන්ති කිං දෙසං පසසසෙ දිජ.

සුකඛං ච, වියලි ගියාවූද; කොලාපං, පවනින් හඬන්නා වූ; ඔපත්තං, පතිත පත්‍ර ඇති; දුමං රුක්ඛං, දුම සඞ්ඛ්‍යාත වෘක්ෂය; ඔහාය, හැරපියා; සකුණා, පක්ෂීහු; යන්ති, යෙත්; දිජ, ඇති පක්ෂිය; කිං දෙසං, (මෙහි) කවර වරදක්; පසසසෙ, දක්නෙහිද.

1265 යෙ ඵලත්ථා සමහජන්ති අඵලොති ජහන්ති නං
අත්තත්ථපඤ්ඤා දුමෙමූධා සෙ හොන්ති පක්ඛපාතිකා.

යෙ, යමෙක් තුමූ; ඵලභොය, ඵලය පිණිස; සමහජනනි, සෙව නය කෙරෙද්ද; අඵලො ඉනි, ඵලනැත කියා; නං, එය; ජහනනි, හැරපියත්; අත්තභඵපඤ්ඤ, ආත්මාර්ථය පිළිබඳව පැවති ප්‍රඥාඅති දුර්මේධා, දුෂ්ටබුද්ධි ඇති; හෙ, ඔහු තුමූ; පකඛපාතිනො හොනති, මිත්‍රපක්ෂය නසන්නාහු වෙත් නොහොත් ආත්මාර්ථ පක්ෂයෙහිම වැටෙන්නාහුද වෙත්.

1266 සාධු සක්ඛි කතං හොති මෙතනි සඛගති සඵවො
සවෙ තං ධම්මං රොචෙසි පාසංසොසි විජානතං.

මෙහි අර්ථ 1266 වෙනි ගාථාවෙන් බලා දතයුතුයි.

1267 සො තෙ සුව වරං දම්මි පත්තඅාන විහඩගම
වරං වරස්සු වක්කඩග යංකිඤ්ච මනසිවඡසි.

මෙහිද අර්ථ 1257 වෙනි ගාථාවෙන් බලා දතයුතුයි.

1268 අපිනාම නං පසෙසෙය්‍ය සපත්තං සඵලං දුමං
දලිද්දොව නිධිං ලඛො නන්දෙය්‍ය නං පුනපපුනං.

සපත්තං, පත්‍රසහිත; සඵලං ඵලසහිත; නං දුමං, ඒ වෘක්ෂය; පසෙසෙය්‍ය, දක්නේ නම්; අපිනාම, ඉතා යෙහෙක; නිධිං ලබ දලිද්දො ඉව, ලබනලද නිදන් ඇති දිලින්දෙක් මෙන්; පුනපපුනං, නැවත නැවත; නං, එය; නන්දෙය්‍ය, අභිනන්දනය කරන්නේ නම්; (ඉතා යෙහෙක).

1269 තතො අමතමාදය අභිසිඤ්ච මහිරුහං
තස්ස සාඛා විරුළ්හිංසු සීතච්ඡායා මනොරමා.

තතො, ඒ ගඛගායෙන්; අමතං, අමෘත ජලය; ආදය, ගෙන; මහිරුහං, දිඹුල් රුකට; අභිසිඤ්ච, සෙවනය කෙළේය; තස්ස, ඒ වෘක්ෂයාගේ; සීතච්ඡායා, සිහිල් සෙවනැති; මනොරමා, පත්‍රපලාස සාඡන්න හෙයින් මනරම්වූ;සාඛා,අතුපතර;විරුළ්හිංසු,වැඩුනාහුය

1270 එවං සක්‍ය සුඛීහොහි සහ සබෙඛහි ඤාතිහි
යථාහමජ්ජ සුඛිතො දිස්වාන සඵලං දුමං.

මෙහි අර්ථ 1260 වෙනි ගථාවෙන් බලා දතයුතුයි.

1271 සුවස්ස ච වරං දත්වා කත්වාන සඵලං දුමං
පක්කාමි සහ භරියාය දෙවානං නන්දනං වනනති.

මෙහි අර්ථ 1261 වෙනි ගාථාවෙන් බලා දතයුතුයි.

425 චුල්ලසුව ජානඛඡසි.

1272 සුතං මෙතං මහාබ්‍රහ්මෙ කාමේ භුඤ්ජති හාරිතො
කාචෙවතං වචනං තුච්ඡං කාච්චි සුද්ධි ඉරියසි.

මහාබ්‍රහ්මෙ, මහ බඹුණ; හාරිතො, හාරිත නම් තපස්වීහු; කාමෙ, කාමයන්; භුඤ්ජති, අනුභවසාරන්නේයසි; මෙ, මා විසින්; එතං, මේ කාරණය; සුතං, අසනලදි; කාච්චි, කිමෙක්ද; එතං වචනං, මේ වචනය; තුච්ඡං, සිස්ද; කාච්චි, කිමෙක්ද; සුද්ධි, ශුද්ධවූයෙහි; ඉරියසි, වෙසෙහිද?

1273 එවමෙතං මහාරාජ යථා තෙ වචනං සුතං
කුම්මගහං පටිපන්නොඅසම්ි මොහනෙය්‍යෙසු මූචිඡිතො.

මහාරාජ, මහරජ; තෙ, තා විසින්; සුතං, අසනලදි; වචනං, වචනය; යථා, යම්සේද; එතං, මේ කාරණය; එවං, මෙසේමැයි; කුම්මගහං, කුත්සිහවූ මාගියට; පටිපන්නොඅසම්ි, පැමිණියෙම් වීමි; මොහනෙය්‍යෙසු, මූලාකරන්නට සුදුසුවූ පවකාම ගුණයන්හි; මූචිඡිතො, මූලා වීමි.

1274 ආදූ පඤ්ඤා කිමත්ථිකා නිප්‍රණා සාධු චින්තනි
යාය උපපතිතං රාගං කිං මතො න චිනොදයෙ.

නිප්‍රණා, සූක්ෂමවූ; සාධු චින්තනි, සම්‍යක්ප්‍රඥයන් මනාකොට සිතන්නා වූ; පඤ්ඤා, ප්‍රඥා නොම; කිමත්ථිකා, කුමකටද; යාය, යම් ප්‍රඥවක් කරණ කොටගෙන; උපපතිතං, උපන්නාවූ; රාගං, රාගය; කිං මතො, හොබදු සිතකින් යුක්තවූයේ; න චිනොදයෙ, දුරු නොකරන්නේද-උපන් රාගය ප්‍රඥ බලයෙන් දුරුකාදැක්ක යුත්තේයයි සේසි. මෙහි "ආදූ" යනු නිපාත මාත්‍රයි.

1275 චත්තාරොමෙ මහාරාජ ලොකෙ අතිබලා භුසා
රාගො දෙසො මදෙ මොහො යත්ථ පඤ්ඤා න ගාධති.

මහාරාජ, මහරජ; ලොකෙ, ලෙව්හි; යත්ථ, යම් කෙනකුන් කෙරෙහි; පඤ්ඤා, ප්‍රඥා තොමෝ; න ගාධති, පිහිට නොලැබේද; රාගො, රාගයද; දෙසො, වෙෂයද; මදෙ, මදයද; මොහො, මොහයද යන; ඉමෙ චත්තාරො, මොහු සතරදෙන; භුසං, අත්‍යන්තයෙන්; අතිබලා, අතිශයින් ප්‍රබලයෝසි; හෙවත් යමක්හු සන්තානයෙහි මේ රාගාදීහු පරියුත්ථාන භාවයට පැමිණියේද එහිලා; පඤ්ඤා, ප්‍රඥා තොමෝ; න ගාධති, ප්‍රතිෂ්ඨාවක් නොලබයි-කෙලෙසයන් අධිකාවස්ථායෙහි ප්‍රඥා යෙනුදු වලකාගත නොහැක්කේයයි සේසි.

1276 අරහං සීලසම්පන්නෝ සුඛෝ වරති හාරිතෝ
මේධාවී පණ්ඩිතොවෙව ඉති නෝ සම්මතෝ භවං.

අරහං, පූජාහිවූ; සීලසම්පන්නෝ, ආචාර ශීලයෙන් සම්පන්න වූ; සුඛෝ, ශුඛවූ; හාරිතෝ, හාරිත නම් තපස්වී තෙම; මේධාවී, ධාරණ ප්‍රඥ ඇත්තේය; පණ්ඩිතෝ වෙව, පරිජානන ප්‍රඥයෙනුදු සුකතයයි; ඉති, මෙසේ; භවං, පින්වත් තෙම; නෝ, අප විසින්; සම්මතෝ, සම්භාවනා කරන ලදී.

1277 මේධාවිනමපි හිංසන්ති ඉසිං ධම්මගුණෙ රතං
විතක්කා පාපකා රාජ සුභා රාගූපසංහිතා.

රාජ, මහරජ; සුභා, ශුභනිමිත්තග්‍රහණයෙන් පැවැත්තාවූ; රාග, රාගයෙන්; උපසංහිතා, යුක්තවූ; පාපකා, ලාමක; විතක්කා, කාමවිතර්කයෝ; ධම්මගුණෙ රතං, ධර්මගුණයෙහි ඇලුනු; මේධාවිනමපි, නුවණැත්තාවූද; ඉසිං, තපස්වියා; හිංසන්ති, හිංසාකෙරෙත්

1278 උපපන්නොඅයං සරීරජෝ
රාගෝ වණ්ණවිදූසනෝ
තව තං පජහ භද්දමත්ථු තෙ
බහුත්තාසි මේධාවි සම්මතෝ.

තෙ, තට; භද්දං, භද්‍රයෙක්; අත්ථු, වේවයි; බහුත්තං, බොහෝ දෙන අතුරෙහි; මේධාවී, නුවණැත්තේයයි; සම්මතෝ, ප්‍රසිඛවූ යෙහි; ආසි, වී; තව, තාගේ; සරීරජෝ, ශරීරයෙහි ජාතවූ; වණ්ණ විදූසනෝ, ගුණවර්ණ රූපවර්ණ දෙස කිලුටු කරන්නාවූ; අයං රාගෝ, මේ රාගය; උපපන්නෝ, උපන්නේය; පජහ, (ඒ රාග රජස තාගේ ප්‍රඥනමැති හස්තයෙන් ගසා) දුරුකොට පිය.

1279 තෙ අන්ධකරණෙ කාමෙ බහුදුක්ඛෙ මහාවිසෙ
තෙසං මූලං ගවෙසිස්සං ඡෙජ්ජං රාගං සබන්ධනං.

අන්ධකරණෙ, ප්‍රඥාචක්ෂුස නසන හෙයින් අන්ධභාවය කරන්නාවූ; බහුදුක්ඛෙ, බොහෝ දුකින් ගැවසී ගත්තාවූ; මහාවිසෙ, මහ විෂයක් වැනිවූ; තෙ කාමෙ, උක්තප්‍රකාර දෝෂඇති කාමයන් හරණ පිණිස; තෙසං, ඒ කාමයන්ගේ; මූලං, අයොනිසොමනසිකාර සඤ්ඤාත මූල; ගවෙසිස්සං, සොයමි; රාගං, රාගය; සබන්ධනං, සුභ නිමිත්තග්‍රහණ සඤ්ඤාත බන්ධනය හා එක්කොට; ඡෙජ්ජං, ප්‍රඥා නැමති ඛඩ්ගයෙන් කපමි.

1280 ඉදං වත්වාන හාරිතෝ ඉසි සච්චපරක්කමෝ
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගෝ අහූති.

හාරිතෝ, හාරිත නම් වූ; සච්චපරක්කමෝ, සත්‍ය වූ පරාක්‍රම ඇති; ඉසි, තාපශ්වී තෙම; ඉදං වත්වාන, මේ වචනය කියා; කාම රාගං, කාමරාගය; විරාජෙත්වා, දුරුකොට; බ්‍රහ්මලොකූපගෝ, බ්‍රහ්ම ලොකයට ගියේ; අහූ, වී.

426 හාරිත ජාතකයයි.

1281 බහුස්සුතං චිත්තකථිං ගඛා වහති පාටලං
වුය්හමානඤ භද්දන්තෙ එකං මෙ ගාහි ගාථකං.

බහුස්සුතං, බොහෝ ශාස්ත්‍ර ඇති; චිත්තකථිං, චිත්‍රකථි වූ; පාට ලං, පාටලි නම් ලද ගාඛිභීයා; ගඛා, ගඛා තොමෝ; වහති, ගෙන යයි; වුය්හමානඤ, ගඛාදියෙන් ගෙනයනු ලබන තැනැත්තව; තෙ, තට, භද්දං, භද්‍රයෙක් වේවයි; මෙ, මට, එකං ගාථකං, එක් කුඩා ගාථාවක්; ගාහි, කියා.

1282 යෙන සිඤ්චන්ති දුක්කිතං යෙන සිඤ්චන්ති ආතුරං
තස්ස මඤ්ඤෙ මරිස්සාමි ජාතං සරණතෝ භයං.

දුක්කිතං, දුක්පත්වූවහු; යෙන, යම් ජලයකින්; සිඤ්චන්ති, තෙමෙද්ද; ආතුරං, ආතුරයා; යෙන, යම් ජලයෙකින්; සිඤ්චන්ති, තෙමෙද්ද; තස්ස මඤ්ඤෙ, එසේ ප්‍රයොජනවත් ජලමඩ්‍යයෙහි; මරිස්සාමි, මියෙමි; සරණතෝ, එසේ වූ සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1283 යත්ථ බීජාති රුහන්ති සත්තා යත්ථ පතිට්ඨිතා
සා මෙ සිසං නිපිළෙසි ජාතං සරණතෝ භයං.

යත්ථ, යම් පොළොවෙහා; බීජාති, බීජයෝ; රුහන්ති, හටගනිද්ද; සත්තා, සත්වයෝ; යත්ථ, යම් තැනෙක්හි; පතිට්ඨිතා, පිහිටියෝද; සා, ඒ පොළොව තොමෝ; මෙ, මාගේ; සිසං, හිස; නිපිළෙසි, පෙළයි; සරණතෝ, සරණස්ථානවූ ඒ ස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1284 යෙන භත්තානි පච්චන්ති සීතං යෙන විහඤ්ඤති
සො මං ඛත්ති ගහිතානි ජාතං සරණතෝ භයං.

යෙන, යම් වහ්නියක් කරණකොට ගෙන; හත්ථානී පවත්තී, ඔත්පෑසෙද්ද; යෙන, යමක් කරණකොට ගෙන; සීතං, සීත; විහඤ්ඤති, නසීද; සො, ඒ මේ සරණව සිටි වහ්නිය; මං, මාගේ; ගත්තානි, ශරීරයන්; ඩහති, දවයි; සරණතො, සරණස්ථාන වූ ඒ ස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1285 යෙන*භුත්තෙන යාපෙන්ති පුථුබ්‍රාහ්මණඛත්තියා
සො මං භුත්තෙනා†ව්‍යාපාදෙති ජාතං සරණතො භයං.

භුත්තෙන, අනුභවකළාවූ; යෙන, යම් ඔතකින්; පුථු, බොහෝ වූ; බ්‍රාහ්මණඛත්තියා, බ්‍රාහ්මණ ක්ෂත්‍රියයෝ; යාපෙන්ති, යැපෙද්ද; සො, ඒ ආහාරය තෙම; භුත්තෙනා, අනුභව කරන ලද්දේ; මං, මා; ව්‍යාපාදෙති, විනාශයට පමුණුවයි (මරයි) සරණතො, සරණස්ථාන වූ ඒ ස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1286 ගිම්හානං පච්ඡිමෙ මාසෙ වාතමිච්ඡන්ති පණ්ඩිතා
සො මෙ භඤ්ජති ගත්තානි ජාතං සරණතො භයං.

ගිම්හානං, ග්‍රීෂ්මඍතූන් සම්බන්ධ වූ; පච්ඡිමෙ මාසෙ, කෙළවර මසැ හෙවත් පොසොන්මස පසු පොහොය හා ඇසලමස ආදි දේ පෝයයි මෙසේ මසෙකැ; පණ්ඩිතා, පණ්ඩිතවරහු; වාතං, පවන; ඉච්ඡන්ති, කැමතිවෙති; සො, හේ මාරුතය; මෙ, මාගේ; ගත්තානි, ශරීරය; භඤ්ජති, බිඳිනේය; සරණතො, එසේවූ සරණස්ථානයෙන් භයං, භය; ජාතං, උපන.

1287 යං නිස්සිතා ජගති රුහං විහඞ්ගමා සොයං අග්ගිං පමුච්චති
දිසා භජථ වක්කඞ්ගා ජාතං සරණතො භයං.

යං, යම්බඳු වූ; ජගතිරුහං, ජගත් සඞ්ඛ්‍යාත පොළොව හට ගත් හෙයින් ජගති රුහ නම් ලද වෘක්ෂයක්; විහඞ්ගමා, පක්ෂීහු; නිස්සිතා, හැසිරූ කොළෝද; සො අයං, හේ මේ රුහ; අග්ගිං, ගිනි; පමුච්චති, හරණේය හෙවත් තමා කෙරෙන් ගිනි ඔත්තට නහන්නේ; වක්කඞ්ගා, පක්ෂීනි; දිසා භජථ, දිගුන් සෙවනය කරව්; සරණතා, තොපට සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1288 යමානයිං සොමනස්සං මාලිනිං වන්දනුස්සදං
සා මා සරා නීවත්තති ජාතං සරණතො භයං. . .

---

* භත්තෙන-මරම්මු. † ව්‍යාපාදි-සිංහල.

මාලිනිං, මල්දම් පලඳින්නාවූ; වඤ්ඣුස්සදං, සදුන් උස්සදවූ නෙවත් සදුන් කලක බොහෝ කොට ගැල්වූ; යං, යමක්; සොම්‍ම නස්සං, සතුටු උපදවා; ආනයිං, ගෙනාම්ද; සා, (ඒ මා ගෙනා) ඕ තොම; මං, මා; ඝරා, ගෙන්; නිවත්තති, නෙරිනීය; සරණතෝ, එවැනි සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන;—"සොම්‍ම නස්සා"යි කියන පාඨද ඇත, එහි සන්නොඝපතුරුවා ය යන අර්ථයි.

1289 යෙන ජාතෙන නන්දිස්සං යස්ස ව භවඝිඡිතං
සෝ මං ඝරා නිවත්තති ජාතං සරණතෝ භයං.

ජාතෙන, උපන්නා වූ; යෙන, යමක්හු කරණකොට ගෙන; නන්දිස්සං, සතුටුවීම්ද; යස්සව, යමක්හුගේ; භවං, අභිවෘඩිය; ඉච්ඡිතං, කැමතිවීම්ද; සෝ, හේ; නිවත්තති, (මා ගෙන් දැන්) නෙරනේය; සරණතෝ, එසේ වූ සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන.

1290 සුණන්තු මෙ ජානපදා නෙගමා ච සමාගතා
යතොදකං තදාදිත්තං යතෝ ඛෙමං තතෝ භයං.

සමාගතා, රැස්වූ; ජානපදා, ජනපද වාසිහුද; නෙගමා ච, නියම්ගම් වාසිහුද; මෙ, මා සම්බන්ධව; සුණන්තු, (මාගේ වචනය) අසත්වා; යතොදකං, යම් ජලයෙක් ඇද්ද; තං, ඒ ජලය; ආදිත්තං, ගිනි ගෙන දිලියෙන්නේය; යතෝ, යම් රජක්හු කෙරෙන්; ඛෙමං, ක්‍ෂෙමද; තතෝ, ඒ රජහු කෙරෙන්; භයං, භය උපන්නේය.
ඒ කෙසේදයත්?

1291 රාජා විලුම්පතෙ රට්ඨං බ්‍රාහ්මණෝ ච පුරොහිතෝ
අත්තගුත්තා විහරථ ජාතං සරණතෝ භයන්ති.

රාජා, රජද; පුරොහිතෝ, පුරොහිත වූ; බ්‍රාහ්මණෝ ච, බ්‍රාහ්මණයාද; රට්ඨං, රට; විලුම්පතෙ, පහරයි; එසේ හෙයින්; සරණතෝ, සරණස්ථානයෙන්; භයං, භය; ජාතං, උපන; අත්තගුත්තා, තෙපි තොප විසින්ම රක්‍ෂාකරන ලද්දාහු; විහරථ, වසව්.—"යතොදකං" යනු ප්‍රථමාවිභක්තියෙහි නිපාතයි.

427 පදමානවක ජාතකයයි.

1292 අසස ඉන්‍දසමෝ රාජා අවචත්තං අජරාමරෙ
සවෙ තං යඤ්ඤං යාජෙය්‍ය ඉසිං ලොමසකස්සපං.

සවෙ, ඉදින්; භවං, තෝ; ලොමසකස්සපං, ලොමසකාශ්‍යප නම් වූ;ඉසිං, ඍෂිහු ගෙනහැර; යඤ්ඤං, පසුඝාත නම් යාගය; යාජෙය්‍ය කරන්නේ වීනම්; අච්චන්තං,අත්‍යන්තයෙන්ම; අජරාමරෝ,ජරාමරණ රහිතවූ යෙහි; ඉන්‍දසමෝ රාජා අස්ස, ශක්‍රයා හා සම වූ රජ වන්නේසි—"ඉසිංලොමසකස්සපං"යනු භාව සම්බන්ධකොට"ආනෙත්වා" යනු අඛ්‍යාහාර කටයුතු.

1293 සසමුද්දපරියායං මහිං සාගරකුණ්ඩලං
න ඉච්ඡේ සහ නින්‍දාය එවං සයහ විජානහි.

සයහ, සයහය; සසමුද්දපරියායං, සමුද්‍රපරික්ෂේපසහිත වූ හෙවත් සාගරය පර්‍යන්තකොට ඇති; සාගරකුණ්ඩලං, සාගර යෙන් සිසාරා වැලඳ සිටි හෙයින් කුණ්ඩලාකාර වූ; මහිං, පෘථිවිය; සහ නින්‍දාය, මොහු විසින් පසුඝාතනය කරනලද මේ නින්‍දාව හා සමඟ; න ඉච්ඡේ, නොකැමැත්තෙමි; එවං, එපරිද්දෙන්; විජානහි, දනු.

1294 ධිරත්ථු තං යසලාභං ධනලාභං ච බ්‍රාහ්මණ
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා.

මෙහි අර්ථ 541 වෙනි ගාථාවෙන් බලා දතයුතුයි.

1295 අපි චේ පත්තමාදාය අනාගාරෝ පරිබ්බජේ
සා එව ජීවිකා සෙය්‍යෝ යා චේ ධම්මෙන එසනා.

මෙහිද අර්ථ 544 වෙනි ගාථාවෙන් දතයුතුයි.

1296 අපි චේ පත්තමාදාය අනාගාරෝ පරිබ්බජේ
අඤ්ඤං අහිංසයං ලොකෙ අපි රජ්ජෙන තං වරං.

මෙහිද අර්ථ 545 වෙනි ගාථාවෙන් දතයුතුයි.

1297 බලං වණ්හු බලං සුරියෝ බලං සම්මණ්බ්‍රාහ්මණා
බලං වෙලා සමුද්දස්ස බලාතිබලම්හියෝ.

වණ්හු, වන්‍දතෙම; බලං, අක්‍රිකාරවිධවංසනයෙහි සමර්ථභෙයින් බල නම් වන්නේය; (මෙම කාරණයෙන්) සුරියෝ, සූර්‍යතෙම; බලං, බලනම් වන්නේය; සම්මණ්බ්‍රාහ්මණා, ශ්‍රමණබ්‍රාහ්මණයෝ; බලං, ඉෂ්ටානිෂ්ට ක්ෂමා කිරීමෙහි සමර්ථ හෙයින් බල නම් වෙති; සමුද්දස්ස වෙලා, සමුද්‍රයාගේ වේරලද; බලං, සමුද්‍රය තමා ඉක්ම නොයාමෙහි සමර්ථ හෙයින් බල නම් වෙයි; ඉත්ථියෝ, ස්ත්‍රීහු වනාහි; බලාතිබලා, මෙකී වන්‍දසූර්‍යාදී බලඝන්ට වඩා බල නම් වෙත්.

1298 යථා උග්ගතපං සන්තං ඉසිං ලොමසකස්සපං
පිතුඅත්ථං වන්දවතී වාජපෙය්‍යං අයාචසි.*

යථා, යම්සේ; උග්ගතපං සන්තං, උග්‍රවූ තපස් ඇති; ලොමස කස්සපං, ලොමසකාශ්‍යප නම් වූ; ඉසිං, ඍෂිහු; වන්දවති, වන්දවනී තොම; පිතුඅත්ථං, තමාගේ පියාණන්ට වැඩ පිණිස; වාජපෙය්‍යං, වාජපෙය්‍ය නම් යාගය; අයාචසි, යාචඤ්ඤ කළාද; එසේ හෙයින් මෙකී සියළු බලයෙන් සත්‍රිහු බලවත්හ. යන අර්ථයි.

1299 තං ලොභපකතං කම්මං කට්ඨකං කාමහෙතුකං
තස්ස මූලං ගවෙසිස්සං ඡෙජ්ජං රාගං සබන්ධනං.

ලොභපකතං, (ඒ චන්‍දවතී නම් රාජවරස්ත්‍රිය කෙරෙහි මා ළඟින් කළා වූ) ලොභය හෙතුකොට ගෙන කරන ලද්ද වූ; (එසේ හෙයින්ම) කාමහෙතුකං, පවකාමය හෙතුකොට ඇත්තා වූ; තං කම්මං, ඒ පාප කර්මතෙම; කට්ඨකං, තීක්ෂණ වූ විපාක ඇත්තේයි; තස්ස, ඒ කර්මයාගේ; මූලං, අයොනිසොමනසකාර සඤ්ඤාත වූ මූලය; ගවෙසිස්සං, සොයමි; සබන්ධනං, ගුහනිමිත්තාභංඛ්‍යාතබන්ධන සහිතවූ; රාගං, රාගය; ඡෙජ්ජං, සිදිමි.

1300 ධිරත්ථු කාමේ සුබහූපි ලොකෙ
තපොව සෙය්‍යෝ කාමගුණෙහි රාජ;
තපෝ කරිස්සාමි පහාය කාමෙ
තමෙව රඤ්ඤ චන්දවති ච හොතූති.

රාජ, රජ; ලොකෙ, ලොකයෙහි; සුබහූපි, ඉතා බොහෝ වූද; කාමෙ, කාමයන්ට; ධිරත්ථු, නිතු වේවා; කාමගුණෙහි, මෙකී කාම ගුණයන්ට වඩා; තපෝ එව, තපසම; සෙය්‍යෝ, උත්තමය; එසේ හෙයින්; කාමෙ, කාමයන්; පහාය, හැර; තපෝ, ශීලසංයම් සවරූප වූ තපස; කරිස්සාමි, කෙරෙම්; රඤ්ඤ, රටද; චන්දවති ච, මේ චන්‍දවතී නම් රාජ කුමාරිකාද; තවෙව හොතු, තටම වේවා.

428 ලොමසකස්සපජාතකක්ඛයි.

1301 කාසාය වත්ථේ සකුණෙ වදාමි
දුවෙ දුවෙ නන්දිමනෙ වරන්නෙ
කං අණ්ඩජං අණ්ඩජමානුසෙසු
ජාතිං පසංසන්ති තදිඞ්ඝ බ්‍රූථ.

* අයාජසි-මරම්ම.

කාසායවත්ථේ, රන්වන් පැහැ ඇති බැවින් කාසාවවස්ත්‍ර පෙරෙවියන් බඳු වූ; දුවෙ දුවෙ, යුග්ම යුග්මව; නන්දිමනෙ, සතුටු සිත් ඇතිව; වරන්නෙ, (මෙහි) හැසිරෙන්නා වූ; සකුණෙ, පක්ෂීවූ තොපට; වදාමි, කියමි; හෙවත් තොප විචාරමි; අණ්ඩජා, එම්බා පක්ෂීනි; මානුසෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; කං අණ්ඩජං, කිනම් පක්ෂියයි කියා; ජාතිං, (තොපගේ) ජාතිය; පසංසන්ති, ප්‍රශංසා කෙරෙද්ද; ඉංඝ, එහෙයින්; තං, එය; බ්‍රූථ, කියව්; (නොහොත්) අණ්ඩජමානුසෙසු, පක්ෂීන් හා මනුෂ්‍යයන් අතුරෙහි; කං අණ්ඩජං, කිනම් පක්ෂියයි කියා; ජාතිං, තොපගේ ජාතිය; පසංසන්ති, ප්‍රශංසා කෙරෙද්ද.)

1302 අමෙහ මනුසෙසූ මනුස්සහිංස
අනුපුබ්බකෙ චක්කවාකෙ වදන්ති
කල්‍යාණභාවමහි දිජෙසු සම්මතා
අභිතරූපා විචරාම අණ්ණවෙ
(න කාසහෙතූපි කරොම පාපං)

මනුස්සහිංස, මනුෂ්‍ය හිංසය; අනුපුබ්බකෙ, ඔවුනොවුන්ට අනුගත වන්නාවූ ප්‍රියසංවාස ඇති; අමෙහ, අප; චක්කවාකෙ, චක්‍රවාකයයි කියා; මනුසෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; වදන්ති, කියති; දිජෙසු, පක්ෂීන් අතුරෙහි; කල්‍යාණභාවාති, කල්‍යාණභාවයෝයයි; සම්මතා, සම්මතයෙමු; අභිතරූපා අමහි, නිහීයවූවමු; අණ්ණවෙ, පියුම් විල්හි; විචරාම, ඇවිදිමු;—මෙහි සතර වන පදය "නකාසහෙතූපි කරොම පාපං" යි කියාද සම්හර කෙනෙක් කියත්; එහි, කාසහෙතු, ආහාරය පිණිස; පාපං, පාපයක්; න කරොම, නොකරම්හ; එසේ හෙයින්; "කල්‍යාණ භාවාති වදන්ති"යි සම්බන්ධ කරනු. මෙහි මනුෂ්‍යයන්ට පීඩා කරන හෙයින් මනුෂ්‍යහිංසයයි චක්‍රවාකයාට ආමන්ත්‍රණය කොළෝ.

1303 කිං අණ්ණවෙ කානි ඵලානි භුඤ්ජං
මංසං කුතො ඛාදථ චක්කවාකා
කිං භොජනං භුඤ්ජථ වො අනොමා
බලව වණ්ණා ච අනප්පරූපා.

අනොමා, අලාමකඅනින්දිතවූ, චක්කවාකා, චක්‍රවාකයෙනි;වො, තොපගේ; බලව, ශක්තිබලයද; වණ්ණා ච, ශරීරවර්ණයද; අනප්පරූපා, අතිශයවූ සවරූප ඇත්තේය; එහෙයින්; කිං, කිමෙක්ද; අණ්ණවෙ, මේ සරස්හි; කානි ඵලානි, කවර ඵලකෙතකුන්; භුඤ්ජං,

අනුභව කෙරෙද්ද; නොහොත් අනුභව කළාහුද; කුණපා, කමර ප්‍රාණියක්හුගේ ශරීරයෙන්; මංසං, මාංශය; ඛාදථ, කව්ද; කීං හොජනං, කිනම් භොජනයක්; භුජථ, අනුභවකරව්ද;—මෙහි "කිං" යනු පෘච්ඡාවෙහි වැටේ.

1304 න අණ්ණමේ සන්ති ඵලානි වංක
මංසං කුතෝ ඛාදිතුං චක්කවාකෙ
සෙවාලභක්ඛාමහ අවාඝභොජනා
න ඝාසහෙතු පකරොම පාපං.

වංක, කාවුඩුව; අණ්ණමේ, මේ සරස්හි; ඵලානි, ඵලයෝ; න සන්ති, නැත; චක්කවාකෙ, චක්‍රවාකයාට; මංසං, මාංශය; ඛාදිතුං, කන්නට; කුතෝ, කොයින්ද; එහෙයින් අපි; සෙවාලභක්ඛා අමහ, සෙවෙල් භක්ෂණය කරම්හ; අවාඝභොජනා අමහ, වල්කල රඟින උදඝභොජනයම්හ; ඝාසහෙතු, ආහාර පිණිස; පාපං, පාපකර්මයක්; න පකරොම, නොකරමු;—මෙහි "චක්කවාකෙ" යනු විභක්ති විපරීනාම හෙයින් ෂෂ්ඨ්‍යර්ථයි.

1305 න මෙ ඉදං රුච්චති වක්කවාකා
අසම්ං භවෙ හොජනසන්නිකාසෙ
අහොසි පුබ්බෙ තතෝ මෙ අඤ්ඤථා
ඉච්චෙව මෙ විමති එත්ථ ජාතා.

චක්කවාකා, චක්‍රවාකය; ඉදං, මේ (තොප අනුභව කෙරෙමි කී ආහාරය) මෙ, මට; න රුච්චති, අභිමත නොවේ එසේ හෙයින්; අසම්ං භවෙ, මේ චක්‍රවාක ජාතියෙහි; භොජන සන්නිකාසෙ, සෙවෙල් ආදී ආහාරයට අනුරූප ඇත්තෙහි නොවෙයි කියා, මෙ, මට; පුබ්බෙ, පෙර; අහොසි, විය; තතෝ, ඉක්බිති දැන්; මෙ, මට; අඤ්ඤථා, අනික්පරිද්දකින් වීයයි; ඉච්චෙව, මෙසේ; එත්ථ, මේ තොපගේ ශරීර වර්ණයෙහි; මෙ, මට; විමති, විමතියක්; ජාතා, හටගතු.

1306 අහම්පි මංසානි ඵලානි භුඤ්ජෙ
අන්නානි ච ලොණිය තෙලියානි
රසං මනුස්සෙසු ලභාමි භොත්තුං
සූරොව සංගාමමුඛම්හි ජෙත්වා.
න ච මෙ නාදිසො වණ්ණො
චක්කවාකා යථා තව.

අහම්පි, මම එනාහි; මංසානි, මාංශයන්ද; ඵලානි, ඵලයන්ද; ලොණිය, ලවණයෙන් යුක්ත වූද, තෙලියානි, තෙලයෙන් යුක්ත

වී; අන්නානි, ආහාරයන්; භුඤ්ජේ, අනුභව කෙරෙමි; සංගාමමුඛමහී, සංග්‍රාම භූමියෙහි; සූරොව, නිර්භීය සූරපුරුෂයන්හු මෙන්; ඡෙඩා, හැරගෙන; මනුස්සෙසු, මිනිසුන් කෙරෙහි; රසං, රසය; භොත්තුං, අනුභව කරන්නට; ලභාමි, ලැබෙමි; එහකුදුවුවත්; චක්ඛවාඛ, චක්‍රවාඛය; තව, තාගේ; වණ්ණො, ශරීරවර්ණය; යථා, යම්සේද; තාදිසො, එබඳුවූ වර්ණයෙක්; මෙ, මට; න ච අත්ථි, නොම ඇති.

1307 අසුඛහකෙඛාසි ඛණානුපාති
කිවෙජන තෙ ලබහති අන්නපානං
න තුස්සසි රුකඛඵලෙහි වංඛ
මංසානි වා යානි සුසානමජ්ඣෙ.

වංඛ, කාකය තෝ; අසුඛ හකෙඛාසි, අශුභ වූ භක්ෂණ ඇත් තෙහි හෙවත් පැහැරගෙන කන හෙයින් අපිරිසිදු වූ ආහාර ඇත් තෙහි; ඛණානුපාති, ප්‍රමාද ක්ෂණයෙහි හෙනසුළුයෙහි; තෙ, තට; අන්නපානං, කනබොන දෙයක්; කිවෙජන, දුකින්; ලබහති, ලැබෙන්නේය; රුකඛඵලෙහි, වෘක්ෂඵලයෙන්ද; සුසානමජ්ඣෙ, සොහොන් මැද; යානි මංසානි, යම් මාංශකෙනෙක් ඇද්ද එයින්ද; න තුස්සසි, නොසතුටු වන්නෙහි.

1308 යො සාහසෙන අධිගම්ම භොගෙ
පරිභුඤ්ජති වංඛ ඛණානුපාති
තතො උපකඞ්ඛසි නං සභාවො
උපකඞ්ඛො වණ්ණබලං ජහාති.

ඛණානුපාති, ක්ෂණයෙහි හෙන සුළු වූ; වංඛ, කාකය; යො, යමෙක්තෙම්; සාහසෙන, සාහසයෙන් අනුභවකටයුතුවට; අධිගම්ම, පැමිණ හෙවත් ලදින්; පරිභුඤ්ජති, අනුභව කෙරේද; තතො, ඉක්බිත්තෙන්; නං, ඒ පුද්ගලයා; සභාවො, සවකීයවූ භාවයට; උපකඞ්ඛසි, ගහිා කරන්නේය; උපකඞ්ඛො, තමා විසින්ද අනුන් විසින්ද ගරහන ලද්දේ; වණ්ණ, වර්ණයද; බලං, බලයද; ජහාති, හරණේසි.

1309 අපපම්පි චෙ නිබ්බුතිං භුඤ්ජති යදි
අසාහසෙන අපරූපඝාති
බලඤ්ච වණ්ණො ච තදස්ස හොති
න හි සඞ්ඛා ආහාරමයෙන වණ්ණො.

යදි, ඉදින්; අසාහසෙන, සාහසයක් නොකිරීමෙන්ද; අපරූපඝාති, පරරූපඝාතයක් නොකිරීමෙන්ද; නිබ්බුතිං, නිර්වෘතභොජ

නය හෙවත් ධර්මයෙන් ලද්දාවූ (අනුන්ට පීඩාවක් නොකොට ලද්දාවූ) අපපමාණ, මදවූද නිර්වෘත භොජනයක්; භුජිති වේ, අනුභව කරන්නේ වීනම්; තදා, එකල්හි; (මේ ධර්මයෙන් ලද ආහාරය හෙතුකොටගෙන) අස්ස, ඒ ප්‍රාඥයාගේ; බලඤ්ච, ශරීරබලයද; වණ්ණෝච, වර්ණයද; හොති, වන්නේය; එසේ හෙයින්; සබ්බා වණ්ණා, සියළු වර්ණය; නහි ආහාරමයෙන, අනෙකප්‍රකාර ආහාරයෙන් වන්නේම නොවෙයි.

429 චතුත්‍රාර්ය ජ්‍ඤානය.

1310 සුනිත්තිකං අරඤ්ඤමහි පන්තමහි සයනාසනෙ
යෙ ච ගාමෙ නිත්තිකඛනති තෙ උලාරතරා තයා.

අරඤ්ඤමහි, අරණ්‍යයෙහි; පන්තමහි සයනාසනෙ, ප්‍රාන්ත ශයනාසනයෙහි හෙවත් සුවිදුර වූ වනාන්තරයෙහි; සුනිත්තිකං, ශීහාදිය ක්ෂමා කරන්නට පිළිවන; යෙ ච, යම් කෙනෙක්; ගාමෙ, ග්‍රාමයෙහි; නිත්තිකඛනති, ක්ෂමා කෙරෙද්ද; තෙ, ඔහු; තයා, ඒ ක්ෂාන්ති කරණකොටගෙන; උලාරතරා, උදාරතරයෝයි.

1311 අරඤ්ඤා ගාම මාගම්ම කිං සීලං කිං වතං අහං
පුරිසං නාත සෙවෙය්‍යං තමෙම අක්ඛාහි පුච්ඡිතො.

නාත, පියාණෙනි; අහං, මම; අරඤ්ඤා, අරණ්‍යයෙන්; ගාමං, ගමට; ආගම්ම, පැමිණ; කිං සීලං, කෙබඳු ශීලයක්; කිං වතං; කෙසේ වූ ව්‍රතයක්; කිං පුරිසං; කෙබඳු වූ පුරුෂයකු; සෙවෙය්‍යං, සෙවනය කෙරෙම්ද; මෙ, මට; තං, ඒ; පුච්ඡිතො, විචාරණ ලද්දෙහි; අක්ඛාහි, කියව.

1312 යො තෙ විස්සාසතෙ නාත විස්සාසඤ්ච ඛමෙය්‍ය තෙ
සුස්සූසී ච තිත්තික්ඛී ච තං භජෙහි ඉතො ගතො.

නාත, පුත්‍රය; යො, යමෙක්; තෙ, තා හා; විස්සාසතෙ, විශ්වාස කරන්නේද; (යමෙක්) තෙ, තා හා කරන ලද; විස්සාසඤ්ච, විශ්වාසයද; ඛමෙය්‍ය, ක්ෂමා කරන්නේද හෙවත් චිරකාලයක් පවත්වන්නේද; සුස්සූසී ච, යමෙක් තාගේ වචනයෙහි සුශ්‍රූසා ඇත්තේද හෙවත් තාගේ වචනය අසනු කැමැත්තේද; තිත්තික්ඛී ච, යමෙක් තාගේ වචනය ක්ෂමා කරන්නේද; තං, ඔහු; ඉතො, මේවලින්; ගතො, ගමට ගියෙහි; භජෙහි, සෙව්.

1313 යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං
උරසීව පතිඨාය තං භජේහි ඉතෝ ගතෝ.

යස්ස, යම්කිහුගේ; කායෙන, කයින්ද; වාචාය, වචයින්ද; මනසා, සිතින්ද; දුක්කතං, දුෂ්කෘතයෙක්; නත්ථි, නැද්ද; තං, ඔහු; උරසීව, මවකගේ ළෙහි පිහිටි පුත්‍රයකු සේ; පතිඨාය, සිතින්ම විශ්වාස ගෙන; ඉතෝ ගතෝ, මේ අරණ්‍යයෙන් ග්‍රාමයට ගියෙහි; භජේහි, සේවනය කර.

1314 යෝ ච ධම්මෙන චරති චරන්තොපි න මඤ්ඤති
විසුද්ධාචාරං සප්පඤ්ඤං තං භජේහි ඉතෝ ගතෝ.

යෝ ච, යමෙක් වනාහි; ධම්මෙන, ත්‍රිවිධ සුචරිත ධර්මයෙන්; චරති, පවත්නේද; චරන්තොපි, එසේ වූ සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේද; න මඤ්ඤති, මම සුචරිත ධර්මයෙහි හැසිරෙමි කියා මානයක් නො කෙරේද; විසුද්ධාචාරං, විසුද්ධ සඛ්‍යාත වූ දස කුසල කර්මපථය කරන්නා වූ; සප්පඤ්ඤං, සප්‍රාඥ වූ; තං, ඔහු; ඉතෝ ගතෝ, මේසින් ගමට ගියෙහි; භජේහි, ඇසිරු කර.

1315 හලිද්දිරාගං කපිචිත්තං පුරිසං රාගවිරාගිනං
තාදිසං භාත මා සෙවී නිම්මනුස්සම්පි චෙ සියා.

භාත, පුත්‍රය; චෙ, ඉදින්; නිම්මනුස්සං අපි, (සියළු දඹදිව්තලය) නිර්මනුෂ්‍ය වූයේ නමුදු; හලිද්දිරාගං, අස්ථිර වූ වත ඇති හෙයින් හරිද්‍රාරාගයක් වැනි වූ; කපිචිත්තං, වානරයක් හට සේ චචල වූ (විරකත වන්නා වූ) සිත් ඇති; රාගවිරාගිනං, රාගීන් කෙරෙහි හා විරාගීන් කෙරෙහි ඇලීම් නො ඇලීම් දෙකින් යුක්ත වූ; තාදිසං පුරිසං, එබඳු පුරුෂයා; මා සෙවී, නහමක් ඇසිරු කර.

1316 ආසීවිසං ව කුපිතං මීළ්හලිත්තං මහා පථං
ආරකා පරිවජ්ජෙහි යානීව විසමං පථං.

කුපිතං, කිපුනා වූ; ආසීවිසං ඉව, ආශීර්විෂයක් වැනි වූ; මීළ්හලිත්තා, අසුචියෙන් තැවරුනු; මහාපථං, මහාමාර්ගයක් වැනි වූ; විසමං, භාණ්ඩ පහළින් විෂම වූ; පථං, මාර්ගයක්; යානීව, යානා එකින් යන්නාක් වැනි වූවහු මෙන්; ආරකා, දුරින්; පරිවජ්ජෙහි, දුරුකර.

1317 අනත්ථා භාත වඩ්ඪන්ති බාලං අචූපසෙවතෝ
මාසූ බාලෙන සඞ්ගඤ්ඡි අමිත්තෙනෙව සබ්බදා.

තාත, පුත්‍රය; බාලං, අඥානයා; අවවූපසෙවතො, අධික සොට, සෙවනහුගේ; අනත්ථා, අනර්ථයෝ; වඩනති, වැඩෙන්නාහුය, සබඳ, සියළු කල්හි; අම්තෙතන එව, පස මිහුරු වූම; බාලෙන; අඥානයා හා; මා සඞගඤ්ඡි, සංවාසයට නො පැමිණෙව-අසසු යනු නිපාතමාත්‍රයි.

1318 තං තාහං තාත යාචාමි කරසසු වචනං මම
මාසසු බාලෙන සඞගඤ්ඡි දුකෙඛා බාලෙහි සඞගමොති.

තාත, පුත්‍රය; තං, ඒ කාරණයෙන්; තං, තා; අහං, මම; යාචාමි, ආරාධනා කෙරෙමි; මම, මාගේ; වචනං, වචනය; කරසසු, කර; බාලෙන, බාලයා හා; මාසඞගඤ්ඡි, නහමක් එක්වා; කුමක් හෙයින් දයත්? බාලෙහි, බාලයන් හා; සඞගමො, සඞගමය තෙම; දුකෙඛා, දුකයි-එහෙයින් බාලයන් හා එක් නොවයි කියාම අර්‍ථසම්බන්ධයි, මෙහිදු "අසසු" යනු නිපාතයි.

430 හලිද්දිරාග ජාතකය.

1319 කුතොනු ආගච්ඡථ හො තයො ජනා
සවාගතා එත්ථ නිසීදථාසනෙ
කච්චිත්ථ හොනෙතා කුසලං අනාමයං
චිරසසං වබ්භාගමනං වො ඉධ.

හො, පින්වත්නි; තයො ජනා, ජනයෝ තුන්දෙන; කුතො නු; කොයින්; ආගච්ඡථ, අවුද; එත්ථ; මෙයට; සවාගතා, තොප විසින් සුවසේ එන ලද; ආසනෙ, ආසනයෙහි; නිසීදථ, බැසගිදු; හොනෙතා, පින්වත්නි; කුසලං කච්චිත්ථ, නිදුක්ද; අනාමයං කච්චිත්ථ, නිරොගිද; වෝ, හේ තොපගේ; ඉධ, මෙහිලා; අබ්භාගමනං, ආගමනය; චිරසසංව, බොහෝකලකින්ම වීය.

1320 අහමෙව එකො ඉධ මඤ්ඣපත්තෙතා
න චාපි මෙ දුතියො කොචි විජ්ජති
කිමෙව සඞ්ඛාය තෙ භාසිතං ඉසෙ
කුතො නු ආගච්ඡථ හො තයො ජනා.

ඉසෙ, තපස්වීය; එකො, හුදකලා වූ; අහමෙව, මම ම; ඉධ; මේ විල; අඤ්ඣපත්තෙතා, පැමිණියෙමි; මෙ, මට; දුතියො, දෙවැනි වූ; කොචි, කිසිවෙක්; න චාපි විජ්ජති, නොද ඇත; හො, පින්වත්නි;

තයො ජනා, තෙපි තුන්දෙන; කුතො නු ආගච්ඡථ, කොයින් අවු දැයි; තෙ, තා විසින්; කිමෙව සඤ්ඤාය, කුමක් පිණිස; භාසිතං, කියන ලදද.

1321 තුවං ව එකො භරියා ච තෙ පියා
සමුග්ගපක්කිත්තනිකිණ්ණමන්තරෙ
සා රක්ඛිතා * කුච්ඡි ගතාව තෙ සතා
වායුස්ස පුත්තෙන සහා තහිං රතා.

තුවං ව, තෝ වනාහි; එකො, (පළමු) හුදකලෙහි; අන්තරෙ, ඇතුළුකුක්ෂියෙහි; සමුග්ගපක්කිත්තනිකිණ්ණා, සුමුඟ ලා තබන ලද්දවූ හෙවත් සුමුඟ බහා ලා ඒ සුමුඟ ඇතුළුකුක්ෂියෙහි පිහිටුවන ලද්දවූ; තෙ පියා භරියා ච, තාගේ ප්‍රිය භාර්‍යාව; (එකා, හුදකලාව) තෙ, තාගේ; කුච්ඡිගතාව සතා, ඇතුළු කුක්ෂියට ගියාවූ පරිද්දෙන්; රක්ඛිතා, (තා විසින්) රක්‍ෂා කරන ලද්දා වූ; සා, ඒ (තාගේ) භාර්‍යාව තොමෝ; වායුස්ස පුත්තෙන සහ, වායුපුත්‍ර නම් විඤ්ඤරයක්හු හා; තහිං, ඒ ඇතුළු කුක්ෂියෙහිදීම; රතා, කෙළහරතීන් අභිරතයි– මෙසෙයින් තෙපි තුන්දෙනයයි පූර්ව්‍යාඛ්‍යාව හා සම්බන්ධකරනු. මෙහි "එකො" යනු භරියා ශබ්දය හා ද යෙදිය යුතුකල්හි සන්ධිලිහුවශයෙන් ලිංග පරිවර්තනයයි. මෙහි "සමුග්ගපක්කිත්තනිකිණ්ණමන්තරෙ" යන්නෙහි මකාර ආගම වශයෙන් දතයුතු.

1322 සංවිග්ගරූපො †ඉසිනා ව්‍යාකතො
සොදානවො තත්ථ සමුග්ගමුග්ගිලි
අද්දක්ඛි භරියං සුවිමාලභාරිනිං
වායුස්ස පුත්තෙන සහා තහිං රතං.

ඉසිනා, ඍෂිහු විසින්; ව්‍යාකතො, කියන ලද්දවූ; සංවිග්ගරූපො, කලකිරුණා වූ සවභාව ඇති; සො දානවො, ඒ දානවතෙම; තත්ථ, එහි ලා; සමුග්ගං, (තමා බඩ තුබූ) කරඬුව; උග්ගිලි, නැඟීය; (තදනන්තරවම්) වායුස්ස පුත්තෙන සහ, වායුපුත්‍ර නම් විඤ්ඤරයා හා සමඟ; තහිං, එහිම; රතං, ඇළුනාවූ; සුවිමාලභාරිනිං, සුවිවූ මල්බර දරන්නා වූ; භරියං, භාර්‍යාව; අද්දක්ඛි, දිටී.

1323 සුදිඨරූපුග්ගතපානුවත්තිනා
හීනා නරා යෙ පමදා වසං ගතා
යථා හවෙ පාණිරිවෙත්ථ රක්ඛිතා
දුඨා මසි අඤ්ඤමභිපපමොදති.

---

* කුච්ඡිගතාවතෙසදෘ-මරම්ම. † ඉසිනා පබ්භාකතො-මරම්ම.

උගහනපානුවත්තිනා, උග්‍ර වූ තපස් අනුව පවත්නා වූ; සුදිඨ රූපා, කාරණය මනාකොට දන්නා ලද; එසේ හෙයින්; යථා, යම් හෙයකින්; හවේ, එකාන්තයෙන්; එත්, මේ ඇතුල් කුක්ෂියෙහි ලා; පාණිරිව, මාගේ ප්‍රාණය මෙන්; රක්ඛිතා, රක්ෂා කරන ලද තැනැත්තිය; මයි, මා කෙරෙහි; දුඪා, මිත්‍රද්‍රොහකම්ම කොට; අඤ්ඤං, අනික් පුරුෂයකු; අභිපපමොදති, කැමතිවන්නිද එසේ හෙයින්; යෙ නරා, යම් පුරුෂ කෙනෙක්; පමාදවසං ගතා, ප්‍රමාද වසඟ ඛවට ගියෝද එසේ වූ ඒ නරයෝ; හීනා, අතිශයින් හීනයෝයි.

1324 දිවා ච රත්තො ච මයා උපඨිතා
තපස්සිනා හෝතිරිවා වනෙ වසං
සා ධම්මමොක්කමම අධම්මමාචරි
අකිරියරූපෝ පමදා හි සත්ථවෝ.

වනෙ, වෙතෙහි; වසං, වසන්නා වූ; තපස්සිනා, තපශ්චියක්හු විසින්; හෝතිරිව, වත්තියක්හු මෙන් හෙවත් දෙවේලෙහි ගිනි දෙවියාට පුදන සේ; මයා, මා විසින්; දිවා ච, දවලෙහිද; රත්තො ච, රාත්‍රියෙහිද; උපඨිතා, උපස්ථාන කළාද; සා, ඕ තොම; ධම්මා, පතිව්‍රතා ධර්මයෙන්; ඔක්කමම, ඉවත් ව; අධම්මං, අධර්මය, ආචරි, හැසුරුනි; එසේ හෙයින්; පමදා හි, සත්‍රීන් හා සමහ; සත්ථවෝ, සත්ථවය; අකිරියරූපෝ, අකිරිය රූප ඇත්තේයි.

1325 සරීරමජ්ඣම්හි සිතාති මඤ්ඤිහං
මයහං අයන්තී අසතිං අසඤ්ඤතං
සා ධම්මමොක්කමම අධම්මමාචරි
අකිරියරූපෝ පමදා හි සත්ථවෝ.

මයහං, මාගේ; සරීරමජ්ඣම්හි, ශරීරමධ්‍යයෙහි හෙවත් කුස තුල; සිතාති, සිටියා යයිද; අයං, මෝතොමෝ; මයහං ඉති, මාගේ යයිද; අසතිං, අසත්පුරුෂ ධර්මයෙන් සමන්විත වූ; අසඤ්ඤතං, අසංයත වූ හෙවත් දුශ්ශිල වූ තැනැත්තියක් ගැන; අහං, මම; අමඤ්ඤිං, සිතීම්; සා, ඕ තොම; ධම්මා, පතිව්‍රතා ධර්මයෙන්; ඔක්කමම, ඉවත්ව; අධම්මං, අධර්මය; ආචරි, හැසුරුනි; එසේ හෙයින් පමදා හි, සත්‍රීන් හා; සත්ථවෝ, සත්ථවය, අකිරියරූපෝ, අකිරිය රූප ඇත්තේය නො කළ යුතු යයි සේයි.

1326 සුරක්ඛි * තා මෙති කථන්නු විස්සසෙ
අනෙකචිත්තා † සු න හත්ථි රක්ඛණා
එතා හි පාතාලපපාතසන්නිභා
එත්ථපමත්තෙතා වසනං නිගච්ඡති.

---

* සුරක්ඛිතම්මෙ-පොත්, † පුනහෙත්ථ-බුරුම.

මේ, මා විසින්; සුරක්ඛිතා, මනා සොට රක්ෂා කරන ලදුයි; කථන්නු විස්සසෙ, කුමට නම් (සත්‍රීන් හා) විස්වාස වෙද්ද; අනෙක චිත්තාසු, නොයෙක් සිත් ඇති සත්‍රීන් කෙරෙහි; රක්ඛණා, රක්ෂා තොමෝ; නහි අත්ථි, නොම ඇත; එසේමඇ; එතා හි, මේ සත්‍රීහු චිතාහි; පාතාලපඋතසන්නිභා, ලොකාසවාද වශයෙන් දුෂ්පූර හෙයින් මහාසමුද්‍රයෙහි පාතාලසඞ්ඛ්‍යාත ප්‍රපාතය හා සදෘශයහ; එත්ථ, මෙසේ වූ සත්‍රීන් කෙරෙහි; පමත්තෙනා, ප්‍රමත්තපුරුෂ තෙම; ව්‍යසනං, ව්‍යසනයට; නිගච්ඡති, පැමිණෙන්නේසි.

1327 තසමා හි තෙ සුඛිනෝ චීතසොකා
යෙ ‡ මාතුගාමෙහි චරන්ති නිස්සටා
එතං සිවං උත්තමමාභිපත්ථයං
න මාතුගාමෙහි කරෙය්‍ය සන්ථවං.

තසමා හි, එසේ හෙයින්; යෙ, යම් කෙනෙක්; මාතුගාමෙහි, සත්‍රීන් කෙරෙන්; නිස්සටා, දුරුවූ වාහු; චරන්ති, හැසිරෙද්ද; තෙ, ඔහු; සුඛිනෝ, සුවපත් වන්නාහ; චීතසොකා, චීතශොක ඇත්තාහුසි; උත්තමං, උතුම් වූ; එතං සිවං, මේ සත්‍රීන් කෙරෙන් දුරුව උපදවන ධ්‍යාන සුඛ සඞ්ඛ්‍යාත මේ සිවය; අභිපත්ථයං, ප්‍රාර්ථනා කරන්නේ; මාතුගාමෙහි, සත්‍රීන් හා සමඟ; සන්ථවං, සංසනවය; න කරෙය්‍ය, නො කරන්නේඇ.

431 සමුගඟ ජාතකයයි.

1328 න ඛෝ මෙ රුච්චති ආලි පූතිමංසස්ස පෙක්ඛනා
එතාදිසා සඛාරසමා ආරකා පරිවජ්ජයෙ.

ආලි, යෙහෙලිය; පූතිමංසස්ස, පූතිමාංශ නම් තීගේ සවාමීහුගේ; පෙක්ඛනා, බැලීම; මෙ, මට; න ඛෝ රුච්චති, රුස්නේ නොවෙයි; එතාදිසා, මෙබඳු වූ; සඛාරසමා, යහලුවා කෙරෙන් දුරුව; ආරකා පරිවජ්ජයෙ, දුරින් දුරුකරන්නේසි.

1329 උම්මත්තිකා අයං වෙණී වණ්ණෙති පතිනෝ සඛිං
පජ්ඣායති පවිගච්ඡනතිං ආගතං මෙලමාතරං.

උම්මත්තිකා, උනමත්ත වූ; අයං වෙණී, මේ වෙණී තොමෝ; පතිනෝ, තමාගේ වල්ලභයාහට; සඛිං, තමාගේ යෙහෙළිය;

‡ මාතුගාමාසි-සිංහල පොත්.

වණ්ණෙණති, වණ්ණිණතා සොරෙසි; (හෙවත් මාගේ යේළි වූ එළි ම, කෙරෙහි සෙනහ ඇත්තී මා හා කැටිවම එසි කියා මෙසේ එළියට ගුණ කියයි, දැන් වනාහි මාගේ සමීපයට) ආගතං, ආවා වූ; මෙල මෘතරං, "මෙලමාහා" නම් එළිය; පටිගච්ඡතිං, නැවත යන්නියට පජ්ඣායති; අත්‍රව ශොක කෙරේ.

1330 එවං ඛොසි සම්ම උම්මත්තෙතා දුම්මෙධො අවිචක්ඛණෝ
යො එවං මිතාලයං කත්වා අකාලෙන විපෙකඛසි.

සම්ම, සබ්ද; යො එවං, හේ තෝ; මිතාලයං කත්වා, මිළවුන්ගේ ලෙස කොට ගෙන; අකාලෙ, නො කල්හි; (යෙහෙළිය සමීපයට නො එන තුරුම්;) විපෙකඛසි, බැලිද (එසේ බැලූ); එවං ඛො, තෝ වනාහි;අවිචක්ඛණෝ, පරීක්ෂා ඥන නැත්තා වූ; උම්මත්තෙතාසි, උනමත්ත වෙහි.

1331 න අකාලෙ විපෙකඛෙය්‍ය කාලෙ පෙකඛෙය්‍ය පණ්ඩිතෝ
පූතිමංසෙව පජ්ඣාති යෝ අකාලෙ විපෙකඛති.

පණ්ඩිතෝ, නුවණැත්තේ; අකාලෙ, නො කල්හි හෙවත් කාම ගුණයන් අරභයා ශුභවශයෙන් විත්තෙකාතපත්ති උපන් කල්හි; න විපෙකඛෙය්‍ය, නොබලන්නේය;කාලෙ,කාලයෙහි හෙවත් අශුභාදී වශයෙන් රූප දක්නා කල්හි; පෙකඛෙය්‍ය, බලන්නේය; කුමක් හෙයින්ද යත්? යෝ, යමෙක්; අකාලෙ, බලන්නට නුසුදුසු කාල යෙහි; විපෙකඛති, බලාද; (ඒ පුරුෂයා) පූතිමංසෝ ඉව, මේ පූති මාංශ නම් කැනගිලු මෙන්; පජ්ඣාති, සිතා—යම්සේ මේ පූතිමාංශ නම් කැනගිලා නො බැලුවමනා කල්හි බලා ගොවරයෙන් පිරි හිණිද එපරිද්දෙන් මහණහුද රූපාදීන් ශුභාකාරයෙන් වැට හුණු කල්හි බලා මෙලොව පරලොව ශොභාකරන්නාහු යයි සේසි.

1332 පියං ඛො ආලි මේ හොතු පුණ්ණපත්තං දදාහි මේ
පති සංජීවතෝ මය්හං එය්‍යාහි ඔය පුච්ඡකා.

ආලි, යෙහෙළිය; මේ, මට; පියං හොතු, ප්‍රියයෙක් වේවා; මේ, මට; පුණ්ණපත්තං, සතුටු පඬුරු; දදාහි, දේ; මය්හං, මාගේ; පති, වල්ලභතෙම; සංජීවතෝ, ජීවත් ව්ය; පිය පුච්ඡකා, ප්‍රියයක් පිළිගන්නීය; එය්‍යාසි, (මාහාසමඟම) ඒ—මෙහි "ඛො" යනු නිපාතයි.

1333 පියං ඛො ආලි තෙ හොතු පුණ්ණපත්තං දදාමි තෙ
මහතා ව පරිවාරෙන එසසං කාසිරාහි හොජනං

ආලි, යෙහෙළිය; තෙ, තිට; පියං හොතු, ප්‍රියයෙන් වේවා; තෙ, ඔට; පුණ්ණපත්තං, සහුටු පඬුරු; දදාමි, දෙමි; (එතකුදු හුද කලාව නොහවුත්) මහා ච, මහත්වූද; පරිවාරෙන, පිරිවර හා සමග; එසසං, එම්; හොජනං, (ඒ අප එන්නවුන්ට) ආහරයක්; කයිරාහි, කර.

1334 කිදිසො තුයහං පරිවාරො යෙසං කාහාමි හොජනං
කිං නාම කාව තෙ සබ්බෙ තමෙම අකඛාහි පුච්ඡිතො.

යෙසං, යම්බඳු පරිවාරයක් හට; හොජනං, ආහාරයක්; කාහාමි, කෙරෙම්ද; (එසේවූ) තුයහං, තිගේ; පරිවාරො, පරිවාරය තෙම; කිදිසො, කොබඳුද; තෙ සබ්බෙ, ඔහු හැම; කිං නාමකා, කෙනෙම්හුද; තං, එය; මේ මට; පුච්ඡිතා, විචාරණ ලද්දෙහි; අකඛාහි, කිය.

1335 මාලියො චතුරකඛා ච පිඬනියො අථ ජම්බුකො
එදිසො මයහං පරිවාරො තෙසං කයිරාහි හොජනං.

මාලියො, මාලියයාද; චතුරකඛා ච, චතුරක්ඛියාද; පිඬනියො ච, පිඬිනියයාද; අථ, නැවත; ජම්බුකො, ජම්බුකයාද; මයහං, මාගේ; පරිවාරො, පරිවාරය තෙම; එදිසො, මෙබඳුය; (පන්සියයක් පන්සියයක් පිරිවරකොට නම් කී බල්ලෝ සතර දෙන මාගේ පිරිවරයහ) තෙසං, ඔවුන්ට; (සැහෙන පරිද්දෙන්) හොජනං, හොජනයක්; කයිරාහි, කර.

1336 නික්ඛන්තාය අගාරසමා භණ්ඩකම්පි විනස්සති
ආරොග්‍යං ආලිතො වජ්ජං ඉධෙව විසමාගමා.

අගාරසමා, ගෙන්; නික්ඛන්තාය, නික්මුනාවූ තොපගේ; භණ්ඩකම්පි, වසතුද; විනස්සති, නස්නේය; ආලිතො, තොපගේ යහළුවා හට; ආරොග්‍යං, නිරොගිබවය; වජ්ජං, මම්ම කියාලමි; (එසේ හෙයින්) ඉධෙව, මෙහිම; විස, නිවාසයකර; මාගමා, නහමක්යා.

432 පූතිමංස ජාතකයයි.

1337 යො තෙ පුත්තකෙ අඛාදි දිත්තාහතෙත්තා අදූසකෙ
තසමිං දුයං නිපාතෙහි මා තෙ මුච්ඡි ජීවිතො.

දිත්තාහතෙත්තා, නා විසින් දෙනලද බත් ඇති; යො, යමෙක්; තෙ, තාගේ; අදූසකෙ, නිරපරාධවූ; පුත්තකෙ, දරුවන්; අඛාදි,

කෑදැ; තසම්ං, ඔහු සෙරෙහි; දුඨං, දළ; නිපාතෙහි, එල හෙවත් දළ ඛහාලා උගුර විදුපිය; තෙ, තාගේ; (හසතයෙන්) ජීවිතෝ, ජීවත් වන්නේ; ඉා මුඛිත්, නහමක් ඕදේවා—සජීව වැ තාගේ හසතයෙන් මේ පාපධම්මඅැතියේ නහමක්ඕදේවා මොක්ෂයක් නොලබා ඉා ජීවිතක්ෂයට පමුණුවා වාසි සේසි.

1338 ආකිණ්ණලුද්දෝ පුරිසෝ ධානිවෙලංව මක්ඛිතෝ
පදෙසං තං න පස්සාමි යත්ථ දුඨං නිපාතයෙ.

ආකිණ්ණලුද්දෝ, අතිශයින් දරුණු වූ; පුරිසෝ, පුරුෂතෙම; ධානිවෙලංව, කිරිමවකාගේ වසතුයක් මෙන්; මක්ඛිතෝ, කෙලශ මලයෙන් මිශ්‍රිතය එසේ හෙයින්; යත්ථ, (මොහුගේ) යම් ශරීර ප්‍රදෙශයෙක්හි; දුඨං, දළ; නිපාතයෙ, හෙලම්ද; තං පදෙසං, එසේ වූ ශරීර ප්‍රදෙශයක්; න පස්සාමි, කොා දකිමි.

1339 අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං විවරදස්සිනෝ
සබ්බං මෙ පථවිං දජ්ජා නෙව නං අභිරාධයෙ.

අකතඤ්ඤුස්ස, කෙලෙහිගුණ නොදන්නා වූ; නිච්චං, සතත යෙන්; විවරදස්සිනෝ, වරද දක්නාසුලු වූ; පොසස්ස, පුරුෂයාහට; මෙ, ඉදින්; සබ්බං පථවිං දජ්ජා, සියලු පොළොව දුන්නේ වී නම්; නං, ඔහු; නෙව අභිරාධයෙ, නොම සතුටු කරන්නේය.

1340 කිනන්නු සුබාහු තරමානරූපෝ
පචවා ගතොසි සහ මාණවෙන
නීං කිච්චමත්ථං ඉධමස්සිතුයාහං
අකඛාහි මෙ පුච්ඡිතෝ එතමත්ථං.

සුබාහු, මනාවූ බාහු ඇත්තව; කිනන්නු, කිමෙක්ද; තරමාන රූපෝ, සවරූප ඇත්තෙහි; මාණවෙන සහ, මාණවකයා හා එක්ව; පචවාගතොසි, නැවත ආයෙහි වී; ඉධ, මෙහි ලා; තුයහං, තට; (මේ මාණවකයා විසින් සැදිය යුතු) අත්ථං, අර්ථප්‍රතිසංයුක්ත වූ; කිං කිච්චං, කවර කෘත්‍යයෙක්; අත්ථි, ඇද්ද; මෙ, මා විසින්; පුච්ඡිතෝ, විචාරණ ලද්දෙහි; එතං අත්ථං, මේ කාර්ණය; අකඛාහි, කිය.

1341 යෝ තෙ සඛා දද්දරෝ සාධුරූපෝ
තස්ස වධං පරිසඞ්කාමි අජ්ජ
පුරිසස්ස කම්මායතනානි සුත්වා
නාහං සුඛං දද්දරං අජ්ජ මඤ්ඤෙ.

තෙ, තාගේ; සඛා, යහලු වූ; සාධුරූපො, මනා වූ සවරූප ඇති; යො දද්දරො, යම් වටුවෙක් ඇද්ද; අජ්ජ, අද; තස්ස පුරිසස්ස, ඒ පුරුෂයාගේ; කම්මායතනානි, කර්මායතනයන් හෙවත් කර්මයන්; සුත්වා, අසා; වධං, වධය; පරිසඞ්කාමි, ශාඞ්කා කෙරෙමි; අහං, මම; අජ්ජ, අද; දද්දරං, දද්දරයා; සුඛිං, සුවපත් යයි; න මඤ්ඤාමි, නොසිතමි.

1342 කානිස්ස කම්මායතනානි අස්සු
පුරිසස්ස වුත්තනිසමොධානතාය
කං වා පටිඝාතං පුරිසස්ස සුත්වා
පරිසඞ්කසි දද්දර මාණවෙන.

අස්ස පුරිසස්ස, මේ පුරුෂයාගේ; වුත්තනිසමොධානතාය, වෘත්ත නිසමොධානය පිණිස හෙවත් දිවිපැවැත්ම ගලපන පිණිස, කානි කම්මායතනානි, කිනම් කර්මායතන කෙනෙක් හෙවත් මොහු විසින් කරන ලද කවර කර්මයක්; අස්සු, ඇත්තෙහිද; පුරිසස්ස, පුරුෂයාගේ; කං වා පටිඝාතං, කවර ප්‍රතිඥවක් හෝ; සුත්වා, අසා; මාණවෙන, මාණවකයා විසින්; දද්දරං, තිත්තිර පණ්ඩිතයා; (මරණ ලදුයි) පරිසඞ්කසි, සැක කෙරෙහිද?

1343 විණණා කලිඞ්ගා චරිතා වණිජ්ජා
වෙත්තාවාරෝ සඞ්කුපථොපි විණෙණා
නවෙහි විණණං සහ වාහරෙහි.
දණ්ඩෙන යුද්ධම්පි සමජ්ජමජ්ඣෙ.

කලිඞ්ගා, (වෙළඳුන්ගේ බඩු උසුලාගෙන යන මොහු විසින්) කලිඞ්ගදෙශයෝ; විණණා, හැසිරෙන ලදහ; වනිජ්ජා, වෙළඳුම; චරිතා, (මොහු විසින්) කරනලදුදු; වෙත්තාවාරෝ, වෙත්‍රයෙන් හැසිරිසයුතු වූ; සඞ්කුපථොපි, ඛාණුකාමාගියද; විණෙණා, වළඳනා ලද; නවෙහි, (ජීවිතහෙතුයෙන්ම) නළුවන් සමඟද; විණණං, හැසිරෙන ලද; වාහරෙහි, (වරදුල් උසුලාගෙන යන ඔහු විසින්) වරදුල් වැද්දන් සමඟද; (විණණං) හැසිරෙනලද; සමජ්ජමජ්ඣෙ, සභාමධ්‍යයෙහි; දණ්ඩෙන, මුගුරෙන්; යුද්ධම්පි, යුද්දද; (විණණං) කරනලද.

1344 බඩා කුලිඞ්ගා මිතමාළහස්මා
අකඩා ජිතා සංයමෝ අබහතීතෝ
අබ්බූහිතං ප්‍රපථඤ අඩ්ඪරත්තං
හත්වා දඩ්ඪා පිණ්ඩපරිගහෙන.

කුලිඞ්කා, (ඔහු විසින්) සියොත්හුද; බඩා, බඳනා ලදහ; ආළහ බෙහෙ, නැළියෙන්; මිතං, (ධාන්‍යමැණිම්ද) කරන ලද; අකඩා, අක්ෂධූර්තයෙන්; (ඔවුන්ට වතාවත් කරන්නා වූ ඔහු විසින්) ජීතා, දැනගන්නා ලදහ; සංයමෝ, ශීලසංයමය; අඛණ්ඩතෝ, (ජීවිකාවෘත්තිය සඳහා පැවිදි වූ ඔහු විසින් ම) ඉක්මවන ලද; අඩ්ඪරත්තා, අඩරාත්‍රියෙහි; පුපඵකං, ලේ; අබ්බූහිතං, නොවැගිරෙන සේ බොළේ-මොහු විසින් වනාහි ජීවිකා සඳහා රාජදේශීන්ගේ අත්පාසපා ඔවුන්ගෙන වුත් ශාලාවෙක්හි හොවා වූණ මුඛයෙන් වැගිරෙන රුධිරය අඩරාත්‍රි සමයෙහි එහි ගොස් "කුණ්ඩක ධූම" නම් දුමක් දී නඛන ලද්දේ යයි සේසි. පිණ්ඩපටිඝහෙන, (ආජීවක ප්‍රව්‍රජ්‍යායෙන් පැවිද්ද ලබා සිටි කාලයෙහි උණු වූ) ආහාර පිණ්ඩ පිළිගැන්මෙන්; හඪාපි, (මොහුගේ) අත්ද; දඩ්ඪා, දැවුණාහ.

1345 තානිස්ස කම්මායතනානි අස්ස
පුරිසස්ස වුත්තිසමොධානතාය
යථා අයං දිස්සති ලොමපිණ්ඩා
ගාළෝ හතා කිං පන දද්දරස්සාති.

වුත්තිසමොධානතාය, ජීවිකා වෘත්තියගේ සමොධානය පිණිස; අස්ස පුරිසස්ස, මේ පුරුෂයාගේ; තානි කම්මායතනානි, ඒ කෂ්මායතනයන්; අස්ස, ඇසිමි; යථා, යම්සේ; අයං ලොමපිණ්ඩා, මේ වටුවාගේ රෙම පිඬ; දිස්සති, මොහුගේ ජටා අතුරෙහි දක්නා ලැබේද මේම කාරණයෙන්; ගාළෝ, ගෙරිද; හතා, මොහු විසින් නසන ලදහ; දද්දරස්ස, දද්දරය හට වන්නාහි; කිං පන (කා කථා) ගෙරුමැරුසේ එටුවා නොමරුද යන අර්ථයි-මෙහි "අස්ස" කි තැන "අස්සං" සි යන්නෙහි අර්ථයි.

433 නිතනිර ජාතකයයි.

නවකනිපාතයයි.

——(+)——

1346 චතුවාරම්දං නගරං ආයසං දළහතොරණං
ඔරුඛපතිරුඛොසම් කිං පාපං පකතං මයා.

ඉදං නගරං, මේ නුවර; චතුවාරං, සතර දෙරටුවක් ඇත් තේය; ආයසං, අයොමයවූ; දළහං, දැඩි; තොරණං, තොරණ ඇත්

සේය; ඔරුඛපතිරූඛොසම්, ඇතුල්කොට සිසාරා පවුරෙන් වලඳනා ලදිමි; (එසේ හෙයින්) මයා, මා විසින්; කිං පාපං, කවර නම් පාප යෙක්; කතං, කරන ලදද?

1347 සබ්බෙ අපිහිතා චාරු ඔරුඛොසම් යථා ත්විජෝ
කිමාධිකරණං යක්ඛ! චක්කාහිනියතෝ අහං.

යක්ඛ, යක්ෂය; සබ්බෙ, සියළු; චාරු, චාරයෝ; අපිහිතා, පියන ලදහ; ත්විජෝ යථා, පක්ෂියෙකු මෙන්; හෙවත් මැදිරියක හුන් පක්ෂි යෙකු මෙන්; ඔරුඛොසම්, වලකන ලදිමි; කිමාධිකරණං, කවර කාරණයකින්, අහං, මම; චක්කාහිනියතෝ, චක්‍රයෙන් පහරණ ලදිමිද–මෙහි "අපිහිතා"යන්නෙහි අ යනු පද පූරණ මාත්‍රනිපාතයි.

1348 ලබ්භා සතසහස්සානි අතිරෙකානි වීසති
අනුකම්පකානං ඤාතීනං වචනං සම්ම නාකරිං

සමෙන දිත්‍තස්ස න අඝඝමෙති
එවං සහස්සානං සහස්ස යාගිනං
කලම්පි නාගඝනති තථා විධස්ස තෙති.

මිසමෙ, විෂම වූ කාය කම්මාදියෙහි; නිවිඨා, පිහිටියා වූ; එකෙ, සමහර කෙනෙක්; ඛණ්ඩා, අනුන්ට පීඩාකොට; වධිත්වා, අනුන් මරා; අථ,නැවත; සොචයිත්වා,අනුන් ශොක කරවා; දදන්හි, දෙන්නාහුය; අස්සුමුඛා, කඳුලු මුහුනු ඇති; සදණ්ඩා, දණ්ඩසහිත වූ; සා දක්ඛිණා, එසේ දෙන්නා වූ දක්ෂිණා නොමෝ; සමෙන දින්නස්ස, දැහැමෙන් සෙමෙන් දුන්නා වූ දුගීනපුද්ගලයා සම්බන්ධව සම බවට නො පැමිනෙන්නීයි; එවං, මෙසේ හෙයින්; සහස්ස යාගිනං, සහශ්‍රයාගි වූ; තෙ සහස්සානං, ඒ පුරුෂයෝ ලක්ෂයක් දෙන; තථා විධස්ස, එබඳු වූ වහුගේ හෙවත් සොයාගත් දෙය ධර්මය දෙන්නා වූ දුගීත පුද්ගලයා සම්බන්ධව; කලං, සොළොස් වන කලාවට; නාගඝන්හි, නො අගනාහුය-"සහස්සානං සහස්සයා ගිනං" යනු විභක්ති පරිනාම කොට "තෙ" යනු හා සම්බන්ධ කටයුතු.

444 බිලාරකොසිය ජාතකයයි.

1462 වණ්ණවා අසිරූපොසි සත්තෝ සජාත රොහිතෝ
චක්කවාක සුරූපොසි විප්පසන්නාමුඛින්ද්‍රියෝ.

1463 පාසීනං පාවුසං මච්ඡං වලජං මුඤ්ජරොහිතං
ගඩ්ඩාය තීරෙස්මූ නිසින්නෝ එවං භුඤ්ජසි භොජනං.

චක්කවාක, චක්‍රවාකය නෝ වන්නාහි; වණ්ණවා අසි, ශරීර වර්ණ ඇත්තෙහි; අසිරූපොසි, විශිෂ්ටරූ ඇත්තෙහි; සත්තෝ, සත්ත්ව වූ ශරීර ඇත්තෙහි; සජාතරොහිතෝ, මනාව හටගත්තා වූ සවර්ණයට බදු වර්ණ ඇත්තෙහි; එසේ හෙයින්ම; සුරූපොසි, මනා වූ රූ ඇත්තෙහි; විප්පසන්න,ප්‍රසන්න වූ; මුඛින්ද්‍රියෝ, මුඛ හා ඉන්ද්‍රියයන් ඇත්තෙහි එහෙයින්; ගඩ්ඩාය තීරෙස්මූ, ගං තෙරෙහි; නිසින්නෝ,හුන්නෙහි;පාසීනං මච්ඡං,පතෙරූ (පෙට්) මස්ද; පාවුසං, ලූල්මස්ද; වලජං, බලමස්ද; මුඤ්ජරොහිතං, මුදුම්ස්ද (රේමස්ද) යන; එවං භොජනං, මෙසේ වූ භොජනයක්; භුඤ්ජසි, අනුභව කෙරෙහිද.

1464 නවාහමෙතං භුඤ්ජාමි ජඞ්ඝලා නොදකානි වා
අඤ්ඤත්‍ර සෙවාලපණකා එතමෙම සමම භොජනං.

සම්ම, සබඳ; අහං, මම; එතං වා, මේ නා කී ආහාරය හෝ; සෙවාලපණකා, සෙවාලය දියකෙලෙස්ස යන මෙයින්; අඤ්ඤත්‍ර,

පිවිත්ව; ජඞ්ගලා, ජඞ්ගල දෙශයෙහි වූ මිංශයන් හෝ; න භුඤ්ජාමි අනුභව නො කෙරෙමි; න ඔදකානිවා, ජලාශ්‍රයෙහි වූ මංශයන් හෝ අනුභව නො කෙරෙමි; එතං, මේ සෙවෙල් දිය කෙලෙස් දෙක; මෙ, මට; භොජනං, ආහාරයයි.

1465 නවාහමෙතං සදහාමි චක්කවාසස්ස භොජනං
අහං හි සම්ම භුඤ්ජාමි ගාමෙ ලොණියතෙලියං

1466 මනුස්සෙසු කතං භත්තං සුචිං මංසූපසෙචනං
න ච මෙ තාදිසො වණ්ණො චක්කවාක යථා තවී.

අහං, මම; එතං, සෙවෙල්ය දියපරඬලාය යන මේ දෙක; චක්කවාක සස,චක්‍රවාකයාට;භොජනං, භොජනයයි;න වා සදහාමි, මම නොම හදහම්; සම්ම, සඛ්ද; අහං හි, මම වනාහි; ගාමෙ, ගම්හි; ලොණියතෙලියං, ලවණයුක්ත වූ ද තෙල්න් යුක්ත වූ ද; මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; කතං, කරන ලද්ද වූ; සුචිං, නිශ්කලඞ්ක වූ; මංසූපසෙචනං, මාංශප්‍රක්ෂිප්ත වූ හෙවත් මසව්ලෙන් යුක්ත වූ; භත්තං, භොජනය; භුඤ්ජාමි, අනුභව කෙරෙමි එතකුදු වුවත්; චක්කවාක, චක්‍රවාකය; තව යථා, යාගේ මෙන්; මෙ, මට; තාදිසො වණ්ණො, එබඳු වූ ශරීරවර්ණයෙක් නම්; න ච, නොම ඇත, එහෙයින් තාගේ මේ ආහාරය නො අදහම්; යට ගාථාවට සම්බන්ධයි.

1467 සම්පස්සං අත්තනි වෙරං හිංසාය මානුසිං පජං
උත්‍රස්සො සසසි භීතො තෙන වණ්ණො තෙ එදිසො.

අත්තනි, තමා කෙරෙහි; වෙරං, අනුන් විෂය කොට උපන්නා වූ වෛරචිත්තය; සම්පස්සං, බලන්නෙහි; මානුසිං පජං, මනුෂ්‍ය සඞ්ඛ්‍යාත වූ ප්‍රජාව; හිංසාය,පෙළන්නෙහි; උත්‍රස්සො,චිත්තෝත්‍රාසය ඇත්තෙහි; භීතො, භයපත් වූ යෙහිම; සසසි, අනුභව කරන්නෙහි; තෙන, ඒ කාරණයෙන්; හෙ, තාගේ; වණ්ණො, ශරීර වර්ණය; එදිසො, මෙබඳුයි; තෝම විළිකුල් වන්නෙහි යි.

1468 සබ්බලොකවිරුද්ධොසි ධම්මපාපෝන කම්මනා
ලද්ධො පිණ්ඩා න පීනෙති තෙන වණ්ණෝ තෙ එදිසො.

ධම්ම, කාශ්‍යප තෝ විනාශි; පාපෙන කම්මනා, පාපකර්මය හෙතුකොට ගෙන; සබ්බලොක, සියලු ලොවට; විරුද්ධොසි, විපක්ෂයෙහි; ලද්ධො, තා විසින් ලබන ලද; පිණ්ඩා, භොජනය; න පීනෙති, තා නො පිනවන්නේය; තෙන, එහෙයින්; තෙ, තාහ්ගේ; වණ්ණෝ, ශරීරවර්ණය; එදිසො, මෙබදු වන්නේය හෙවත් ප්‍රතිකූල වන්නේ සි.

1469 අහම්පි සම්ම භුඤ්ජාමි අහිංසා සබ්බපාණීනං
අපෙපාසුකෙකා නිරාසඞ්කී අසොකො අකුතො භයො.

සම්ම, සබඳ; අහම්පි, මමද; සබ්බපාණීනං, සියලු සත්වයන්ට; අහිංසා, හිංසා නො කරන්නෙම්; අපෙපාසුකෙකා, උත්සාහ නො කරන්නෙම්; නිරාසඞ්කී, ආශඞ්කාවක් නැත්තෙම්; අසොකො, ශොකයක් නැත්තෙම්; අකුතො භයො, කිසිතෙනකින් භය නැත්තෙම්; භුඤ්ජාමි, අනුභව කෙරෙමි.

1470 සො කරස්සු ආනුභාවං විනිවත්තස්සු සිලියං
අහිංසාය චරං ලොකෙ පියො හොහිසි මම්මිව.

සො, හේ තෝ; ආනුභාවං කරස්සු, ව්‍යර්ථකර; සීලියං, සවකීය වූ දුශ්ශීල සභාවය; විනිවත්තස්සු, ඉක්ම පවතු මෙසේ කල්හි; අහිංසාය, අවිහිංසාවෙන් යුකතව; ලොකෙ, ලෙව්හි; චරං, ඇවිදිනෙහි; මං ඉව,මා හා සදෘශ වූ යෙහි;පියො හොහිසි,ලොවට ප්‍රිය වන්නෙහි.

1471 යො න හනති න ඝාතෙති න ජිනාති න හාපයෙ
මෙත්තාංසෙ සබ්බභූතෙසු වෙරං තස්ස න කෙනචීති.

යෙ, යමෙක් තෙම; න හනති, පරහිංසාවක් නො කෙරේද; න ඝාතෙති, විනාසයක් නො කෙරේද; න ජිනාති, අනුන්ගේ ධන හානියක් නො කෙරේද; න හාපයෙ, අනිකකු ලවා හානියක් නො කරවාද; සබ්බභූතෙසු, සියලු සත්වයන් කෙරෙහි; මෙත්තාංසෙ, මෛත්‍රීභාගයක් ඇත්තේද හෙවත් සර්වසත්වයන් කෙරෙහි මෛත්‍රී කෙරේද; තස්ස, ඔහට; කෙනචි, කිසිවක්හු හා ද; න වෙරං, වෛර යෙක් නැති.

445 චක්කවාක ජාතකයයි.

1472 සච්චං කිර තිම්පි හුරිපඤ්ඤ
යා තාදිසී සිරිධිතිමුතී ව
න තායතෙහාවවසූපනීතං
යෝ යවකං භුජසි අපපසූපං.

හුරිපඤ්ඤ, බොහෝ වූ ප්‍රඥ ඇති; ත්වං, තෝ; අපපසූපං, මෘදු නෑත්තා වූ; යවකං, යවසාලේ බත්; භුජසි, අනුභව කරන්නෙහිද එසේ වූ; අභාවවසූපනීතං, අභාවවසඟ බවට පැමිණියා වූ හෙවත් විපත්තියට පැමිනියා වූ තා; තාදිසී, එබඳු වූ; සිරි, ශ්‍රීද; ධිතී, එබඳු වූ ධෛර්‍යය ද; මුති ච, එබඳු වූ සමාහිතශක්තිය ද; න තායතෙ, රක්ෂා නො කෙරෙයි එසේ හෙයින්; සච්චං කිර, සැබෑය හෙවත් ශ්‍රීමත් බව උත්තමය ප්‍රඥවත් බව නිතය ඇත සෙනසුන්ගේ මේ මතය සැබෑවි.

1473 සුඛං දුක්ඛෙන පරිපාචයන්තෝ
කාලාකාලං විචිනං ඡන්ද ඡන්නෝ
අත්ථස්ස මාරුති අවාපුරන්තෝ
තෙනාහං තුස්සාමි යවොදනෙන.

අහං, මම; දුක්ඛෙන, කායිකචෛතසිකදුක්ඛයෙන්; සුඛං, පුරාතනසුඛය; පරිපාචයන්තෝ, මුහුකුරුවන්නෙම් හෙවත් වඩන්නෙම්; කාලාකාලං, කල් නොකල් දෙන හෙවත් මේ සැඟවී ඇවිදින්ට කලැ මේ නො සැඟවී ඇවිදින්ට කලැයි කාලාකාලය; විචිනං, සිතන්නෙම් හෙවත් පරීක්ෂා කරන්නෙම්; ඡන්ද, මාගේ අභිප්‍රාවසයෙන්; ඡන්නෝ, සැඟවුනෙම්; අත්ථස්ස, අභිවෘද්ධියට; මාරුති, කාරණ සඞ්ඛ්‍යාත වූ මාරයන්; අවාපුරන්තෝ, විවෘත කරන්නෙම් යම් හෙයකින් වෙසෙම්ද; තෙන, ඒ කාරණයෙන්; යවොදනෙන, යවසාලේ බතින්; තුස්සාමි, සතුටු වෙමි.

1474 කාලච ඤත්වා අභිජිහනාය
මනෙනහි අත්ථං පරිපාචයිත්වා
විජම්භිස්සං සිහවිජම්භිතානි
නාසීඩියා දක්ඛසි මං පුනාපි.

අභිජිහනාය, ජයග්‍රහණයට; කාලං; කාල; ඤත්වා, දැන; මනෙනහි; මාගේ ඥානයෙන්; අත්ථං, මාගේ පුරාතන යසස; පරිපාචයිත්වා, වඩා;

සිහවිජමහිතානි,සිංහවිජාමහතය;විජමහිසසං,විජාමහතය කෙරෙමි; පුනපි, නැවතද; තාය ඉඩියා, ඒ පුරුතන සමාඩියෙන් යුකත වූ; මං, මා; දකඛසි, (තෝ) දක්නෙහි.

1475 සුඛී හි එකෙ න කරොනති පාපං
අවණණසංයොග භයා පුනෙකෙ
පහූ සමානො විපුලත්ථචිනති
කිං කාරණා මෙ න කරොසි දුකඛං.

සුඛී, සුඛිත වූ; එකෙ හි, සමහර කෙනෙක් වනාහි; පාපං, පව්; න කරොනති,නො කෙරෙති; පුන,නැවත; එකෙ,සමහර කෙනෙක්; අවණණසංයොගභයා, අපකීර්තියක් හා එක් වෙම් යේ හෝසි යන භීතින් පව් නොකෙරෙති (තෝ වනාහි); පහූ සමානො, ප්‍රබල සභාවයෙහි; විපුලත්ථචිනති, බොහෝ වූ අර්ථචින්තනය කරන්නෙහි (එසේ වූ තෝ); මෙ, මට; කිං කාරණා, කවර කාරණයෙන්; දුකඛං, දුකක්; න කරොසි, නො කෙරෙහිද හෙවත් මාගේ රාජ්‍යග්‍රහණ යෙන් මට දුක් නො කෙරෙහිද.

1476 න පණ්ඩිතා අත්තසුඛස්ස හෙතු
පාපානි කම්මානි සමාචරන්ති
දුකෙඛන ඵුඨා ඛලිතාපි සන්තා
ඡන්දූ ච දෙසා න ජහන්ති ධම්මං.

පණ්ඩිතා, ප්‍රාඥයෝ; අත්තසුඛස්ස හෙතු, ආත්මසුඛයක් හෙතු කොටගෙන හෙවත් තමන්ට සුවදෙම්හයි; පාපානි කම්මානි, පාප කර්මයන්; න සමාචරන්ති,නො කෙරෙති, දුකෙඛන,කායික චෛතසික දුකඛයෙන්; ඵුඨා, පහරණ ලද්දා වූ; ඛලිතාපි සන්තා, ඛලිත වූ සභාව ඇත්තාද වූ හෙවත් ඛලිතාව විපත්තියෙහි දිහිටි සභාව ඇත්තාද වූ; ඡන්දූ ච, රාගයකින්ද;දෙසා ච, වෛෂය කින්ද; ධම්මං, කුලක්‍රමාගත ධර්මය ද සුචරිත ධර්මයද; න ජහන්ති, නො හරිත්.

1477 යෙන කෙනචි වණෙණන මුදුනා දාරුණෙන වා
උඩරෙ දීනමත්තානං පජඡා ධම්මං සමාචරෙ.

මුදුනා, මොලොක් වූ ද; දාරුණෙන වා, දරුණු වූ ද යන; යෙන කෙනචි වණෙණන, යම් කිසි කාරණයෙකින්;දීනං, බැගෑ වූ; අත්තානං, තමා; උඩරෙ, උදුරන්නේය හෙවත් නහා ගන්නේය; එසේ දුකින් මුකතව සිට; පජඡා, පසුව; ධම්මං, සුචරිත ධර්මය; සමාචරෙ, කරන්නේයි.

1478 යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා
න තස්ස සාඛං භඤ්ඤය්‍ය මිත්තදුභී හි පාපකෝ.

යස්ස රුක්ඛස්ස, යම් වෘක්ෂයක්හුගේ; ඡායාය, සෙවනෙහි; නිසීදෙය්‍ය වා, හුන්නේ වී නම් හෝ; සයෙය්‍ය වා, හොත්තේ වී නම් හෝ; තස්ස, ඒ වෘක්ෂයාගේ; සාඛං, ශාඛාවක්; න භඤ්ඤය්‍ය, නො බිඳිනේය කුමක් හෙයින්ද යත්? ඉදින් බුන්නේ වී නම්; පාපකෝ, පව්ටු හෙතෙම; මිත්තදුභී හි, මිත්‍රද්‍රෝහිම වෙයි.

1479 යස්ස හි ධම්මං මනුජෝ විජඤ්ඤා
යෙ චස්ස කඞ්ඛං විනයන්ති සන්තෝ
තං හිස්ස දීපච්ච පරායනච්ච
න තෙන මිත්තං ජරයෙථ පඤ්ඤා.

මනුජෝ, පුරුෂ තෙම; යස්ස හි, යම්ක්හු කෙරෙහි; ධම්මං, ධර්මය හෙවත් කාරණය; විජඤ්ඤා, දන්නේද; යෙ ච සන්තෝ, යම් සත්පුරුෂකෙනෙක්; අස්ස, මේ පුරුෂයාගේ; කඞ්ඛං, ශාඞ්කාව; විනයන්ති දුරුකෙරෙද්ද; තං හි, ඒ සෑහ දුරු කිරීම වැනැහි; අස්ස, මේ ශාඞ්කාවෙන් දුරු වූ පුරුෂයාට; දීපං වා, පිහිට නමුදු වෙයි; පරායනච්ච, පිළිසරණ නමුදු වෙයි එසේ හෙයින්; තෙන, ඒ ආචාර්‍යයිව සිටි පුරුෂයා හා සමඟ; මිත්තං, මිත්‍රභාවය; පඤ්ඤා, ප්‍රඥාවන්ත තෙම; න ජරයෙථ, නො දිර වන්නේය හෙවත් මිත්‍රභාවය නො හරනේයි.

1480 අලසෝ ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතෝ පබ්බජිතෝ න සාධු
රාජා න සාධු අනිසම්මකාරී
යෝ පණ්ඩිතෝ කොධනෝ සෝ න සාධු.

ගිහී, ගෘහස්ථ තෙම; කාමභොගී, කාමානුභව කරන්නේ; අලසෝ, හීන වීර්‍ය්‍ය වී නම්; න සාධු, යහපත් නො වෙයි; පබ්බජිතෝ; ප්‍රව්‍රජිත තෙම; අසඤ්ඤතෝ, සඤ්ඤතභාවී නොවේ නම්; න සාධු, මනා නො වෙයි; රාජා, රජ තෙම; අනිසම්මකාරී, පරීක්ෂා කාරී නො වේ නම්; න සාධු, නො මැනව; යෝ පණ්ඩිතෝ, යම් ප්‍රාඥයෙක්; කොධනෝ, කිපෙන සුලු වී නම්; සෝ, ඒ කිපෙන සුලු ප්‍රාඥ තෙම; න සාධු, මනා නො වෙයි.

1481 නිසම්ම ඛත්තියෝ කයිරා නානිසම්ම දිසම්පති
නිසම්මකාරිනෝ රාජ යසෝ කිත්ති ච වඩ්ඪතීති.

ඛත්තියෝ, ක්ෂත්‍රිය තෙම; නිසම්ම, කාරණා පරීක්ෂා කොට; කයිරා, කරන්නේය; නානිසම්ම, පරීක්ෂා නො කොට නො කරන්නේය; ඒ කුමක් හෙයින්ද යත්? රාජ, රජ; නිසම්මකාරිනෝ, පරීක්ෂා කාරිහට; යසෝ, යසසද; කිත්ති ච, කීර්තියද; වඩ්ඪති, වඩනේසි.

446 භූරිපඤ්හ ජාතකය යි.

1482 කිංසු නරෝ ජපපමධිච්චකාලෙ
කං වා විවජ්ජං කතමං වා සුතානං
සෝ මච්චෝ අස්මිං ච පරම්හි ලෝකෙ
කථං කරෝ සොත්ථානෙන ගුත්තෝ.

නරෝ, මඬගල කැමැත්තා වූ පුරුෂ තෙම; කාලෙ, මඬගල ප්‍රාප්තිනා කාලයෙහි; කිංසු ජපපං, කවර නම් ජපයෙක් හෙවත් කුමක් නම් ජපකරන්නේ; කං වා විවජ්ජං, කවර නම් වෙදයක් හෝ; සුතානං, ශ්‍රුතයන් අතුරෙන්; කතමං වා, කවරක් හෝ; අධිච්ච, හදාරන්නේද; සෝ මච්චෝ, ඒ මඬගලාපේක්ෂී පුරුෂ තෙම; අස්මිං ලොකෙ, මේලෙව්හිද; පරම්හි ච, පරලෙව්හිද; කථං කරෝ, මේ ජපාදීන් අතුරෙන් කුමකින් කුමක් කරන්නේ; සොත්ථානෙන, සවස්ථානයෙන් හෙවත් සවස්ති භාවය ඵලවන්නා වූ මඬගලයෙන්; ගුත්තෝ, රක්ෂිතවන්නේද.

1483 යස්ස දෙවා පිතරෝ ච සබ්බෙ
සිරිංසපා සබ්බභූතානි චාපි
මෙත්තාය නිච්චං අපචිතානි හොන්ති
භූතෙසු වෙ සොත්ථානං තදාහු.

සබ්බෙ දෙවා, බ්‍රහ්මාවු දෙවතාවන් ආදි කොට ඇති සියලු දෙවිතාවෝද; පිතරෝ ච, සියලු රූපාවචර බ්‍රහ්මයෝද; සිරිංසපා,

සියලු දිසී ජානිහුද;සබ්බභූතානි වාපි, මොවුන් කෙරෙන් අමිශ්‍රව වූ සියලු සත්ත්වයෝද යන මොහු; යසස,යශස් හුගේ; මෙත්තාය, මෛත්‍රී චිත්තයෙන්; අපචිතානි හොත්ති, පූජනා ලද්දාවූ නම්; තං, ඒ; භූතෙසු, සියලු භූතයන් කෙරෙහි;සොභනං, පූරුෂයන්ට මඩනා නම් වෙයි; ආහු, කියත්.

1484 යො සබ්බලොකස්ස නිවාතවුත්ති
ඉත්ථි පුමානං සහ දූරකානං
ඛන්තා දුරුත්තානං අපපටිකූලවාදී
අධිවාසනං සොභනං තදාහු.

යො, යමෙක් තෙම; සබ්බලොකස්ස, සියලු ලොකයා හට; නිවාතවුත්ති, මෛත්‍රීන් මුදු සිත් ඇති බැවින් නිවප්‍රවෘත්ති ඇතිව පවතීද; සහ දූරකානං,බාලයන් සහිත වූ; ඉත්ථිපුමානං, සත්‍රී පුරුෂයන්ගේ; දුරුත්තානං, දුරුක්ත වචනයන් සම්බන්ධව; ඛන්තා, ක්ෂමා කරන්නේද; අපපටිකූලවාදී, අනුකූල වූ වචන ඇත්තේද; තං අධිවාසනං, ඒ ක්ෂමා කිරීම; සොභනං, පූරුෂයා හට කිරපරාධ වූ මඩනා යයි; ආහු, කියත්.

1485 යො නාවජානාති සහායමත්තා
සිපෙන කුල්‍යාහි ධනෙන ජච්චා
රුචිපඤ්ඤඤ අත්ථකාලෙ මුතීමා
සහායෙසු වෙ සොභනං තදාහු.

යො යමෙක් තෙම්; සහායමත්තා, සහායන් කෙරෙහිද සහායමාත්‍රයන් කෙරෙහිද; සිපෙන, ශිල්පයෙන් හෝ; කුල්‍යාහි, කුලීන භාවයෙන් හෝ; ධනෙන, වසතුවෙන් හෝ; ජච්චා, ජාතියෙන් හෝ; නාවජානාති, අවඥා නො කෙරේද; රුචිපඤ්ඤඤ, සුන්දරප්‍රඥා ඇත්තේද; අත්ථකාලෙ, ඒ මිත්‍රයන්ට වැඩකට සුදුසු කාලයෙහි; මුතීමා, අර්ථය පිරිසිඳ විචාරන්නට සුදුසු සමාධිශක්ති ඇත්තේද මෙන්; සහායෙසු,සහායයන් කෙරෙහි;තං,ඒ අවඥා නො කිරීම;සොභනං, ඒ හට මඩනා යයි; ආහු, කියත්-මෙහි මැලීකෙළියෙහි පවත් මෙන පූරුද්ද සහාය නම් වෙයි.

1486 මිත්තානි වෙ යස්ස භවන්ති සන්තෝ
සං විස්සත්ථා අවිසංවාදකස්ස
න මිත්ත දුභී සංභාගං ධනේන
මිත්තේනස්සු වෙ සොභනානං තදාහු.

අවිසංවාදකස්ස, අවිසංවාදසවරූප වූ හෙවත් තුවජ්සවරූපතෙ, වන්නා වූ; යස්ස, යමක් හට; සන්තෝ, නුවනැත්තා වූ සත් පුරුෂයෝ; වෙ, එකාන්තයෙන්; මිත්තානි භවන්ති, මිත්‍රවෙද්ද; සංවිස්සත්ථා, අතිසයින්ම විශ්වාස වෙද්ද හෙවත් ගෙට වැද කැමැත්තක් කැමැති පරිද්දෙන් ගන්නට සුදුසු වෙද්ද එසේම යමෙක් නෙම; න මිත්තදුභී, මිත්‍රද්‍රොහි නො වේද; ධනේන සං විභාගං, වසතුවෙන් සං විභාගී වේද අනුභව කරන සුලුද ඕහට; මිත්තේනස්සු, මිත්‍රයන් නිමිත්ත කොට ගෙන ලැබිය යුතු වූ; තං, ඒ විශ්වාසභාවය; සොභනානං, මඩහල යයි; ආහු, කියත්.

1487 යස්ස භරියා තුල්‍යවයා සමගතා
අනුබ්බතා ධම්මකාමා * පජාතා
කොලිනියා සීලවතී පතිබ්බතා
දාරෙසු වෙ සොභනානං තදාහු.

යස්ස, යමක්හුගේ; භරියා, භාර්‍යාව; තුල්‍යවයා, සම වූ වයස් ඇත්තීද; සමගතා, සමගිව වසාද; අනුබ්බතා, අනුවපවත්තීද; ධම්ම කාමා, ත්‍රිවිධසුචරිතධර්මයන් කැමැත්තීද; පජාතා, පුත්‍රවත්ද; කොලිනියා, කුලීනද; පතිබ්බතා, පතිව්‍රතාධර්මය රක්ෂා කරන්නීද; දාරෙසු, එබදු ගුණයෙන් යුකත වූ අඹුවන් කෙරෙහි; තං, ඒ; සොභනානං, සොභිභාවයයි; ආහු, කියත්.

1488 යස්ස රාජා භූතපති යසස්සී
ජානාති සොවෙය්‍ය පරක්කමඤ්ච
අවෙජ්ඣතා සුහදයං මමත්ති
රාජූසු වෙ සොභනානං තදාහු.

---

* ස ජාතා-මරමම,

භූතපතී, ජනෙශ්වර වූ; යසසසී, යසසසී වූ; රාජා, රජ තෙම; යසස, යමක්හුගේ; සොවෙය්‍යං, සුචිභාවයද; පරක්කමව, වික්‍රමයද; ඤාතාති,දනීද; මම, මට; සුහදයං, සුහෘදයයි-මෙතෙම මා හෙරෙහි පක්ෂපාත බවක් ඇත්තේයයි; අවෙජ්ඣතා, අවෙධි භාවයෙන් හෙවත් නොවෙනස් බැවින්; ඤාතාති, දනීද; රාජුසු, රජ්ජුරුවන් කෙරෙහිලා; වෙ, එකාන්තයෙන්; තං සොත්‍ථානං, ඕ හට ඒ මඟුල යයි; ආහු, කියත්.

1489 අන්නාව, පානාව දදාති සඛො
මාලාව ගන්ධාව * විලෙපනාව
පසන්නාචිත්තෙනා අනුමොදමානො
සග්ගෙසු වෙ සොත්‍ථානං තදාහු.

සඛො, සැදැහැ ඇත්තේ; පසන්නාචිත්තෙනා, ප්‍රසන්න සිත් ඇත්තේ; අනුමොදමානො, සතුටු වන්නේ; අන්නා ව, හොජනයද; පානව, පානයද; ගන්ධව, සුවඳද; මාලව, මල්ද; දදාති, දෙන්නේ වී නම්;තං,ඒ; සග්ගෙසු, සවඟියෙහි ලා;වෙ,එකාන්තයෙන්;සොත්‍ථානං, සවසථාන යයි; ආහු, කියත්.

1490 යමරියධමෙමන පුනන්නි වුඛා
ආරාධිතා සම්මවරියාය සන්තෙනා
බහුස්සුතා ඉසයෝ සීලවන්තෙනා
අරහන්ත මජ්ඣ සොත්‍ථානං තදාහු.

වුඛා, ඥානවෘඛ වූ; සම්මවරියාය, සම්‍යක් ප්‍රතිපත්තීන්; ආරාධිතා, ආරාධනා කරන ලද්ද වූ; සන්තෙනා, සත්පුරුෂ වූ; බහුස්සුතා, ප්‍රතිවෙධ වශයෙන් බහුශ්‍රැත වූ; සීලවන්තෙනා, ආර්‍ය්‍යශීල ඇත්තා වූ; ඉසයෝ, ඍෂීහු; යං, යමක්හු; අරියධමෙමන, උත්තමධර්මයෙන්; පුනන්නි, පවිත්‍රවන්නාහු නම්; තං, ඒ; අරහන්තමජ්ඣ, රහතුන් කෙරෙහි ලා විය යුතු වූ; සොත්‍ථානං, සවසථ යයි; ආහු, කියත්.

1491 එතානි ඛො සොත්‍ථානානි ලොකෙ
විඤ්ඤූපසත්‍ථානි සුබ්‍රූයානි
තානීධ සෙවෙය්‍ය නරො සපඤ්ඤු
නහි මඞ්ගලෙ කිඤ්චනමත්ති සඤ්ඤති.

---

* විඤ්ඤාණව-මරම්ම.

එතානි ඉමානි, මෙකී මඞ්ගලයෝම; **ලොකෙ**, ලොක යෙහිලා; **විඤ්ඤූ**, පණ්ඩිතයන්; **පසංසන්ති**, ප්‍රශංසා කරත්; **දිට්ඨමඞ්ගලා**, දිට්ඨමඞ්ගලයන්; **සුඛුද්‍රයානි**, සුඛොදුරු යට කාරණයහ එ‍ෙහයින්; **සුපඤ්ඤා නරෝ**, ප්‍රඥා සම්පන්න වූ පුරුෂ තෙම; **ඉධ**, මෙහිලා; **හානි**, යථොක්ත ඒ මඞ්ගලයන් ම; **සෙවෙය්‍ය**, සෙව්නේය; මඞ්ගලෙහි, මෙයින් පිටත් දෘෂ්ටමඞ්ගලයන් අතුරෙහි; **සච්චා**, සත්‍ය වූ කිසි මඞ්ගලයක්; **නහි අත්ථි**, නොම ඇති; **මෙහි "ඉති"** යනු අවධාරණයෙහි වැටේ.

447 මහාමඞ්ගල ජාතකයයි.

1492 උළුහි කණ්හ කිං සෙසි කොඅත්ථො සුපනෙන තෙ
යොපිතායං සකො භාතා හදයං වක්ඛුච දක්ඛිණං
තස්ස වාතා * බලීයන්ති සතො ජපති කෙසව.

කෙසව, කෙශවය; **තෙ**, තාගේ; **හදයං ඉව**, හෘදය වැනි වූ; **දක්ඛිණං චක්ඛුං ඉව**, දකුණැස හා සම වූ; **සතො**, සත්‍යනම් වූ; **යෝ අයං සකෝ භාතා**, යම් මේ සවකිය වූ භ්‍රාතෘවෙක් ඇද්ද; **තස්ස**, ඔහුගේ හෘදය; **වාතා**, අපසමාරුසඛ්‍යාත වාතයෝ; **බලීයන්ති**, පැතිරෙති; **ජපති**, බෙණෙයි හෙවත් සසත මට දෙයි කියා තත් දෙඩයි එසේ හෙයින්; **කණ්හ, කණ්හය**; **උළුහි, නැඟිසිටු**; **කිං සෙසි**, කුමට වැද හොවීද; **තෙ**, තාගේ; **සුපනෙන්පි**, නිදීමෙන්; **කෝ අත්ථෝ**, කවර නම් වැඩෙක් ද.

1493 තස්ස තං වචනං සුත්වා රොහිණෙය්‍යස්ස කෙසවෝ
තරමානරූපෝ වුට්ඨාසි භාතුසොකෙන අට්ටිතෝ.

තස්ස රොහණෙය්‍යස්ස, ඒ රොහණෙය්‍ය නම් තැනැත්ත වූ ගේ; **තං වචනං**, ඒ අනන්තරොක්ත වචනය; **සුත්වා, අසා**; **තරමානරූපෝ**, සුහුසුලු වූ සවරූප ඇති; **කෙසවෝ**, කෙසව තෙම; **භාතුසොකෙන අට්ටිතෝ**, භ්‍රාතෘශොකයෙන් පීඩිත වූ යේ; **උට්ඨාසි**, නැඟී සිටියේ.

1494 කිනනු උම්මත්තරූපොව කෙවලං චාරකං ඉමං
සසෝ සසොති ලපසි නො නු තෙ සසමාහරි.

---

* බලීයන්ති-සම්හර.

කිනහු, කිමෙක්ද; උම්මත්තරූපොව; උන්මත්තකයක්හු මෙන්; කෙවලං,සියලු; ඉමං චාරකං; මී චාරවතී නුවර ඇවිදිනෙහි; සසෝ සසොහි, සසය සසයයි; ලපසි, දෙඩවන්නෙහි; කොහු, කවරෙක් වනාහි; තෙ, තාගේ; සසං, සසයකු; ආහරි, ගෙනායේද-කවරෙකු විසින් තොපගේ සසකයෙක් ගන්නා ලද්දේදැ. මෙහි"චාරකං"යනු අපෙක්ෂාවෙන් "අනුවිචරි" යන්නක් අපෙක්ෂා කටයුතු.

1495 සොවණ්ණමයං මණිමයං ලොහමයං අථ රූපිමයං
සඞ්ඛසිලා පවාලමයං කාරයිස්සාමි තෙ සසං.

1496 සන්ති අඤ්ඤපි සසකා අරඤ්ඤ වනගොචරා
තෙපි තෙ ආනයිස්සාමි කිදිසං සසමිච්ඡසි.

1497 නවාහමෙතෙ ඉච්ඡාමි යෙ සසා පඨවිං සිතා
වන්දතො සසමිච්ඡාමි තං මෙ ඔහර කෙසව.

සොවණ්ණමයං, සවණ්ණමය වූද; මණිමයං, මැණික්මය වූද; ලොහමයං, ලොහමය වූද; අථ, නැවත; රූපිමයං, රජතමය වූද; සඞ්ඛසිලාපවාලමයං, සඞ්ඛමය වූද ශිලාමය වූද ප්‍රවාලමය වූද; සසං, සසකයන්හු; තෙ, තට; කාරයිස්සාමි, කරවම්ද නොහොත්; වන ගොචරා, වනගොචර වූ හෙවත් වෙනෙහි වසන්නා වූ; අඤ්ඤපි සසකා, කීවවුන් කෙරෙන් පිටත් අනික් සසක නොනකුත්; සන්ති, ඇත; තෙ, තට; තෙපි, ඒ සසකයන්ද; ආනයිස්සාමි, ගෙනෙම්ද; (තෝ වනාහි)කීදිසං සසං, මෙකී සාවුන් කෙරෙන් කෙබඳු වූ සසක යක්හු; ඉච්ඡසි, කැමැත්තෙහිද; කෙසව, කෙසවය; යෙ සසා, යම් සසක කෙනෙක්; පඨවිං සිතා, පෘථිවිය ආශ්‍රය කොළෝද; එතෙ, ඔවුන් අතුරෙන්; අහං, මම; න ඉච්ඡාමි, (සසකයෙකු) නො කැමැත්තෙමි; (වැලි කවරසසකයකු කැමැති වෙම්ද යත්) වන්දතො, වඳුයා කෙරෙන්; සසං,සසකයා; ඉච්ඡාමි, කැමැත්තෙමි; තං, ඒ සසකයා; මෙ, මට; ඔහර, බහා දේ.

1498 සො නූන මධුරං ඤාති ජීවිතං විජහිස්සසි
අපත්තියං යො පත්ථයසි වන්දතො සසමිච්ඡසි.

ඤාති, ප්‍රියබාන්ධවය; යො, යම්බඳු වූ තෝ; අපත්තියං, නො පැතිය යුතු වසතුවක්; පත්ථයසි, ප්‍රාර්ථනා කෙරෙහි; චන්දතො, චන්ද්‍රයා කෙරෙන්; සසං, සසතායා; ඉච්ඡසි, කැමැත්තෙහිද; සො, එසේ ප්‍රාර්ථනා කරන්නා වූ තෝ; නූන, එකාන්තයෙන්; මධුරං, මධුර වූ; ජීවිතං, තාගේ ජීවිතය; විජහිස්සසි, හරනෙහි.

1499 එවං වෙ කණ්හ ජානාසි යදඤ්ඤමනුසාසසි
කසමා පුරෙ මතං පුත්තං අජ්ජාපිමනුසොචසි.

කණ්හ, කෘෂ්ණය; වෙ, ඉදින්; එවං ජානාසි, මෙසේ දන්නෙහි වී නම්; යදි, ඉදින්; අඤ්ඤං, අනිකෙකුට; අනුසාසසි, මෙපරිදිදෙන් අනුසාසනා කරන්නෙහි වී නම්; කසමා, කවරහෙයකින්; පුරෙ, පළමුකොට; මතං, මලා වූ; පුත්තං, පුත්‍රයාට; අජ්ජාපි, අද දක්වා; අනුසොචසි, ශොක කෙරෙහිද-"අජ්ජාපිමනුසොචසි" කී තෙන "ම" යනු ආගමසි.

1500 යං න ලබභා මනුසෙසන අමනුසෙසන වා පුන
ජාතො මෙ මා මරි පුත්තෙනා කුතො ලබභා අලබභියං.

මෙ, මාගේ; ජාතො, උපන්නා වූ; පුත්තෙනා, පුත්‍රයෙක් තෙම; සුන, නැවත; මා මරි, නොමී යේ වසි කියා; මනුසෙසන වා, මිනිසකු විසින් ද; අමනුසෙසන වා, අමනුෂ්‍යයකු විසින් ද; යං, යම්කාරණයෙකින්; න ලබභා, ලබන්නට නො පිළිවන එසේ හෙයින්; අලබභියං, ලබන්නට නො පිළිවන් දෙයක්; කුතො ලබභා, කවර හෙයකින් ලැබියයුතුද.

1501 න ඔනනා මූලහෙසජ්ජා ඔසධෙහි ධනෙන වා
සක්කා ආනයිතුං කණ්හ යං පෙතමනුසොචසි.

කණ්හ, කෘෂ්ණය; යං පෙතං, මලා වූ යමක්හු; අනුසොචසි, අනුශොක කෙරෙහිද; (ඒ මලා වූ තාගේ පුත්‍රයා) මන්නා, මන්ත්‍රයෙන් හෝ; මූල හෙසජ්ජා, මූලහෙෂජ්‍යයෙන් හෝ; ඔසධෙහි, අනිත් කිසි ඖෂධය කින් හෝ; ධනෙන වා, වසතුයෙකින් හෝ ආනෙතුං, ගෙනෙන්නට; න සක්කා, නො පිළිවනි.

1502 ආදිත්තං වත මං සන්තං සතඝිත්තංව පාවකං
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

මෙහි අළු 715 වෙනි අඞ්කය ධරණ ගාථාවෙන් බලා දතයුතු.

1503 අබ්බහි වත මෙ සල්ලං යං මෙ හදයනිස්සිතං
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි

මෙහිද අළු 716 වෙනි අඞ්කය ධරන ගථාවෙන් බලා දතයුතු.

1504 සොහං අබ්බූළ්හසල්ලොසමි ඒතසොකො අනාවිලො
න සොචාමි න රොදාමි තව සුඛාන මානව.

මෙහිද අළු 717 වෙනි අඞ්කය ධරන ගාථාවෙන් බලා දතයුතු.

1505 එවං කරොනති සපඤඤු යෙ හොනති අනුකම්පකා
විනිවත්තනයනති සොකමහා ඝතො ජෙඨංව භාතරන්ති.

යෙ, යම් කෙනෙක්; අනුකම්පකා හොනති, ලොකානුකම්පක යෝ වෙද්ද; ජෙඨං භාතරං, ජ්‍යෙෂ්ඨභ්‍රාතෘහු; ඝතොව, ඝතයා මෙන්; සොකමහා, ශොකයෙන්; විනිවත්තයනති, ශොකී වූ ජන යන් පහකොරෙද්ද එබඳු වූ; සපඤඤු, ප්‍රඥසම්පන්න වූ; (තෙ, ඔහු තුමූ) එවං, කරොනති, මේ යට කී පරිදිදෙන් කරන්නාහුයි.

448 සත්ත ජාතකයයි.

දසක නිපාතයයි.

ආචාර්‍ය්‍ය රාජගුරුන් විසින් ලියන ලද "ජාතක කථා සන්ගහය"

මේ දසකනිපාතාවසානයෙන්

සම්පූර්ණ යි.

1506 තස්ස නාගස්ස විපවාසෙන
විරූළහා සල්ලකී ච කුටජා ච
කුරුවින්දකරවීරභිසසාමා ච
නිවාතෙ පුප්ඵිතා ච කණ්ණිකාරා.

තස්ස නාගස්ස, ඒ (මාගේ පුත්‍ර වූ) හස්තිරාජයාගේ; විපවාසෙන, වියොගයෙන්; සල්ලකී ච, ඉඳුසාලවෘක්ෂයෝද (ඉදුසල් ගස්ද) නොහොත් ඇඹෙල්ලගස්ද; කුටජා ච, සෙළිඳගස්ද; කුරුවින්ද, (සුවඳ සුඹුලු ඇති) කුරුඳුගස්ද; කරවීර, ඉලුක්ආදී මහා තෘණද; භිස, නෙලුම්ද; සාමා ච, ගොඩ හමුද; (ඝන මේ සියල්ල) විරූළහා, (මෙතෙකින්) වැඩෙන්නාහුය; නිවාතෙ, පළිතපාදයෙහි; කණ්ණිකාරා ච,(මාගේ පුත්‍රයා විසින් අතු බිඳ නො කන ලද)කිණිහිරි වෘක්ෂයෝද; පුප්ඵිතා, පුෂ්පිතවූ වාහු මෙන් වැඩෙන්නාහුය.

1507 නොවිදෙව සුවණ්ණකායූරා
නාගරාජං හරන්ති පිණ්ඩාය
ඝත්ථ රාජා රාජකුමාරෝ ච
භාවවමභිහෙස්සති * අසම්භීතෝ.

නොවිදෙව, කිසිතැනෙක්හි හෙවත් කිසියම් ගමක හෝ නුවරක; සුවණ්ණකායූරා, සවර්ණාභරණයෙන් යුක්ත වූ රාජරාජමහාමාත්‍යයෝ; නාගරාජං, (මාතිපොෂක) හස්තිරාජයා; පිණ්ඩාය,(රැගෙන වූ) භොජනයෙන්; හරන්ති,පොෂණය කෙරෙත්; ඝත්ථ, ඝම් හස්තිරාජයාහු පිටැ; රාජා, රජද; රාජකුමාරෝ ච, රාජ කුමාරද නිඳ,අසම්භීතෝ,භය රහිතව; භාවවං, (සතුරන්ගේ) සන්නා භය;අභිහෙස්සති, බිඳින්නේය.

1508 ගණ්හාහි නාග භඞ්ගං මා නාග කිසකෝ භව
† බහූනි රාජකිච්චානි තානි නාග කරිස්සසි.

නාග, හස්තිරාජය; භඞ්ගං, ආහාරය; ගණ්හාහි, ගනුව හෙවත් අනුභව කරව; නාග, හස්තිරාජය; කිසකෝ, (ආහාර අනුභව නොකිරීමෙන්) කෘශවූයෙහි; මා භව,නො වෙව; නාග, හස්තිරාජය; රාජකිච්චානි, රාජකෘත්‍යයෝ; බහූනි, බොහෝ වන්නාහුය; තානි, ඒ රාජකෘත්‍යයන්; කරිස්සසි, කරව.

* අසම්භිතෝ-මරම්ම.
† බහූනි රාජපිණ්ඩානි යානි නාග කරිස්සසි-සම්භර.

1509 සා නූනෙසා කපණිකා අඞ්කා අපරිනායිකා
ඛාණුං පාදෙන සටෙවති ගිරිං වණෙඞ්ගරණං පති.

නූන, එකාන්තයෙන්; කපණිකා, (පුත්‍රවියොගයෙන්) බැගෑ පත්වූ; අඞ්කා, අඞ්වූ, අපරිනායිකා, පිරිනමන්නෙක් නැත්තා වූ (මෙහෙයන්නෙක් නැත්තාවූ) සා එසා, (මාගේ මාතෘ වූ) ඒ මේ හස්තිනී තොමෝ; ගිරිං වණෙඞ්ගරණං පති, වණෙඞ්ගරණ පර්වතයට අභිමුඛව; (පර්වතපාදයෙහි කම්පාවෙමින්) පාදෙන, පාදයෙන්; ඛාණුං, කණු; සටෙවති,(හඬමින් ඒ ඒ තන්හි)ඝට්ටනය කරන්නීය.

1510 කාන්‍ර තෙ සා මහානාග අඞ්කා අපරිනායිකා
ඛාණුං පාදෙන සටෙවති ගිරිං වණෙඞ්ගරණං පති.

මහානාග, මහා හස්තිරාජය; අඞ්කා, අඞ්වූ; අපරිනායිකා, පිරිනමන්නෙක් නැත්තා වූ; (මෙහෙයන්නෙක් නැත්තා වූ) යම්ක් තොමෝ) ගිරිං වණෙඞ්ගරණං පති, වණෙඞ්ගරණ පර්වතයට අභිමුඛව (පර්වතපාදයෙහි කම්පාවෙමින්); පාදෙන, පාදයෙන්; ඛාණුං, කණු; සටෙවති,(හඬමින් ඒ ඒ තන්හි) ඝට්ටනයකරන්නීද. සා, ඕ තොමෝ; තෙ, තාගේ; කාන්‍ර, කවරක් වන්නීද;

1511 මාතා මෙ සා මහාරාජ අඞ්කා අපරිනායිකා
ඛාණුං පාදෙන සටෙවති ගිරිං වණෙඞ්ගරණං පති.

මහාරාජ,මහරජ්ජුරුවන් වහන්ස! අඞ්කා,අඞ්වූ; අපරිනායිකා, පිරිනමන්නෙක් නැත්තා වූ (මෙහෙයන්නෙක් නැත්තා වූ); මෙ, මාගේ; මාතා, මව් වූ; සා, ඕ තොමෝ; ගිරිං වණෙඞ්ගරණං පති, වණෙඞ්ගරණ පර්වතයට අභිමුඛව; (පර්වතපාදයෙහි කම්පාවෙමින්) පාදෙන, පාදයෙන්; ඛාණුං, කණු; සටෙවති,(හඬමින් ඒ ඒ තන්හි) ඝට්ටනය කරන්නීය.

1512 මුචථෙතං මහානාගං යොයං හරති මාතරං
සමෙතු මාතරා නාගො සහ සබ්බෙහි ඤාතිභි.

යො අයං, යම් මේ හස්තියෙක් තෙම; මාතරං, මව; හරති, පොෂණය කෙරේද; එතං මහානාගං, මේ මහා හස්තිරාජයා; මුචථ, (වහා) මුදා හරිව්; නාගො, හස්ති තෙම; සබ්බෙහි ඤාතිභි සහ, සියලු ඤාතීන් සහිතව; මාතරා, මව හා; සමෙතු, එක් වේවා.

1513 මුත්තෝ ච බඤ්ඤා නාගෝ * මුත්තෝ දමථෝ කුඤ්ජරෝ
මුහුත්තං අස්සාසයිත්වා අගමා යෙන පබ්බතෝ.

නාගෝ, හස්ති තෙම; බඤ්ඤා, බන්ධනයෙන්; මුත්තෝ ව, මිදුනේ; කුඤ්ජරෝ, කුඤ්ජර තෙම; දමථෝ, දමයෙන්; මුත්තෝ, මිදුනේ; මුහුත්තං, මොහොතක්කල්; අස්සාසයිත්වා, අස්වසා; (අස් වැසිලි ලබා) පබ්බතෝ, වණ්ණාරණ්‍ය පර්වතය; යෙන, යම් තැනෙක් හිද එතැන්හි; අගමා, ගියේය.

1514 තතෝ සෝ නළිනිං ගන්ත්වා සිතං කුඤ්ජරසෙවිතං
සොණ්ඩායුදකමාහිත්වා මාතරං අභිසිඤ්චථ.

තතෝ, ඉක්බිත්තෙන්; සෝ, ඒ හස්තිතෙම; සිතං, සිහිල් ජල යෙන් යුක්ත වූ; කුඤ්ජරසෙවිතං, හස්තීන් විසින් සෙවනය කරන ලද; නළිනිං, විලට; ගන්ත්වා, ගොස්; සොණ්ඩාය, සොඬින්; උදකං, ජලය; ආහිත්වා, ගෙන; මාතරං, මාතෘහස්තිනිය; අභිසිඤ්චථ, අභිෂෙක කෙළේය හෙවත් පැන් ඉස තෙමූයේය.

1515 කෝ යං අනරියෝ දෙවෝ අකාලෙන පවස්සති.
ගතෝ මෙ අත්‍රජෝ පුත්තෝ යෝ මයහං පරිචාරකෝ.

අකාලෙන, නොකල්හි; පවස්සති, වැසී කරන්නේද; අනරියෝ, අන්‍යායී වූ; අයං දෙවෝ, මේ දෙව් තෙම; කෝ, කවරෙක්ද; යෝ, යමෙක්; මයහං, මට; පරිචාරකෝ, පරිචාරකවිද හෙවත් උපස්ථායක වීද; මෙ, මාගේ; අත්‍රජෝ, අත්‍රජ වූ (සවකිය වූ); පුත්තෝ, පුත්‍ර තෙම; ගතෝ, ගියේය.

1516 උළෙහි අම්ම කිං සෙසි ආගතොත්‍යාහමත්‍රජෝ
මුත්තොමහි සාසිරූජෙන වෙදෙහෙන යසස්සිනා.

අම්ම, මැනියෙනි; උළෙහි, නැඟී සිටුව; කිං, කුමක් හෙයකින්; සෙසි, හෝනෙහිද; තෙ, නුඹවහන්සේගේ; අත්‍රජෝ, පුත්‍රවූ; අහං, මම; ආගතෝ, ආයෙමි; වෙදෙහෙන, ඥානසම්පන්න වූ; යසස්සිනා, මහත් පිරිවර ඇත්තා වූ; සාසිරූජෙන, කසිරජහු විසින්; (මඟුලෑතු බවට ගන්නා ලද්දේ නමුදු) මුත්තොමහි, (මම එයින්) මිදුනෙමි.

---

* මුත්තාමාදය කුඤ්ජරෝ-මරම්ම.

1517 චිරං ජීවතු සෝ රාජා කාසීනං රඨවඩ්ඪනෝ
යෝ මේ පුත්තං පමොචෙසි සඳ්ධ, වඩාපවාසිකානනී.

යෝ, යමෙක් තෙම; සඳ්ධ, සියලු කල්හි; වඩාපවාසිකං, වෘඩි ඝන්ට පුදන්නා වූ; මේ පුත්තං, මාගේ පුත්‍රයා, පමෝචෙසි, මිදුයේද; කාසීනං, කසිදෙශවාසීන්ගේ; රඨවඩ්ඪනෝ, රාෂ්ට්‍රවර්ධනය කරන්නා වූ; සෝ රාජා, ඒ රජ තෙම; චිරං, බොහෝ කාලයක්; ජීවතු, (නිරුපද්‍රැතව) ජීවත් වේවා.

449 මාතිපොසක ජාතකය.

1518 සුණෝහි මයහං වචනං ජනින්ද!
අත්ථෙන ප්‍රණහමහි ඉධානුපත්තෙනා
න බ්‍රාහ්මණෙ අඞ්කෙ තිඨමානෙ
ගන්තබ්බමාහු දිපදුත්තමෙඨ.!

ජනින්ද, ජනප්‍රධාන වූ මහරජ්ජුරුවන් වහන්ස; මයහං, මාගේ; වචනං, වචනය; සුණෝහි, ඇසුව මැනව; ප්‍රණහමහි, ප්‍රණහ වූ නුඹ්වහන්සේ කෙරෙහි; අත්ථෙන, එක් අර්ථයක් සඳහා; ඉධ, මෙහි; අනුපපත්තෙනා, පැමිණියෙම්-කරුණක් නැතුව ආයෙම් නොවෙමැයි කියයි; දිපදුත්තං, දෙපා ඇත්තවුන් අතුරෙහි; සෙඨ, ශ්‍රෙෂ්ඨ වූ මහරජ්ජුරුවන් වහන්ස; බ්‍රාහ්මණෙ, බ්‍රාහ්මණයන්ද; අඞ්කෙ, මඟින්ද; තිඨමානෙ, පැමිණ සිටින කල්හි; (ඔවුන් නො බලා); ගන්තබ්බං, යායුතුයයි; න ආහු, (පණ්ඩිතයෝ) නො කියත්.

1519 සුණෝමි නිඨාමි වදෙහි බ්‍රහ්මෙ!
යෙනාපි අත්ථෙන ඉධානුපත්තෙනා
කං වා කමත්ථං මයි පත්ථයානෝ
ඉධාගමෝ බ්‍රහ්මෙ! තදිඞ්ඝ බ්‍රූහි.

බ්‍රහ්මෙ, බ්‍රාහ්මණය; සුණෝමි, (තාගේ වචනය) අසමි; නිඨාමි, සිටිමි; වදෙහි, කියව; යෙනාපි අත්ථෙන, යම් අර්ථයක් සඳහා; ඉධ, මෙහි; අනුපපත්තෙනා, පැමිණියෙහිද; බ්‍රහ්මෙ, බ්‍රාහ්මණය; මයි, මා කෙරෙහි; කං වා, කුමක් හෝ; පත්ථයානෝ, ප්‍රාර්ථනා කරන්නෙහි; කමත්ථං, කවර අර්ථය කට; ඉධ, මෙහි; ආගමෝ, ආයෙහිද; තං, එය; ඉඞ්ඝ, වහාම නොහොත් එකානතයෙන්ම; බ්‍රූහි, කියව.

1520 දදුගි මෙ ගාමවරානි පච
දුසිසතං සත්තගවං සතානි
පරො සහස්සං ව සුවණ්ණනිකෙඛ
භරියා ච මෙ සාදිසි වෙ දදුගි.

මෙ, මට; පචගාමවරානි, ගම්වරපසන්ද; දුසිසතං, දුසින් සියයක්ද; සත්තගවං සතානි, සත්සියයක් ගවයන්ද; පරොසහස්සං, සහශ්‍රයෙන් අධික වූ; සුවණ්ණනිකෙඛ, සවණිණ නිෂ්කයන්ද-රන් පස්කලඳක් සවණිණයකි සවණිණපසක් නිෂ්කයයකි රන්පස් විසි කලඳකැයි සේසි; දදුගි, දුනමැනව; මෙ, මට; සාදිසි, (රූපවණිණ කුලප්‍රදෙශයෙන් මා හා) සදෘශ වූ;වෙ භරියා ව,(මහත් යසස් ඇති) භාර්‍යාවන් දෙදෙනෙක්ද; දදුගි, දුනමැනව.

1521 තපො නු තෙ බ්‍රාහ්මණ හිංසරූපො
මන්තානු තෙ බ්‍රාහ්මණ චිත්තරූපා
යක්ඛා නු තෙ අස්සවා සන්ති කොචි
අත්ථං වා මෙ අභිජානාසි කත්තං.

බ්‍රාහ්මණ, බමුණ; තෙ, තාගේ; හිංසරූපො, බලවත් සවරූප වූ; තපො නු, ශීලාචාර ගුණසඞ්ඛ්‍යාත තපො කර්‍මයක් ඇත්තේද; නොහොත්; බ්‍රාහ්මණ, බමුණ; තෙ, තාගේ; චිත්තරූපා, විසිතුරු වූ; මන්තානු, සර්‍වාර්‍ථසාධක මන්ත්‍රකෙනෙක් ඇත්තාහුද; නොහොත්; තෙ, තාගේ; අස්සවා, වචනකාරී වූ කැමැති කැමැති දේ ගෙන දෙන්නා වූ; කොචි යක්ඛා නු, යම්කිසි යක්ෂකෙනෙක්; සන්ති, ඇත්තාහුද; නොහොත්; මෙ, මට; කත්තං, (තා විසින්) කරන ලද; අත්ථං වා, (යම්කිසි) අර්‍ථයක් හෝ; අභිජානාසි, දන්නෙහි දැ සි විචාරසි.

1522 න මෙ තපො අත්ථි න චාපි මන්තා
යක්ඛා ච මෙ අස්සවා නත්ථි කොචි
අත්ථම්පි තෙ නාභිජානාමි කත්තං
පුබ්බෙ ච ඛො සඞ්ගතිමත්තමාසි.

මෙ, මාගේ; තපො, තපොකර්‍මයක්; න අත්ථි, නොම ඇත; මන්තා, මන්ත්‍රයෝද; න චාපි, නොම ඇත; මෙ, මාගේ; අස්සවා, වචනකාරී වූ කැමැති කැමැති දේ ගෙන දෙන්නා වූ; කොචි යක්ඛා ච, කිසියම් යක්ෂ කෙනෙක්ද; නත්ථි, නැත; තෙ, නුඹවහන්සේට; කත්තං, (ම විසින්) කරන ලද; අත්ථම්පි, කිසි අර්‍ථයකුදු; නාභිජානාමි, නො දනිමි; පුබ්බෙ ච ඛො, පූර්‍වයෙහි; සඞ්ගතිමත්තං, (නුඹවහන්සේ හා) සමාගමය පමණක්; ආසි, විය.

1523 පඨමං ඉමං දස්සනං ජානතො මේ
න චාභිජානාමි ඉතෝ පුරත්ථා
අකඛාහි මේ පුච්ඡිතෝ එතමත්ථං
කදා කුහිං වා අහු සඞ්ගමෝ නෝ.

ජානතෝ, දන්නා වූ; මේ, මාගේ; ඉමං, මේ; පඨමං දස්සනං, (තාගේ)පළමුවෙනි දැකීම වෙයි; ඉතෝ පුරත්ථා, මෙයින් පූර්වයෙහි; න ච අභිජානාමි, (තා) නො හඳුනමි; කදා, කවර කලෙක්හි හෝ; කුහිං වා, කවර ස්ථානයෙක්හි හෝ; නෝ, අපගේ; සඞ්ගමෝ, සඞ්ගමය තෙම; අහු, වී දැයි; එතං අත්ථං, මේ කාරණය; පුච්ඡිතෝ, පුළුවුස්නා ලදි; මේ, මට; අකඛාහි, කියව.

1524 ගඞ්ගාරරාජස්ස පුරම්හි රම්මේ
අවසිම්හසේ තක්කසිලායං දෙව
තත්ථන්ධකාරම්හි තිමිසිකායං
අංසෙන අංසං සමඝට්ටයිම්හ.

දෙව, දෙවයන් වහන්ස! ගඞ්ගාරරාජස්ස, ගඞ්ගාර රජහුගේ; රම්මෙ, රම්‍ය වූ; තක්කසිලායං පුරම්හි, තක්සලා පුරයෙහි; අවසිම්හසෙ, විසූයෙමු; තත්ථ, එහි දී; තිමිසිකායං, බහලාන්ධකාර වූ රාත්‍රියෙහි; අන්ධකාරම්හි, අන්ධකාරයෙහි, අංසෙන අංසං, අංසයෙන් අංසය; සමඝට්ටයිම්හ, සංඝර්ෂණය කෙළෙමු.

1525 තෙ තත්ථ ඨත්වාන උභෝ ජනින්ද!
සාරාණීයං චිත්තසාරිම්හ තත්ථ
තාංයෙව නෝ සඞ්ගතිමත්තමාසි
තතෝ න පච්ඡා න පුරෙ අහොසි.

ජනින්ද, ජනෙන්ද්‍රයන් වහන්ස; තෙ උභෝ, ඒ අපි දෙදෙන; තත්ථ, එහි (අංසයෙන් අංසය පැහැර සිටි ස්ථානයෙහි); ඨත්වාන, සිට, තත්ථ, එහි දීම; සාරාණීයං, සිහිකළයුතු කථාවක්; චිත්තසාරිම්හ, කොටතිම වූ යෙමු; (මාගේ භික්ෂාභාජනය නුඹවහන්සේ විසින් බිඳින ලද්දේය එකල්හි මාගේ බත් මිළ දෙවයි කියෙමි නුඹ වහන්සේ වනාහි මට දැන් බත් මිළ දෙන්ට නොපිළිවන මම වනාහි කාසි රජහුගේ පුත්‍ර වූ ජුණහකුමාර නම් වෙමි, මා රාජ්‍යයෙහි පිහිටි කල්හි අවුත් මාගෙන් වසතු ඉල්ව වයි කියෙහි යන සිහිකළ යුතු කථාව කෙළෙමු යයි කීය) නෝ, අපගේ; තාංයෙව සඞ්ගතිමත්තං, එමසඞ්ගති මාත්‍රයම; ආසි, විය; තතෝ පච්ඡා, ඉන් පසුවද; න,(සඞ්ගතියෙක්)නුවූයේය; පුරෙ, ඉන් පෙරද; න අහොසි, (සඞ්ගතියෙක් එක්වීමෙක්) නුවූයේය.

1526 යදූ කදූවි මනුජෙසු බ්‍රහ්ම!
සමාගමෝ සප්පුරිසෙන හොති
න පණ්ඩිතා සඞ්ගතිසඤ්ඤතානි
පුබ්බෙ කතං වාපි විනාසයන්ති.

බ්‍රහ්ම, බ්‍රාහ්මණය; යදූ කදූවි, යම් කිසිකලෙක්හි; මනුජෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; සප්පුරිසෙන, සත්පුරුෂයා හා; සමාගමෝ හොති, සමාගමය වේද; පණ්ඩිතා, පණ්ඩිතයෝ; සඞ්ගති, (ඒ මොහොතෙහි කළ) සඞ්ගතිය හෝ; සඤ්ඤතානි, (විරකාලයක් කළ) සඤ්ඤය හෝ; පුබ්බෙකතං වාපි, පෙරකළ ගුණයක් හෝ; න විනාසයන්ති, නොනසත්.

1527 බාලා ව ඛො සඞ්ගතිසඤ්ඤතානි
පුබ්බෙ කතං වාපි විනාසයන්ති
අපපම්පි ධීරෙ සුකතං න නස්සති
තථා හි ධීරා සුකතඤ්ඤුරූපා.

බාලා ව ඛො, අඥානයෝ වනාහි; සඞ්ගති, (මොහොතක්කල් කළ) සමාගමය හෝ; සඤ්ඤානි, (විරකාලයක් කළ) මිත්‍ර සඤ්ඤය හෝ; පුබ්බෙ කතං වාපි, පෙරකළ ගුණය හෝ; විනාසයන්ති, නසත්; ධීරෙ, ප්‍රාඥයා කෙරෙහි; සුකතං, මනාකොට කරන ලද, අපපම්පි, සුවල්පවූද ගුණධර්මය; න නස්සති, නො නැසේ; තථාහි, එසේම කාරණයෙක් ඇත; ධීරා, ප්‍රාඥයෝ; සුකතඤ්ඤුරූපා, කළ ගුණ දන්නා සුභාව ඇත්තාහුය.

1528 දදාමි තෙ ගාමවරානි පඤ්ච
දාසීසතං සත්තගවංසතානි
පරොසහස්සං ච සුවණ්ණනික්ඛ
භරියා ච තෙ සාදිසි වෙ දදාමි.

මෙහි අට 1520 වෙනි ගාථාව බලා දතයුතු, දෙතැනක පෙනෙන "තෙ" යන්න හා "දදාමි" යන්නත් මෙහි වෙනසයි.

1529 එවං සතං හොති සමෙච්ච රාජ
නක්ඛත්තරාජරිව තාරකානං
ආපූරති කාසිපති තථා අහං
තයා හි මෙ සඞ්ගමෝ අජ්ජ ලද්ධොති.

රාජ, මහරජ්ජුරුවන් වහන්ස; සහං, සත්පුරුෂයන්ගේ; සමෙවව, (එක්වාරයෙක්හි පැමිණ ලබන ලද) සඞ්ගතිය නම්; එවං, මෙසේ; හොති, වෙයි; කාසිපති, කාසිදෙසාධිපති වූ තරෙක්ෂයන් වහන්සේ; තාරකානං, තාරකාවන්ගේ මධ්‍යයෙහි, නක්ඛත්තරාජ ඉව, (පැළුවියෙහි පවත් ක්‍රමයෙන් වැඩෙන්නා වූ) චන්ද්‍රයා මෙන්; ආපූරති, සම්පූර්ණවන්නේද; අහං, (අද භුඹවහන්සේ විසින් දෙන ලද ගම්වර ආදියෙන් සම්පූර්ණ වූ) මමද; තථා, එසේමය; තයාහි, භුඹවහන්සේ හා සමහ; සඞ්ගමෝ, සඞ්ගමය; අජ්ජ, අද; ලබ්භා, ලද්දේය—අද වනාහි මාගේ මන දෙල පිරුණු හෙයින් මවිසින් භුඹවහන්සේ හා සඞ්ගමය ලබන ලදැයි භුඹවහන්සේ හා මිත්‍රඵලය නිපනැයි කියයි.

450 ප්‍රණ්ණ ජාතකයයි.

1530 යසෝ කාරෝ පුඤ්ඤකාරොහමස්මි
සදත්ථුතෝ සමණ බ්‍රාහ්මණානං
මඝාරහෝ දෙවමනුස්සපූජිතෝ
ධම්මෝ අහං දෙහි අධම්ම!මඝවං

අහං, මම; යසෝ කාරෝ අස්මි, (දෙව්මිනිසුන්ට) යසස ගෙන දෙන්නෙක් වෙමි; පුඤ්ඤකාරෝ අස්මි, (එසේම දෙව්මිනිසුන්ට) පුණ්‍යය ගෙන දෙන්නෙක් වෙමි; සමණ බ්‍රාහ්මණානං, මහණ බමුණන් විසින්; සදත්ථුතෝ, සියලු කල්හි සතුති කරන ලද්දෙමි හෙවත් නිතර ප්‍රසංසා කරන ලද්දෙමි; මඝාරහෝ, මාඝීය ලැබීමට සුදුස්සෙමි; දෙවමනුස්සපූජිතෝ, දෙව්මිනිසුන් විසින් පුදන ලද්දෙමි; අධම්ම, අධම්මනම් දිව්‍යපුත්‍රය; අහං, මම; ධම්මෝ, ධම්ම නම් දිව්‍යපුත්‍රයෙමි එහෙයින්; මඝවා, මාඝීය; දෙහි, (මට) දෙව.

1531 අධම්මයානං දළ්හමාරුහිත්වා
අසන්තසන්තෝ බලවාහමස්මි
සකිස්සහෙතුමහි තවජ්ජ දජ්ජං
මඝවං අහං සම්ම අදින්නපුබ්බං.

(ධම්ම, ධම්මනම් දිව්‍යපුත්‍රය;) සෝ, හේමම්; අමහි, අධම්ම නම් දිව්‍යපුත්‍ර වෙමි; අහං, මම; දළ්හං, දැඩි වූ; අධම්මයානං, අධම්ම රථයට; ආරුහිත්වා, ආරුඬව; අසන්තසන්තෝ, සන්ත්‍රාසනැත්තේම්

හෙවත් භය නැත්තෙමි; බලවා අසමි, බලවත් වීමි; කිසාහෙතු, කුමක් හෙතුකොට ගෙන;අජ්ජ,අද;සම්ම,යහලුව; අහං,මම; අදින්නා පුබබං, (කිසිවෙකුට)ත්‍රුදුන් බිරූ; මගහං, මාගීය; තව, තට; දම්මි, දෙන්නෙම්ද—නො දෙන්නෙම්ම යයි අධම්මදිවසපුත්‍ර කී.

1532 ධම්මෝ හවේ පාතුරහොසි පුබ්බෙ
පච්ඡා අධම්මෝ උදපාදි ලොකෙ
ජෙට්ඨො ච සෙට්ඨො ච සනන්තනෝ ච
උයාසි ජෙට්ඨස්ස කණිට්ඨ! මග්ගා.

පුබ්බෙ, ප්‍රථම කල්පික කාලයෙහි; හවේ, එකාන්තයෙන්; ලොකෙ, ලොකයෙහි; ධම්මෝ, (දශකුශල කර්ම්මපථ) ධර්ම්මය තෙම; පාතුරහොසි, පහල වූයේය; පච්ඡා, (ඊට) පසුව; අධම්මෝ, අධර්ම්මය තෙම; උදපාදි, පහල වූයේය; එහෙයින්, ජෙට්ඨෝ ච, ජ්‍යෙෂ්ඨ වූයේද; සෙට්ඨෝ ච, ශ්‍රෙෂ්ඨ වූයේද;සනන්තනෝ ච, පුරාතන වූයේද ධර්ම්මය වෙයි;කණිට්ඨ,කණිෂ්ඨවූ අධම්මදිවසපුත්‍රය;ජෙට්ඨස්ස,ජ්‍යෙෂ්ඨවූ (ධර්ම්මදිවසපුත්‍රවූ) මට; මග්ගා, මාගීයෙන්; උයාසි, ඉවත්ව යව.

1533 න යාචනාය නපි පකිරූපා
අර්හාහි * වොහං දදෙය්‍යං මග්ගං
යුධඤ්ච නො † හොති උභින්නමජ්ජ
‡ යුධිසම්ං යො ජෙස්සති තස්ස මග්ගා.

අහං, මම; වෝ, තොපට; යාචනාය, යාචඤ්ඤාවෙන් හෙවත් ඉල්වීම හෙතුකොට ගෙන; මග්ගං, මාගීය; දදෙය්‍යං, දෙන්නෙම් නම්; න අරහති, සුදුසු නොවේ; නපි පතිරූපා, සුදුසු වචන කිමෙන් හෝ මාගීය ලැබීමට සුදුසු බැවින් හෝ දෙන්ට සුදුසු නො වේ; අජ්ජ, අද; නො උභින්නං, අප දෙදෙනාගේ; යුධඤ්ච, යුධය නමුත්; හොති, වේද; යුධිසම්ං, ඒ යුධයෙහි; යො, යමෙක් තෙම; ජෙස්සති, ජයගන්නේද; තස්ස, ඔහුට; මග්ගා, මාගීය අහිති වේ.

1534 සබ්බා දිසා අනුවිසටෝ හම්සම්
මහබ්බලෝ අම්බායසෝ අතුල්‍යෝ
ගුණෙහි සබ්බෙහි උපෙතරූපෝ
ධම්මෝ අධම්ම! තවං කථං විජෙස්සසී.

---

* සෙ අහං-මරම්ම. † නොතු-මරම්ම. ‡ යුධම්හි යො ජයති-මරම්ම.

අහං, මම; සබ්බා දිසා, සතරදිගය සතර අනුදිගය යන සියලු දිශාවන්හි; අනුවිසටෝ අසම්, (තමන්ගේ ගුණයෙන්) ප්‍රකට වූයෙමි; මහබ්බලෝ,මහත් බල ඇත්තා වූ; අමිතයසෝ, අප්‍රමාණ යසස් ඇත්තා වූ; අතුල්‍යෝ, අසදෘශ වූ; සබ්බෙහි ගුණෙහි, සියලු ගුණයෙන්, උපෙතරූපෝ, යුක්ත වූ; ධම්මෝ(අසම්), ධර්ම නම් දිව්‍යපුත්‍ර වීමි; අධම්ම, අධර්මනම් දිව්‍යපුත්‍රය; ඕං, තෝ; කථං විජෙස්සසි, (මා හා සමඟ යුද්ධකොට) කෙසේ ජයගන්නෙහිද.

1535 ලොහෙන වෙ හඤ්ඤති ජාතරූපං
න ජාතරූපෙන හනන්ති ලොහං
* ස මෙ අධම්මෝ භජති ධම්මමජ්ජ
අයෝ සුවණ්ණං විය දස්සනෙයෘං.

වෙ, එකාන්තයෙන්; ලොහෙන, අයෝමය මිටියෙන්; ජාතරූපං, සුවර්ණය; හඤ්ඤති, නසන්නේය; ජාතරූපෙන, සුවර්ණයෙන්; ලොහං, ලොහය; (යකඩය) න හනන්ති, නොනසන්නේය; මෙ, මාගේ; සෝ අධම්මෝ, හේ අධර්මය නෙම;අජ්ජ, අද; ධම්මං, (තාගේ) ධර්මය; භජති, බිඳින්නේය; කුමක්මෙන්ද යත්? දස්සනෙයෘං, දර්ශනීයවූ; සුවණ්ණං, සුවර්ණය බිඳින්නා වූ; අයෝ විය, ලොහය මෙනි.

1536 සචෙ තුවං යුබ්බලෝ අධම්ම!
තුයහං න වුඩ්ඪා ච ගරූ ච අත්ථි
මඝං ච තෙ දම්මි-පියාපියෙන
වාචා දුරුත්තානිපි තෙ ඛමාමි.

අධම්ම, අධර්ම නම් දිව්‍යපුත්‍රය; සචෙ, ඉදින්; තුවං, තෝ; යුබ්බලෝ, යුද්ධය බලකොට ඇත්තෙහි නම්; තුයහං, එසේවූ තට; වුඩ්ඪා ච, (ඥන වෘද්ධයෝ) වෘද්ධයෝද; ගරූ ච, ගරු කටයුතු පණ්ඩිතයෝද; න අත්ථි, නොම ඇත; තෙ, (එසේ වූ) තට; මඝං ච, මාඝීයද; පියාපියෙන, දෙන්නාවූ ප්‍රිය අප්‍රිය දෙදෙනකු කෙරෙන් ප්‍රියයකු විසින් මෙන්; දදම්, දෙමි; තෙ, (යලිත්) තා විසින් කියන ලද; වාචාදුරුත්තානිපි, දුරුක්තවචනයන්ද (නපුරුකොට කියන ලද තෙපුල්ද), ඛමාමි, ඉවසම්.

1537 ඉදං ව සුත්වා වචනං අධම්මෝ
අවංසිරෝ පත්‍යතා උඩ්ඩපාදෝ
යුද්ධත්ථිකෝ වෙ න ලභාමි යුද්ධං
එත්තාවතා හොති හතෝ අධම්මෝ.

* සචෙ-සමහර-වෙ-මරම්ම.

අධමෙමා, අධම්ම දිව්‍යපුත්‍ර තෙම; ඉදව වචනං, මේ වචනය; සුත්වා, අසා; යුඛජ්ඣිකෝ වෙ, ඉදින් යුඬ කැමැත්තේ වී නමුත්; යුඬං, යුඬය; න ලභාමි, නො ලබමියි; (මෙසේ විලාපකියමින්) අවංසිරෙ, හිස යටිකුරුව; උඩ්ඩපාදෙ, පා උඩුකුරුව; පතිතෝ, (භූමියෙහි) වැටුනේය;එත්තාවතා, (මහණෙනි; යම්තාක් පෘථිවියට ප්‍රවිෂ්ට වූයේද) මෙපමණෙකින්; අධමෙමා, අධම්ම දිව්‍යපුත්‍ර තෙම; හතෝ හොති, නටුයේ නම් වේ;—පෘථිවිවිවරයෙන් අවිවිමහ නරකයට බටුයේ යයි සේසි.

1538 ඛන්තීබලෝ යුඬබලං විජෙත්වා
හන්ත්වා අධම්මං නිහනිත්ව භූම්‍යා
පායාසි චිත්තො අභිරුයහ සන්දනං
මහෙහනෙව අතිබලෝ සච්චනිකකමො.

යුඬබලං, යුඬබලය; විජෙත්වා, ජයගෙන; අධම්මං, අධම්ම දිව්‍යපුත්‍රයා; හන්ත්වා, පෙළා; භූම්‍යා, පොළොවෙහි; නිහනිත්වා, හෙලා; අතිබලෝ, මහත්වූ බලඇති; සච්චනිකකමො, සත්‍යයම පරාක්‍රමකොට ඇති; ඛන්තීබලෝ, අධිවාසන ඤාණබලයෙන් යුක්ත වූ දිව්‍යපුත්‍ර තෙම; චිත්තො, හටගත් සතුටුසිත් ඇත්තේ; සන්දනං, දිව්‍යරථයට; අභිරුයහ, නැඟී; මහෙහනෙව, (යෑපුවූ) මාඝීයෙන්ම; පායාසි, ගියේය.

1539 මාතාපිතා සමණ බ්‍රාහමණා ච
අසම්මානිතා යස්ස සකෙ අගාරෙ
ඉධෙව නිකඛිපප සරීරදෙහං
කායස්ස භෙදා නිරයං වජන්ති තෙ
යථා අධමෙමා පතිතෝ අවංසිරෙ.

මාතාපිතා,මව්පියෝද; සමණ බ්‍රාහමණා ච; මහණ බමුණෝද; යස්ස, යම්කිහුගේ; සකෙ අගාරෙ, සවකීය ගෘහයෙහි; අසම්මා නිතා, සත්කාර නො කරන ලද්දාහුද; ඉධෙව, මේ දිව්‍යලොක යෙහිම;සරීරදෙහං, ශරීරසඞඛ්‍යාත වූ දෙහය; නිකඛිපප, බහා; තෙ, ඔහු තුමූ; අධමෙමා, අධම්මදිව්‍ය පුත්‍රතෙම; අවංසිරෙ, හිස යටි කුරුව; යථා, යම්පරිද්දකින්; පතිතෝ, (නරකයෙහි) වැටුනේද එපරිද්දෙන්; කායස්ස භෙදා, ශරීරයාගේ භෙදයෙන්; නිරයං, නරකයට; වජන්ති, යන්නාහුය.

1540 මාතාපිතා සමණබ්‍රාහමණා ච
සු සම්මානිතා යස්ස සකෙ අගාරෙ
ඉධෙව නික්ඛිපප සරීරදෙහං
කායස්ස භෙදා සුගතිං වජනති තෙ
යථාපි ධමෙමා අභිරුයහා සඳ්ඝනනති.

මාතාපිතා, මවිපියෝද; සමණබ්‍රාහමණා ච, මහණ බමුණෝද; යස්ස, යමක්හුගේ; සකෙ අගාරෙ, සඩකීය ගෘහයෙහි; සු සම්මානිතා, මොනවට සත්කාර කරන ලද්දාහුද; ඉධෙව, මෙහිම; සරීරදෙහං, ශරීර සඞ්ඛ්‍යාත දෙහය; නික්ඛිපප, බහෑ; තෙ, ඔහු තුමූ; ධමෙමා, ධර්ම නම් දිව්‍යපුත්‍ර තෙම; සඳ්ඝනං, දිව්‍යරථයට; අභිරුයහ, නැඟී; යථාපි, යම්සේ ගියේද එපරිද්දෙන්; කායස්ස භෙදා, ශරීරයාගේ භෙදයෙන්; සුගතිං, සුගතියට; වජනති, යන්නාහුයි.

451 ධමම ජාතකය.

1541 එකා නිසිදනා සුවිසඤඤදතුරු
පාසාදමාරුයහ අනිඳිතඞ්ගී
යංවාමි භං කිණණරතෙතනවකඛු
ඉමෙකරතතිං උභයො වසෙම.

සුවි, පිරිසිදුවසත්‍ර නිවැසනය කළා වූ; සඤඤදතුරු, මනාකොට පිහිටුවන ලද දෙවඳොර ඇති—ඉරියව් මොනවට පිහිටුවා පිරිසිදු වසත්‍ර හැඳ එකලාව හුන් තැනැත්තී යයි කී නියායි; අනිඳිතඞ්ගී, (පාදතලයෙහි පටන් කෙසාග්‍රය දක්වා සියලු ශරීරාවයවයන් පරිපූර්ණ බැවින්) නිදුස්, නොකට සුදු ශරීර ඇති; —උතුම් ශොභා වෙන් අගතැන් පත් ශරීර ඇත්තී යි; කිණණරතෙතනවකඛු, (මණ්ඩලත්‍රයකින් ශා පවත්‍රසාදයෙන් ශෙෂියා වූ) කිඳුරන්ගේ නෙත් වැනි විසල්සුසින් යුත් උතතමාඞ්ගිය නී; පාසාදං, ප්‍රාසාදයට; ආරුයහ, නැඟ; එකා නිසිදනා, හුදකලාව හිඳිනෙහි; ඉමං එකරතතිං, (අද) මේ එකරැය; (මේ සරසන ලද අලංඞ්කෘත සයන

මධ්‍යයෙහි) උභයෝ, අපි දෙදෙන; (එකතුව) වසෙමු, වෙසෙමු සි (සෙය්‍යාව කරම්හ සි); නං, නී; යාවාමි, යාචාමි, කොරෙමි—ඉල්ලමි සි සේසි.

1542 * ඔකිණ්ණන්තරපරිඛං දළහමට්ටාලකොඨකං
රක්ඛිතං ඛග්ගහත්ථේහි දුප්පවෙසමිදං පුරං.

දුප්පවෙසං, කිසිවෙකුට ප්‍රවිශ්‍රවන්ට නොහැකි වූ; ඉදං පුරං, මේ (දෙළොස් යොදුන් සියලු සුරැකිත) පුරය; ඔකිණ්ණන්තර පරිඛං, අතරතුර දියඅගලය මඩඅගලය වියලිඅගල්ය යන මෙසින් ගැවසී ගත්තේය; දළහමට්ටාලකොඨකං, අතිශයින් සිර්වූ අටලු දොරකොටු යන මෙසින් සන්නිවිතය; ඛග්ගහත්ථේහි, ආයුධගත් අත් ඇති දසදහසක් යොධයන් විසින්; රක්ඛිතං, රක්නා ලද්දේය.

1543 දහරස්ස යුධිනෝ වාපි ආගමෝ ච න විජ්ජති
අථ කෙන නු වණ්ණේන සඞ්ගමං ඉච්ඡසෙ මයා.

දහරස්ස, ළදරුවෙකුටද; යුධිනෝ වාපි, යොධභටයෙකුටද; ආගමෝ ච, (මෙහි මේ වේලාවට කිසිවෙකුගේ) පැමිණීමෙක් නම්; න විජ්ජති, නැත්තේය; අථ, නැවත; කෙන නු වණ්ණේන, (නුඹ වහන්සේ) කවර කාරණයකින්; මයා, මා හා; සඞ්ගමං, සඞ්ගමය; ඉච්ඡසෙ, කැමැත්තෙහිද.

1544 යක්ඛොහමස්මි කල්‍යාණි ආගතොමහි තවන්තිකං
ත්වං මං නන්දස්සු භද්දන්තෙ! පුණ්ණපාංසං දදාමි තෙ.

කල්‍යාණි, සුන්දර දර්ශණයෙන් සමන්විත වූ ප්‍රියාව; අහං, මම; යක්ඛොඅස්මි, එක් දිව්‍යපුත්‍රයෙක් වෙමි; තවන්තිකං, තීගේ සමීපයට; ආගතොමහි, (දිව්‍යානුභාවයෙන්) පැමිණියෙමි; භද්දන්තෙ, පින්වතිය; ත්වං, තී; මං, මා; නන්දස්සු, (අද) සතුටු කරව; තෙ, තිට, පුණ්ණපාංසං, රන්මසුපිරු තලිය; දදාමි, දෙමි.

1545 දෙවං වා යක්ඛං අථවා මනුස්සං
න පත්ථෙමි උදයමත්තිච්ච අඤ්ඤං
ගච්ඡේව ත්වං යක්ඛ! මහානුභාව
මාවස්සු ගන්ත්වා පුනරාවජ්ජ මං.

---

* උක්කිණ්ණන්තරපරිඛ--සම්හර.

මහානුභාව, මහත් ආනුභාව ඇති; යක්ඛ, දිව්‍යරාජය; උදයං අනිච්ච, උදය රජ්ජුරුවන් ඉක්මවා; අඤ්ඤං, අන්‍ය වූ; දෙවං වා, දෙවියෙක් හෝ; යක්ඛං වා, යක්ෂයෙක් හෝ; අථවා, නොහොත්; මනුස්සං, මනුෂ්‍යයෙක් හෝ; න පත්ථෙමි, මම ප්‍රාර්ථනා නොකෙරෙමි; භික්, හේ නුඹ වහන්සේ; ගච්ඡව, මෙහි නොසිටම යව; ගන්ත්වා, ගොස්; පුන, නැවත; මා ච අවජීත්, නොඑවයි කී-"අයඝු" යනු නිපාතමාත්‍රයි.

1546 යා රති උත්තමා කාමභොගිනං
යං හෙතු සත්තා විසමං චරන්ති
මා තං රතිං ජීසි තුවං සුවිම්හිතෙ!
දදුම් තෙ රූපියකංසපූරං.

කාමභොගිනං, (සොඳුර රාජධීතාව) කාමභෝගී සත්වයන්ගේ; යා රති, යම් මෛථුන කාමරතියක් ඇද්ද එය; උත්තමා, උතුම් රතිය වන්නිය; යං හෙතු, යම්බඳුකාමයක් හෙතුකොට ගෙන, සත්තා, සත්වයෝ; විසමං චරන්ති, විසමව හැසිරෙද්ද; සුවිම්හිතෙ, මනාපහසිතයෙන් යුක්ත වූ සොඳුර! තං රතිං, ඒ කාමරතිය; තුවං, නී; මාජීසි, ජීර්ණ නොකර හෙවත් නොනස; (මමද හිස් අතින් නොආයෙමි) තෙ, නිව; රූපියකංසපූරං, රත්‍රන් පිරූ රිදී තලියක්; දදුම්, දෙම් කියේය.

1547 නාරිං නරෙ නිජ්ඣාපයං ධනෙන
උක්කංසති යත්ථ කරොති ඡන්දං
විපච්චනීකො තව දෙවධම්මො
පච්චක්ඛතො ඔකතරෙන එසි.

නරෙ, පුරුෂ තෙමේ නම්; නාරිං, ස්ත්‍රිය; (කෙලෙසරතිය හෙතු කොටගෙන) ධනෙන, ධනයෙන්; නිජ්ඣාපයං, සිත්ගන්නේ; යත්ථ, ඒ ස්ත්‍රිය කෙරෙහි; ඡන්දං කරොති, ආලය කෙරේ; උක්කංසති, ඈ උසස් කෙරෙයි;—ගුණවණ්ණා කොට නැවත නැවත ඉතා අධිකව ධනය දීමෙන් ප්‍රලොභ කෙරෙයි සේයි; දෙව, දෙවය; තව, නුඹ වහන්සේගේ; ධම්මො, සවභාව ධර්මය තෙම; විපච්චනීකො, ඊට විරුද්ධය හෙවත් වෙනස්ය; පච්චක්ඛතො, ප්‍රත්‍යක්ෂ වශයෙන්; ඔකතරෙන, අනිසයින් සවලා ධනයෙන් යුක්තව; එසි, ආයෙහිද එහෙයිනි;—පළමු දවස් රන්පිරූ රන්තලියක් ගෙනවුත් දෙවන දවස් රන්පිරූ රිදීතලියක්ද තුන්වන දවස් කහවනු පිරූ ලොහොතලියක් ගෙන ආයෙහි සි.

1548 ආයු ච වණ්ණා ච මනුස්සලොකෙ
නිහීයති මනුජානං සුගතෙන!
තෙනෙව වණ්ණෙන ධනම්පි තුයහං
නිහීයති ජිණ්ණතරාසි අජ්ජ.

සුගතෙන, ශොභන ගාත්‍රයෙන් යුත් රාජ කුමාරිකාවෙනි; මනුස්සලොකෙ, මනුෂ්‍යලොකයෙහි; මනුජානං, මනුෂ්‍යයන්ගේ; ආයු ච, ආයුෂයද; වණ්ණා ච, ශරීරවර්ණයද; නිහීයති, (පෙරහ නෙහි වත්කළ දියත්තක් මෙන්) පිරිහෙන්නේය; තෙනෙව වණ්ණෙන, එම හෙතුවෙන්ම; තුයහං, නිට (දෙන ලද); ධනම්පි, ධනයද; නිහීයති, පිරිහෙයි; අජ්ජ, අද; ජිණ්ණතරාසි, ති අතිශයින් ජීර්ණයෙහි.

1549 එවං මෙ පෙක්ඛමානස්ස රාජපුත්ති! යසස්සිනි
හායතෙ වත තෙ වණ්ණා අහොරත්තානමච්චයෙ.

යසස්සිනි, යසස් ඇත්තා වූ; රාජපුත්ති, රාජපුත්‍රිය; එවං, මෙපරිද්දෙන්; මෙ, මා විසින්; පෙක්ඛමානස්ස, බලමින් සිටියදීම; අහොරත්තානං. අහෝ රාත්‍රයන්ගේ; (රෑ දවල් දෙදෙනාගේ) අච්චයෙ, ඇවෑමෙහි; (ඉක්මීමෙහි) වත, එකාන්තයෙන්; තෙ, නිගේ; වණ්ණා, රූපවර්ණය තෙම; හායතෙ, පිරිහී යන්නේය.

1550 ඉමිනාව ත්වං වයසා රාජපුත්ති! සුමෙධසෙ
බ්‍රහ්මචරියං චරෙය්‍යාසි භීයෙය්‍යා වණ්ණවති සියා.

සුමෙධසෙ, සුන්දර ප්‍රඥ ඇති; රාජපුත්ති, රාජපුත්‍රිය; ත්වං, නී; ඉමිනාව වයසා, මේ වයසින්ම; බ්‍රහ්මචරියං, ශ්‍රේෂ්ඨචර්‍යාව, චරෙය්‍යාසි, පුරව හෙවත් පැවිදිව ශ්‍රමණ ධර්මය රක්ෂා කරව; භීයෙය්‍යා, අධිකව; වණ්ණවති සියා, ශරීර වර්ණය ඇති වන්නිය.

1551 දෙවා න ජීරන්ති යථා මනුස්සා
ගත්තෙසු තෙසං වලියො න හොන්ති
පුච්ඡාමි තං යක්ඛ! මහානුභාව
කථන්නු දෙවානසරීරදෙහො.

මනුස්සා යථා, මනුෂ්‍යයෝ යම්සේ ජරාවෙන් දීරන්නාහුද එපරිද්දෙන්; දෙවා, දෙවියෝ; න ජීරන්ති, නො දිරන්නාහුද; තෙසං, ඒ දෙවියන්ගේ; ගත්තෙසු, ගාත්‍රයන්හි, (ශරීරයන්හි); වලි

යෝ න හොනති, රැලි නො වැටෙන්නාහුය; තං, ඒ කාරණය; මහානුභාව, මහත් ආනුභාව ඇති; යකඛ; දෙවිය(නුඹ වහන්සේ ගෙන්); පුච්ඡාමි; විචාරමි;දෙවානං, ඒ දෙවියන්ගේ; සරීරදෙහො, ශරීරසඞ්ඛාත දෙහයතෙම;කථන්නු,සෙසේ නම් නො දිරන්නේද.

1552 දෙවා න ජීරන්ති යථා මනුස්සා
ගත්තෙසු තෙසං වලියො න හොන්ති
සුවෙ සුවෙ භියතරො ච තෙසං
දිබ්බා ච වණ්ණා විපුලා ච හොගා.

මනුස්සා යථා-පෙ-වලියො න හොන්ති, රැලි නො වැටෙන්නාහුය; සුවේ සුවෙ, දිනෙහි දිනෙහි; තෙසං, ඒ දෙවියන්ගේ; භියතරො ච, අධික වූ; දිබ්බා ච වණ්ණා, දිව්‍යමය වූ වර්ණය; විපුලා ච හොගා,විපුල වූ භොගයෝද වැඩිවන්නාහුය.

1553 කිං සූධ භීතා ජනතා අනෙකා
මඝොනා ච නෙකායතනා පවුත්තා
පුච්ඡාමි නං යකඛ! මහානුභාව.
කත්ථඨිතො පරලොකං න භායෙ.

ඉධ; මේ ලොකයෙහි; අනෙකා ජනතා, (දිව්‍යරූපය මේ ඉන්ද්‍රියාදී ප්‍රභෙද වූ) නොයෙක් ජනයෝ; කිංසු භීතා, කුමකට භයින් (පිරිහෙන සවභාව ඇත්තාහු ඕනිස්ලොවින් දෙව්ලොවට නො යන්නාහු ද සි); අනෙකායතනා, නොයෙක් තීර්ථායතන; (නොයෙක් කුසල් උපදනා තැන් වශයෙන්); පවුත්තා, (පණ්ඩිත යන් විසින්) කියන ලද; මඝොනා, (දිව්‍යලොකගාමී) මාගීය; (කොං, කවරේද;) මහානුභාව, මහත් ආනුභාව ඇති; යකඛ, දිව්‍යරූපය; පරලොකං, පරලොවට යන තැනැත්තේ; කත්ථ, කවර මාගී යෙක්හි; ඨිතො,සිටියේ; න භායෙ, බිය නොවේ ද සි විචාරයි.

1554 වාචං මනඤ පණිධාය සම්මා
කායෙන පාපානි අකුබ්බමාණො
ඛභවන්නපානං සරමාවසන්තො
සඩ්ඩො මුදූ සංවිභාගී වදඤ්ඤූ
සඞ්ගාහකො සඛිලො සණ්හවාචො
එත්ථඨිතො පරලොකං න භායෙ.

වාචං, (සොඳුර උදය නම් කුමාරිකාවෙනි) වචනයද; මනඤ, සිතද; සම්මා, මනාකොට; පණිධාය, පිහිටුවා; කායෙන, කයින්:

පාපානි,පාපකම්මයන්;අකුබ්බමානෝ, නො කරන්නේ හෙවත් මේ දුශකුසල කම්මපථය සමාදන්ව පවත්නේ; බහුඅන්නපානං, බොහෝ දියයුතු දානවසතු ඇති; ඝරං ආවසන්තෝ, ගෘහයෙහි වාසය කරන්නේ; සඛෝ, (දානයාගේ විපාක ඇත්තේය යි)සැදහැ සිතින් සමන්විත වූයේද; මුදු, මොළොක් සිත් ඇත්තේද; සංවිභාගී, දාන සංවිභාගයෙහි ඇලුනේද; වදඤ්ඤූ, වචන දන්නේද හෙවත් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ගේ හිඤ්ඤාවයඃසඞ්ඛ්‍යාත වචන දන දන් දේද; සඞ්ගාහකෝ, සතර සඞ්ග්‍රහ වස්තුවෙන් සඞ්ග්‍රහ කරන්නේද; සඛිලෝ, ප්‍රියවචන ඇත්තේද; සණ්හවාචෝ, මට සිලුටු වචන ඇත්තේද; එත්ථිනෝ, මෙතෙක් මේ ගුණ රැසියෙහි සිටි තැනැත්තේ; පරලෝකං, පරලොවට යන්නේ; න සොචයෙ, බිය නොවන්නේ සි.

1555 අනුසාසසි මං යක්ඛ! යථා මාතා යථා පිතා
උළාරවණ්ණ පුච්ඡාමි කොනු? සොමසි සුබ්‍රහ්මා.

උළාරවණ්ණ, උදාරවර්ණශෝභාගුණයෙන් යුක්ත වූ; යක්ඛ, දිව්‍යරාජය; මං, මට; යථා මාතා, (පුත්‍රයෙකුට අනුශාසනා කරන්නා වූ) මවක මෙන්; යථා පිතා, පියෙකු මෙන්; අනුසාසසි, අනුශාසනා කෙරෙහි; සුබ්‍රහ්මා, ඉතා උස් වූ ශරීරයක් ඇති; සොං, නුඹ වහන්සේ; කොනු අසි, කවරෙක් වූ යෙහිදැ සි.

1556 උදයොහමස්මි කල්‍යාණි! සංඛ්‍යාරත්ථා ඉධාගතෝ.
ආමන්ත ඛෝ තං ගච්ඡාමි මුත්තෝහාස්මි තව සඞ්ඛරා.

කල්‍යාණි, කල්‍යාණදර්ශනීය වූ රාජකුමාරිකාවෙනි; අහං, මම; උදයෝ අස්මි,(පළමුභවයෙහි නීගේ සැමි වූ) උදය නම් රජ වෙමි; සඞ්ඛරත්ථා, සඞ්ඛාරයක් නිසා හෙවත් පෙර නිවිසගත් අවුල් කාරණයක් නිසා; ඉධ, මේහි; ආගතෝ, (නී විමසා එසින් මුදන පිණිස) ආයෙමි; තං, නීට; ආමන්ත ඛෝ, ආමන්ත්‍රණය කොට; ගච්ඡාමි, යමි; තව, නීගේ; සඞ්ඛරා, සඞ්ඛාරයයි කියන ලද පෙර නිවිසගත් අවුලෙන්; මුත්තෝ අස්මි, මිදුනෙමි.

1557 සචෙ ඛෝ සොං උදයොසි සඞ්ඛරත්ථා ඉධාගතෝ
අනුසාස මං රාජපුත්ත! යථාස්සු පුන සඞ්ගමෝ.

සචෙ ඛෝ, ඉදින් වනාහි; සොං, නුඹ වහන්සේ; උදයොසි, උදය රජ වූ යෙහි නම්; සඞ්ඛරත්ථා, සඞ්ඛාරය (අවුල) මුදාගෙන

පිණිස; ඉධ, මෙහි; ආගතො, පැමිනියෙහි වී නම්; රාජපුත්‍ර, රාජපුත්‍රයන් වහන්ස; යථා, යම්පරිද්දකින්; පුත්‍ර,නැවත;සඞ්ඝමෝ, සඞ්ඝමය (එක්වීම); අසසු, වන්නේද එපරිද්දෙන්; මං, මට; අනුසාස, අනුශාසනා කළ මැනව.

1558 අතිපතති වයො ඛණෙ තථෙව
ඨානං නත්ථි ධුවං වවනති සත්තා
පරිජීරති අඛ්‍රුවං සරීරං
උදයෙ! මා පමාද චරසසු ධම්මං.

උදයෙ, උදයභද්‍රාවෙනි; වයො, ප්‍රථමාදි ත්‍රිවිධ වයස; අතිපතති, අතිශයින් ඉකුත් වෙයි; ඛණෙ, උත්පාදස්ථිතිභඞ්ගක්ෂණ යද; තථෙව, එසේම ඉක්මෙන්නේය; ඨානං, (උපන් සත්ව සංඝකාරයෝ නොබිඳී සිටිත්ව සි පැතීමෙනුදු ඔවුන්ගේ) සිටීමෙක් නම්; නත්ථි, නැත්තේය; ධුවං, එකාන්තයෙන්; සත්තා, සියලු සත්වයෝ; වවනති, චුතවන්නාහුය; අඛ්‍රුවං, අනිස්ථිර වූ; සරීරං, (මේ සවණ්ණවණ්ණ) ශරීරය; පරිජීරති, දිරන්නේමය; මා පමාදං චරසසු, ප්‍රමාදයට නො පැමිණෙව; ධම්මං, දශකුසල ධර්මයෙහි; චරසසු, හැසිරෙව.

1559 කසිණා පඨවී ධනසස පූරා
එකසෙසව සියා අනඤඤධෙය්‍යා
තථාපි ජහාති අවීතරාගො
උදයෙ! මා පමාද චරසසු ධම්මං.

උදයෙ, උදයභද්‍රාවෙනි; ධනසස පූරා, ධනයෙන් පිරුණා වූ, කසිණා පඨවී, සකල පෘථිවිය; එකසෙසව, එකම රජක් හට; සියා; අසිති වන්නීද; අනඤඤධෙය්‍යා, අනික් රජක් හට අසිති නො වන්නීද; අවීතරාගො, තෘෂ්ණාවසභාවයෙන් පහ නො කරන ලද රාග ඇති ඒ පුද්ගල තෙම; තථාපි,(මෙතෙක් යසසින් තෘප්තියකට නො පැමිණ) ඒ යසසද; ජහාති, අත්හැර (මරණ කාලයෙහි අවීතරාගීව ම පරලොව යන්නේය–මෙසේ තෘෂ්ණාවගේ අපූරණීය භාවය දනුව සි දක්වයි; මා පමාදං චරසසු–පෙ–

1560 මාතා පිතා භගිනී භාතරො ව
භරියාපි ඛත්තෙන හොනති අත්ථතා
තෙ චාපි විජහනති අඤඤමඤඤං
උදයෙ! මා පමාද චරසසු ධම්මං.

උදයෙ, උදයභද්‍රාවෙනි; මාතාපිතා ව, මවුපියෝද; භගිනී, නැගනීහුද;භාතරෙ ව, භ්‍රාතෘහුද; භරියාපි, භාර්‍යාවෝද; ධනෙන, ධනයෙන්;අතිත්තා, තෘප්තිරහිත වූවාහු; හොන්ති, වෙත්;තෙ වාපි, ඔහු තුමූද; (මව පුත්‍රයාද පුත්‍රයා මවද පියා පුත්‍රයාද පුත්‍රයා පියාද භ්‍රාතෘව නැගනියද නැගනිය භ්‍රාතෘවද භාර්‍යාව සවාමියාද සවාමියා භාර්‍යාවද යන) අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; විජහන්ති හරිත් (වෙනස් වෙත්)—මෙසේ සත්වයන්ගේ විනාශභාවය දැන ගනුව; මා පමාදං චරස්සු-පෙ-

1561 කායො පරභොජනන්ති ඤත්වා
සංසාරෙ සුගතිං දුගතිඤ්ච
ඉත්තරවාසොති ජානිය
උදයෙ! මා පමාද චරස්සු ධම්මං.

උදයෙ, උදයභද්‍රාවෙනි; කායො, මේ ශරීරය;පරභොජනන්ති, (අනෙකප්‍රකාර වූ කවුඩු ආදි වූ) අන්‍යසත්වයන්ගේ භොජනයයි; ඤත්වා, දැන; සංසාරෙ, සංසාරයෙහි; සුගතිං, සුගතියෙහිද; දුගතිඤ්ච, දුගතියෙහිද; ඉත්තරවාසොති, සුළුකාලයක් වාසය කරන්නේය සිද දැන;මා පමාදං චරස්සු,ප්‍රමාදයට නො පැමිණෙව; ධම්මං, දශකුසලධර්මයෙහි; චරස්සු, හැසිරෙව.

1562 සාධු භාසතියං යකෙඛා අපපං මච්චානජීවිතං
කාසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුකෙඛන සංයුතං
සාහං එකා පබ්බජිස්සාමි හිත්වා කාසිං සුරුක්ඛනන්ති.

මච්චානං, සත්වයන්ගේ; ජීවිතං, ජීවිතය; අපපං, සුළුපයයි; (කියන්නාවූ) අයං යකෙඛා, මේ දෙවි තෙම; සාධු, යහපතක්; භාසති, කියන්නේය; කුමක් හෙයින්ද යත්? කසිරඤ්ච,(මේ ශරීරය වනාහි) දුක්ඛසහිතය හෙවත් ආශ්වාද රහිතය; පරිත්තං ච, බොහෝ කල් නො පවත්නේය හෙවත් සුළුපකාලයක් පවත් නේය; තඤ්ච, හෙද; දුකෙඛන, සියලු වූතදුඃඛයෙන්; සංයුතං, යෙදුනේය හෙවත් ගැවසීගත්තේය, සා අහං, හේ මම; සුරුක්ඛනං, සුරුක්ඛනපුරයද; කාසිං, කසීරටද; හිත්වා, හැර දමා; එකා, එකලා වම; පබ්බජිස්සාමි, පැවිදිවන්නෙමි කී.

452 උදයභද්‍ර ජාතකයයි.

1563 මිත්තෝ මිත්තස්ස පානීයං අදිස්සං පරිභුඤ්ජහං
තේන පච්ඡා විජිගුච්ඡිං තං පාපං පකතං මයා
මා පුන අකරං පාපං තස්මා පබ්බජිතෝ අහං.

අහං, (මහරජණෙනි) මම; මිත්තෝ, (එකක් ඩට) මිත්‍රව; මිත්තස්ස, (ඒ) මිත්‍රයාගේ සන්තක වූ; අදිස්සං, නො දෙන ලද; පානීයං, පැන්; පරිභුඤ්ජිං, (මේ නියායෙන්) පරිභෝග කෙළෙමි; තං පාපං, (යම්හෙයකින්) ඒ පාපය; මයා, මා විසින්; පකතං, කරන ලදද; තෙන, ඒ කරණකොට ගෙන, පච්ඡා, පසුව; විජිගුච්ඡිං, විශෙෂයෙන් පිළිකුල්බවට පැමිනියෙමි; තස්මා, (යම් හෙයකින් පෘථජ්ජනයෝ පව්කම් කෙරෙද්ද) එහෙයින්; අහං, මම; පුන, නැවත; පාපං, පාපය; මා අකරං, නො කෙරෙමැයි (ඒ මා විසින් කළ පාපය අරමුණු කොට) පබ්බජිතෝ, පැවිදි වීමි.

1564 පරදාරඤ්ච දිස්වාන ඡන්දෙ මෙ උපපජ්ජථ
තෙන පච්ඡා විජිගුච්ඡිං තං පාපං පකතං මයා
මා පුන ඒවරං පාපං තස්මා පබ්බජිතෝ අහං.

පරදාරඤ්ච, (මහරජණෙනි) අනුන්ගේ භාර්‍යාවක්ද; දිස්වාන, දැක (ඉන්ද්‍රිය භෙදකොට බලා); මෙ, මාගේ; ඡන්දෙ, කාමයෙහි ඡන්දයෙක්; උපපජ්ජථ, උපන්නේය; තං පාපං-පෙ-

1565 පිතරං මේ මහාරාජ! චොරා අගණ්හු කානනෙ
තෙසාහං පුච්ඡිතෝ ඤාතං අඤ්ඤථා නං වියාකරිං.

මහාරාජ, මහරජණෙනි; මෙ, මාගේ; පිතරං, පියා; චොරා, සොරු; අගණ්හු, අල්වා ගත්තාහුය; තෙසං, ඒ සොරුන් විසින්; පුච්ඡිතෝ, පුළුවුස්නා ලද; අහං, මම; ඤාතං, දැන දැන; අඤ්ඤථා, අන් පරිද්දකින්; නං, එය; වියාකරිං, ප්‍රකාශ කෙළෙමි.

1566 තෙන පච්ඡා විජිගුච්ඡිං යං පාපං පකතං මයා
මා පුන අකරං පාපං තස්මා පබ්බජිතෝ අහං.

මෙහි අර්ථ ඔට කියන ලද මැයි.

1567 පාණාතිපාතමකරුං සොමයාගෙ උපඨිතෙ
තෙසාහං සම්භුඤ්ඤිසිං තේන පච්ඡා විජිගුච්ඡිං
තං පාපං පකතං මයා මා පුන අකරං පාපං.
තස්මා පබ්බජිතෝ අහං.

සොමයාගෙ, (අභිනව චන්ද්‍රයා උදාතවූ කල්හි සොමයාග නම් යක්ඛබලියක් කළෝ ඒ) සොමයාගය; උපඨිතෙ, එළඹ සිටි

කල්හි; පාණාතිපාතං, ප්‍රාණඝාතය; අකරිං, කළාහුය; තෙසං, ඔවුන්ගේ ඒ ප්‍රාණඝාතය; සම්නුඤ්ඤසු ආසිං, අනුමොදන් වූ යෙමි; තෙන, ඒ කරණකොට ගෙන; පච්ඡා, පසුව; විජිගුවජ්ජං, එළිකුල් සොළෙමි-පෙ-

1468 සුරාමෙරයමධ්‍යා යෙ ජනා පයිමාසු නෝ
බහුන්නං තෙ අනත්ථාය මජ්ජපානමකප්පයුං.

සුරා, පිළුසුරුදි සුරාවද; මෙරය, පුෂ්පාසවාදි මෙරයද; මධ්‍යා, මිහිරිය සි සිතුම්න් පානය කරන්නාහු; නෝ, අපගේ ගම්හි; යෙ ජනා, ගම්වැසි යම්බඳු ජනයෝ; පයිමං ආසුං, පළමු මේබඳු සවරූප වූවාහුය සි කියා; තෙ, ඒ ගම් වැසි ජනයෝ; බහුන්නං, බොහෝ ජනයන්ට; අනත්ථාය, අනර්ථ පිණිස; මජ්ජපානං, මද්‍ය පානය; අකප්පයුං, කළාහුය.

1569 තෙසාහං සම්නුඤ්ඤසුසිං තෙන පච්ඡා විජිගුවජ්ජිං
නං පාපං පකතං මයා මෙ පුන අකරං පාපං
තස්මා පබ්බජිතෝ අහං.

අහං, මම; තෙසං, ඔවුන්ගේ ඒ සුරාපානය; සම්නුඤ්ඤසු ආසිං, අනුමොදන් වූයෙමි—සෙස්ස යට කී පරිද්දෙන් දනයුතුයි.

1570 ධිරත්ථු සුබහූ කාමෙ දුග්ගන්ධෙ බහුකණ්ටකෙ
යො අහං පතිසෙවනෙනා න ලභිං තාදිසං සුඛං.

යෝ අහං, යම්බඳු වූ මම; පතිසෙවනෙනා, (යම් කාමයක්) ප්‍රතිසෙවනය කරන්නෙම්; තාදිසං සුඛං, එබඳු වූ කෙලෙස් රහිත ධ්‍යානසැපයක්; න ලභිං, නො ලැබූයෙමිද; දුග්ගන්ධෙ; දුගඳ වහනය වන්නාවූ; බහුකණ්ටකෙ, බොහෝ පසම්තුරන් ඇති; සුබහූ, ඉතා බොහෝ වූ; කාමෙ, ඒ කාමයන්ට; ධිරත්ථු, නිඳු වේවා.

1571 මහස්සාදා සුඛා කාමා නත්ථි කාමා පරං සුඛං
